# බේරුවල සංවර්ධන සැලැස්ම
# 2019 - 2030

පළමු වෙළුම



නාගරික සංවර්ධන අධිකාරිය
2019 ජූලි



# බේරුවල සංවර්ධන සැලැස්ම

2019–2030

වෙළුම I

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
නාගරික සංවර්ධන අධිකාරිය

## බේරුවල සංවර්ධන සැලැස්ම 2019 – 2030 - පළමු වෙළුම

© නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව - 2019

සියළුම හිමිකම් ඇවිරිණි.

මෙම ප්‍රකාශනය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කෙරේ. මෙම ප්‍රකාශනය, සම්පූර්ණයෙන්ම හෝ කොටසක් මෙම අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රතිප්‍රකාශනය කිරීම, විකිණීම, බෙදා හැරීම, ලිඛිත අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ නවීන තාක්ෂණික ක්‍රම හරහා තැටිගත කිරීම, බෙදාහැරීම හෝ වෙළඳ අරමුණක් සඳහා යොදා ගැනීම සිදු නොකළ යුතුය.

ප්‍රකාශනය

නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව
6 වන,7 වන හා 9 වන මහල, “සෙත්සිරිපාය”,
බත්තරමුල්ල, කොළඹ, ශ්‍රී ලංකාව

වෙබ්අඩවිය– www.uda.gov.lk
විද්‍යුත් තැපෑල– info@uda.gov.lk
දුරකථන අංක- + 94112 873 637

ප්‍රකාශනය 2019 - ජූලි

බේරුවල සංවර්ධන සැලසුම 2019 - 2030 ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර එය පළමු වෙළුම හා දෙවැනි වෙළුම වශයෙන් ප්‍රකාශයට පත්කෙරේ. මෙහි පළමු වෙළුම අනු කොටස් දෙකකින් සමන්විත වන අතර එය පළමුවන කොටස හා දෙවන කොටස වශයෙන් සඳහන් කර ඇත. මෙහි එන පළමු වෙළුමෙහි පළමුවන කොටස මඟින් සංවර්ධන සැලසුම හැඳින්වීම, පසුබිම් අධ්‍යයනය, සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය පිළිබඳ සඳහන් කරන අතර එහි දෙවන කොටස මඟින් සංවර්ධන සැලැස්මේ දැක්ම, අරමුණු හා පරමාර්ථ, සංකල්පිත සැලැස්ම, සංවර්ධන උපාය මාර්ග සැලසුම් යනාදිය අන්තර්ගත කර ඇත. සංවර්ධන සැලැස්මෙහි දෙවන වෙළුම වෙනම ප්‍රකාශනයක් ලෙස සකස් කර ඇති අතර එහි 2019 - 2030 කාල පරිච්ඡේදය සඳහා බලපවත්වන සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි හා කලාපීකරණ රෙගුලාසි යනාදිය අන්තර්ගත කර ඇත.

බේරුවල සංවර්ධන සැලසුම 2019 - 2030 පිළියෙළ කරන ලද්දේ, නාගරික සංවර්ධන අධිකාරියේ බස්නාහිර පළාත් අංශයේ කළුතර දිස්ත්‍රික් කාර්යාලය විසින් වන අතර ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනෙකුත් අංශයන්ගේ හා අදාළ සම්පත් දායකයන්ගේ උපදෙස් හා මඟපෙන්වීම සැලසුම පිළියෙළ කිරීමේ කාර්යයේදී යොදා ගැනිණි.

**අධීක්ෂණ කටයුතු**

ආචාර්ය ජගත් මුණසිංහ ***සභාපති - නා.සං.අධි.***, ඉංජිනේරු එස්.එස්.පී. රත්නායක ***අධ්‍යක්ෂ ජනරාල්- නා.සං.අධි.***, නගර නිර්මාණ ශිල්පී කේ.ඒ.ඩී. චන්ද්‍රදාස ***හිටපු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අධි.***, නගර නිර්මාණ ශිල්පී ඩී.එම්.බී. රණතුංග ***අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අධි.***, එම්.පී. රණතුංග ***නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) - නා.සං.අධි.***, නගර නිර්මාණ ශිල්පී ජනක් රණවීර ***අධ්‍යක්ෂ (සංවර්ධන සැලසුම් හා පරේයේෂණ හා සංවර්ධන අංශය) - නා.සං.අධි.***, නගර නිර්මාණ ශිල්පී ලලිත් විජේරත්න ***හිටපු අධ්‍යක්ෂ (සංවර්ධන සැලසුම් අංශය) - නා.සං.අධි.***, වයි.ඒ.පී.කේ. ගුණතිලක ***අධ්‍යක්ෂ (බස්නාහිර පලාත් අංශය) - නා.සං.අධි.***

**සැලසුම් කණ්ඩායම**

නගර නිර්මාණ ශිල්පී බී.ඒ.ආර්. අජිත් කුමාර මයා ***නියෝජ්‍ය අධ්‍යක්ෂ සැලසුම් (බස්නාහිර පළාත් අංශය, කළුතර දිස්ත්‍රික් කාර්යාලය) නා.සං.අධි.***, නගර නිර්මාණ ශිල්පී එම්. හේමන්ති මිය ***හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ සැලසුම් (බස්නාහිර පළාත් අංශය, කළුතර දිස්ත්‍රික් කාර්යාලය) නා.සං.අධි.***, එස්. අබේසිංහ මිය ***නගර නිර්මාණ ශිල්පී (බස්නාහිර පළාත් අංශය, කළුතර දිස්ත්‍රික් කාර්යාලය) නා.සං.අධි.***, අයි.පී. ගුණවර්ධන මයා ***සැලසුම් නිලධාරී (බස්නාහිර පළාත් අංශය, කළුතර දිස්ත්‍රික් කාර්යාලය) නා.සං.අධි.***, ආර්.එම්.සී.එන්. රණතුංග මෙනවිය ***සහකාර සැලසුම් නිලධාරී (බස්නාහිර පළාත් අංශය, කළුතර දිස්ත්‍රික් කාර්යාලය) නා.සං.අධි.***, ඩී.කේ.එල්.එම්. ගුණරත්න මිය ***සහකාර සැලසුම් නිලධාරී (බස්නාහිර පළාත් අංශය, කළුතර දිස්ත්‍රික් කාර්යාලය) නා.සං.අධි.***, ඩබ්ලිව්. පී.පී.එම්. සිරිවර්ධන මෙනවිය ***සහකාර සැලසුම් නිලධාරී (බස්නාහිර පළාත් අංශය, කළුතර දිස්ත්‍රික් කාර්යාලය) නා.සං.අධි.***

**සහය කණ්ඩායම්**

පරිසර හා භූ දර්ශන අංශය - නා.සං.අධි.
භූගෝලීය තොරතුරු පද්ධති අංශය - නා.සං.අධි.
පර්යේෂණ හා සංවර්ධන අංශය - නා.සං.අධි.
සංවර්ධන සැලසුම් අංශය - නා.සං.අධි.

# ප්‍රණාමය

වසර දෙකකට ආසන්න කාලයක් පුරාවට සිදුකරන ලද බේරුවල සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීමේ ක්‍රියාවලිය සඳහා අධිකාරියේ විවිධ අංශයන් හා විවිධ පාර්ශවකරුවන් විසින් නොමඳ සහාය ලබා දෙන ලදී.

පළමුකොට කෘතඥතා පූර්වක ස්තූතිය සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම සඳහා මාර්ගෝපදේශනය ලබාදුන් මහානගර හා බස්නාහිර සංවර්ධන ගරු අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමන් හට පුද කරන අතර මෙම සැලැස්ම පිළියෙළ කිරීම සඳහා බේරුවල නගර සභාවේ සහ බේරුවල ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිවරුන් හා ලේකම්වරු ඇතුළු සියලුම පළාත් පාලන නිලධාරීන් කළ උදාර සේවාව වෙනුවෙන් අපගේ ගෞරවනීය ස්තූතිය පුද කරන්නෙමු.

මෙම සැලැස්ම ආරම්භ කළ අවස්ථාවේ සිට අවසන් අවස්ථාව දක්වා ක්‍රමවත් මාර්ගෝපදේශන හා නිර්මාණාත්මක නව තාක්ෂණික ක්‍රම ඔස්සේ බේරුවල සංවර්ධන සැලැස්ම පිළියෙළ කළ යුතු ආකාරය පිළිබඳව නොමඳ සහයක් ලබාදුන් නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපති, ආචාර්ය ජගත් මුණසිංහ මැතිතුමා ස්තූති පූර්වකව සිහිගන්වන අතර, අධ්‍යක්ෂ ජනරාල් ඉංජිනේරු එස්.එස්.පී. රත්නායක මැතිතුමා හා හිටපු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් චන්ද්‍රදාස මැතිතුමා ඇතුළු සියළුම අධ්‍යක්ෂවරුන්වද, ස්තූතිපූර්වකව සිහි පත් කරන්නෙමු.

සැලසුම පිළියෙල කිරීමේදී ක්‍රමවත් උපදේශන හා වැඩමුළු පවත්වමින්, දැනුවත් කරමින් සහාය ලබාදුන් නාගරික සංවර්ධන අධිකාරියේ අතිරේක අධ්‍යක්‍ෂ ජනරාල් (සැලසුම්) ඩී.එම්.බී. රණතුංග මහතා, ලලිත් විජේරත්න මහතා සංවර්ධන සැලසුම් අංශය (හිටපු අධ්‍යක්‍ෂ), පර්යේෂණ සංවර්ධන අංශය ද, සහාය ලබාදුන් පරිසර හා භූ දර්ශන අංශය හා භූගෝලීය තොරතුරු පද්ධති අංශය ඇතුළු නන් අයුරින් සහාය ලබා දුන් සියළුම අංශ වල සේවක මණ්ඩලයට ස්තූතිය පුද කර සිටින අතර, කළුතර දිස්ත්‍රික් කාර්යාලයේ සියලුම සේවක මණ්ඩලයට විශේෂ ස්තූතිය පුද කර සිටින්නෙමු.

එමෙන්ම මෙම සැලැස්ම ආරම්භයේ සිට මාර්ගෝපදේශනයෙන් හා සැලසුම් කණ්ඩායම දිරිමත් කරමින් සැලැස්මේ සාර්ථකත්වය පසු පස සිටින බස්නාහිර පළාත් අංශයේ හිටපු අධ්‍යක්ෂ ජනක් රණවීර මහතාටත් විශේෂ ස්තූතිය පුද කර සිටින්නෙමු.

මීට අමතරව, මෙම සංවර්ධන සැලැස්ම වඩාත් සාර්ථක කර ගැනීමේදී නිර්මාණාත්මකව පිටු සකස් කිරීමෙන් සහය වූ මූනියැක් ආයතනය සහ ත්‍රිමාණකරණ හා දර්ශනීය පුවරු නිර්මාණයෙන් සහය වූ චමිදු ගුණවර්ධන මහතා ඇතුළු නන් අයුරින් සහාය පළ කළ සියළුම මහත්ම මහත්මීන් ස්තූති පූර්වකව සිහි ගන්වන්නෙමු.

# ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය



1978 අංක 41 දරණ පනත යටතේ ස්ථාපිත කරන ලද නාගරික සංවර්ධන අධිකාරිය මේ වන විට පුරා 40 වසරක විශිෂ්ඨ සේවයක් සිදුකරමින් ශ්‍රී ලංකාවේ කීර්තිමත් ආයතනයක් ලෙස කිරුළු දරා ඇත. මෙහි තවත් එක් සංධිස්ථානයක් ලෙස බේරුවල සංවර්ධන සැලැස්ම 2019 – 2030 ප්‍රකාශයට පත්කර නිමා කිරීම දැක්විය හැකිය. වසර දෙකක අඛණ්ඩ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස බේරුවල සැලසුම් කණ්ඩායම විසින් සිදු කරන ලද, බේරුවල සංවර්ධන සැලැස්ම 2019–2030 මඟින් බේරුවල අනාගත සංවර්ධන කටයුතු සැලසුම් සහගත ලෙස ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත.

කළුතර දිස්ත්‍රික්කය තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතුරින් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් වන බේරුවල, බහු ආංශික ආර්ථික කටයුතුවලින් ස්වයංපෝෂිත කලාපයක් ලෙස හඳුනාගත හැකිය. වෙරළඉම කේන්ද්‍ර කොට ගත් ප්‍රදේශයක් ලෙස, සංචාරක සංවර්ධනය හා බැදුණු අනෙකුත් ආර්ථික කටයුතු තුළින් ආර්ථිකය සංවර්ධනයක් බලාපොරොත්තු වීම මෙම සංවර්ධන සැලැස්මේ මුඛ්‍ය පරමාර්ථය වේ.

මාගේ දැනුම අනුව, මෙම සැලසුම විවිධ නවෝත්පාදක නගර සැලසුම් ක්‍රම, නව තාක්ෂණික මෙවලම් යොදා ගනිමින් සිදුකල සැලැස්මක් බැවින් නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදුකළ සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස හැඳින්විය හැකිය. මෙම සංවර්ධන සැලැස්ම සැකසීම සඳහා තම කාලය යොදවමින් සාර්ථක ලෙස නිමකළ නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායමට හා ඒ සඳහා නන් අයුරින් සහය දුන් අදාළ පළාත් පාලන ආයතනවල කාර්යය මණ්ඩල සේවය අගයකොට සලකමි.

ඒ අනුව වර්ෂ 2019 –2030 කාල පරාසය තුළ සාර්ථක ලෙස ක්‍රියාත්මක වෙනැයි බලාපොරොත්තු වන මෙම සංවර්ධන සැලැස්ම සියළුම පාර්ශවකරුවන්ගේ එකතුවෙන් සාර්ථක ලෙස ක්‍රියාත්මක වෙනැයි බලාපොරොත්තු වෙමි.

පාඨලී චම්පික රණවක
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය

# ගරු සභාපතිතුමාගේ පණිවිඩය



වර්තමානය වන විට නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික සැලසුම් සකස් කිරීමට හා එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට ඇති ප්‍රධානතම ආයතනය වන අතර නාගරික පරිසරය ගුණාත්මක ලෙස කළමණාකරනය කිරීමේ වගකීමද එසේම පැවරී ඇත. 1978 වර්ෂයේදී මෙම ආයතනය ස්ථාපිත කිරීමේ පරමාර්ථය වී ඇත්තේ ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුළින් නාගරික ප්‍රදේශවල හා එහි ජනතාවගේ පොදු යහපැවැත්ම ප්‍රවර්ධනය හා නියාමනය කිරීමයි.

1982 අංක 4 දරණ සංශෝධිත පනතෙහි (II කොටස 8 වන වගන්තිය 8 අ [I]) අනුව අමාත්‍යවරයා විසින් නාගරික සංවර්ධන ප්‍රදේශයන් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයන්හි සංවර්ධන සැලසුම් සකස් කිරීම අත්‍යාවශ්‍ය කරුණක්ව ඇත. බේරුවල ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය සඳහා සකස් කරනු ලැබූ සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා බලාත්මක කිරීම, එම විධිවිධාන යටතේ සිදු කර ඇත. බේරුවල ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය බේරුවල ප්‍රාදේශිය ලේකම් බලප්‍රදේශය හා ඒ අවට ප්‍රදේශයන්හි භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන බේරුවල සංවර්ධන සැලැස්ම අවසන් කර ඇත.

මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී, අපගේ ගමන් මාර්ගය සුමට නොවන අතර, අභියෝග පිරුණු, අවිනිශ්චිත-යන්ගෙන් සැදි විෂම බලාපොරොත්තුවලින් අපවිත්‍ර වූ කටුක ගමන් මාර්ගයක් බව අප අමතක කර නොමැත. නාගරික සංවර්ධන අධිකාරිය වර්තමානයේ අවශ්‍ය පද්ධති, මෙවලම්, හා ක්‍රමෝපායන් තුළින් සන්නද්ධව අභියෝගයන් සඳහා මුහුණ දීමටත්, අවිනිශ්චිතභාවයට ඔරොත්තු දීම තුළින් බේරුවල ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය "දක්ෂිණ වෙරළ තීරය විවර කරන විසල් දොරටුවක්" බවට පත් කිරීමට අධිෂ්ඨාන කොට ගෙන සිටියි.

මෙම පුළුල් කාර්ය සාර්ථකව ඉටු කර ගැනීම සඳහා කැපවීමෙන් හා වෙහෙස මහන්සි වී වැඩකටයුතු කරන නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම හා නන් අයුරින් සහයෝගය දැක්වූ සැමට මාගේ හෘදයාංගම කෘතවේදීත්වය පිරිනැමීම සඳහා මෙය අවස්ථාවක් කර ගන්නා අතර මෙම සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා මේ හා සමාන සහයෝගය ඉදිරියටත් බලාපොරොත්තු වෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ
සභාපති
නාගරික සංවර්ධන අධිකාරිය

# ගරු පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ පණිවිඩය




මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ නාගරික සංවර්ධන අධිකාරියේ බස්නාහිර පළාත් අංශය (කළුතර දිස්ත්‍රික් කාර්යාලය) විසින් බේරුවල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය හා නගර සභා බලප්‍රදේශය ඒකාබද්ධ කරමින් පිළියෙළ කරනු ලැබූ බේරුවල සංවර්ධන සැලැස්ම 2019-2030 සම්බන්ධයෙන් සුභාසිංශන එක් කරනුයේ ඉතා සතුටිනි.

ප්‍රදේශය තුළ පවතින භෞතික සම්පත් නිසි ලෙස ප්‍රයෝජනයට ගෙන ආර්ථික සංවර්ධන අවස්ථාවන් උපායශීලී ලෙස උපයෝගී කර ගැනීමත්, භෞතික සංවර්ධන ක්‍රියාවලිය තුළ සමාජ, ආර්ථික හා භෞතික විෂමතා අවමකර ගැනීමත්, ස්වභාවික පරිසර පද්ධතිය හා පාරිසරික සංවේදී ප්‍රදේශ රැක ගනිමින් ස්වභාවික විපත් අවම වන අන්දමට ප්‍රදේශය තුළ සංවර්ධන කටයුතු සිදු කිරීමත්, ප්‍රදේශයේ පවතින සංචාරක, ධීවර, මැණික් වෙළඳාම හා කෘෂි කර්මාන්තය යන බහුවිධ ආර්ථිකයන් සැලසුම් සහගත ලෙස සංවර්ධනය කිරීමත් යනාදිය තුළින් ප්‍රදේශයේ ජනතාවට උසස් ජීවන තත්ත්වයක් උදා කරලීමත් මෙම සංවර්ධන සැලැස්ම තුළින් අපේක්ෂිත අරමුණු වේ.

එම අරමුණු සාක්ෂාත් කරමින් නව සංවර්ධන දිශානතියක් ඔස්සේ ගමන් කරමින් විධිමත් සංවර්ධනයක් තුළින් සැලසුම් සහගත නගරයක් හා මානව හිතකාමී පරිසරයක් බිහිකරලීමට අපේක්ෂා කරමු.

මොහොමඩ් මසාහිම් මොහොමඩ්
සභාපති
බේරුවල නගර සභාව

බී.ඩබ්.එම්. මේනක විමලරත්න
සභාපති
බේරුවල ප්‍රාදේශීය සභාව

# පූර්විකාව

සුසැදි, සුරැකි සොදුරු නාගරීකරණයක් ළඟා කර ගැනීමේ ගමනකට අවතීර්ණ වී සිටින නාගරික සංවර්ධන අධිකාරිය, අනාගත ශ්‍රී ලංකාවෙහි සැලසුම් සහගත, තිරසාර ලෙස සංවර්ධනය වූ ප්‍රදේශ, නිවැසියන්ගේ සාඩම්බරයට හේතුකාරක වෙමින් අවශ්‍යතා හා යහ පැවැත්මට හිතකාමී වූ නගර, නිර්මාණය කිරීමේ ඉලක්ක වෙත ළඟා වී ඇත.

2017 වසරේ සිට පුරා වසර දෙකකට ආසන්න කාලයක් තුළ දත්ත හා තොරතුරු රැස් කිරීම සහ එම දත්ත නවීන තාක්ෂණය හා ක්‍රම වේදයන් ඔස්සේ විශ්ලේෂණයන්ට භාජනය කරමින් සැලසුම් බලප්‍රදේශය තුළ පවතින විභවතා හා ගැටළු හඳුනා ගන්නා ලදී. ඒ අනුව සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික ව්‍යුහය තුළ විධිමත් නාගරික පද්ධතිය ස්ථාපිත කිරීමේ අරමුණින් ඉදිරි වර්ෂ 11 ක කාලය සඳහා බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බලප්‍රදේශය තුළ හඳුනාගත් සැලසුම්, ව්‍යාපෘතීන් සහ ගොඩනැගිලි රෙගුලාසි පිළිබඳව සවිස්තරාත්මක විග්‍රහය මෙමඟින් සපයයි.

මෙම සැලැස්ම වර්ෂ 2019 සිට වර්ෂ 2030 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා බල පැවැත්වේ. ඒ අනුව මෙම සැලැස්මෙහි දැක්ම ලෙස,

“දක්ෂිණ වෙරළ තීරය විවර කරන විසල් දොරටුවක් කරා...” යන්න ගොඩනගනු ලැබීය.

මෙම දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා ප්‍රධාන අරමුණු තුනක් සහ උපායමාර්ගික සැලසුම් හයක් පිළිබඳව අවධානය යොමු කළ අතර එහිදී, යෝජිත භූමි පරිහරණ සැලැස්ම, අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම, ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම, තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම, ජනාවාස සංවර්ධන උපායමාර්ගික සැලැස්ම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම යන සැලසුම් සකස් කරන ලදී. මෙම සංවර්ධන සැලසුම මඟින් සැලසුම් සහගත ප්‍රදේශයක් තුළ ප්‍රතිනිර්මාණය වී ඇති සංවර්ධන අවස්ථාවන් පිළිබඳව මහජනතාව, ආයෝජකයන් මෙන්ම ආධාර සපයන ආයතනයන්ට අවබෝධ කරදීමක් ද සිදුවේ.

ඒ අනුව මෙම සංවර්ධන සැලැස්ම පළමු වෙළුම හා දෙවන වෙළුම ලෙස කොටස් දෙකකින් යුක්ත වන අතර පළමු වෙළුම පරිච්ඡේද හයකින් සමන්විත වේ. ඒ යටතේ, සංවර්ධන සැලැස්මේ පසුබිම, මූලික අධ්‍යයනය, සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය, සංවර්ධන සැලසුම් රාමුව, SWOT විශ්ලේෂණය සහ සංවර්ධන සැලැස්ම ආදිය දැක්විය හැකිය.

දෙවන වෙළුම පරිච්ඡේද දෙකකින් සමන්විත වන අතර එය සංවර්ධන කලාප හා කලාපීකරණ රෙගුලාසි සහ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසිවලින් යුක්ත වේ.

# පටුන

ප්‍රණාමය III
ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය IV
ගරු සභාපතිතුමාගේ පණිවිඩය V
ගරු පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ පණිවිඩය VI
පූර්විකාව VII
පටුන VIII
පළමු කොටස IX

පරිච්ඡේදය 01 : සංවර්ධන සැලැස්මේ පසුබිම 01

1.1. හැඳින්වීම 02
1.2. සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන් 02
1.3. සංවර්ධන සැලැස්මේ විෂය පථය 04
1.4. සැලසුම් ක්‍රියාවලිය 05

1.4.1. පසුබිම් අධ්‍යයනය 07
1.4.2. විෂය පථය 07
1.4.3. සංවර්ධන විභවතා හා ගැටළු හඳුනාගැනීම 07
1.4.4. ඉදිරි දැක්ම, ඉලක්ක හා අරමුණු සකස් කිරීම 08
1.4.5. සවිස්තරාත්මක විශ්ලේෂණය 08
1.4.6. උපායමාර්ගික සැලසුම් හා ව්‍යාපෘති සකස් කිරීම 08
1.4.7. නීති හා රෙගුලාසි සකස් කිරීම 08
1.4.8. දළ සංවර්ධන සැලැස්ම සම්මුතියකට පත්කර ගැනීම 09
1.4.9. සම්මුතියකට පත්කර ගන්නා ලද සැලැස්ම ඉදිරිපත් කිරීම 09
1.4.10. අනුමැතිය හා ප්‍රකාශයට පත්කිරීම 09

පරිච්ඡේදය 02 : මූලික අධ්‍යයනය 11

2.1. අධ්‍යයන ප්‍රදේශය 12
2.2. සැලසුම් සහ තත්ත්ව සන්දර්භ 13

2.2.1. සැලසුම් සන්දර්භය 13
2.2.2. තත්ත්ව සන්දර්භය 25

2.3. සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම 28

2.3.1. ක්‍රියාකාරී ප්‍රදේශ 28
2.3.2. භූගෝලීය මායිම 28
2.3.3. පරිපාලන මායිම 28
2.3.4. “බේරුවල” පිළිබඳ මූලික දත්ත 30

පරිච්ඡේදය 03 : සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය 33

3.1. ගැටළු හඳුනා ගැනීම 34
3.2. ගැටළු විශ්ලේෂණය 34

දෙවන කොටස 57
ඇමතිතුමාගේ අනුමැතිය 58
ගැසට් නිවේදනය 59

පරිච්ඡේදය 04 : සංවර්ධන සැලැසුම් රාමුව 61

4.1. සංවර්ධන සැලැස්මේ දැක්ම 62
4.2. දැක්මෙහි ප්‍රකාශනය 62
4.3. සංවර්ධන සැලැස්මේ අරමුණු 63
4.4. සංවර්ධන සැලැස්මේ පරමාර්ථ 63

පරිච්ඡේදය 05 : SWOT විශ්ලේශණය 65

5.1. සාරාංශගත SWOT විශ්ලේශණය 66
5.2. විස්තරාත්මක SWOT විශ්ලේශණය 72

පරිච්ඡේදය 06 : සංවර්ධන සැලැස්ම 95

6.1. සංකල්පිත සැලැස්ම 96
6.2. යෝජිත භූමි පරිහරණය සැලැස්ම 98
6.3. අපරව්‍යුහ පහසුකම් සංවර්ධන කිරීමේ උපායමාර්ගික සැලැස්ම 102

6.3.1. ජනගහනය පුරෝකථනය 102
6.3.2. නිවාස ව්‍යාප්තිය සහ නිවාස ඝනත්වය 103
6.3.3. සේවා කළමනාකරණ සැලැස්ම 105
6.3.4. මාර්ග හා ප්‍රවාහන සැලැස්ම 110
6.3.5. ජල සැපයුම් සැලැස්ම 127
6.3.6. විදුලි සැපයුම් සැලැස්ම 128
6.3.7. මළාපවහන, අපජල හා ජලාපවහන කළමනාකරණ සැලැස්ම 128
6.3.8. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම 130

6.4. ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම 134

6.4.1. ඒකාබද්ධ සංචාරක කර්මාන්ත සංවර්ධන උපායමාර්ගික සැලැස්ම 134
6.4.2. මැණික් කර්මාන්ත සංවර්ධන උපායමාර්ගික සැලැස්ම 142
6.4.3. ධීවර කර්මාන්ත සංවර්ධන උපායමාර්ගික සැලැස්ම 142
6.4.4. කෘෂිකර්මාන්ත සංවර්ධන උපායමාර්ගික සැලැස්ම 144

6.5. තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම 145

6.5.1. පාරිසරික සංරක්ෂණ සැලැස්ම 145
6.5.2. ආපදා කළමනාකරණ සැලැස්ම 149
6.5.3. පොදු හා විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම 152

6.6. ජනාවාස සංවර්ධන උපායමාර්ගික සැලැස්ම 156
6.7. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම 161

6.7.1 ආයතනික වගකීම 167
6.7.2. ව්‍යාපෘති සාරාංශය 169

කෙටි යෙදුම් 228
ඡායාරූප ලැයිස්තුව 228
සිතියම් ලැයිස්තුව 229
වගු ලැයිස්තුව 230
ඇමුණුම් ලැයිස්තුව 231
ඇමුණුම් 233
පරිශීලිත මූලාශ්‍ර 246



# පළමු කොටස

01 පරිච්ඡේදය



# සංවර්ධන සැලැස්මේ පසුබිම

## 1.1. හැඳින්වීම

1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරිය ප්‍රතිස්ථාපනය කොට ඇති අතර 1982 අංක 4 දරණ සංශෝධිත පනත යටතේ නාගරික බලප්‍රදේශයන් ලෙස ප්‍රකාශිත බලප්‍රදේශයන්හි භෞතික, ආර්ථික, සමාජීය හා පාරිසරික යන අංශයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් තුලින සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණින් සංවර්ධන සැලසුම් සකස් කිරීම නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යභාරයක් වේ. එය පෙරදැරි කොට ගෙන මේ දක්වා විධිමත් සංවර්ධන සැලැස්මක් නොමැති බේරුවල නගර සභා බලප්‍රදේශය හා ප්‍රාදේශීය සභා බලප්‍රදේශය යන ප්‍රදේශ ද්විත්වය සඳහා නව සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගන්නා ලදී.

මෙහි ඉහත සඳහන් නෛතික ප්‍රතිපාදනවලට අනුගතව, 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ 3 වන වගන්තියේ බලතල හා ප්‍රකාරව බේරුවල බලප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරියේ බලප්‍රදේශයක් ලෙස වෙරළ ඉමේ සිට කි.මී. 1ක ප්‍රදේශයක් 1982.12.17 දිනැති අංක 223/16 දරණ ගැසට් පත්‍රය මඟින් ද, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බේරුවල නගර සභා බලප්‍රදේශය 1979.08.09 වන දින අංක 62 දරන ගැසට් පත්‍රය මඟින් ද, බේරුවල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය පිළිවෙලින් 1994.06.02 දින අංක 821/23 දරණ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී. පසුව 2003.01.09 දිනැති අංක 1270/30 දරණ ගැසට් පත්‍රය මඟින් නාගරික සංවර්ධන අධිකාරී බලප්‍රදේශ ලෙස වර්ග කිලෝමීටර 70.33 කින් යුතු භූමි ප්‍රමාණයක් ප්‍රකාශයට පත්කර ඇත. ඒ අනුව බේරුවල සංවර්ධන සැලැස්ම (2019– 2030) බේරුවල නගර සභා බලප්‍රදේශයත් ප්‍රාදේශීය සභා බලප්‍රදේශයත් යන ප්‍රදේශ දෙකම ඒකාබද්ධ කර ගනිමින් සමස්ත බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයම සැලසුම් බලප්‍රදේශය ලෙස සලකා බලමින් සංවර්ධන සැලැස්ම සකස් කරන ලදී.

සැලසුම් බලප්‍රදේශය තුළ පවතින භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික යන අංශයන් සවිස්තරාත්මකව අධ්‍යයනය කර සංචාරක, ධීවර, මැණික් වෙළඳාම හා කෘෂිකර්මාන්තය යන ප්‍රධාන ආර්ථික විභවතා හඳුනා ගන්නා ලදී. ඒ හේතුවෙන් ආකර්ෂණය වන දේශීය හා විදේශීය සංචාරකයින්ට මෙන්ම ප්‍රදේශයේ ජීවත්වන නේවාසික ජනතාවටත් පහසුකම් සපයන නගරයක් ලෙස බේරුවල ප්‍රදේශයේ තිරසාර සංවර්ධනයක් ඇතිකිරීමේ අරමුණ පෙරදැරිව දිගු කාලීන අරමුණු හා දැක්මක් සහිතව 2019–2030 යන ඉදිරි වසර 11 සඳහා සංවර්ධන උපායමාර්ග හා මගපෙන්වීම් යටතේ මෙම සංවර්ධන සැලැස්ම සකස්කරන ලදී.

## 1.2. සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන්

*නාගරික සංවර්ධන අධිකාරියේ බස්නාහිර පළාත් අංශයේ කළුතර දිස්ත්‍රික් කාර්යාලය මඟින් පිළියෙළ කරන ලද බේරුවල සංවර්ධන සැලැස්ම (2019–2030) සකස් කිරීමේදී අධිකාරියේ නිලධාරීන්ට අමතරව ප්‍රදේශයේ පවතින ගැටළු හා විභවතා හඳුනා ගැනීමට සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි ප්‍රාදේශීය ආයතන හා පාර්ශවකරුවන් සහභාගි කරගනිමින් පාර්ශවකරුවන්ගේ සාකච්ඡාවක් 2018 ජනවාරි මස පැවැත්වුණි. ඒ සඳහා සහභාගී වූවන්ගේ නාමාවලිය පහත පරිදි වේ.*

### *ප්‍රධාන පාර්ශව ආයතන*

1. *බේරුවල නගර සභාව*
2. *බේරුවල ප්‍රාදේශීය සභාව*

## අනෙකුත් පාර්ශව ආයතන

1. ලංකා ධීවර වරාය හා නීතිගත සංස්ථාව
2. ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය
3. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
4. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
5. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව
6. ජාතික ස්කාගාර සංස්ථාව
7. රබර් පර්යේෂණායතනය
8. පුරා විද්‍යා දෙපාර්තමේන්තුව
9. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය-කළුතර
10. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බේරුවල
11. මාර්ග සංවර්ධන අධිකාරිය
12. පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය
13. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
14. දිස්ත්‍රික් වාරිමාර්ග දෙපාර්තමේන්තුව
15. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව
16. නිවාස සංවර්ධන අධිකාරිය
17. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
18. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
19. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම හා සංවර්ධනය කිරීමේ සංස්ථාව
20. ලංකා විදුලි පෞද්ගලික සමාගම
21. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය
22. ග්‍රාම නිලධාරි කාර්යාලය -බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
23. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
24. වෙළඳ සංගම්
25. ධීවර සමිති
26. මැණික් සංගමය-චීන කොටුව
27. ශ්‍රී ලංකා පොලිසිය
28. ශ්‍රී ලංකා සංචාරක පොලිසිය
29. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
30. පර්යන්ත රෝහල -අලුත්ගම,බේරුවල
31. ආයුර්වේද රෝහල -බේරුවල
32. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, බේරුවල

## නාගරික සංවර්ධන අධිකාරියේ කළුතර දිස්ත්‍රික් කාර්යාලීය සැලසුම් කණ්ඩායම

1. වයි. ඒ. ජී. කේ. ගුණතිලක මයා, අධ්‍යක්ෂ (බස්නාහිර පළාත් අංශය)
2. ජනක් රණවීර මයා, හිටපු අධ්‍යක්ෂ (බස්නාහිර පළාත් අංශය)
3. බී. ඒ. ආර්. අජිත් කුමාර, නියෝජ්‍ය.අධ්‍යක්‍ෂ (සැලසුම්)
4. එම්. හේමන්ති මිය, හිටපු නියෝජ්‍ය.අධ්‍යක්‍ෂ (සැලසුම්)
5. එස්. අබේසිංහ මිය, සැලසුම් නිලධාරිනි
6. අයි. පී. ගුණවර්ධන, සැලසුම් නිලධාරි
7. ආර්. එම්. සී. එන්. රණතුංග මිය, සහකාර සැලසුම් නිලධාරිනි
8. ඩී. කේ. එල්. එම්. ගුණරත්න මිය, සහකාර සැලසුම් නිලධාරිනි
9. ඩබ්ලිව්. ජී. පී. එම්. සිරිවර්ධන මිය, සහකාර සැලසුම් නිලධාරිනි

*සහය දැක්වූ නාගරික සංවර්ධන අධිකාරියේ අනෙකුත් අංශ*

1. *සංවර්ධන සැලසුම් අංශය*
2. *භූගෝලීය තොරතුරු පද්ධති අංශය*
3. *පරිසර හා භූ දර්ශන අංශය*
4. *පර්යේෂණ හා සංවර්ධන අංශය*

## 1.3. සංවර්ධන සැලැස්මේ විෂය පථය

බේරුවල ප්‍රදේශය, බස්නාහිර පලාතේ දක්ෂිණ දිශානගව පිහිටි ස්වභාවික ධීවර වරාය ආශ්‍රිතව දියුණු වූ උපායශීලි ස්ථානයක පිහිටි වෙරළ ඉම නගරයක් ලෙස හැඳින්විය හැකිය.

බේරුවල ප්‍රදේශයේ ප්‍රාදේශීය ක්‍රියාකාරීත්වය සලකා බැලීමේදී උතුරු දෙසින් කළුතර, මතුගම, දොඩන්ගොඩ යන ප්‍රදේශ කරා සහ දකුණු දෙසින් බෙන්තොට දක්වා විහිදී තිබුනද, විශාල භූමි ප්‍රමාණයක් සඳහා සංවර්ධන සැලැස්මක් සකස්කිරීමේදී පවතින ප්‍රායෝගික ගැටළු හේතුකොටගෙන බේරුවල නගර සභා බලප්‍රදේශය හා බේරුවල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය අයත්වන පරිදි බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගැනිණි.

මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී පහත සඳහන් අංශ කෙරෙහි අවධානය යොමු කෙරිණි. යෝජිත භූමි හා ගොඩනැගිලි සංවර්ධන සැලසුම, ප්‍රදේශයේ ප්‍රධාන විභවතා වන මැණික් වෙළඳාම, ධීවර, සංචාරක හා කෘෂිකර්මාන්තය ඇතුළත් ආර්ථික සංවර්ධන සැලසුම, භෞතික හා සමාජීය අපරව්‍යුහ හා පොදු පහසුකම් සංවර්ධන සැලසුම, යෝජිත නේවාසික ප්‍රදේශ සංවර්ධනය හා වෙරළ ඉම හා අභ්‍යන්තරික ප්‍රදේශවල පාරිසරික සංවේදී ප්‍රදේශ කළමනාකරණ සැලසුම යන සැලසුම් සකස්කර ඇත. මේ මඟින් 2030 වන විට ළඟා කර ගැනීමට අපේක්ෂිත අභිවෘද්ධිය සඳහා අවශ්‍ය උපායමාර්ග සකස් කරන ලදී.

මෙම ප්‍රදේශයේ භෞතික පිහිටීම අනුව දක්ෂිණ සංචාරක කේන්ද්‍රස්ථානයේ ඇරඹුම් ලක්ෂයෙහි පිහිටා ඇති බැවින් හා 2017 වර්ෂයේ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මඟින් සකස් කළ ජාතික භෞතික සැලැස්ම 2040 ට අනුව මෙම බලප්‍රදේශය ආර්ථික කලාපය තුළ පිහිටා ඇති කලාපයක් ලෙස හඳුනාගෙන ඇති බැවින් බේරුවල සංවර්ධන සැලැස්ම (2019– 2030) තුළින් මෙම ප්‍රදේශයේ ආර්ථික අංශය මෙන්ම නැගී එන නාගරික ප්‍රදේශ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරයි.

වෙරළ සංරක්ෂණය හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මඟින් සකස් කළ වෙරළ කලාප කළමනාකරණ සැලැස්මට අනුව මෙම කලාපය සංවේදී වෙරළ කලාපයන් බව හඳුනා ගෙන ඇති අතර බේරුවල සංවර්ධන සැලැස්ම 2019–2030 තුළින් පාරිසරික පසුබිම කෙරෙහි ද වැඩි අවධානය යොමු කරමින් සැලසුම සකස් කොට ඇත.

බේරුවල සංචාරක කර්මාන්තය පිළිබඳව අවධානය යොමු කිරීමේදී වැඩි වශයෙන් සංචාරක කර්මාන්තයට නැඹුරුතාවයක් දක්වන්නේ බෙන්තර ගඟ ආශ්‍රිත දක්ෂිණ ප්‍රදේශය සමඟ වුවත් පරිපාලන දිස්ත්‍රික්ක දෙකකට අයත්වීම හේතුකොට ගෙන සංචාරක කර්මාන්තයේ සංවර්ධනයට අදාළ උපාය මාර්ග හා සැලසුම් සකස්කිරීම බේරුවල පරිපාලන බලප්‍රදේශයට පමණක් සීමා වී ඇත.

සංවර්ධන සැලැස්ම මඟින් හඳුනා ගන්නා ලද ඇතැම් ගැටළු සඳහා නාගරික සංවර්ධන අධිකාරියට සෘජුව මැදිහත් විය නොහැකි බැවින්, අනෙකුත් ආයතනයන්ගේ මැදිහත් වීමද අවශ්‍ය වේ. පාසල්, රෝහල් සඳහා අවශ්‍ය මානව හා භෞතික යටිතල පහසුකම් සැපයීම, 2030 වන විට වැඩිවන ජනගහනය සඳහා අවශ්‍ය පානීය ජල අවශ්‍යතාවය සපුරාලීම, සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය තුළින් උත්පාදනය වන රැකියා අවස්ථා ලබා දීම උදාහරණ ලෙස දැක්විය හැක.

ඉහත කරුණු සියල්ල සලකා බලමින් මෙම සැලැස්ම දිගු කාලීන දැක්මක් හා අරමුණු ඉලක්ක කර ගනිමින් ආර්ථික, සමාජීය, පාරිසරික හා භෞතික යන අංශවල නෛතික රාමුවක් තුළින් බිහිවන්නා වූ තිරසාර නාගරික ප්‍රදේශයක් බිහි කිරීමට සුදුසු ව්‍යාපෘතීන් හඳුනා ගනිමින් 2030 වන විට ළඟාකර ගන්නා වූ සංවර්ධනය ඉදිරිපත් කෙරේ.

## 1.4. සැලසුම් ක්‍රියාවලිය

මෙම සංවර්ධන සැලසුම පිළියෙල කිරීම සඳහා යොදාගත් සැලසුම් ක්‍රියාවලිය අතිශය නම්‍යශීලී වන අතර සෑම පියවරකදීම කළ අධ්‍යයනයන් මෙම සැලැස්මේ සාර්ථකත්වය සඳහා හේතු වී ඇත. පසුබිම් අධ්‍යයනයන්, ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා තාක්ෂණික විශ්ලේෂණයන් ආදියෙන් යුක්ත සැලසුම් ක්‍රියාවලිය පහත පරිදි දැක්විය හැකිය.

**පසුබිම් අධ්‍යයනය**

**ප්‍රාථමික දත්ත ලබාගැනීම** – චන්ද්‍රිකා ජායාරූප / අන්තර්ජාලය, ක්ෂේත්‍ර නිරීක්ෂණ | **ද්විතියික දත්ත ලබා ගැනීම** – ජාතික භෞතික සැලසුම, සංචාරක සැලැස්ම, සම්පත් පැතිකඩ

**විෂය පථය**

Excel / SPSS / Arc GIS ආදී මෘදුකාංග භාවිත කරමින් සැලසුම් බලප්‍රදේශයේ පවත්නා තත්ත්වය විශ්ලේෂණය කිරීම

**සංවර්ධන ගැටළු හා විභවතා හඳුනා ගැනීම**

2018 ජනවාරි මස පැවැත්වූ පාර්ශවකරුවන්ගේ වැඩමුළුව තුළින්; ධීවර, සංචාරක, මැණික් හා කෘෂිකර්මාන්තය යන ප්‍රධාන ආර්ථික ක්‍රම 4 ඔස්සේ හඳුනාගත් විභවතා NVIVO මෘදුකාංගය මඟින් විශ්ලේෂණය කිරීම

**ඉදිරි දැක්ම, ඉලක්ක හා අරමුණු සකස් කිරීම**

ඉහත දී හඳුනාගත් ගැටළු හා විභවතාවන්හි ප්‍රමුඛතාවය මත පදනම්ව ඉදිරි දැක්ම හා අරමුණු; ආර්ථික, සමාජීය, භෞතික හා පාරිසරික යන අංශයන් පදනම් කරගනිමින් සකස් කිරීම

**සවිස්තරාත්මක තොරතුරු විශ්ලේෂණය**

නේවාසික ජනගහන පුරෝකථනය, සංසරණ ජනගහන පුරෝකථනය, SWOT විශ්ලේෂණය, පාරිසරික සංවේදිතා විශ්ලේෂණය, අවකාශීය සම්බන්ධතා සමෝධානිත විශ්ලේෂණය, සංවර්ධන පීඩනය, මංසන්ධි විශ්ලේෂණය, ආදී විශ්ලේෂණයන් පදනම් කරගනිමින් තොරතුරු විශ්ලේෂණය සිදු කිරීම.

**උපායමාර්ගික සැලසුම් හා ව්‍යාපෘති සකස් කිරීම**

සංවර්ධන සැලසුම් බලප්‍රදේශය සඳහා අපේක්ෂිත ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කරගැනීමේ අරමුණින් විවිධ අංශයන් ඔස්සේ උපායමාර්ගික සැලසුම් නිර්මාණය කිරීම.( යෝජිත අවකාශීය සංවර්ධන සැලැස්ම, යෝජිත පාරිසරික කළමනාකරණ සැලැස්ම, යෝජිත භෞතික හා සමාජීය අපරව්‍යුහ පහසුකම් සංවර්ධන සැලැස්ම, යෝජිත ආර්ථික සංවර්ධන සැලැස්ම, යෝජිත ජනාවාස ව්‍යාප්ති සැලැස්ම)

**නීති හා රෙගුලාසි සකස් කිරීම**

සැලසුම් බලප්‍රදේශය සඳහා සකස් කරන ලද සංකල්පමය සැලැස්මට අනුව කලාපීයකරණ සිතියමක් පිළියෙල කිරීම හා එම කලාපීයකරණ සැලැස්ම බලාත්මක කිරීමට අවශ්‍ය නීති හා රෙගුලාසි සකස් කිරීම.

**දළ සංවර්ධන සැලැස්ම සම්මුතියට පත් කර ගැනීම**

මහජන අදහස් විමසීම සඳහා පාර්ශවකරුවන් සම්බන්ධ කරගනිමින් සංවර්ධන සැලැස්ම පිළිබඳව පොදු එකඟතාවයකට පැමිණීම සහ අදාළ සංශෝධනයන් වෙතොත් නිවැරදි කිරීම.

**සම්මුතියකට පත්කර ගන්නා ලද සැලැස්ම ඉදිරිපත් කිරීම**

දළ සැලැස්ම අනුමැතිය සලකා බැලීම සඳහා ප්‍රධාන සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම

**අනුමැතිය හා ප්‍රකාශයට පත් කිරීම**

ශෛනතික රාමුවට අනුකූලව සංවර්ධන සැලැස්ම ප්‍රකාශයට පත් කිරීම.

## 1.4.1. පසුබිම් අධ්‍යයනය

බේරුවල ප්‍රදේශය සඳහා නව සංවර්ධන සැලසුමක් සකස් කිරීමේ ආරම්භක අවස්ථාවේදී අවශ්‍ය දත්ත හා තොරතුරු එක් රැස් කරගැනීම සඳහා විවිධ ක්‍රමෝපායන් උපයෝගි කරගත් අතර ප්‍රධාන වශයෙන් ප්‍රාථමික මූලාශ්‍ර, ද්විතීක මූලාශ්‍ර ලෙස එය වෙන් කළ හැකිය. අන්තර්ජාලය හා චන්ද්‍රිකා ඡායාරූප තුළින් ප්‍රදේශය පිළිබඳව සිදුකළ අධ්‍යයනයන් උපයෝගී කරගනිමින් ප්‍රදේශය තුළ ක්ෂේත්‍ර චාරිකාවල යෙදීමෙන් ප්‍රාථමික දත්ත ලබාගන්නා ලදී. තවදුරටත් ජාතික මට්ටමින්, පළාත් මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් බේරුවල ප්‍රදේශයට හිමි වී ඇති ස්ථානය ජාතික භෞතික සැලසුම, සංචාරක සැලැස්ම, සම්පත් පැතිකඩ ආදී මූලාශ්‍ර මඟින්ද පොත් පත්, සඟරා ආදිය මඟින්ද බේරුවල ප්‍රදේශයේ විකාශනය හා එහි ඓතිහාසික පසුබිම පිළිබඳව තොරතුරු අධ්‍යයනය කරන ලදී. තවද රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන, උදාහරණ ලෙස බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මාර්ග සංවර්ධන අධිකාරිය, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, සංචාරක මණ්ඩලය යනාදී ආයතන හරහාද ද්විතික දත්ත එකරැස් කරගන්නා ලදී. එම දත්ත තුළින් සැලසුම් බලප්‍රදේශය පිලිබඳව දළ අධ්‍යයනයක යෙදුණි.

## 1.4.2. විෂය පථය

මෙහිදී ප්‍රධාන වශයෙන් ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍රවලින් රැස්කරගත් දත්ත පරිගණක මෘදුකාංග (Excel, SPSS, Arc GIS ආදී) උපයෝගී කරගනිමින් විවිධ විශ්ලේෂණයන්ට හා ඇගයීම්වලට භාජනය කරමින් ප්‍රදේශයේ ආර්ථික, සාමාජීය, පාරිසරික හා භෞතික ලක්ෂණ පිළිබඳව පුළුල් විග්‍රහයක් සිදු කෙරුණි. එතුළින් ප්‍රදේශය සඳහා වන සංවර්ධන සැලසුමක අවශ්‍යතාවය කාණ්ඩ තුනක් යටතේ හඳුනා ගැනිණි. එනම්,

1. *බේරුවල සැලසුම් බලප්‍රදේශය තුළ පවතින සීමා කළ නොහැකි සංවර්ධන පීඩනය පාලනය කිරීම,*
2. *විවිධ ආයතනයන්ගේ මැදිහත් වීමෙන් ක්‍රියාත්මක වන්නාවූ විවිධ ව්‍යාපෘතීන් සමෝධානය කරගනිමින් බේරුවල සංවර්ධනය ඉතා නිවැරැදී දිශානතියක් කරා ප්‍රවේශ කරලීම.*
3. *බේරුවල සැලසුම් ප්‍රදේශයේ පවත්නා විභවතාවයන් විවිධ ආර්ථික කටයුතුවලට ප්‍රශස්ත අයුරින් දායක කර ගැනීම.*

මෙසේ හඳුනා ගන්නා ලද එක් එක් සැලසුම් අවශ්‍යතාවයන්හි පවතින ප්‍රබලතා, දුබලතා, අවස්ථා හා තර්ජන විශ්ලේෂණය කරන ලදී.

## 1.4.3. සංවර්ධන ගැටළු හා විභවතා හඳුනාගැනීම

මෙහිදී ප්‍රදේශයේ සංවර්ධනය සඳහා දායක කරගතහැකි විවිධ පාර්ශවකරුවන්, සම්පත් දායකයින්, රාජ්‍ය හා පෞද්ගලික අංශය හා අදාල සමිති සමාගම් ආදිය සම්බන්ධකර ගනිමින් පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් පවත්වනු ලබන සාකච්ඡාවක් (Stakeholder Meeting) 2018 ජනවාරි මසදී පවත්වන ලදි. පාර්ශවකරුවන්ගේ සාකච්ඡාවට සහභාගී වූවන්ගේ සවිස්තරාත්මක තොරතුරු ඇමුණුම 01 හි දැක්වේ.

## 1.4.4. ඉදිරි දැක්ම, ඉලක්ක හා අරමුණු සකස් කිරීම

ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව හඳුනා ගන්නා ලද ගැටළු, විභවතා ආදිය පිළිබඳව අවධානය යොමු කරමින් බේරුවල සැලසුම් බලප්‍රදේශයේ අනාගත සංවර්ධනය පිළිබඳ දර්ශනයක් සහිත දැක්මක් පිළියෙළ කරගන්නා ලදී. එම දැක්ම කරා ළඟා වීමට අවශ්‍ය ඉලක්ක 3 ක් හා එම ඉලක්ක කරා ළඟා වීමට අවශ්‍ය අරමුණු ද ඇතුළත්ව සංවර්ධන සැලැස්මේ ක්‍රමවත් කේන්ද්‍ර ගත කිරීමක් මෙහිදී සිදුකරන ලදී. එතුළින් "සුසැදි, සුරැකි, සොඳුරු නාගරීකරණයක් කරා" වන නාගරික සංවර්ධන අධිකාරියේ මූලික දැක්ම සාක්ෂාත් කිරීමට බලාපොරොත්තු වේ.

## 1.4.5. සවිස්තරාත්මක විශ්ලේෂණය

හඳුනාගත් ඉලක්ක සවිස්තරාත්මකව විශ්ලේෂණය කිරීම සඳහා තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ සවිස්තරාත්මක දත්ත විශ්ලේෂණය කිරීමක් සිදු කරන ලදී.

1. *සංවර්ධනයේ තිව්‍රතාවය (Development Pressure)*
2. *පාරිසරික සංවේදිතා විශ්ලේෂණය (Environmental Sensitivity Analysis)*
3. *මාර්ග ජාල සම්බන්ධතා විශ්ලේෂණය (Connectivity Analysis)*
4. *අවකාශීය සම්බන්ධතා සමෝධානිත විශ්ලේෂණය (Space Syntax)*
5. *මංසන්ධි විශ්ලේෂණය (Node Analysis)*

## 1.4.6. උපායමාර්ගික සැලසුම් හා ව්‍යාපෘති සකස් කිරීම

මෙහිදී වඩාත් අවධානයට ලක්වූ  ගැටළු හා බාධක අවම කර ගනිමින් හා ප්‍රදේශයේ පවතින සම්පත් තිරසාර ලෙස භාවිතා කරමින්, සංවර්ධන සැලසුම මඟින් අපේක්ෂිත අරමුණු හා ඉලක්ක කරා ළඟා වීමට හැකි වන පරිදි උපායමාර්ගික සැලසුම් හා ව්‍යාපෘති සැකසීම මෙහි මූලික අරමුණ විය. ඒ අනුව අපේක්ෂිත සංවර්ධනය ළඟා කර ගැනීම සඳහා ප්‍රධාන සැලසුම් 5 ක් සකස් කෙරුණි. එනම්,

1. *යෝජිත භූමි පරිහරණ සැලැස්ම*
2. *අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම*
3. *ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම*
4. *තිරසර පරිසර සංවර්ධන උපායමාර්ග සැලැස්ම*
5. *ජනාවාස සංවර්ධන උපායමාර්ගික සැලැස්ම*

ඉහත කී උප සැලසුම් මඟින් හඳුනා ගන්නා ලද උපායශීලී ව්‍යාපෘතීන් මොනවද යන්න "ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම" යටතේ විග්‍රහ කෙරේ.

## 1.4.7. නීති හා රෙගුලාසි සකස් කිරීම

මෙහිදී පළමුවෙන්ම සංකල්පමය සැලැස්මක් (Concept Plan) පිළියෙළ කරගත් අතර ඊට අනුකූළ වන සේ සංවර්ධන සැලැසුම් බලප්‍රදේශය මූලික කලාප කිහිපයකට බෙදා වෙන්කර කලාපීයකරණ සිතියමක් (Zoning Map) පිළියෙළ කර ගන්නා ලදි. එහිදී එම එක් එක් කලාපයට යෝග්‍ය වන පරිදි අනාගත සංවර්ධනයන් සඳහා බල පැවැත්වෙන සියලුම සංවර්ධන කටයුතු වලට අදාළ ගොඩනැගිලි හා සැලසුම් රෙගුලාසි වෙන් වෙන්ව පිළියෙළ කෙරුණි.

## 1.4.8. දළ සංවර්ධන සැලැස්ම පිළිබඳව පාර්ශවකරුවන් සමඟ සම්මුතියට පැමිණීම

සංවර්ධන සැලැස්ම සකස් කිරීමෙන් පසු එම සැලැස්ම පිළිබඳ පාර්ශවකරුවන්ගේ අදහස් හා යෝජනා ලබාගැනීම තුළින් සම්මුතියකට එළඹ ඉදිරියට ගෙනයාම මෙයින් අපේක්ෂා කෙරේ.

## 1.4.9. සම්මුතියට පත්කර ගන්නා ලද සැලැස්ම, සැලසුම් කමිටුවට ඉදිරිපත් කිරීම

ලේඛනගත කරනලද සංවර්ධන සැලැස්ම තවදුරටත් සංශෝධනය කර ගැනීම සඳහා අවශ්‍ය යෝජනා හා උපදෙස් ලබාගැනීමට නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම මෙහිදී සිදු වේ.

## 1.4.10. අනුමැතිය හා ප්‍රකාශයට පත්කිරීම

ප්‍රධාන පාර්ශවකරුවන්ගේ හා ප්‍රධාන සැලසුම් කමිටුවේ අදහස් ලබාගැනීමෙන් පසුව සංශෝධනය කරන ලද සැලැස්ම විෂය භාර ඇමතිවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව මහජනයා වෙත ප්‍රකාශයට පත් කෙරේ

# 02 පරිච්ඡේදය



# මූලික අධ්‍යයනය

02 පරිච්ඡේදය
මූලික අධ්‍යයනය

අධ්‍යයන ප්‍රදේශය

## 2.1. අධ්‍යයන ප්‍රදේශය

බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ග්‍රාම නිලධාරී කොට්ඨාස 82 කින් යුතු, වර්ග කි.මී. 70.04 ක වපසරියකින් යුතු භූමි ප්‍රදේශය, නාගරික සැලසුම් බලප්‍රදේශය ලෙස හඳුනා ගෙන ඇති අතර මෙම සංවර්ධන සැලැස්ම සැකසීමේදී බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සැලසුම් ප්‍රදේශය ලෙස තෝරා ගැනිණි.

කළුතර දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණයෙන් 4.1% කට ආසන්න වූ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, දිස්ත්‍රික්කයේ පිහිටි අනෙකුත් පළාත් පාලන බලප්‍රදේශයන්හි විශාලත්වය හා සැසඳීමේදී 03 වන ස්ථානය හිමි කරගෙන ඇත. උන්නතාංශය අනුව මුහුදු මට්ටමේ සිට අඩි 50–100 අතර සාමාන්‍ය උසකින් පිහිටා ඇත. එමෙන්ම  මෙම පළාත් පාලන ඒකකයේ භූමි විෂමතාවයන් අඩි 50–200 අතර පිහිටයි. බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය උතුරු දෙසින් කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන්ද, නැගෙනහිරින් මතුගම හා දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන්ද, දකුණින් බෙන්තර ගඟින්ද, බටහිර දෙසින් මුහුදු සීමාවෙන්ද මායිම්ව පිහිටා ඇති අතර, ඒ තුළ බේරුවල ප්‍රාදේශීය සභාව හා බේරුවල නගර සභාවද පිහිටා ඇත.

වර්තමානයේ ප්‍රදේශය තුළ පවතින භූමි පරිභෝජනය සැලකීමේදී අනාගතයේදී ප්‍රාදේශීය හා කලාපීය වශයෙන් ජනගහනය ඒකරාශී වීමේ විභවතාවයක් පවතී. මෙම සාධකය බලප්‍රදේශයේ ඉදිරි සංවර්ධන යෝජනා වලදී සැලකිල්ලට ගත යුතු අතර විශේෂයෙන්ම දෛනික සංසරණ ජනගහනයට හා අපේක්ෂිත නේවාසික ජනගහනයට අවශ්‍ය සේවා පහසුකම් පුළුල් කිරීම සඳහා පවතින ඉඩම් පරිහරණ රටාව විධිමත්ව සැලසුම් කළ යුතුව ඇති බව හඳුනාගෙන ඇත. වර්තමානයේ භූමි පරිහරණ රටාවට අනුව සංවර්ධනය කළ හැකි ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 1046.4 ක් (මුළු භූමි ප්‍රමාණයෙන් 26%) පමණ වේ. මෙලෙස සැලසුම් බලප්‍රදේශය තුළ පවතින අනාගත සංවර්ධනයන් සඳහා යොදා ගත හැකි විභවතාවයක් සහිත භූමි ප්‍රදේශ කිහිපයක් පිළිබඳ තොරතුරු ඇමුණුම 02 මඟින් දැක්වේ.



## 2.2. සැලසුම් සහ තත්ත්ව සන්දර්භය


මෙහි එන, සැලසුම් සන්දර්භය තුළින් බේරුවල සැලසුම් බලප්‍රදේශය ඓතිහාසිකව විකාශනය වූ ආකාරය පිළිබඳව හා සැලසුම් බලප්‍රදේශය ජාතික හා ප්‍රාදේශීය වශයෙන් අනෙකුත් ප්‍රදේශ හා සම්බන්ධ වී ඇති ආකාරය පිළිබඳව සංක්ෂිප්ත විග්‍රහයක් සිදුකර ඇත. එමෙන්ම තත්ත්ව සන්දර්භය තුළින් බේරුවල ප්‍රදේශයේ ජනගහනය, නිවාස, ප්‍රදේශයේ ආර්ථිකය ඇතුළු මූලික තොරතුරු පිළිබඳව විග්‍රහයක් සිදුකර ඇත.

### 2.2.1. සැලසුම් සන්දර්භය

බේරුවල නගර සභා බලප්‍රදේශයටත්, ප්‍රාදේශීය සභා බලප්‍රදේශයටත් දළ සංවර්ධන සැලසුම් දෙකක් පැවති නමුත් බේරුවල ප්‍රදේශය පිළිබඳව පුළුල් පසුබිම් අධ්‍යයනයක් සිදුකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රාදේශීය සභාව හා නගර සභාව සඳහා වෘයුක්ත සැලසුම් දෙකක් සකස් කිරීම වෙනුවට එම ප්‍රදේශ දෙක ඒකාබද්ධ කරන ලද සමෝධානික සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය හඳුනා ගැනිණි. ඒ අනුව වර්ග කි.මී. 70.04 කින් යුත් බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සැලසුම් බලප්‍රදේශය වශයෙන් හඳුනා ගන්නා ලදී.

අතීතයේ සිට ධීවර කර්මාන්තය සහ සංචාරක කර්මාන්තය මුල් කරගත් වාණිජ මධ්‍යස්ථානයක් ලෙස බේරුවල ප්‍රදේශය පැවතීම හේතුවෙන් කළුතර දිස්ත්‍රික්කය තුළ එයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. 16 වන සියවස පමණ වනවිට ජාත්‍යන්තර වෙළඳාමට බටහිර ජාතින් ප්‍රවිෂ්ඨවීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම ප්‍රදේශයේ වෙළඳ හා වාණිජ කටයුතු සීඝ්‍ර වර්ධනයකට ලක්විය. මේ අනුව විශේෂයෙන් අරාබි හා යුරෝපා ජාතින් බේරුවල, පානදුර වැනි ප්‍රදේශයන්හි වරායන් ආශ්‍රිතව පුළුල් ලෙස වෙළඳ කටයුතුවල නියැලීම සිදු කර ඇත. මෙලෙස වර්ධනය වූ වෙළඳ කටයුතු හේතුකොට ගෙන අරාබි ජාතිකයන් බහුල ලෙස බේරුවල කේන්ද්‍රකර පදිංචි වී ඇති අතර ශ්‍රී ලාංකික ස්ත්‍රීන් හා අවාහ විවාහ සිදුවිය. (ඉන්ද්‍රකීර්ති, රජරට ශිෂ්ඨාචාරය සහ නිරිත දිග රාජධානිය,2002)

කුරුණෑගල යුගයේ කිරුළපලන් ගලේ බණ්ඩාර කුමාරයාගේ අභිෂේක මහෝත්සවය සඳහා සොලී දේශයෙන් පැමිණි බ්‍රාහ්මණයන් 8 දෙනා කැඳවාගෙන පැමිණි රුවල් නෞකාවේ රුවල් පහත්කොට යාත්‍රාව නවතා තබන ලද්දේ මෙම බේරුවල වරාය ආශ්‍රිත ප්‍රදේශයේ බව මෙම ප්‍රදේශය පාදකකොට ගනිමින් රචනා කළ පුරාවෘත්තවල සඳහන් වේ. "රුවල බෑ වරාය" යන කියමන පසුබිම් කොටගෙන පසුකාලීනව මෙම ප්‍රදේශය "බේරුවල" යන නාමයෙන් ව්‍යවහාරයට පැමිණියේ යැයි මතයක් පවතී.





*රූපය 2.1. මස්ජිඩ් උල් අබ්‍රාල් දේවස්ථානය -ක්‍රි.ව. 1000 - 1300*
*මූලාශ්‍රය: Sri Lanka Muslims වෙබ් අඩවිය - 2018*

බේරුවල ප්‍රදේශයේ ඓතිහාසික පසුබිම සලකා බලන විට ජනප්‍රවාදයට අනුව අනුරාධපුර යුගය තෙක් දිවෙන ඓතිහාසික බෞද්ධ සිද්ධස්ථානයක් වන වෙහෙරගල කන්ද රජමහා විහාරය මෙම ප්‍රදේශයේ පිහිටා තිබේ. දැනට මෙම ස්ථානයෙහි නුවර යුගයට අයත් පුරා විද්‍යා සාධක ඉතිරිව ඇත. නුවර යුගයට අයත් බෞද්ධ සිද්ධස්ථාන මෙම ප්‍රදේශය තුළ පැවතීමෙන් අතීතයේ පටන් මෙම ප්‍රදේශයහි ජනාවාස පැවති බවට හෙළිදරව් වෙයි.

තවද, බේරුවල නගර සභා සීමාවට අයත් ක්‍රි.ව. 1000 – 1300 කාලයට අයත් යැයි සැලකෙන මස්ජිඩ් උල් අබ්‍රාල් දේවස්ථානය (රූපය: 2.1) සහ කිච්චිමලෙයි මුස්ලිම් දේවස්ථානය වෙළඳාම් කටයුතු සඳහා ලංකාවට ප්‍රථමයෙන් පැමිණි මුස්ලිම් ජාතිකයන් විසින් ඉදිකරන්නට ඇති බව ජනප්‍රවාදයේ සඳහන් වන අතර, එයද ප්‍රදේශය පුරා ජනාවාස පැතිරී තිබූ බවට සාක්ෂි දරයි.

පසුකාලීනව යටත් විජිත සමයේ ඉදිකර ඇති කතෝලික දේවස්ථානවලින් පැහැදිලි වනනේ මුහුදුබඩ ග්‍රාම නිලධාරී වසම් ආශ්‍රිතව යටත් විජිත සමයට අයත් ගම්, සේවා ස්ථාන සහ ආරක්ෂක බලකොටු විසිරී පවතින්නට ඇති බව ය. බේරුවල සැලසුම් බලප්‍රදේශයෙහි දකුණු මායිමෙහි බෙන්තර ගඟෙහි මෝය කටට ආසන්නව 17 වන ශතවර්ෂයේදී පෘතුගීසීන් විසින් ආරක්ෂක බලකොටුවක් ඉදිකර ඇති අතර, ඉංග්‍රීසින් විසින් පසුකාලීනව එය සෞඛ්‍ය මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කොට ඇත. කොළඹ සහ ගාල්ල අතර සම්බන්ධතාවය පවත්වාගෙන යෑමට බෙන්තොට ගඟ හරහා තොටුපොලක් පැවති ඇති අතර, අළුත්ගම නගරය එම තොටුපළෙහි එක් අන්තයක පිහිටා ඇත.



*රූපය 2.2. බෙන්තොට ගඟ හරහා ඇති දුම්රිය පාලමෙහි 1894 හි දර්ශනයක්*
*මූලාශ්‍රය: Lankapura වෙබ් අඩවිය 2007-2011*

19 වන සියවසෙහි මුල් භාගයෙහි ඉංග්‍රීසීන් විසින් මුහුදුබඩ දුම්රිය මාර්ගය ඉදි කරනු ලැබූ පසුව ඒ හා ආශ්‍රිතව බේරුවල ප්‍රදේශයේ සේවා මධ්‍යස්ථාන දියුණු වූවා යැයි සැලකිය හැක. රූපය 2.2 මඟින් දැක්වෙන්නේ එම බෙන්තොට ගඟ හරහා වැටී තිබූ එම දුම්රිය මාර්ගයෙහි අතීත දර්ශනයකි. මෙලෙස ස්ථාපිත වූ බව සැලකෙන බේරුවල ප්‍රදේශයේ සංස්කෘතික අංශ පිළිබඳව සලකා බැලීමේදී, මෙම ප්‍රදේශය ඓතිහාසික වටිනාකම්වලින් පිරිපුන් ස්ථානයක් මෙන්ම සාමාජීය වශයෙන් ගත් කළ සිංහල, මුස්ලිම් ජනතාව එකට ජීවත්වන ප්‍රදේශයක් වශයෙන් හඳුනාගත හැකිය. සංස්කෘතික අංශ දෙස බලනවිට විදෙස් සංචාරකයන්ගේ නෙත ගැටෙන ප්‍රදේශයක් වීම විශේෂයෙන් සඳහන් කළ යුතුය. ඒ අතර කන්දේ විහාරය, කළුවාමෝදර ධර්මද්වීප යෝගාශ්‍රමය, ශුද්ධ වූ ජුසේ මුනිඳුන්ගේ දේවස්ථානය, ශ්‍රී ලංකාවේ ඉපැරණි කල්වාරිය, බ්‍රීෆ් උද්‍යානය ප්‍රධාන තැනක් ගනී.

මෙසේ විකාශනය වෙමින් සංවර්ධනයන්ට භාජනය වූ බේරුවල සැලසුම් බලප්‍රදේශයෙහි එදා සහ අද තත්ත්වය රූපය 2.3 හා 2.4 යන රූප රාමු පෙළ මඟින් දක්වා ඇත.




බෙන්තොට පාලම



මැණික් කැපීම – චීන කොටුව



චීන කොටුව - 1964




බේරුවල ප්‍රදීපාගාරය




චීන කොටුව සංගමය




මැණික් කැපීම 1937 - 1985



අබ්‍රාල් මුස්ලිම් පල්ලිය



ෆාසියා ජුම්මා මස්ජිත් පල්ලිය 1964

රූපය 2.3 : බේරුවල සැලසුම් බලප්‍රදේශයේ පැවති ඓතිහාසික තත්ත්වය




රූපය 2.4 : බේරුවල සැලසුම් බලප්‍රදේශයේ වර්තමාන තත්ත්වය

## 2.2.1.1. ජාතික හා ප්‍රාදේශීය සම්බන්ධතාවය

බේරුවල යනු ජාතික හා ප්‍රාදේශීය වශයෙන් සම්බන්ධතාවයක් ඇති ප්‍රදේශයක් ලෙස හැඳින්විය හැකිය. ප්‍රදේශයට උතුරු දෙසින් කළුතර, පානදුර, කොළඹ යන නගර සහ දකුණු දෙසින් අම්බලන්ගොඩ, ගාල්ල, මාතර, කතරගම යන නගර මෙන්ම නැගෙනහිර දෙසින් මතුගම, හොරණ යන නගර පිහිටා තිබීම සහ ඒවා සඳහා සෘජු ප්‍රවේශ මාර්ගවලින් සම්බන්ධ වී ඇති හෙයින් සැලසුම් බලප්‍රදේශයේ කලාපීය සම්බන්ධතාවය වැඩි දියුණු කිරීමට ඉවහල්වී ඇත. මෙසේ ප්‍රදේශය තුළ පවතින ප්‍රාදේශීය හා ජාතික සම්බන්ධතාවය සිතියම 2.1 මඟින් දැක්වේ.

කොළඹ, ගාල්ල, හම්බන්තොට හරහා වැල්ලවාය පසුකර දිවෙන A002 ප්‍රධාන මාර්ගය මුල් කරගෙන ස්ථානගත වී ඇති බේරුවල ප්‍රදේශය ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාණිජ නගරය වන කොළඹ සහ තදාසන්න නගර කරාද, දකුණු දෙසට ගාල්ල, මාතර, හම්බන්තොට, කතරගම දක්වාද, මතුගම – අළුත්ගම මාර්ගයෙන් මතුගම, රත්නපුර, බදුල්ල දක්වාද ගමන් කළ හැකි විධිමත් මාර්ග ජාලයකින් සමන්විත වේ. තවද, දක්ෂිණ අධිවේගී මාර්ගයේ දොඩන්ගොඩ සහ වැලිපැන්න යන අන්තර් හුවමාරු මධ්‍යස්ථාන දෙක සැලසුම් බලප්‍රදේශයට සමීපව පිහිටා තිබීමත්,ඒවා සඳහා ප්‍රවේශ වියහැකි මාර්ග කිහිපයක් සැලසුම් බලප්‍රදේශය හරහා ගමන් කිරීමත් සැලසුම් ප්‍රදේශය දිවයිනේ අනෙකුත් ප්‍රදේශ සමග ඇති අන්තර් සම්බන්ධතාවය වැඩි කිරීමට ඉවහල් වී ඇත.




**ප්‍රාදේශීය සහ ජාතික සම්බන්ධතාවය**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : මිනින්දෝරු දෙපාර්තමේන්තුව

0 1.5 3 6 9 12 කි.මී


නාගරික සංවර්ධන අධිකාරිය
මැයි 2017

බස්නාහිර පළාත් අංශය | බේරුවල සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

*සිතියම 2.1 : බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය හා ජාතික සම්බන්ධතාවය*

## 2.2.1.2. පූර්ව සැලසුම් අධ්‍යයනයන්


පෙර සැලසුම් අධ්‍යයනයන් පිළිබඳ සැලකීමේදී, රූපය 2.5 මඟින් දක්වා ඇති 1998 වර්ෂයේ සකස් කරන ලද මහාකොළඹ ව්‍යුහ සැලැස්මට අනුව බේරුවල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පිහිටි අළුත්ගම, දර්ගා නගර සිව්වන පෙළ නගර ලෙස හඳුනාගෙන ඇත.




*රූපය 2.5 : මහාකොළඹ ව්‍යුහ සැලැස්ම– 1998*
*මූලාශ්‍රය: මහාකොළඹ ව්‍යුහ සැලැස්ම, නාගරික සංවර්ධන අධිකාරිය -1996*

ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය අනුව 2002 වසරේ පිළියෙල කරන ලද බස්නාහිර පළාතේ භෞතික ව්‍යුහ සැලැස්ම (රූපය 2.6) අනුව "අළුත්ගම" හා "දර්ගා නගරය" උප නාගරික මධ්‍යස්ථාන ලෙස සංවර්ධනය කිරීමට යෝජිත අතර බේරුවල, අළුත්ගම හා දර්ගා නගර සේවා මධ්‍යස්ථාන ලෙස ද සංවර්ධනය කිරීමට යෝජනා කර ඇත.


තවද 2004 වසරේ දී පිළියෙළ කරන ලද කොළඹ මහානගර සැලැස්ම මඟින් බේරුවල ප්‍රදේශය නාගරික මධ්‍යස්ථානයක් සහ එය බස්නාහිර පළාතේ ඇතුළත පිහිටි නගරයක් (Inner Ring Township) ලෙසත් හඳුනාගෙන ඇත.




*රූපය 2.6 : බස්නාහිර පළාත් භෞතික ව්‍යුහ සැලැස්ම - 2002*
*මූලාශ්‍රය: ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව*


ජාතික භෞතික සංවර්ධන සැලසුම් සහ ප්‍රතිපත්තියට අනුව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මඟින් රූපය 2.7 හි දැක්වෙන පරිදි වෙරළ කලාප කළමනාකරණ සැලැස්මක් 2004 වර්ෂයේ සකස් කොට ඇත. එම සැලැස්මට අනුව බේරුවල සිට බෙන්තොට දක්වා වන වෙරළ කලාපය සහ පයාගල ආශ්‍රිත වෙරළ කලාපය සීඝ්‍ර ලෙස වෙරළ ඛාදනයට ලක්වන ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇති අතර, එම ප්‍රදේශවල වෙරළ ඛාදනය වසරකට මීටර් 1 සිට 3 දක්වා වේ. එම නිසා වෙරළ කලාප කළමනාකරණ සැලසුම මඟින් හඳුනාගෙන ඇති වෙරළාරක්ෂිත සහ අදාළ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම තිරසාර සංවර්ධනයක් සඳහා වන මෙම සැලැස්මට ඇතුළත් විය යුතුය.

රූපය 2.8 මඟින් පෙන්වා ඇති ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මඟින් සකස් කරන ලද ජාතික භෞතික සැලැස්ම 2040 ට අනුව බේරුවල ප්‍රදේශය පිහිටා ඇත්තේ යෝජිත ආර්ථික කොරිඩෝව තුළයි.





*රූපය 2.7 : කොළඹ මහානගර සැලැස්ම (CESMA) –2004*
*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය*

නවදුරටත් සලකා බැලීමේදී, 2017 යෝජිත බස්නාහිර පළාත් ව්‍යුහ සැලැස්මෙහි (රූපය 2.9) මීගමුව සිට අලුත්ගම දක්වා වෙරළ තීරය සංචාරක කලාපයක් ලෙස හඳුනාගෙන ඇත. සැලසුම් බලප්‍රදේශයට අයත් පයාගල සිට අලුත්ගම දක්වා වෙරළ තීරය මෙම සංචාරක කලාපයට අයත් වේ.




*රූපය 2.8 : ජාතික භෞතික සැලැස්ම – 2040*
*මූලාශ්‍රය: ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව*




*රූපය 2.9 : යෝජිත බස්නාහිර පළාත් ව්‍යුහ සැලැස්ම –2017*
*මූලාශ්‍රය: බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය – 2017*

## 02 පරිච්ඡේදය මූලික අධ්‍යයනය

### සැලසුම් සහ තත්ත්ව සන්දර්භය

#### සැලසුම් සන්දර්භය

2011 වසරේදී බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා සකස් කරන ලද පශ්චාත් සුනාමි නැවත ගොඩනැගීමේ සැලසුම් ආධාරක ව්‍යාපෘති දළ සැලැස්ම රූපය 2.10 මඟින් දැක්වේ. මෙමඟින් සුනාමියෙන් අවතැන් වූ නැවත පදිංචි කළ ජනතාව සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සපයා දෙන ලදී. ඒ යටතේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා හඳුනා ගත් ව්‍යාපෘතීන් පහත පරිදි වේ.

1. *ප්‍රදේශය තුළ පවතින සමෝධානික මාර්ග ජාලය සංවර්ධනය කිරීම.*
2. *අභ්‍යන්තර ප්‍රදේශයේ පවතින නේවාසික ප්‍රදේශ සංවර්ධනය කිරීම.*
3. *පාරිසරික වශයෙන් වැදගත් වෙරළ රක්ෂිත ප්‍රදේශ සහ විනෝදාත්මක ප්‍රදේශ සංවර්ධනය කිරීම*




*රූපය 2.10 : පශ්චාත් සුනාමි නැවත ගොඩනැගීමේ සැලැස්ම –2011*
*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2011*

## 2.2.2. තත්ත්ව සන්දර්භය

සැලසුම් ප්‍රදේශයේ වර්තමාන ජනගහනය 171,874 පමණ වන අතර මෑත වර්ෂ කිහිපයක ජනගහන වර්ධන වේගය වගුව 2.1 මඟින් දක්වා ඇත.

| **වර්ෂය** | **ජනගහනය** | **වර්ධන වේගය** |
|---|---|---|
| *2001* | *144,733* | *1.34 %* |
| *2012* | *164,969* | *1.23 %* |
| *2017* | *171,874* | *1.32 %* |

*වගුව 2.1: ජනගහන වර්ධන වේගය 2001 සිට 2017 දක්වා (බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය)*
*මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව - 2011*

බේරුවල සැලසුම් බලප්‍රදේශයේ ජන ඝනත්වය 2017 වර්ෂය සඳහා සිදුකළ පුරෝකතනයන්ට අනුව වර්ග කිලෝමීටරයට පුද්ගලයන් 1933 කි.

සංක්‍රමණික ජනගහනය පිළිබඳව අවධානය යොමු කිරීමේදී අධ්‍යාපන, රැකියා, වෙළඳ සහ සංචාරක කටයුතු ආදී හේතු පදනම් කරගෙන විවිධ ප්‍රදේශවලින් ජනතාව සැලසුම් බලප්‍රදේශය තුළ පිහිටා ඇති නගරවලටත්, සැලසුම් බලප්‍රදේශය හරහා ද දිනපතා ගමන් කරනු ලැබෙයි. මේ නිසා සැලසුම් බල ප්‍රදේශ සීමාව තුළ පුද්ගලයින් 150,000 – 200,000 ත් අතර ප්‍රමාණයක් මාසිකව සංසරණය වන බැව් නිරීක්ෂණය වේ. තවද, අළුත්ගම හා පයාගල මහජන පොළවල් පවතින දිනයන් තුළ ජනයාගේ වැඩිවීමක් දක්නට ලැබේ. දෛනික සංසරණය වන ජනයාට අවශ්‍ය සේවා පහසුකම් සැපයීම මෙම සැලසුම් මඟින් අපේක්ෂා කෙරේ.

සැලසුම් බලප්‍රදේශයේ නිවාස සංඛ්‍යාව පිළිබඳව දැක්වීමේදී, වගුව 2.2 අනුව එය ස්ථිර, අර්ධ ස්ථිර හා තාවකාලික ලෙස වර්ග කර ඇත. මෙහි අර්ධ ස්ථිර සහ තාවකාලික නිවාස සංඛ්‍යාව ඉහළ යාම සඳහා ප්‍රධානතම හේතුව ලෙස 2004 සිදු වූ සුනාමි විපත හඳුන්වාදිය හැකි අතර, ඉන් බොහොමයක් දෙනා ධීවර සහ මී රා කර්මාන්තය ජීවනෝපාය කරගත් වෙරළට සමීපව ස්ථානගතවූවන් වේ. සුනාමි උවදුර නිසා අවතැන් වූ සමහරුන් සඳහා විකල්ප නිවාස ආසන්න ප්‍රදේශවලින් ලබා දී ඇත.

| **නිවාස තත්ත්වය** | **ස්ථිර** | **අර්ධ ස්ථිර** | **තාවකාලික** | **එකතුව** |
|---|---|---|---|---|
| *සංඛ්‍යාව* | *32,595* | *3,005* | *1,097* | *36,697* |
| *ප්‍රතිශතය* | *88.82* | *8.18* | *2.98* | *100* |

*වගුව 2.2: 2016 වර්ෂයේ බේරුවල ප්‍රා.ලේ.කො. තුළ පවතින නිවාස වර්ගීකරණය*
*මූලාශ්‍රය: සම්පත් පැතිකඩ 2016 (බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය)*

බේරුවල සැලසුම් බලප්‍රදේශය තුළ පවතින සුවිශේෂීම ලක්ෂණය වනුයේ ප්‍රදේශයටම ආවේණික වූ ආර්ථික විවිධාංගීකරණයයි. එනම්, ධීවර කර්මාන්තය, සංචාරක කර්මාන්තය, මැණික් කර්මාන්තය හා කෘෂිකර්මාන්තය යන ආර්ථික ක්‍රම 4 මත බේරුවල ආර්ථිකය රඳා පැවතීමයි.


තත්ත්ව සන්දර්භය

ප්‍රදේශයේ ආර්ථිකයට දායක වන ප්‍රධාන අංශයක් ලෙස ධීවර කර්මාන්තය හඳුනාගත හැකි අතර වෙරළබඩ ග්‍රාම නිලධාරී වසම්වල ජීවත් වන බහුතරයකට සෘජු හා වක්‍ර ලෙස මෙම කර්මාන්තය ජීවනෝපාය මාර්ග සලසයි. බේරුවල සැලසුම් බලප්‍රදේශය ගත් කළ ධීවර පවුල් 3,000 කට ආසන්න ප්‍රමාණයක් ජීවත් වේ. මත්ස්‍ය නිෂ්පාදනය අතින් ද  මෙට්‍රික් ටොන් 32 ක පමණ වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනයක් මෙම ප්‍රදේශයෙන් ජාතික ආර්ථිකයට එක් කරනු ලබයි. සැලසුම් බලප්‍රදේශය තුළ පයාගල, මග්ගොන, බේරුවල උතුර, බේරුවල දකුණ සහ අලුත්ගම ලෙස ප්‍රධාන ධීවර කලාප 5 ක් හඳුනා ගත හැකි අතර,  ඒ අතරින් ස්වාභාවික ධීවර වරායක් වන බේරුවල ධීවර වරායට සුවිශේෂී ස්ථානයක් ලැබේ.

එමෙන්ම සංචාරක කර්මාන්තය ගත්කළ  ප්‍රදේශයේ භෞතික පිහිටීමත්, සුන්දර වෙරළ තීරයක් හා බෙන්තර ගඟ පිහිටීමත් ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් ආගමික ස්ථාන වන කිච්චිමලේ පල්ලිය, කන්දේ විහාරය, බ්‍රීෆ් උද්‍යානය යනාදිය පිහිටීමත් නිසා ඉහළ සංචාරක ආකර්ශනයකින් යුතු ස්ථාන බවට හඳුනාගෙන ඇත. වර්තමානය වනවිට බේරුවල සැලසුම් බලප්‍රදේශය තුළ සංචාරක කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල ව්‍යාප්තිය සිදුවී ඇති ආකාරය  සිතියම 2.2 න් පෙන්නුම් කෙරේ.

ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථික විභවතාවයක් වන කෘෂිකාර්මික කටයුතු රටේ අභ්‍යන්තර ප්‍රදේශයට වන්නට ව්‍යාප්තවී ඇති අතර පොල්, රබර් හා වී වගාව මින් ප්‍රධාන වේ. එම ආර්ථික විභවතාවයන් ප්‍රදේශයේ ආර්ථිකයට මෙන්ම තුලනාත්මක පාරිසරික තත්ත්වයක් ඇති කිරීමට හේතුවී ඇත.

තවද ප්‍රදේශයේ සිදු කෙරෙන මැණික්  වෙළඳාම පිළිබඳව විමසා බැලීමේදී, එය  ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම  මැණික් වෙළඳපළ ලෙස හැදින්වේ. ප්‍රදේශය තුළ මැණික් නිධි නොමැති වුවද, පවතින ප්‍රදේශවලින් ලැබෙන මැණික් මෙන්ම විදේශීය රටවලින් රැගෙන එන මැණික් අලෙවිය හා මිලදී ගැනීම මෙම ප්‍රදේශය තුළ (චීන කොටුව) දෛනිකව පවත්වා ගෙන යනු ලබන  අතර, මේ සඳහා දිගු ඉතිහාසයක් පවතී. මෙම ප්‍රදේශයට ආරාබි ජාතිකයන්ගේ පැමිණීමත් සමඟ මැණික් වෙළඳාම ආරම්භ වූ හෙයින් මෙහි නියැලෙන බහුතර පිරිසක් මුස්ලිම් ජාතිකයෝ වෙති.




**සංචාරක කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම් වල ව්‍යාප්තිය**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මුලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 1.25 2.5 5 7.5 10 කි.මී

**නාගරික සංවර්ධන අධිකාරිය**
මැයි 2017

බස්නාහිර පළාත් අංශය | බේරුවල සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

*සිතියම 2.2 : සංචාරක කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකම්වල ව්‍යාප්තිය*

# 2.3. සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම

සංවර්ධන සැලැස්මේ අරමුණු ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා නගර සභා බලප්‍රදේශය සතු භූමිය ප්‍රමාණවත් නොවන බැවින් බේරුවල නගර සභාව හා ප්‍රාදේශීය සභාව යන බලප්‍රදේශ ද්විත්වයෙන් සමන්විත බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත් වන පරිදි සැලසුම් බලප්‍රදේශය නිර්ණය කරන ලදී. මෙම බලප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ද නාගරික ප්‍රදේශයක් ලෙස ප්‍රකාශිත බලප්‍රදේශයකි. තවද සංවර්ධන සැලැස්මේ සැලසුම් බලප්‍රදේශය නිර්ණය කිරීමේදී ප්‍රධාන වශයෙන් කරුණු කිහිපයක් සැලකිල්ලට ගැණිනි. ඒවා පහත පරිදි දැක්විය හැකිය.

## 2.3.1. ක්‍රියාකාරී ප්‍රදේශ

බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යනු විවිධාංගීකරණයෙන් යුතු ආර්ථිකයක් සහිත ප්‍රදේශයකි. ප්‍රධාන ආර්ථික කටයුතු බේරුවල නගර සභා ප්‍රදේශයට මෙන්ම ප්‍රාදේශීය සභා ප්‍රදේශවලටද ව්‍යාප්තව ඇත. ධීවර හා මැණික් වෙළඳාම යන ආර්ථික කටයුතු නගර සභා ප්‍රදේශයේත් ඉන් ඔබ්බට අළුත්ගම දක්වා වූ දකුණු වෙරළ තීරය සංචාරක කටයුතු ප්‍රධාන වූ ආර්ථිකයක් දක්නට ලැබෙන අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අභ්‍යන්තරයට වන්නට කෘෂි කාර්මික ආර්ථිකයක් දක්නට ලැබේ. මේ ආකාරයට ධීවර, මැණික්, සංචාරක, කෘෂි කර්මය යන ආර්ථික ක්‍රියාකාරකම් බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට හා ඉන් ඔබ්බට දකුණු වෙරළ තීරය පුරාවට දක්නට ලැබේ.


සංවර්ධන පීඩනය (Development Pressure) හා සංවේදිතා දර්ශකය (Sensitivity Index) යන ද්විත්වය උපරිපතනය (overlay) කර බලන කල්හි සංවර්ධන පීඩනය ප්‍රධාන මාර්ග ඔස්සේ සංවේදිතා දර්ශකය ඉහළ ප්‍රදේශ කරා ගලායාමේ නැඹුරුතාවයක් හඳුනාගත හැකිය. එබැවින් මෙම සංවේදිතා ප්‍රදේශ ආරක්ෂා කරගැනීමේ අරමුණින් හා දැනට ප්‍රදේශය තුළ පවත්නා ක්‍රියාකාරී සීමාව (Functional Boundary) පදනම් කරගනිමින් සැලසුම් බලප්‍රදේශය නිර්ණය කර ගැනුණි.

## 2.3.2. භූගෝලීය මායිම

බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ භූගෝලීය පිහිටීම සලකා බලන විට එය ජලාශ්‍රිත පහත් බිම් ප්‍රදේශ බොහොමයක් පදනම් කර ගනිමින් නිර්මාණය වී ඇත. ඒ අනුව බේරුවල සැලසුම් බලප්‍රදේශය බටහිර දෙසින් මුහුදු තීරය හා සම්බන්ධ ව පිහිටා ඇති අතර අභ්‍යන්තරයට වන්නට ස්වභාවික ජලවහන පද්ධතියකින් සෑදී ඇත. මෙහිදී ප්‍රධාන වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු දෙසින් රට මායිම්ව පිහිටා ඇති අළුත්ගම ප්‍රදේශයෙන් මුහුදට එක්වන ප්‍රධාන ගංගාව වන බෙන්තර ගඟ හා උතුරින් පයාගල හා මග්ගොන අතරින් මුහුදට එක් වන දුම්මල්මෝදර ඇළ ආශ්‍රිතව ඇළ මාර්ග පද්ධතිය ප්‍රධාන වේ. නැගෙනහිර ප්‍රදේශයෙහි තෙත් බිම් ප්‍රදේශයක් හා රබර් හා වී ගොවිතැන සහිත කෘෂිකාර්මික වගාවන් දක්නට ලැබේ. මේ අනුව සංවර්ධන සැලැස්මේ මායිම් නිර්ණයට භූගෝලීය සාධක සැලකිල්ලට ගැණුනු අතර හුදෙක් එම සාධක මත පමණක්ම පදනම් නොවුණි.

## 2.3.3. පරිපාලන මායිම

බේරුවල සැලසුම් බලප්‍රදේශය ප්‍රධාන පරිපාලන මායිම් දෙකකින් සමන්විත වේ. එනම් නගර සභා බලප්‍රදේශය හා ප්‍රාදේශීය සභා බලප්‍රදේශයයි. මෙහිදී භූගෝලීය සාධක, ක්‍රියාකාරී කලාපයන් සියල්ල සැලකිල්ලට ගනිමින් බෙන්තර ගඟින් සීමා වන බේරුවල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය සැලසුම් මායිම ලෙස යොදා ගැණින. මේ අනුව නිර්ණය කරගත් සැලසුම් බලප්‍රදේශයෙහි පිහිටීම සිතියම 2.3 මඟින් දැක්වේ. ක්‍රියාකාරී ප්‍රදේශ, භූගෝලීය මායිම හා පරිපාලන මායිම යන කරුණු තුන සැලකිල්ලට ගෙන බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යන පරිපාලන මායිම සැලසුම් බලප්‍රදේශය ලෙස තෝරාගන්නා ලදී.




**පිහිටීම**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : මිනින්දෝරු දෙපාර්තමේන්තුව

0 0.45 0.9 1.8 2.7 3.6 කි.මී

නාගරික සංවර්ධන අධිකාරිය
මැයි 2017

බස්නාහිර පළාත් අංශය | බේරුවල සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

*සිතියම 2.3 : බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සැලසුම් බලප්‍රදේශයේ පිහිටීම*

## 2.3.4. “බේරුවල” පිළිබඳ මූලික දත්ත



**නේවාසික ජනගහනය**

**164,948** (2012)

**171,874** (2017)

**ප්‍රදේශයේ ජන ඝනත්වය**


**1933** වර්ග කිලෝමීටර එකකට පුද්ගලයන් ගණන - 2017

**ජනගහන වර්ධන වේගය – 2017** **1.23%**


**දෛනික සංසරණ ජනගහනය – 2017** **75000**

**වයස් මට්ටම අනුව ජනගහන ව්‍යාප්තිය**


2016

60 වැඩි  **8%**

15- 59  **60%**

0-14  **32%**

**ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජනගහනය–2016**






**සමස්ත භූමි ප්‍රමාණය** **70.33** වර්ග කිලෝමීටර

නගර සභා ප්‍රදේශය **4.55** වර්ග කිලෝමීටර

ප්‍රාදේශීය සභා ප්‍රදේශය **65.78** වර්ග කිලෝමීටර

**ප්‍රදේශය පුරා විහිදී ඇති මාර්ග පද්ධතිය**



**මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග ප්‍රමාණය** **කි.මී 14.8**

**පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ග ප්‍රමාණය** **කි.මී 50**

අනෙකුත් මාර්ග පළාත් පාලන ආයතන සතු ය.

**ජාතීන් අනුව ජනගහනය –2016**
එකතුව 164,948

**105,807** **78.1%**
සිංහල

**57,161** **20.69%**
මුස්ලිම්

**1,592** **0.91%**
ශ්‍රී ලංකා දෙමළ


**171** **0.13%**
ඉන්දියානු දෙමළ


**113** **0.09%**
බර්ගර්

**25** **0.02%**
මැලේ


**80** **0.05%**
වෙනත්

*මූලාශ්‍රය : සම්පත් පැතිකඩ –2016*





**මුළු නිවාස ප්‍රමාණය**
**35,743** - 2016




**මත්ස්‍ය නිෂ්පාදනය සඳහා බේරුවල ප්‍රදේශයෙන් දළ දේශීය නිෂ්පාදනයට කරනු ලබන දායකත්වය**




**බේරුවල ප්‍රදේශයේ පිහිටා ඇති මත්ස්‍ය තොටුපළවල්**

- මග්ගොන
- බේරුවල දකුණ
- පයාගල
- බේරුවල උතුර

## 03 පරිච්ඡේදය



# සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

## 3.1. ගැටළු හඳුනා ගැනීම

පාර්ශවකරුවන්ගේ වැඩමුළුවේදී හඳුනාගත් ගැටළු සහ දත්ත විශ්ලේෂණය තුළින් විවිධ ක්ෂේත්‍රයන්හි ඇති විභවතාවයන් ප්‍රයෝජනයට ගනිමින් බේරුවල බලප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීමේ අවශ්‍යතාවය කරුණු කිහිපයක් යටතේ හඳුනා ගැනිණි. ඒවා පහත පරිදි වේ.

1. *බේරුවල සැලසුම් බලප්‍රදේශය තුළ පවතින සීමා කළ නොහැකි සංවර්ධන පීඩනය පාලනය කිරීම.*

    I. *වර්තමානය වනවිට සැලසුම් බලප්‍රදේශය තුළ පවතින සංවර්ධන පීඩනය පරිසර සංවේදී කලාපයන් කරා ප්‍රවේශ වීම හේතුකොට ගෙන පරිසර සංවේදී කලාපයන්ට, හරිත වගාවන් සහිත කලාපයන්ට සහ වෙරළබඩ කලාපයන්ට අහිතකර බලපෑමක් ඇති වී තිබීම.*
    II. *අනවසර ඉදිකිරීම් තුළින් ස්වභාවික දර්ශන පථයන් අවහිර කිරීම.*
    III. *ධීවර කර්මාන්තයට සිදුවන අහිතකර බලපෑම්*

2. *විවිධ ආයතනයන්ගේ මැදිහත් වීමෙන් ක්‍රියාත්මක වන්නාවූ විවිධ ව්‍යාපෘතීන් සමෝධානය කරගනිමින්, බේරුවල සැලසුම් බලප්‍රදේශය සංවර්ධනය; නිවැරදි දිශානතියක් කරා ප්‍රවේශ කරලීම.*

    I. *මොරගල්ල වෙරළ තීරය සංවර්ධනය කිරීම සඳහා වූ ජාතික මැදිහත්වීම.*
    II. *බේරුවල නගරසභා බලප්‍රදේශයේ සහ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ විවිධ ආයතනයන්ගේ මැදිහත් වීමෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතීන්.*

3. *බේරුවල සැලසුම් ප්‍රදේශයේ පවත්නා විභවතාවයන් විවිධ ආර්ථික කටයුතුවලට ප්‍රශස්ත අයුරින් දායක කර ගැනීම.*


    I. *බේරුවල සැලසුම් බලප්‍රදේශයේ සංචාරක කර්මාන්තය ආශ්‍රිත විභවතා*
    II. *බේරුවල සැලසුම් බලප්‍රදේශයේ ධීවර කර්මාන්තය ආශ්‍රිත විභවතා*
    III. *බේරුවල සැලසුම් බලප්‍රදේශයේ මැණික් වෙළඳාම ආශ්‍රිත විභවතා*
    IV. *බේරුවල සැලසුම් බලප්‍රදේශයේ කෘෂිකර්මාන්තය ආශ්‍රිත විභවතා*

## 3.2. ගැටළු විශ්ලේෂණය

### 1. බේරුවල සැලසුම් බලප්‍රදේශය තුළ පවතින සීමා කළ නොහැකි සංවර්ධන පීඩනය පාලනය කිරීම.

*I. වර්තමානය වනවිට සැලසුම් බලප්‍රදේශය තුළ පවතින සංවර්ධන පීඩනය පරිසර සංවේදී කලාපයන් කරා ප්‍රවේශ වීම හේතු කොට ගෙන පරිසර සංවේදී කලාපයන්ට, හරිත වගාවන් සහිත කලාපයන්ට සහ වෙරළබඩ කලාපයන්ට අහිතකර බලපෑමක් ඇති වී තිබීම .*

වර්තමානයේ පවතින භූමි පරිභෝජනයට අනුව මුළු භූමි ප්‍රමාණයෙන් 50% කට ආසන්න ප්‍රමාණයක් පවතිනුයේ සංවේදී පරිසර පද්ධතියකි. රූපය 3.1 මඟින් හා සිතියම 3.1 මඟින් දැක්වෙන්නේ සැලසුම් බලප්‍රදේශයේ වර්තමාන භූමි පරිභෝජන රටාවයි.




*රූපය 3.1 : බේරුවල සැලසුම් බලප්‍රදේශයේ භූමි පරිභෝජන රටාව –2015*
*මූලාශ්‍රය : බේරුවල සැලසුම් කණ්ඩායම, කළුතර දිස්ත්‍රික් කාර්යාලය – 2017*

සිතියම 3.2 මඟින් දැක්වෙන සැලසුම් බලප්‍රදේශයේ සංවේදිතා විශ්ලේෂණය පිළිබඳව විමසීමේදී, මෙම ප්‍රදේශය හරහා ගලා බසින ප්‍රධාන ඇළ මාර්ග වන කළුවාමෝදර සහ දුම්මල්මෝදර යන ඇළ මාර්ග ආශ්‍රිතවත්, ඒවා මඟින් ඇති වී ඇති අනෙකුත් කුඩා ඇළ මාර්ග පද්ධතිය ආශ්‍රිතවත් පාරිසරික සංවේදී කලාප බිහි වී තිබේ. මීට අමතරව, ප්‍රදේශය පුරා විසිරී ඇති හෙක්ටයාර 1,430ක් පමණ වන කුඹුරු ඉඩම් සහ ඒ ආශ්‍රිත පහත් බිම්ද පාරිසරික සමතුලිතතාවය පවත්වා ගැනීමට වැදගත් කාර්යභාරයක් ඉටුකරන තෙත් භූමි ලෙස හැඳින්විය හැකිය.

වැසි අධික දිනවල ඇති වන ජල ගැලීම් පාලනය කිරීමට වැදගත්කමක් උසුලන ඉහත කී කුඹුරු සහ පහත් බිම් වැඩිවන භූමි වටිනාකම හේතුවෙන් අනවසර ගොඩකිරීම් වැනි තර්ජනයන්ට ලක්වී ඇති අතර, ඇළ මාර්ග දෙපස ඉදිකිරීම් හේතුවෙන් ස්වභාවික ජල බැසයාම අවහිර වී ප්‍රදේශය සුළු වර්ෂාවකදී වුවද ගංවතුර තර්ජනයට ලක් වේ.


බෙන්තර ගඟ, කළුවාමෝදර හා දුම්මල මෝදර ඇළ ප්‍රමුඛ රට සම්බන්ධ අතුරු ඇළ මාර්ග පද්ධතියක් ප්‍රදේශය තුළින් ගලා බසින අතර, අවධිමත් ගොඩනැගිලි ඉදිකිරීම හා තෙත්බිම් ගොඩකිරීම් යන කරුණු හේතුවෙන් ස්වභාවික ජලය බැස යාමට බාධා ඇති වී තිබේ. මේ හේතුවෙන් ප්‍රදේශයේ ස්ථාන රැසක් සුළු වර්ෂාපතනයකදී වුවද ගංවතුර තර්ජනයකට ලක් වේ.

වර්ෂ 2009 සහ 2015 බේරුවල සම්පත් පැතිකඩෙහි ඉඩම් පරිභෝජන රටාව පිළිබඳ දත්ත අනුව 2009 සිට 2015 දක්වා වූ කාල පරාසය තුළ, සැලසුම් බලප්‍රදේශයේ වී වගා භූමි ප්‍රමාණය පහත පරිදි වේ.

- *2009 – හෙක්ටයාර 950.8 (එය මුළු භූමි ප්‍රමාණයෙන් 14.5% ක ප්‍රතිශතයකි)*
- *2015 – හෙක්ටයාර 730.6 (එය මුළු භූමි ප්‍රමාණයෙන් 11.1% ක ප්‍රතිශතයකි)*

ඒ අනුව සැලසුම් බලප්‍රදේශයේ වී වගාව සඳහා පැවති ඉඩම් ප්‍රමාණය 2009 සිට 2015 දක්වා වූ කාල පරාසය තුළ 3.4% ක ප්‍රතිශතයකින් අඩු වී ඇති බව පෙනී යයි. මේ සඳහා ප්‍රධාන හේතුවක් ලෙස තෙත් බිම් ගොඩකර වෙනත් භාවිතයන්ට යොදා ගැනීමයි.

උක්ත හේතූන් විමසා බැලීමේදී වැදගත් සංවේදී පරිසර පද්ධතියක පිහිටි බේරුවල සැලසුම් බලප්‍රදේශය සඳහා වන අනාගත සංවර්ධනය, තිරසාර සංවර්ධනයක් බවට පත් කිරීමේ අරමුණ පෙරදැරි කොටගෙන සංවර්ධන සැලැස්මක් අවශ්‍යතාවය හඳුනා ගැනිණි.





**භූමි පරිභෝජන රටාව - 2015**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 0.35 0.7 1.4 2.1 2.8 කි.මී

**නාගරික සංවර්ධන අධිකාරිය**
මැයි 2017



සිතියම 3.1 : බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ භූමි පරිභෝජන රටාව -2015





**සංවේදිතා විශ්ලේෂණය**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 1.25 2.5 5 7.5 10 කි.මී

නාගරික සංවර්ධන අධිකාරිය
මැයි 2017

බස්නාහිර පළාත් අංශය | බේරුවල සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

*සිතියම 3.2: බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංවේදිතා විශ්ලේෂණය*




**සංවර්ධන පීඩන විශ්ලේෂණය**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 1.25 2.5 5 7.5 10 කි.මී


**නාගරික සංවර්ධන අධිකාරිය**
මැයි 2017

බස්නාහිර පළාත් අංශය | බේරුවල සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය


*සිතියම 3.3 : බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංවර්ධන පීඩන විශ්ලේෂණය 2017*

සිතියම 3.3 මඟින් පෙන්නුම් කරන බේරුවල සැලසුම් බලප්‍රදේශයේ සංවර්ධන පීඩන විශ්ලේෂණය සලකා බැලීමේදී වර්තමානයේදී බේරුවල නගර සභා බලප්‍රදේශයට සීමා වූ සංවර්ධන පීඩනය ප්‍රධාන මාර්ගයන් ඔස්සේ ප්‍රදේශයේ අභ්‍යන්තරය කරා ව්‍යාප්ත වීමේ නැඹුරුතාවයක් ඇති බව දක්නට ලැබේ. තවද, ප්‍රදේශයේ භූමි පරිභෝජන රටාව අධ්‍යයනය කිරීමේදී ප්‍රදේශයේ අභ්‍යන්තරයට වන්නට නේවාසික භාවිතයන් සඳහා වැඩි නැඹුරුතාවයක් දක්වන බව පෙනී යයි. එයට ප්‍රධාන සාධකය වී ඇත්තේ (සිතියම 3.4) ගාලු පාර දෙපස හා වෙරළ ඉම ප්‍රදේශයට සාපේක්ෂව අභ්‍යන්තර ප්‍රදේශයේ ඉඩම් වටිනාකම පහළ මට්ටමක පැවතීමයි. ඒ අනුව අභ්‍යන්තර ප්‍රදේශය තුළ අනාගතයේදී සංවර්ධනය වන නේවාසික මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය මූලික පහසුකම් සහිත සේවා මධ්‍යස්ථානත් ඒ හා බැඳුණු භෞතික හා සමාජීය යටිතල පහසුකම් ආදීය විධිමත් ලෙස සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

සිතියම 3.3 අනුව සංවර්ධන පීඩනය වෙරළාසන්න ප්‍රදේශ වලද ඉතා වැඩි අගයක් පෙන්නුම් කරන බව දැකිය හැකිය. 2017 ජනගහන පුරෝකථනයට අනුව හා රූපය 3.2 හි දැක්වෙන මොරටුව විශ්ව විද්‍යාලය මඟින් සිදු කරන ලද අධ්‍යයනයක් වන දළ නාගරික ගමනාගමන සැලැස්මට (Com Transport Project) අනුව වෙරළාසන්න ප්‍රදේශ වල ජනගහනය වැඩි ඝනත්වයක් පෙන්නුම් කරන බව හඳුනා ගෙන ඇත. මෙම නිසා බේරුවල සැලසුම් බලප්‍රදේශය තුළ පැන නැගී ඇති ගැටළු ලෙස වෙරළාසන්න ප්‍රදේශ වල කැලිකසළ බැහැර කිරීමේ ගැටළු, අනවසර ඉදි කිරීම් හා මුහුදු ඛාදනය ආදිය දැක්විය හැක. ඒ තුළින් දර්ශනීය වෙරළ අහිමි වීම හා සංචාරක ආකර්ශනීය බව අඩු වීම ප්‍රදේශයේ ආර්ථිකයට සෘණාත්මක බලපෑමක් එල්ල විය හැකිය. එබැවින් ප්‍රදේශය තුළ තුලනාත්මක සංවර්ධන පීඩනයක් ඇති කිරීම සඳහා විධිමත් නගර සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය පවතී.




*රූපය 3.2 : ජනගහන වර්ධන වේගය 2001- 2012*
*මූලාශ්‍රය: දළ නාගරික ගමනාගමන සැලැස්ම*




**ඉඩම් වටිනාකම්**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 0.35 0.7 1.4 2.1 2.8 කි.මී

**නාගරික සංවර්ධන අධිකාරිය**
මැයි 2018


බස්නාහිර පළාත් අංශය | බේරුවල සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

*සිතියම 3.4 : බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම් වටිනාකම 2017*


03 පරිච්ඡේදය සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

ගැටළු විශ්ලේෂණය

වෙරළ සංරක්ෂණය හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, වෙරළ ආශ්‍රිත පර්යේෂණ හා සැලසුම් අංශය යටතේ පවතින ආපදා කළමනාකරණ ආයතනය හා තවත් ආයතන කිහිපයක සහයෝගය සහිතව කරන ලද පර්යේෂණ මඟින් වර්ෂ 2025 වනවිට මුහුදු මට්ටම ඉහළ යෑමෙන් මෙම සැලසුම් බලප්‍රදේශයේ ඇතැම් ස්ථානයන්ටද තර්ජන ඇතිවිය හැකි බව තහවුරු කරගෙන ඇත. ඒ අනුව රූපය 3.3 මඟින් වර්ෂ 2025 සිට 2100 දක්වා කාල පරාසය තුළ මුහුදු මට්ටම ඉහළ යාමෙන් ඇතිවිය හැකි අවධානමත් රූපය 3.4 මඟින් එම අවදානම් තුළින් ඇතිවිය හැකි උපද්‍රවයන්ගේ මට්ටමත් දැක්වේ. මෙම සිතියම් අධ්‍යයනය මඟින් වෙරළ ඉම ප්‍රදේශ කේන්ද්‍රකොටගත් නේවාසික කලාප සඳහා සහ පාරිසරික සංවේදී ප්‍රදේශයන් කරා ඉහළ මට්ටමක අවධානම් පැතිරීම වලක්වාලිය හැකි සේ සංවර්ධන සැලැස්මක් තුළින් නිසි ලෙස සැලසුම් කළ යුතුව ඇත.



*රූපය 3.3 : මුහුදු මට්ටම ඉහළ නැගීම 2025-2100 මඟින් සැලසුම් බලප්‍රදේශය තුළ අවදානමට ලක්විය හැකි ප්‍රදේශ*



*රූපය 3.4 : වර්ෂ 2025 වනවිට මුහුදු මට්ටම ඉහළ නැගීම මඟින් සැලසුම් බලප්‍රදේශය තුළ ඇති වියහැකි උපද්‍රවයන්හි මට්ටම*

*මූලාශ්‍රය: වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව*

තවද, ඉහත ආයතන මඟින් පර්යේෂණ සිදුකර සුනාමි ව්‍යසනයට පත්වියහැකි ප්‍රදේශද හඳුනා ගෙන ඇත. ඒ අනුව පයාගල උතුර සිට මග්ගොන දක්වා ප්‍රදේශ සුනාමි සඳහා අවධානමක් සහිත ප්‍රදේශ ලෙස හඳුනාගන්නා ලදී. එමෙන්ම දර්ගා නගරයද ගංවතුර බලපෑම් ඇති ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇත.

එසේම මාර්ග පද්ධතියේ තීව්‍රතා විශ්ලේෂණයට අනුව වත්මන් මාර්ග ඒකාබද්ධතාවය බේරුවල නගර මධ්‍යයට වන්නට වැඩි වශයෙන් ව්‍යාප්තව පැවතියද එය වසර කිහිපයක් වන විට සැලසුම් බලප්‍රදේශයේ අභ්‍යන්තර ප්‍රදේශ කරා ව්‍යාප්ත වීමක් දක්නට ලැබේ. ඉන් පැහැදිලි වනුයේ සංවර්ධන පීඩනය අභ්‍යන්තර ප්‍රදේශ කරා ගමන්කරන බවයි. මෙලෙස බලප්‍රදේශය අභ්‍යන්තරයට ව්‍යාප්ත වන සංවර්ධනය, සංවේදී පරිසර කලාපයන්ට තර්ජනයක් නොවන අයුරින් පවත්වා ගැනීමට සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය පවතී.

## 03 පරිච්ඡේදය සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

ගැටළු විශ්ලේෂණය

බේරුවල නගර සභා බලප්‍රදේශයේ දක්නට ලැබෙන තවත් එක් පරිසරික ගැටළුවක් ලෙස ප්‍රදේශය තුළ පවතින පහත් බිම් බොහොමයක් මේ වන විට අනු බෙදුම් වෙමින් පැවතීම දැක්විය හැකිය. මෙම නාගරික සීමාව තුළ ඇති මුළු භූමි ප්‍රමාණයෙන් 9% ක් පහත් බිම් වන අතර, ඒවා අක්කරගොඩ, මාගල්ලවෙල හා සිල්ලිය යන ප්‍රදේශවල පැතිර පවතී. මෙහි ජෛව විවිධත්වයන් දක්නට නොලැබෙන අතර, තෙත්බිම් ප්‍රදේශයෙහි වැවෙන ශාක දක්නට ලැබේ. කැලි කසළ නිසි කළමනාකරණයකින් තොරව බැහැරලීම සඳහා පහත් බිම් භාවිතා කිරීම ප්‍රධාන පාරිසරික ගැටළුවක් බවට පත්ව ඇති අතර මේ හේතුවෙන්, පාරිසරික සමතුලිතතාවය බරපතල තර්ජනයකට ලක් වී ඇත. රූපය 3.5 මඟින් දක්වා ඇත්තේ එසේ අවිධිමත් කසළ බැහැර කිරීම හේතුවෙන් වෙත්තිමරාජපුර පහත්බිම ගොඩවී ඇති ආකාරයයි.




රූපය 3.5 : වර්තමානය වනවිට කැලිකසළ බැහැර කිරීමෙන් ගොඩවී ඇති වෙත්තිමරාජපුර පහත් බිම | මූලාශ්‍රය: ඡායාරූප ගත කිරීම, බේරුවල සැලසුම් කණ්ඩායම කළුතර දිස්ත්‍රික් කාර්යාලය, 2018

පහත්බිම් අනවසර ලෙස ගොඩ කිරීම (සිල්ලිය හා වෙත්තිම රාජපුර) හා එම ගොඩකිරීම් හේතුවෙන් ජල මාර්ග අවහිර වීම හා ගංවතුර තර්ජන ඇතිවීම හා කාණු පද්ධති අවහිර වීම වැනි පාරිසරික ගැටළුවලට පිළියමක් ලෙස මෙන්ම නේවාසිකයන්ට යහපත් හා සුව පහසු ජීවන තත්ත්වයක් ලඟා කර දීම සහ සංවර්ධන පීඩනය පරිසර සංවේදී කලාපයන් කරා ව්‍යාප්ත වීම සඳහා බේරුවල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මක් තිබිය යුතුය යන්න හඳුනා ගන්නා ලදී.

බේරුවල බලප්‍රදේශයේ තවත් ප්‍රධාන ලක්ෂණයක් වනුයේ ඉතා වැදගත් ගංගාවක් වන බෙන්තර ගඟෙන් මායිම් වීම සහ එය බස්නාහිර පළාතේ සීමාව බවටද පත් වී තිබීමයි.

සැලසුම් ප්‍රදේශයේ ජලාපවහන පද්ධතිය ප්‍රධාන වශයෙන් සැකසී ඇත්තේ, ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට දකුණු දෙසින් රට මායිම්ව පිහිටා ඇති අළුත්ගම ප්‍රදේශයෙන් මුහුදට එක්වන ප්‍රධාන ගංගාව වන බෙන්තර ගඟ හා සැලසුම් බලප්‍රදේශයේ උතුරු කොටස හරහා ගලා බැස මහ පයාගල සහ මග්ගොන අතරින් මුහුදට එකතුවන දුම්මල්මෝදර ඇළ හා ඒ ආශ්‍රිත ඇළ මාර්ග පද්ධතියකිනි. තවද, සැලසුම් බලප්‍රදේශයේ දකුණු දෙසට වන්නට විශාල ප්‍රදේශයක් පුරා ගලා බැස බෙන්තර ගඟෙහි මෝයට ආසන්නව බෙන්තර ගඟට එකතු වන කළුවාමෝදර ඇළද මෙහි ප්‍රධාන ස්ථානයක් ගනී. සිතියම 3.5 මඟින් දැක්වෙන්නේ බේරුවල සැලසුම් බලප්‍රදේශයේ ස්වාභාවික ජලවහන පද්ධතියේ ව්‍යාප්තියයි. මෙම ඇළ මාර්ග ආශ්‍රිතව තැනින් තැන කඩොලාන පද්ධති හා වගුරු බිම් පිහිටා ඇති ආකාරයක් දක්නට ඇත්තේ බොහොමයක් ප්‍රදේශ මුහුදු මට්ටමට ආසන්නව පැවතීම නිසාවෙනි. මේවා මුහුදු මට්ටමට වඩා පහළින් පිහිටා ඇති බැවින්, වඩදිය අවස්ථාවේ මුහුදු ජලය මෙම වගුරු බිම් දෙසට ගලා යනු ලැබේ.

එම ඇළ මාර්ග සහ ඒ ආශ්‍රිතව පිහිටා ඇති වගුරු බිම් පාරිසරික සමතුලිතතාවය මෙන්ම ස්වාභාවික සෞන්දර්යය රැකගැනීමට රුකුලක් වී ඇති අතර, සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය කෙරෙහිද සෘජු ලෙස බලපා ඇත. මෙලෙසින් බේරුවල සංවර්ධන සැලසුම් බලප්‍රදේශය පුරා ව්‍යාප්තව ඇති ස්වභාවික ජලවහන පද්ධතියට ද සංවර්ධන පීඩනය කෙරෙහි බලපෑමක් එල්ල වී ඇත.




**සිතියම 3.5 :** *බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්වභාවික ජලවහන පද්ධතිය – බේරුවල සැලසුම් බලප්‍රදේශය*

### II. අනවසර ඉදිකිරීම් තුළින් ස්වභාවික දර්ශන පථයන් අවහිර කිරීම.



රූපය 3.6 : අනවසර ඉදිකිරීම් හේතුවෙන් වෙරළ ඉම දර්ශනය ආවරණය ඇති ආකාරය.
මූලාශ්‍රය: google earth map - 2018 / ඡායාරූප ගත කිරීම: බේරුවල සැලසුම් කණ්ඩායම, කළුතර දිස්ත්‍රික් කාර්යාලය, 2018.05.13

පයාගල සිට අලුත්ගම දක්වා ඇති වර්ග කිලෝමීටර 20 පමණ දිගු රන්පැහැති වෙරළකට හිමිකම් කියන බේරුවල ප්‍රදේශය ඉහළ සංචාරක ආකර්ෂණයක් දිනාගැනීමට සමත් වී ඇත. නමුත් වර්තමානය වනවිට වෙරළ කලාපයට යාව පවතින අනවසර ඉදිකිරීම් හේතුවෙන් වෙරළ තීරය නිසි පරිදි දර්ශනය සඳහා විවෘතව නොපවතී. රූපය 3.6 මඟින් දැක්වෙන්නේ මග්ගොන සහ බේරුවල නගරසභා සීමාවන්හි එසේ අනවසර ඉදිකිරීම් හේතුවෙන් වෙරළ ඉම ප්‍රදේශය ආවරණය වී ඇති ආකාරයයි.

ප්‍රදේශය තුළ සිදුවන අවිධිමත් සංවර්ධනය පාලනය කිරීම සඳහාත් දෙස් විදෙස් සංචාරකයන්ගේ ප්‍රධාන සංචාරක ගමනාන්තයක් බවට බේරුවල ප්‍රදේශය පත් කරගනිමින් ප්‍රාදේශීය ආර්ථිකයට ඉහළ දායකත්වයක් ලබා ගැනීම සඳහාත් විධිමත් සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය පවතී.

බෙන්තර ගඟ රක්ෂිත ප්‍රදේශයෙහි ද අනවසර ඉදිකිරීම් හේතු කොට ගෙන ගං ඉවුර ඛාදනයට ලක් වීමත්, ගංගා ජලයට කැලිකසළ මුදා හැරීමත් යන ගැටළු හඳුනා ගත හැකිය. බෙන්තර ගඟෙහි හෙක්ටයාර 15.07 ක මුළු රක්ෂිත ප්‍රදේශයෙන් හෙක්ටයාර 6.78 ක භූමි ප්‍රමාණයක් හා වෙරළ ඉම ප්‍රදේශයෙහි හෙක්ටයාර 199.14 ක මුළු රක්ෂිත ප්‍රදේශයෙන් හෙක්ටයාර 73.03 ක ප්‍රදේශයක් අනවසර ඉදිකිරීම් සඳහා යොදා ගෙන ඇති බව ප්‍රදේශය තුළ සිදු කළ ක්ෂේත්‍ර සමීක්ෂණ අධ්‍යයනයකින් සිදු කළ දත්ත විශ්ලේෂණය



රූපය 3.7: බෙන්තර ගඟ රක්ෂිතයේ ඉදිකර ඇති අනවසර ඉදිකිරීම්
මූලාශ්‍රය: ඡායාරූප ගත කිරීම, බේරුවල සැලසුම් කණ්ඩායම, කළුතර දිස්ත්‍රික් කාර්යාලය – 2018

මඟින් අනාවරණය විය. රූපය 3.7 මඟින් දැක්වෙන්නේ එම බෙන්තර ගඟ රක්ෂිතය තුළ අනවසර ඉදිකිරීම් සිදුකර ඇති ආකාරයයි. මෙසේ අනවසර සංවර්ධනයන් හේතුවෙන් අනාගත සංවේදී පාරිසරික පද්ධතියට බලපෑම් ඇති කිරීම පාලනය කරමින් ප්‍රදේශය තුළ තුලනාත්මක සංවර්ධනයක් ඇති කිරීම සඳහා සංවර්ධන සැලැස්මක් අවශ්‍ය වී ඇත.

## III. ධීවර කර්මාන්තයට සිදුවන අහිතකර බලපෑම්

මුහුදුබඩ ප්‍රදේශ කේන්ද්‍ර කොටගෙන ව්‍යාප්තව ඇති ධීවර කර්මාන්තයද ප්‍රදේශයේ ආර්ථිකයෙහි වැදගත් තැනක් ගන්නා අතර, ධීවර කර්මාන්තය තුළින් වසරකට මත්ස්‍ය මෙට්‍රික් ටොන් 32 ක පමණ නිෂ්පාදනයක් ජාතික මත්ස්‍ය නිෂ්පාදනයට එකතු කරනු ලබයි. (සම්පත් පැතිකඩ,2016). බේරුවල ධීවර වරාය කරා පැමිණෙන බෝට්ටු නැවැත්වීමට ඉඩකඩ ප්‍රමාණවත් නොවීමත්, රැගෙන එන ධීවර නිෂ්පාදිනයන් නිසියාකාරව අලෙවි කරගත නොහැකි වීමත් සහ මෙම වරාය හා සම්බන්ධිත ඇළ මාර්ගය (බෙරව ඇළ) මඟින් ප්‍රදේශයේ කැලි කසළ ගලාවිත් බේරුවල ධීවර වරාය තුළ තැන්පත් වීමත් නිසා ධීවර කටයුතු නිසි පරිදි සිදුකිරීමට අපහසු වීම හඳුනා ගත් ගැටලුවකි. රූපය 3.8 මඟින් දැක්වෙන්නේ මෙලෙස බෙරව ඇළ මඟින් කැලි කසළ තැන්පත් වී ජල මූලාශ්‍රයන් දූෂිත තත්ත්වයට පත් වී ඇති ආකාරයයි.





රූපය 3.8: බෙරව ඇළ හා ධීවර වරාය ආශ්‍රිත ප්‍රදේශ
මූලාශ්‍රය: ඡායාරූප ගත කිරීම, බේරුවල සැලසුම් කණ්ඩායම, කළුතර දිස්ත්‍රික් කාර්යාලය – 2017

## 2. විවිධ ආයතනයන්ගේ මැදිහත් වීමෙන් ක්‍රියාත්මක වන්නාවූ විවිධ ව්‍යාපෘතීන් සමෝධානය කරගනිමින් බේරුවල සැලසුම් බලප්‍රදේශය සංවර්ධනය නිවැරැදි දිශානතියක් කරා ප්‍රවේශ කරලීම.

### *I. මොරගල්ල වෙරළ තීරය සංවර්ධනය කිරීම සඳහා වූ ජාතික මැදිහත් වීම.*

සැලසුම් බලප්‍රදේශයේ දකුණු මායිමට වන්නට පිහිටා ඇති මොරගල්ල වෙරළ තීරය "රන් සැතපුම " යන නමින් හැඳින්වෙන දෙස් විදෙස් සංචාරකයින්ගේ නොමඳ ආකර්ෂණය දිනා ගත් වෙරළ තීරයක් වේ. මෙම වෙරළ තීරයේ සුන්දරත්වය නිසාම වසරක් පාසා මෙම ස්ථානයට පැමිණෙන සංචාරකයන්ගේ සංඛ්‍යාව ඉහළ යමින් පවතී.රූපය 3.9 සහ 3.10 මඟින් දක්වා ඇත්තේ වර්තමානය වනවිට සංචාරක හෝටල් හා සංචාරක ක්‍රියාකාරකම් පවතින මොරගල්ල සංචාරක කලාපයයි. එමෙන්ම, මොරගල්ල වෙරළ තීරය තිරසාර ලෙස සංවර්ධනය කරමින් ජාත්‍යන්තර මට්ටමේ වෙරළ තීරයක් බවට පත් කිරීමේ අරමුණින් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනයන්ගේ මැදිහත් වීමෙන් කමිටුවක්ද පිහිටුවාගෙන ඇත.




*රූපය 3.9:* මොරගල්ල සංචාරක කලාපය
*මූලාශ්‍රය:* නාගරික සංවර්ධන අධිකාරිය, කළුතර දිස්ත්‍රික් කාර්යාලය

මොරගල්ල වෙරළ තීරය අන්තර්ජාතික වෙරළ තීරයක් ලෙසින් සංවර්ධනය කිරීම සඳහා දැනට මොරගල්ල වෙරළ තීරයේ පවතින විභාවනාවයන්

I. *මෙම වෙරළ තීරය ප්‍රධාන සංචාරක කලාපයක් ලෙසින් දෙස් විදෙස් සංචාරකයන්ගේ නොමඳ ආකර්ශනය දිනාගත් ස්ථානයක් වන අතර දේශීය සංචාරකයින් වෙරළ තීරයේ බාබේරියන් පරය ආසන්නය වැඩි වශයෙන් භාවිතා කරනු ලබයි.*
II. *විදේශීය සංචාරකයන් මෙම වෙරළ කලාපය නෑම සහ ජල ක්‍රීඩා සඳහාත් දේශීය සංචාරකයන් සති අන්ත දිනයන් වල දී විවේකය ගත කිරීම සඳහාත් යොදාගනී. දෙස් විදෙස් සංචාරකයන් කළුවාමෝදර කඩොලාන කලාපය නැරඹීම සඳහා යොදා ගන්නා සංචාරක බෝට්ටු සේවාව මෝය ආශ්‍රිතව ක්‍රියාත්මක වීම.(මොරගල්ල වෙරළ කලාපීයකරණය, මොරගල්ල වෙරළ කළමනාකරණ කමිටුව)*
III. *කුඩා ප්‍රමාණයේ හෝටල් සහ අවන්හල් 12 ක් පමණද විශාල ප්‍රමාණයේ හෝටල් 9ක් පමණද වෙරළ තීරයේ ක්‍රියාත්මක වේ.*
IV. *ධීවර බෝට්ටු තොටුපළවල් 3ක් සිනමන් බේ හෝටලයේ මෝය අසළ සහ අර්ල්ස් රීෆ් හෝටලය අසළ පිහිටා ඇත.*
V. *ජෛව විද්‍යාත්මක අතින් වැදගත් වූ බාබේරියන් පරය පිහිටා තිබීම.*
VI. *විශ්ව විද්‍යාල රජයේ ආයතන ඇතුළු ආයතන රැසක් බාබේරියන් පරය අධ්‍යයනය කරමින් පර්යේෂණ කටයුතු සිදු කරනු ලබයි.*
VII. *සංචාරකයන්ගේ ජීවිතාරක්ෂාව සඳහා පිහිටා ඇති ජීවිතාරක්ෂක කුලුන මොරගල්ල වෙරළේ සාගරික බීච් විලා හෝටලය අසළ පිහිටුවා ඇත.*
VIII. *සංචාරකයන් සඳහා වූ යටිතල පහසුකම් පැවතීම.*

නිල් ධජ අන්තර්ජාතික සහතිකයෙන් පිදුම්ලත් මොරගල්ල වෙරළ තීරය සංවර්ධනය කිරීම සඳහා වූ අරමුණු

I. මොරගල්ල වෙරළ අන්තර්ජාතික මට්ටමේ පහසුකම් සහිත වෙරළක් බවට පත් කිරීම.
II. මොරගල්ල වෙරළ භාවිතයේදී වෙරළ භාවිතා කරන්නන් අතර සිදුවන ගැටුම් අවම කිරීම.
III. මොරගල්ල වෙරළෙහි පවතින පාරිසරික සංවේදී ප්‍රදේශය වන බාබේරියන් පරය ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම.
IV. මොරගල්ල වෙරළෙහි ඉදිරි සංවර්ධන කටයුතු වලදී සැලසුම් සහගතව එම කටයුතු සිදු කිරීමට අදාලව මූලික එකඟතාවන් යෝජනා කිරීම.



*රූපය 3.10:* *මොරගල්ල වෙරළ කලාපය*
*මූලාශ්‍රය:* *Sri Lanka Beach Resourts වෙබ් අඩවිය - 2018*

*II. බේරුවල නගරසභා බලප්‍රදේශයේ සහ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ විවිධ ආයතනයන්ගේ මැදිහත් වීමෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතීන්.*

| ව්‍යාපෘතියේ නම | ක්‍රියාත්මක කරනු ලබන ආයතනය |
|---|---|
| ජල සැපයුම් ව්‍යාපෘතිය - හල්කඳවිල | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| ගාලු පාර පුළුල් කිරීමේ ව්‍යාපෘතිය | මාර්ග සංවර්ධන අධිකාරිය |
| මාර්ග පුළුල් කිරීමේ ව්‍යාපෘතිය - මග්ගොන පාලමේ සිට මොරගල්ල පාලම දක්වා කොටස | මාර්ග සංවර්ධන අධිකාරිය |
| කැලි කසළ බැහැර කිරීමේ ව්‍යාපෘතිය - කුරේ වත්ත | "පිලිසරු" අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය |

*වගුව 3.1: බේරුවල සැලසුම් බලප්‍රදේශය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘතීන්*
*මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018*

වගුව 3.1 මඟින් දැක්වෙන පරිදි විවිධ ආයතන මඟින් සිදු කරනු ලබන ව්‍යාපෘතීන් එකිනෙකට සමෝධානය කර ගනිමින් බේරුවල සංවර්ධන සැලැස්ම සැකසීමෙන් එය නිවැරදි ඉදිරි දැක්මක් සහිත සංවර්ධන සැලැස්මක් බවට පත්කරගැනීමට අවකාශය උදා වේ. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධ ව්‍යාපෘතීන්ගේ ඒකරාශිවීමක් අපේක්ෂා කරයි.

## 3. බේරුවල සැලසුම් ප්‍රදේශයේ පවත්නා විභවතාවයන් විවිධ ආර්ථික කටයුතුවලට ප්‍රශස්ත අයුරින් දායක කර ගැනීම.

සංචාරක කර්මාන්තය, කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය හා මැණික් වෙළඳාම යන අංශ බේරුවල ආර්ථිකයෙහි ප්‍රධාන ස්ථානයක් හිමිකර ගනී. මෙම අංශවල රැකියා නියුක්තිය සලකා බලන විට ඉහත ප්‍රධාන කර්මාන්තවලට අදාළ සේවා සැපයීම්, නිෂ්පාදන, අගය එකතුකිරීමේ කර්මාන්ත සහ නිෂ්පාදන අලෙවිය යන අංශවල ප්‍රධාන වශයෙන් රැකියා නියුක්තිය විසිරී ඇතිබව පෙනීයයි. අළුත්ගම, පයාගල සහ හල්කඳවිල යන ප්‍රදේශවල පිහිටා ඇති සතිපොළවල්ද ප්‍රදේශයේ ආර්ථිකයෙහි ප්‍රධාන තැනක් හිමි කරගන්නා අතර, ඒවාට සැලසුම් ප්‍රදේශයට පරිබාහිරව පිහිටි ප්‍රදේශවලින් පවා ජනතාව ඇදී එයි.

### *I. බේරුවල සැලසුම් බලප්‍රදේශයේ සංචාරක කර්මාන්තය ආශ්‍රිත විභවතා*

ආකර්ශණීය වෙරළ තීරයක් හිමි වීම සහ ගංගා ද්‍රෝණියක පිහිටා තිබීම, බ්‍රීෆ් උද්‍යානය, කන්දේ විහාරය ශාන්ත වින්සෙන්ට් දෙව්මැදුර අශ්‍රිතව පිහිටි ශ්‍රී ලංකාවේ ඉපැරණි කල්වාරිය වැනි පාරිසරික සහ සංස්කෘතික වශයෙන් වැදගත් ස්ථාන රාශියක් මෙම සැලසුම් ප්‍රදේශය තුළ පිහිටා තිබීම දෙස් විදෙස් සංචාරකයින් ඇඳගැනීමට හේතු වී ඇත. එමෙන්ම ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට සැලසුම් කරන ලද සංචාරක නිකේතනය වන බෙන්තොට සංචාරක නිකේතනය බේරුවල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයෙහි දකුණු මායිමෙහි පිහිටා තිබීම සංචාරක කර්මාන්තය තවදුරටත් වැඩි දියුණු වීමට හේතු වී ඇත. රූපය 3.11 මඟින් දැක්වෙන්නේ වර්තමානය වනවිට මොරගල්ල ප්‍රදේශය ආශ්‍රිතව පවතින සංචාරක ක්‍රියාකාරකම් කිහිපයකි.




*රූපය 3.11:* මොරගල්ල වෙරළ කලාපය ආශ්‍රිත සංචාරක ක්‍රියාකාරකම්
*මූලාශ්‍රය: Cinnamon Bey Beruwala 2019 by Travelclick වෙබ් අඩවිය – 2018*

## 03 පරිච්ඡේදය
## සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

### ගැටළු විශ්ලේෂණය

බේරුවල සංවර්ධන සැලසුම් බලප්‍රදේශය පුරා ව්‍යාප්තව ඇති සංචාරක කර්මාන්තය මඟින් වසරකට ජාතික ආර්ථිකය සඳහා මිලියන 4000 පමණ දායකත්වයක් සපයන අතර ලක්ෂ තුනකට ආසන්න සංචාරක සේන්දුවීම් ද බේරුවල සැලසුම් බලප්‍රදේශයෙන් හඳුනා ගතහැකිය. (ශ්‍රී ලංකා සංචාරක අධිකාරිය,2015). එසේම යෝජිත සංචාරක ව්‍යාපෘතීන් ද සංචාරක කර්මාන්තය නගාසිටුවීම සඳහා ඉවහල් වන විභාවනාවයන් ලෙසින් දැක්විය හැකිය. උදාහරණයක් ලෙස දෙද්දුව – බෙන්තොට සංචාරක කලාප ව්‍යාපෘතීන් සඳහන් කළ හැකිය. එපමණක් ද නොව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් බේරුවල බලප්‍රදේශය ප්‍රධාන සංචාරක සන්ධිස්ථානයක් ලෙසින් ප්‍රකාශයට පත්කර ඇත. රූපය 3.12 හා 3.13 මඟින් දැක්වෙන්නේ ශ්‍රී ලංකා සංචාරක අධිකාරිය මඟින් බේරුවල ප්‍රදේශය යෝජිත සංචාරක සංවර්ධන ගමනාන්තයක් අතරට එක් කොට ඇති ආකාරයයි.




*රූපය 3.12: ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක ගමනාන්තයන්*
*මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*




*රූපය 3.13: යෝජිත සංචාරක සංවර්ධන ගමනාන්තයන්*
*මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

ප්‍රදේශයට ස්වභාවික සුන්දරත්වයක් අත්කර දෙන ප්‍රධානතම අංගය ලෙස ස්වභාවික මුහුදු වෙරළ හැඳින්විය හැකිය. විශේෂයෙන්ම මොරගොල්ල සහ පයාගල සිට මග්ගොන දක්වා මුහුදු තීරය දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ශණයට ලක් වී තිබේ.

එමෙන්ම දර්ශනීය භූමි භාගයක පිහිටා ඇති පොතුවිල වේරගලකන්ද පුරාණ රජමහා විහාරය, කපුගොඩ ආඩියාකන්ද දේවාලය, පාරිසරික වැදගත්කමක් ඇති මොරගොල්ල කඩොලාන දූව, කළුවාමෝදර ඓතිහාසික කන්දේ විහාරය, ගම්මැද්ද ප්‍රදේශයේ පිහිටා ඇති කඩොලාන පරිසර පද්ධතිය කළුවාමෝදර සහ කාලවිල බ්‍රිෆ් උද්‍යානය ප්‍රදේශයට ආකර්ෂණයක් අත්කර දෙන දර්ශනීය ස්ථාන ලෙස හඳුන්වා දිය හැකිය.

## II. බේරුවල සැලසුම් බලප්‍රදේශයේ ධීවර කර්මාන්තය ආශ්‍රිත විභවතා

මත්ස්‍ය නිෂ්පාදනය මෙම ප්‍රදේශයට ආවේණික වූ ප්‍රධාන කර්මාන්තයකි. ශ්‍රී ලංකාවේ ස්වාභාවික ධීවර වරායන්ගෙන් එකක් වන බේරුවල වරාය කේන්ද්‍රකොටගත් මත්ස්‍ය නිෂ්පාදනය ඉන් ප්‍රධාන තැනක් ගනී. බේරුවල වරාය සතු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 3.97 කි. එය බේරුවල සැලසුම් බලප්‍රදේශයේ මුළු බිම් ප්‍රමාණයෙන් 0.87% ක ප්‍රතිශතයකි. මෙහි දෛනික නිෂ්පාදිතය මෙට්‍රික් ටොන් 45,000 (සම්පත් පැතිකඩ,2015) ක් වන අතර ප්‍රාදේශීය වශයෙන් 20% ක් හා ජාතික මත්ස්‍ය නිෂ්පාදනයට ඇති දායකත්වය 8% කි (ධීවර හා ජලජ සම්පත් අමාත්‍යංශය). වගුව 3.2 මඟින් දැක්වෙන්නේ බේරුවල වරාය සතු මූලික දත්ත කිහිපයකි.

| බේරුවල වරාය | |
|---|---|
| මාළු නිෂ්පාදනය ( කි. ග්‍රෑම් ) | 13,726 |
| බෝට්ටු සංඛ්‍යාව | 800 |
| ධීවරයන් ගණන | 3,000 |
| නැංගුරම් ස්ථාන | 10 |
| අයිස් කර්මාන්තශාලා | 03 |

*වගුව 3.2: බේරුවල වරාය සතු මත්ස්‍ය නිෂ්පාදිතය හා යටිතල පහසුකම් ප්‍රමාණය - 2015*
*මූලාශ්‍රය: බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සම්පත් පැතිකඩ (2015)*

මසුන් ඇල්ලීම, මත්ස්‍ය වෙළඳාම, කරවල වේලීම, ජාඩි දැමීම යනාදිය ධීවර කර්මාන්තය ආශ්‍රිත සාම්ප්‍රදායික කටයුතු වන අතර, මෙම ප්‍රදේශයේ ධීවර කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදනයන්ට ප්‍රදේශය පුරා විසිරී පවතින සංචාරක හෝටල්වලින් ඉහළ ඉල්ලුමක් තිබේ. වගුව 3.3 හි දැක්වෙන පරිදි සමස්ත ප්‍රදේශයේම පහසුව සඳහා ධීවර කලාපයන් 5 කට වෙන් කර ඇත. මෙම ධීවර කලාපයන් 5 තුළ පිහිටි මත්ස්‍ය තොටුපළවල පිහිටීම ඇමුණුම 03 මඟින් දැක්වේ.

| ධීවර කලාපය | නිවාස ගණන | පවුල් ගණන | ජනගහනය | වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය( කි.ග්‍රෑම්) |
|---|---|---|---|---|
| මග්ගොන | 452 | 448 | 2260 | 291,983 |
| පයාගල | 400 | 486 | 1610 | 555,665 |
| බේරුවල උතුර | 370 | 430 | 1670 | 11,121,500 |
| බේරුවලදකුණ | 186 | 548 | 2250 | 81,000,000 |
| අලුත්ගම | 180 | 182 | 840 | 892,690 |
| **එකතුව** | **1588** | **2094** | **8630** | **93,861,838** |

*වගුව 3.3: බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති ධීවර කලාපයන්*
*මූලාශ්‍රය: බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සම්පත් පැතිකඩ (2016)*

මෙහිදී ප්‍රධාන වශයෙන් මත්ස්‍ය නිෂ්පාදනය බේරුවල නගර සභා සීමාව තුළ පිහිටි බේරුවල ධීවර වරාය කේන්ද්‍ර කරගෙන සිදු වුවද, එම ස්ථානයෙන් දියත්වන බහුදින ධීවර යාත්‍රාවල සහ අනෙකුත් සේවා සැපයීම්වලට සම්බන්ධ විශාල පිරිසක් බේරුවල ප්‍රාදේශීය සභා සීමාව තුළ ජීවත් වේ. තවද, අළුත්ගම, මග්ගොන සහ පයාගල යන ප්‍රදේශයන්ට අයත් ධීවර කලාප තුළද ඔරු, පාරු සහ මා දැල් යොදාගනිමින් ධීවර කර්මාන්තයේ නියැලෙන විශාල පිරිසක් සිටී.

මෙම නගර, ගැල් තොටුපොළවල්, වරායන් සහ නැංගුරම් පොළවල් ආශ්‍රිතව විකාශනය වූ කුඩා පරිමාණ සේවා මධ්‍යස්ථාන ජාලයක් ලෙස බේරුවල ප්‍රදේශය තුළ මූලික වශයෙන් ව්‍යාප්තව ඇති අතර, අළුත්ගම, බේරුවල, මග්ගොන යන නගර ප්‍රධාන සේවා මධ්‍යස්ථාන ලෙස හඳුනා ගත හැකිය. පසුකාලීනව ඒවා යටත් විජිත සමයෙහි ඇතිවූ බලපෑම් සහ මහාමාර්ග සහ දුම්රිය මාර්ග ජාලය තුළින් දියුණු වූ අන්තර් සම්බන්ධතාවය හේතු කොටගෙන, දැනට පවතින ප්‍රධාන නගර සහ සේවා මධ්‍යස්ථාන බවට විකාශනය වූවා යැයි සැලකිය හැක.

බේරුවල ධීවර වරාය හා අවට කලාපය ස්වභාවික පිහිටිම නිසා සංචාරක ආකර්ශනීය ස්ථානයක් බවට පත් කිරීමට විභවතාවයක් පවතින බව හඳුනා ගත් බැවින් එවන් ආකාරයට ධීවර වරායන් සංචාරක කර්මාන්තය සඳහා යොදාගත් අවස්ථා කිහිපයක් අධ්‍යයනය සඳහා යොදා ගැනිණි. පැසිෆික් බීච් ප්‍රජා සැලැස්ම අනුව පොක්ලන්තයේ ප්‍රධාන වරාය වන පෝට් ස්ටැන්ලි වරාය කැනඩාවේ පිහිටි පෝට් චැල් හවුස් හා ශාන්ත කැතරයින්ස් වරායන් හා පැසිෆික් බීච් ආදී ධීවර වරායන් සංචාරක අංශයෙන් ආර්ථිකයට වඩාත් ඵලදායි ලෙස සංවර්ධනයට දායක කරගත් ධීවර වරායන් ලෙස හැඳින්විය හැකිය.

වර්තමානයේදී, සංචාරකයන් වඩාත් ආකර්ශනීය වී ඇති කරුණක් ලෙස මුහුදු ආසන්න විනෝදාස්වාද කටයුතු මෙන්ම ධීවර කටයුතු පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමට ද රුකුලක් දක්වන බැවින් බේරුවල වරාය හා ඒ අවට ඇති සංචාරක ආකර්ශනීය පිහිටීම උපයෝගි කොට ගෙන මෙය සංචාරකයන් ආකර්ෂණීය ස්ථානයක් ලෙස නිර්මාණය කිරීම වැදගත් වේ. ඉහත සඳහන් කළ පරිදි ධීවර වරායන් සංචාරක ආකර්ෂණයට යොදාගනිමින් සංචාරක කර්මාන්තය දියුණු කළ ආකාරය පිළිබඳ ජාත්‍යන්තර අත්දැකීම් උපයෝගී කර ගනිමින් සුදුසු ව්‍යාපෘතීන් සිදුකර ප්‍රාදේශීය ආර්ථිකය සංචාරක කර්මාන්තය තුළින් පුනර්ජනනය කිරීමට අපේක්ෂා කෙරේ.

### *III. බේරුවල සැලසුම් බලප්‍රදේශයේ මැණික් වෙළඳාම ආශ්‍රිත විභවතා*




*රූපය 3.14: චීන කොටුව මැණික් වෙළඳපොළෙහි 1955 දී තත්ත්වය*
*මූලාශ්‍රය: Beauty Gems වෙබ් අඩවිය - 2018*



*රූපය 3.15: චීන කොටුව මැණික් වෙළඳපොළෙහි වර්තමාන තත්ත්වය – 2017*
*මූලාශ්‍රය: Ceylon Gem Hub වෙබ් අඩවිය – 2017*

ලංකාවේ දෙවන විශාලතම මැණික් වෙළඳපළ පවතිනුයේද, බේරුවල නගර සභා සීමාවේ චීන කොටුව ප්‍රදේශයේ වේ. ලංකාවේ බොහෝ ප්‍රදේශවලට දෙස් විදෙස් සංචාරකයන් මැණික් වෙළඳාම හා මිලදී ගැනීම යන කාර්යයන් දෙක සඳහා ම පැමිණේ. මැඩගස්කරය, තායිලන්තය, ස්විට්සර්ලන්තය, චීනය හා ඉන්දියාව වැනි රටවල්වලින් පැමිණෙන අතර වර්ෂ 2017 වනවිට ස්වර්ණාභරණ අධිකාරියෙන් මැණික් වෙළඳාම සඳහා ලබාගත් බලපත්‍ර සංඛ්‍යාව 2500 කි. රූපය 3.14 සහ රූපය 3.15 මඟින් දැක්වෙන්නේ චීන කොටුව මැණික් වෙළඳපොළෙහි 1955 සහ වර්තමාන තත්ත්වයෙහි (2018) ස්වරූපයයි.

යටිතල පහසුකම් නොමැතිවීමත්, ආරක්ෂාවත් හා මූල්‍යමය ආයතන (බැංකු) නොමැතිවීමත් නිසා මෙම කටයුතු නිසි පරිදි සිදුකර ගැනීමට නොහැකිවේ. මැණික් වෙළඳපොළ මෙම බලප්‍රදේශයේ ආර්ථිකයට දායකත්වයක් දරන බැවින් මෙය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් හඳුනා ගැනීමට සංවර්ධන සැලැස්මක් අවශ්‍යව පවතී.

## IV. බේරුවල සැලසුම් බලප්‍රදේශයේ කෘෂි කර්මාන්තය ආශ්‍රිත විභවතා

සැලසුම් බලප්‍රදේශයේ අභ්‍යන්තරයට යනවිට කෘෂි කර්මාන්තය සඳහා වැඩි නැඹුරුතාවයක් දක්වා ඇත. ප්‍රධාන වශයෙන් වගා කරන බෝග ලෙස පොල්, රබර් හා වී ගොවිතැන දැක්විය හැකිය. වර්ෂ 2015 දත්ත වලට අනුව වාර්ෂික රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 8000 ක් වන අතර රැකියා උත්පාදනය 1600 කි. එය මුළු ඉඩම් ප්‍රමාණයෙන් 16% කි. පොල් වගාව ගත්කළ හෙක්ටයාර් 1275 ක් වන අතර එය මුළු බිම් ප්‍රමාණයෙන් 18.6% කි. වාර්ෂික නිෂ්පාදනය ගෙඩි මිලියන 2.2 කි (බේරුවල.ප්‍රා.ලේ.කා,2016). මෙම ප්‍රදේශයේ පාරම්පරික කර්මාන්තයක් ලෙස මී රා කර්මාන්තය හැඳින්විය හැකිය. ප්‍රදේශයේ ආර්ථික අංශය කෙරෙහි මෙමගින් ඇති කරන බලපෑම ඉහළ මට්ටමක පවතී. මේ ආශ්‍රිතව අතුරු රැකියා ලෙස රා මැදීම, රා පෙරීම, රා එකතු කිරීම, ප්‍රවාහනය, විනාකිරි නිෂ්පාදනය ආශ්‍රිතව සැලකිය යුතු පිරිසක් නිරත වී ඇත. මෙම කර්මාන්තය සඳහා පයාගල ප්‍රදේශය අතීතයේ සිටම ප්‍රසිද්ධියක් උසුලයි. මේ තුළින් රා නිෂ්පාදනය වර්ෂයකට ලීටර් මිලියන 03 කි (ශ්‍රී ලංකා ස්කාගාර සංස්ථාව). මෙම සාම්ප්‍රදායික මී රා කර්මාන්තය සංචාරක ව්‍යාපාරය හා සම්බන්ධ කිරීම තුළින් මී රා කර්මාන්තය දියුණු කිරීමේ විභවතාවයක් පවතී.



*රූපය 3.16: කෘෂි කර්මාන්තය ආශ්‍රිත විභවතා*
*මූලාශ්‍රය: agephotos.com වෙබ් අඩවිය*

මේ අනුව සංචාරක, ධීවර මැණික් වෙළඳාම හා කෘෂි කර්මය යන අංශ වලින් ශක්තිමත් වූ ආර්ථිකයක් හිමි බේරුවල ප්‍රදේශයට මෙම සියලු  විභාවතාවයන් ප්‍රශස්ත අයුරින් ප්‍රයෝජනයට ගෙන ආර්ථිකය තවත් ශක්තිමත් කර ස්වාධීන ලෙස ඉහළ එස වූ නගරයක් බවට බේරුවල නගරය පත් කිරීමට බේරුවල සංවර්ධන සැලැස්ම 2019–2030 මඟින් අපේක්ෂා කෙරේ.



# දෙවන කොටස

**බේරුවල නගර සභාව, බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ගෙන් සමන්විත වන**

**බේරුවල නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ**

**සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, 1982 අංක 04 දරණ නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධිත) පනතේ 8 "ඊ" වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2019 මැයි 28 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමණාකරන මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගෙන බේරුවල නගර සභාව, බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ගෙන් සංයුක්ත වන බේරුවල නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.

..................................................

**පාඨලී චම්පික රණවක**
**මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය**

**මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,**
**17 හා 18 වන මහල,**
**"සුහුරුපාය",**
**සුභූතිපුර පාර,**
**බත්තරමුල්ල**

2019 ....ජුනි.... මස ..28.. වන දින.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2129/94 - 2019 ජූනි මස 28 වැනි සිකුරාදා - 2019.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**බේරුවල නගර සභාව, බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ගෙන් සමන්විත වන බේරුවල නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි.**

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත හා එහි සංශෝධන පනත් හි 8(අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව බේරුවල නගර සභාව, බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ගෙන් සමන්විත බේරුවල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා පිළියෙල කරන ලද බේරුවල නාගරික සංවර්ධන සැලැස්ම මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය, පාඨලී චම්පික රණවක වන මා විසින් එකී පනතේ 8(ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල වලට අනුකූලව 2019 ජූනි මස 28 වන දින අනුමත කරන ලද බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

පාඨලී චම්පික රණවක,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 ජූනි මස 28 වෙනි දින,
17 හා 18 වන මහල,
''සුහුරුපාය'',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

බේරුවල නගර සභා සහ බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 ''අ'' වගන්තියේ බලතල ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද බේරුවල නගර සභා සහ බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8 ''ඊ'' වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2019 ජූනි මස 28 වන දින අනුමත කරන ලද බව මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.


2019 ජූනි මස 28 දින.

07 - 4553/5

1A - PG 4553 — 177 (2019/06)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 04 පරිච්ඡේදය



# සංවර්ධන සැලසුම් රාමුව

## 4.1. සංවර්ධන සැලැස්මේ දැක්ම

***"The Grand Portal of South Beach Panorama"***
*An Assortment of Fishery, Gem, & Agriculture, Enterprises In Bound With Beruwala Beach Touristy*

***"දක්ෂිණ වෙරළ තීරය විවර කරන විසල් දොරටුවක් කරා"***



## 4.2. දැක්මෙහි ප්‍රකාශනය

බෙන්තර ගං මායිමෙන් ආරම්භ වන දකුණුලකට ප්‍රවේශ වීමේ ආරම්භක ස්ථානයේ පිහිටා ඇති බේරුවල, යෝධ ආර්ථිකයක් සහිත ස්වාධීන නගරයක් ලෙස ඔසවා තැබීම මෙම සංවර්ධන සැලැස්මේ අනාගත අභිප්‍රායයි. "Grand Portal" හෙවත් විසල් දොරටුව යනුවෙන් මෙහිදී අදහස් කෙරෙනුයේ වර්ෂ 2030 වනවිට බේරුවල ප්‍රදේශය දැනට එහි පවතින ධීවර, මැණික් වෙළඳාම, සංචාරක හා කෘෂිකාර්මික යන බහුවිධ ආර්ථික විභවතාවයන් මනා ලෙස සංකලනය කරගනිමින් ස්වයංපෝෂිත ප්‍රාදේශීය ආර්ථිකයක් සහිත නගරයක් ලෙස ගොඩනැංවීමයි. උක්ත සංවර්ධනයත් පර්යන්තයෙහි පවතින හරිත වැස්ම හා බැදුණු ජෛව පද්ධතියත් ආරක්ෂා කිරීම තුළින් සිදුවන තුලනාත්මක සංවර්ධන දිශාවක් කෙරෙහි මෙහිදී තවදුරටත් අවධාරණය කෙරේ. මෙසේ ගොඩනැගුණු පරිසරයක් සහිත බේරුවල ප්‍රදේශයේ දකුණු දෙසට ඇතුළු වීමේදී හමුවන විසල් දොරටුවක් ලෙස මෙහිදී අර්ථකථනය කෙරේ.

කොළඹ සිට වෙරළ ඉම ඔස්සේ දක්ෂිණ ප්‍රදේශය කරා ගමන් ගන්නා පුද්ගලයෙකුට සුන්දර වෙරළ තීරය අතිශය දර්ශනීය ලෙස විද්‍යාමාන වන්නට ආරම්භ වන්නේ පයාගලිනි. Goldan Sand හෙවත් රන්වන් වෙරළ තීරයක් හිමි මොරගල්ල ප්‍රදේශය එහි කූටප්‍රාප්තියයි. Beach Panorama යනුවෙන් අදහස් කර ඇත්තේ එම වෙරළ ඉම ඔස්සේ ගමන්ගන්නා පුද්ගලයකුට ලැබෙන්නා වූ සමස්ත දර්ශනයේ ක්‍රමානුකූල වෙනස්වීමේ උච්චය බේරුවලින් ඇරඹෙන බවයි. එම දර්ශනයන්ට බාධා වන අයුරින් සිදුවන වර්තමාන සංවර්ධන රටාව පාලනය කරමින් දෙස් විදෙස් සංචාරකයින් වැඩි වශයෙන් ආකර්ෂණය කරගත හැකි වනලෙස බේරුවල ප්‍රදේශය සතු භෞතික පරිසරය නිර්මාණය කිරීම මෙහි අපේක්ෂාවයි.

## 4.3. සංවර්ධන සැලැස්මේ අරමුණු

අරමුණ 01

නිරිතදිග වෙරළ තීරය බහුවිධ සංචාරක පුරවරයක් බවට පත් කිරීම.

අරමුණ 02

වෙරළ ඉම කේන්ද්‍රකොටගත් සංවර්ධන පීඩනය පාලනය කර ගැනීම සඳහා ප්‍රදේශය පුරා විහිදුණු තුලනාත්මක සංවර්ධනයක් ඇති කිරීම.

අරමුණ 03

ප්‍රදේශය තුළ පවතින පාරිසරික සම්පත් උපයෝගී කරගනිමින් ජනතාවට සුවපහසු නගරයක් බවට පත්කිරීම.

## 4.4. සංවර්ධන සැලැස්මේ පරමාර්ථ

අරමුණ 01

නිරිතදිග වෙරළ තීරය බහුවිධ සංචාරක පුරවරයක් බවට පත් කිරීම.

පරමාර්ථ

1. වර්ෂ 2030 වනවිට බේරුවල සංචාරක ආකර්ෂණය වැඩි කිරීම සඳහා වර්ග කි.මී.0.13 ක වෙරළ තීරය එළිමහන් භූමි ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීම.

2. වර්ෂ 2025 වනවිට ධීවර වරාය කේන්ද්‍රකොටගත් සංචාරක ක්‍රියාකාරකම් දිරිමත් කිරීම සඳහා බේරුවල ධීවර වරාය හා බාබේරියන් දූපත ආශ්‍රිත කලාපය නවීකරණය කිරීම.

3. කළුවාමෝදර හා මොරගල්ල යන ප්‍රදේශයන්හි සංචාරක නවාතැන් පහසුකම් වර්ෂ 2025 වනවිට වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

4. වර්ෂ 2022 වනවිට අභ්‍යන්තර ප්‍රදේශයේ පවතින සංචාරක ආකර්ෂණය දිනා ගතහැකි බාවා උද්‍යානය, කිච්චිමලේ පල්ලිය, කන්දෙ විහාරය, සපුගොඩ විහාරය, ශාන්ත ජෝෂප් පල්ලිය, මහදෙණිය විහාරය සහ වේරගල රජමහා විහාරය යනාදී ස්ථානයන් එකිනෙක සම්බන්ධ කිරීම සඳහා කිලෝමීටර 25 පමණ දිගින් යුත් පවත්නා මාර්ග පද්ධතිය පිළිසකර කිරීම.

5. වර්ෂ 2022 වනවිට මැණික් වෙළඳපොල ආශ්‍රිත කටයුතු සඳහා වර්ග මීටර් 400 ක භූමි ප්‍රදේශයක් ලබා දීම හා එම කටයුතු ප්‍රසාරණය කිරීම සඳහා අවශ්‍ය භෞතික යටිතල පහසුකම් සැපයීම.

6. වර්ෂ 2022 වනවිට ගොවිපල කෘෂිකාර්මික කටයුතුවලින් 30% ක් සංචාරක කර්මාන්තය හා ඒකාබද්ධ කරමින් සංචාරක විවිධාංගීකරණයක් ඇති කිරීම.

7. වර්ෂ 2025 වනවිට මත්ස්‍ය නිෂ්පාදනය මගින් දළ දේශීය නිෂ්පාදනයට සිදුකරන ආංශික දායකත්වය 1% කින් ඉහළ නැංවීම සඳහා අවශ්‍ය මත්ස්‍ය කටයුතු ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

8. ගාලු පාර හා දුම්රිය මාර්ග සම්බන්ධ කෙරෙන කිලෝමීටර එකක පමණ දිගින් යුත් දුම්රිය ප්‍රවේශ මාර්ගයන්හි ඇවිදීමේ පහසුකම් වර්ෂ 2025 වනවිට සංවර්ධනය කිරීම.

## 04 පරිච්ඡේදය
## සංවර්ධන සැලැසුම් රාමුව

### සංවර්ධන සැලැස්මේ පරමාර්ථ

අරමුණ 02

**වෙරළ ඉම කේන්ද්‍රකොටගත් සංවර්ධන පීඩනය පාලනය කර ගැනීම සඳහා ප්‍රදේශය පුරා විහිදුණු තුලනාත්මක සංවර්ධනයක් ඇති කිරීම.**

පරමාර්ථ

1. අභ්‍යන්තර ප්‍රදේශයේ හඳුනාගන්නාලද ප්‍රධාන මංසන්ධි 9 ක් වන හිරිගල්ගොඩැල්ල, පාලයන්ගොඩ, පොතුවිල, හල්කඳවිල, මුංහේන, වලතර, අබේපිටිය, පාදාගොඩ සහ කාලවිල යන උප නාගරික මධ්‍යස්ථාන වර්ෂ 2025 වනවිට ස්ථාපිත කිරීම.
2. හිරිගල්ගොඩැල්ල, පාලයන්ගොඩ, පොතුවිල, හල්කඳවිල, මුංහේන, වලතර, අබේපිටිය, පාදාගොඩ සහ කාලවිල යන උපනාගරික මධ්‍යස්ථානයන්හි අවශ්‍ය පොදු හා යටිතල පහසුකම් වර්ෂ 2030 වනවිට සංවර්ධනය කිරීම.
3. තෝරාගත් අභ්‍යන්තර උපනාගරික මධ්‍යස්ථාන හා වෙරළ ඉම නාගරික මධ්‍යස්ථාන ඒකාබද්ධ කිරීම සඳහා මනා ඒකාබද්ධිත මාර්ග ජාලයක් වර්ෂ 2025 වනවිට ප්‍රතිසංස්කරණය කිරීම.
4. බේරුවල, අලුත්ගම, මග්ගොන සහ දර්ගා නගරය යන ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය පොදු පහසුකම් හා අපරවහුන පහසුකම් වර්ෂ 2025 වනවිට සංවර්ධනය කිරීම.
5. වෙරළ ඉම නාගරික ප්‍රදේශයන්ට සීමා වූ නේවාසික ජනඝනය වර්ෂ 2025 වන විට 10% කින් පහළ දැමීම.


අරමුණ 03

**ප්‍රදේශය තුළ පවතින පාරිසරික සම්පත් උපයෝගී කරගනිමින් ජනතාවට සුවපහසු නගරයක් බවට පත්කිරීම.**

පරමාර්ථ

1. තෙත් බිම් සංරක්ෂණය කිරීම සඳහා හෙක්ටයාර 88.31 ක භූමි ප්‍රදේශයක් තෙත්බිම් උද්‍යාන ලෙස වර්ෂ 2030 වනවිට සංවර්ධනය කිරීම.
2. වර්ෂ 2025 වනවිට බේරුවල ප්‍රදේශයෙහි ජලගැලීම් තුරන්කිරීම සඳහා හෙක්ටයාර 160 ක භූමි ප්‍රමාණයක විහිදුණු ස්වාභාවික ඇළ මාර්ග පද්ධතිය නවීකරණය කිරීම.
3. වර්ෂ 2022 වනවිට මුහුදු ඉම කේන්ද්‍රකොටගත් විශේෂ රක්ෂිත කලාපයක් හා ප්‍රධාන ජල මූලාශ්‍රයන් ආශ්‍රිතව රක්ෂිත කලාපයන් හඳුන්වාදීම හා පවත්වාගෙන යාම.

# 05 පරිච්ඡේදය



# SWOT විශ්ලේෂණය

## 5.1. සාරාංශගත SWOT විශ්ලේෂණය

**අරමුණ 01** *නිරිතදිග වෙරළ තීරය බහුවිධ සංචාරක පුරවරයක් බවට පත් කිරීම.*

### S

- අධ්‍යයන බලප්‍රදේශයේ දකුණු මායිමේ දෙස් විදෙස් සංචාරකයන්ගේ නොමඳ ආකර්ෂණය දිනාගත් “රන් සැතපුම” නමින් හඳුන්වන ව.කි.20 ක පමණ භූමි ප්‍රමාණයක පැතිරුණු මොරගල්ල සංචාරක කලාපය තුළ පිහිටි ප්‍රදේශයක් වීම.
- ජාත්‍යන්තරය සමඟ පවා ගණුදෙනු කරන ශ්‍රී ලංකාවේ විශාලතම මැණික් වෙළඳපොළ ලෙසින් ප්‍රකට “පත්තෙකඩේ” යන නමින් හඳුන්වන මැණික් වෙළඳපොළ චීන කොටුව ආශ්‍රිතව පිහිටා තිබීම.
- ඓතිහාසික සහ සංස්කෘතිකමය වශයෙන් වැදගත්කමක් උසුලන කළුවාමෝදර ධර්මද්වීපය, කන්දෙ විහාරය, වෙහෙරගල කන්ද, බ්‍රීෆ් උද්‍යානය, කිච්චිමලේ පල්ලිය ආදී වැදගත් ස්ථානයන් රැසක් වෙරළ ඉම ප්‍රදේශ තුළත් අභ්‍යන්තර කලාපය තුළත් පිහිටා තිබීම.
- හෙක්ටයාර 3.97 ක භූමි ප්‍රමාණයක් ආවරණය කරමින් පවතින ප්‍රාදේශීය සහ ජාතික ආර්ථිකය නංවාලීම සඳහා ප්‍රශස්ථ දායකත්වයක් සපයන ශ්‍රී ලංකාවේ ස්වභාවික වරායන්ගෙන් එකක්වන බේරුවල ධීවර වරාය පිහිටා තිබීම.
- බලප්‍රදේශය පුරා විසිරි පැතිරුණු මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ග, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ග සහ ප්‍රාදේශීය සභාව සතු මාර්ග වශයෙන් මනාව සම්බන්ධිත මාර්ග ජාලයක් පැවතීම.

### W

- මග්ගොන,බේරුවල යන ප්‍රදේශයන්හි පවතින දර්ශණීය මුහුදු තීරය අවහිරවන අයුරින් පවතින අනවසර ඉදිකිරීම්.
- බේරුවල නගරසභා බලප්‍රදේශයේ දිනකට එකතුවන කසළ ටොන් 21.4 ක පමණ ප්‍රමාණය නිසි අයුරින් කළමනාකරණය නොකර නගරසභා සීමාව ආසන්නයේ ඇති බෙරව ඇළට හා බේරුවල වරාය ප්‍රදේශයට අවිධිමත් ලෙස මුදා හැරීම.
- නාගරික සීමාව තුළ මුළු භූමි ප්‍රමාණයෙන් 9% ක පමණ භූමි ප්‍රමාණයක් ආවරණය කරමින් පිහිටා ඇති පහත්බිම් වන අක්කරගොඩ, මාගල්ලවෙල හා සිල්ලිය යන ප්‍රදේශයන්හි අවිධිමත් කසළ බැහැර කිරීම් සඳහා යොදා ගැනීම නිසා පාරිසරික සමතුලිතාවයට බලපෑමක් එල්ල වීම.
- අධ්‍යයන ප්‍රදේශයේ ගාලු පාරේ සිට ප්‍රදේශ අභ්‍යන්තරට පිවිසීමට ඇති පළාත්බද මාර්ග සංවර්ධනය අධිකාරිය සතු මාර්ගයන් අඩි 15 ක් පමණ පටු පළලකින් යුක්තවීම.

## O

- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් 2017-2020 උපායමාර්ගික සැලසුම යටතේ බේරුවල බලප්‍රදේශය සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ලෙසින් හඳුනාගෙන තිබීම.

- පුළුල් පරාසයක විහිදුණු දර්ශනීය වෙරළ තීරයකින් සහ සංචාරක හෝටල්වලින් සමන්විත බෙන්තොට සංචාරක නිකේතනය සැලසුම් බලප්‍රදේශයේ දකුණු සීමාවට වන්නට පිහිටා තිබීම.

- දක්ෂිණ ලංකා අධිවේගී මාර්ගයට ආසන්නව පිහිටා තිබීම. (දොඩන්ගොඩ අන්තර් හුවමාරුවේ සිට කිලෝමීටර 9 ක් දුරින් සහ, ලෙව්වන්දුව අන්තර් හුවමාරුවේ සිට කිලෝමීටර 12 ක් දුරින් පිහිටා තිබීම.)

- නීල ධජ (Blue Flag Certificate) අන්තර්ජාතික සහතිකය පිරිනැමීම සඳහා නිර්දේශිත කලාපයක් වන මොරගොල්ල සංචාරක කලාපය අධ්‍යයන ප්‍රදේශය තුළ පිහිටා තිබීම.

## T

- වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මඟින් සිදුකළ වෙරළ ආශ්‍රිත පර්යේෂණ ඡණ සහ සැලසුම් අංශයේ පර්යේෂණයන්ට අනුව 2025 වනවිට මුහුදු මට්ටම ඉහළ යාමෙන් සැලසුම් බලප්‍රදේශයේ යම් යම් ස්ථානයන්ට තර්ජන එල්ලවිය හැකි බව හඳුනාගෙන තිබීම.

- ස්වාභාවික ආපදාවන් වන වෙරළ ඛාදනය, ගංවතුර සහ නායයෑම් වලට ලක්විය හැකි ප්‍රදේශයක් වීම.

අරමුණ 02 *වෙරළ ඉම කේන්ද්‍රකොටගත් සංවර්ධන පීඩනය පාලනය කර ගැනීම සඳහා ප්‍රදේශය පුරා විහිදුණු තුලනාත්මක සංවර්ධනයක් ඇති කිරීම.*

## S

- අධ්‍යයන බලප්‍රදේශයේ වෙරළ ඉම ප්‍රදේශයන් සහ අභ්‍යන්තර ප්‍රදේශයන් ඒකාබද්ධ කරන්නාවූ ගාලු පාරේ සිට විහිදුණු පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ග පද්ධතියක් පැවතීම.
- අධ්‍යයන බලප්‍රදේශයේ ප්‍රමුඛතම සේවා සපයන ස්ථානය බේරුවල නගරසභා ප්‍රදේශය වුවත් දැනටමත් ප්‍රදේශ අභ්‍යන්තරයේ තරඟකාරී උප නගර වන අලුත්ගම සහ දර්ගා නගරය යන නගරයන් පැවතීම.
- අභ්‍යන්තර ප්‍රදේශය වෙරළ ප්‍රදේශයට සාපේක්ෂව ස්වභාවික ආපදාවන් අවම කලාපයක් වීම.
- අනාගත සංවර්ධනය සඳහා යොදාගතහැකි දියුණු නොවූ සහ අඩු ඉඩම් වටිනාකමකින් යුතු ඉඩම් හෙක්ටයාර 1046.9 ක ප්‍රමාණයක් අභ්‍යන්තර ප්‍රදේශයන්හි පිහිටා තිබීම.
- ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පවතින ඇතැම් මංසන්ධි දැනටමත් සේවා සපයන කුඩා මධ්‍යස්ථාන ලෙස වර්ධනය වීම දක්නට ලැබීම.

## W

- ගාලු පාරේ සිට අභ්‍යන්තර ප්‍රදේශයන්ට විහිදුනු මාර්ග ජාලයක් පැවතියද එම මාර්ගයන් බොහොමයක් ප්‍රතිසංස්කරණය නොකළ සහ ප්‍රමාණවත් පළලක් නොමැති මාර්ගයන් වීම.
- ප්‍රදේශය අභ්‍යන්තරයේ හෙක්ටයාර 1430 ක පමණ භූමි ප්‍රමාණයක විසිරුණු කුඹුරු ඉඩම් හා ඒ ආශ්‍රිත පහත්බිම් යන පාරිසරික සමතුලිතතාවය පවත්වාගැනීමට ඉවහල්වන පාරිසරික සංවේදී කලාපයන් පැවතීම.

## O

- 2002 වසරේ සකසන ලද බස්නාහිර පළාත් භෞතික ව්‍යුහ සැලැස්මට අනුව අලුත්ගම හා දර්ගා යන නගර උප නාගරික මධ්‍යස්ථාන ලෙසින් හඳුනාගෙන සංවර්ධනය කිරීමට යෝජිතව තිබීම.

## T

- බණ්ඩාරගම, හොරණ, මතුගම ආදී සැලසුම් බලප්‍රදේශයට පරිබාහිරව පිහිටි භෞතික හා පාරිසරික අතින් දියුණු පහසුකම් සහිත නගර අධ්‍යයන බලප්‍රදේශය ආසන්නයේ පැවතිම.

## අරමුණ 03 *ප්‍රදේශය තුළ පවතින පාරිසරික සම්පත් උපයෝගී කරගනිමින් ජනතාවට සුවපහසු නගරයක් බවට පත්කිරීම.*

### S

- සැලසුම් බලප්‍රදේශයේ බටහිර මායිම දර්ශනීය වෙරළ තීරයකින් ද, දකුණු මායිම බෙන්තර ගඟ ආශ්‍රිත පාරිසරික වශයෙන් වැදගත් ප්‍රදේශයකින් ද මායිම් වී තිබීම.
- දේශගුණික වශයෙන් සෞම්‍ය දේශගුණයක් ඇති පහතරට තෙත් කලාපයට අයත් ප්‍රදේශයක් වීම.
- සැලසුම් බලප්‍රදේශය තුළ තෙත් බිම් කුඹුරු හා පුරන් කුඹුරු ලෙස හෙක්ටයාර 1581.98 ක පමණ භූමි ප්‍රමාණයක් උද්‍යාන ලෙසින් සංවර්ධනය කිරීම සඳහා අවකාශය තිබීම.

### W

- සැලසුම් බලප්‍රදේශය මුහුදු මට්ටමට සාපේක්ෂව පහත් බිමක පිහිටීම නිසා මුහුදු ජලය ප්‍රදේශ අභ්‍යන්තරයට ගලා ඒමක් දක්නට ලැබීම. මෙය අනාගත සංවර්ධන ඉලක්කයන් කරා ළඟා වීමේදී පාරිසරික වශයෙන් දැඩි තර්ජනයක් ඇති කිරීමට හේතු වේ.
- ගංගා රක්ෂිතයන් සහ ඇළ රක්ෂිතයන් අවිධිමත් නේවාසික භාවිතයන් සඳහා යොදා ගැනීම.
- 177, 410 ක් පමණ වන වත්මන් ජනගහනයට සරිලන පරිදි පොදු හා විනෝද කටයුතු සඳහා ප්‍රමාණවත් ඉඩකඩ වෙන් නොවී තිබීම.

## O

- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතිය හරහා තාක්ෂණික හා මුල්‍යමය ආධාර ලබාදීම.

## T

- වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මඟින් සිදුකල වෙරළ ආශ්‍රිත පර්යේෂණ සහ සැලසුම් අංශයේ පර්යේෂණයන්ට අනුව 2025 වනවිට මුහුදු මට්ටම ඉහළ යාමෙන් සැලසුම් බලප්‍රදේශයේ යම් යම් ස්ථානයන්ට තර්ජන එල්ලවිය හැකි බව හඳුනාගෙන තිබීම.

- ස්වාභාවික ආපදාවන් වන වෙරළ ඛාදනය, ගංවතුර සහ නායයෑම් වලට ලක්වියහැකි ප්‍රදේශයක් වීම.

# 5.2. විස්තරාත්මක SWOT විශ්ලේෂණය

## අරමුණ 01

*නිරිතදිග වෙරළ තීරය බහුවිධ සංචාරක පුරවරයක් බවට පත් කිරීම.*

### ශක්තීන් | අරමුණ 01

1. *අධ්‍යයන බලප්‍රදේශයේ දකුණු මායිමේ දෙස් විදෙස් සංචාරකයන්ගේ නොමඳ ආකර්ෂණය දිනාගත් "රන් සැතපුම " නමින් හඳුන්වන ව.කි.මී. 20 ක පමණ භූමි ප්‍රමාණයක පැතිරුණු මොරගල්ල සංචාරක කලාපය තුළ පිහිටි ප්‍රදේශයක් වීම.*


සංවර්ධන බලප්‍රදේශයේ දකුණු මායිමේ පිහිටා ඇති මොරගල්ල වෙරළ තීරය දෙස් විදෙස් සංචාරක-යකයන්ගේ නොමඳ ආකර්ශනය දිනා ඇති අතර, "රන් සැතපුම" ලෙසින් සංචාරකයන් අතර ප්‍රචලිතව ඇත. රූපය 5.1 මඟින් දැක්වෙන්නේ මෙම සංචාරක කලාපය ආශ්‍රිත ප්‍රදේශයෙහි වර්තමාන තත්ත්වයයි.

මෙම සංචාරක කලාපය රන් පැහැයෙන් යුතු ආකර්ශනීය වෙරළ තීරයකින් (ව.කි. 20 ක් පමණ) සහ ජෛව විද්‍යාත්මක වශයෙන් වැදගත් වූ බෙන්තර ගඟින් සීමාවී තිබීම, සංචාරකයන්ගේ ආකර්ශනය මෙම පුරවරය දෙසට ලබාගැනීම සඳහා අවකාශය සලසා දෙයි. (වාර්ෂිකව විදේශීය සංචාරකයන් 53,067 ක් සහ දේශීය සංචාරකයන් 50,000 ක් පමණ ප්‍රමාණයක් ආකර්ශනය වේ.)

එසේම පැමිණෙන සංචාරකයන්ගේ විනෝදාස්වාදය සඳහා සහ නවාතැන් පහසුකම් වල අවශ්‍යතාව සපුරාලීම සඳහා, .

- *සංචාරක අවන්හල්*
- *සංචාරක ජල ක්‍රීඩා (ජලාශ්‍රිත ස්කූටර්, බෝට්ටු ආදිය)*
- *සුළඟ ආධාරයෙන් කරනු ලබන ක්‍රීඩා*
- *ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම සහ කොරල් පර නැරඹීම සඳහා කිමිදීම*

ආදී පහසුකම් වලින් සමන්විත සංචාරක ආකර්ශනය නොමඳව පවතින සංචාරක ක්‍රියාකාරකම් වැඩි වශයෙන් ඒකාරාශී වූ ස්ථානයක් ලෙස ද මොරගල්ල ප්‍රදේශය හැඳින්විය හැකිය.




*1. මොරගල්ල ආශ්‍රිත සංචාරක ක්‍රියාකාරකම් | 2. බාබේරියන් දූපත හා ප්‍රදීපාගාරය | 3. බාබේරියන් කොරල් පරය*
*4. ස්වභාවික කඩොලාන පද්ධතිය | 5."රන් සැතපුම" නමින් හඳුන්වන මොරගල්ල වෙරළ තීරය | 6.මොරගල්ල සංචාරක කලාපය*

*රූපය 5.1 : මොරගල්ල ආශ්‍රිත සංචාරක කලාපය*
*මූලාශ්‍රය : Cinnamon Bey Beruwala වෙබ් අඩවිය - 2018*

## 2. *ජාත්‍යන්තරය සමඟ පවා ගණුදෙනු කරන ශ්‍රී ලංකාවේ විශාලතම මැණික් වෙළඳපොළ ලෙසින් ප්‍රකට "පත්තෙකඩේ" යන නමින් හඳුන්වන මැණික් වෙළඳපොළ චීන කොටුව ආශ්‍රිතව පිහිටා තිබීම.*

මෙම මැණික් වෙළඳපොල ශ්‍රී ලංකාවේ විශාලතම මැණික් වෙළඳපොළ ලෙසින් ප්‍රකටව පවතින අතර "පත්තෙකඩේ" යන නමින් ද හැඳින්වේ. වෙළඳපොළ සඳහා මාසිකව 20,000 ක පමණ වෙළඳුන් සංඛ්‍යාවක් පැමිණේ. අරාබි ජාතිකයන්ගේ පැමිණීමත් සමඟ මෙම මැණික් වෙළඳාමේ ආරම්භය සිදුවී ඇති අතර, වර්තමානයේදී මෙය මහා පරිමාණයෙන් සිදුවන ව්‍යාපාරයක් බවට පරිවර්තනය වී ඇත. රූපය 3.14 හා 3.15 මඟින් දැක්වෙන්නේ මෙසේ විකාශනය වූ චීන කොටුව මැණික් වෙළඳපොළෙහි අතීත හා වර්තමාන තත්ත්වයයි.

චීන කොටුව මැණික් වෙළඳපොළෙන් මැණික් මිලදී ගන්නා රටවල් ලෙසින් මැඩගස්කරය, ටැන්සානියාව, ඉන්දියාව සහ මොසැම්බික් යන රටවල් ප්‍රසිද්ධියක් උසුලන අතර ප්‍රංශය, ඇමරිකාව, එංගලන්තය සහ ඉන්දියාව යන රටවල් විකුණන රටවල් ලෙසින් ප්‍රසිද්ධියක් උසුලයි. මේ අයුරින් සංවර්ධන සැලසුම් බලප්‍රදේශයේ මැණික් වෙළඳපොළ ජාත්‍යන්තරය සමඟ පවත්වන සම්බන්ධතාවය, සැලසුම් බලප්‍රදේශය බහුවිධ සංචාරක ගමනාන්තයක් බවට පත්කරලීමට අවකාශය උදා කර දෙයි.

## 3. *ඓතිහාසික සහ සංස්කෘතිකමය වශයෙන් වැදගත්කමක් උසුලන කළුවාමෝදර ධර්මද්වීපය, කන්දෙ විහාරය, වෙහෙරගල කන්ද, බ්‍රීෆ් උද්‍යානය, කිච්චිමලේ පල්ලිය ආදී වැදගත් ස්ථානයන් රැසක් වෙරළ ඉම ප්‍රදේශ තුළත් අභ්‍යන්තර කලාපය තුළත් පිහිටා තිබීම.*

බේරුවල ප්‍රදේශය බහුවිධ සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීමේදී දැනටමත් වෙරළ ඉම කේන්ද්‍ර කොටගත් හා අභ්‍යන්තර ප්‍රදේශයන්හි පිහිටි ඓතිහාසික හා සංස්කෘතිකමය වශයෙන් වැදගත් කමක් උසුලන ස්ථාන සංචාරක ආකර්ෂණය දිනාගත් ස්ථාන බවට පත් වෙමින් පවතී. සැලසුම් බලප්‍රදේශය තුළ පිහිටා ඇති ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන ලෙස අලුත්ගම කන්දෙ විහාරය, වෙහෙරගල රජමහා විහාරය, මහාදෙනිය පුරාණ විහාරය, ශාන්ත වින්සෙන්ට් පල්ලිය සහ කල්වාරිය, මග්ගොන ශාන්ත ජෝසප් කතෝලික සිද්ධස්ථානය යනාදියත් සංස්කෘතිකමය වශයෙන් වැදගත් ස්ථාන ලෙස බ්‍රීෆ් උද්‍යානය, සාම්ප්‍රදායික මීරා කර්මාන්තය සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් හැඳින්විය හැකිය. එවැනි වැදගත්කමක් ඇති ස්ථාන පිහිටා තිබීම අනාගතයේදී සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා ප්‍රදේශය තුළ පවත්නා ප්‍රබල විභවතාවයක් ලෙස හැඳින්විය හැකිය. සිතියම 5.1 මඟින් දැක්වෙන්නේ මෙසේ සැලසුම් බලප්‍රදේශය තුළ පවතින කොට්ඨාසයේ සංචාරක කර්මාන්තය සඳහා විභවතාවයක් පවතින ස්වභාවික හා ඓතිහාසික ස්ථාන.




**සංචාරක කර්මාන්තය සඳහා විභවතාවයක් පවතින ස්වභාවික හා ඓතිහාසික ස්ථාන**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 0.35 0.7 1.4 2.1 2.8 කි.මී

නාගරික සංවර්ධන අධිකාරිය
සැප්තැම්බර් 2018

බස්නාහිර පළාත් අංශය | බේරුවල සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

*සිතියම 5.1 : බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංචාරක කර්මාන්තය සඳහා විභවතාවයක් පවතින ස්වභාවික හා ඓතිහාසික ස්ථාන*

### 4. *හෙක්ටයාර් 3.97 ක භූමි ප්‍රමාණයක් ආවරණය කරමින් පවතින ප්‍රාදේශීය සහ ජාතික ආර්ථිකය නංවාලීම සඳහා ප්‍රශස්ථ දායකත්වයක් සපයන ශ්‍රී ලංකාවේ ස්වභාවික වරායන්ගෙන් එකක්වන බේරුවල ධීවර වරාය පිහිටා තිබීම.*

රූපය 5.2 හි දැක්වෙන පරිදි අධ්‍යයන ප්‍රදේශයේ හෙක්ටයාර් 3.97 ක පමණ භූමි ප්‍රමාණයක් ආවරණය කරමින් පවතින බේරුවල ධීවර වරාය ශ්‍රී ලංකාවේ ස්වභාවික ධීවර වරායන්ගෙන් එකක් ලෙස ප්‍රසිද්ධියක් උසුලයි. එමෙන්ම මෙම ධීවර වරායෙහි නිෂ්පාදිතයන්ගෙන් ප්‍රාදේශීය සහ ජාතික ආර්ථිකය නංවාලීම සඳහා සැලකිය යුතු දායකත්වයක් සපයයි. මෙම ස්වභාවික ධීවර වරාය සතුව ශීතාගාර පහසුකම්, නැංගුරම් පහසුකම් සහ ධීවර බෝට්ටු පවතී. එයද ධීවර නිෂ්පාදිතයන් ඉහළ නැංවීම සඳහා ප්‍රශස්ථ දායකත්වයක් සපයයි.

එමෙන්ම බේරුවල ධීවර වරාය ආශ්‍රිතව ඇති බේරුවල කලපුව, බාබේරියන් දූපත සහ ප්‍රදීපාගාරය යන ස්ථානයන් ද බේරුවල ධීවර වරාය දෙසට ඇති ආකර්ශනය ඉහළ නැංවීම සඳහා ඉවහල් වේ.



*රූපය 5.2 : බේරුවල ධීවර වරාය හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්*
*මූලාශ්‍රය : google earth map – 2018, Sri Lanka Finder වෙබ් අඩවිය,2017*


### 5. *බලප්‍රදේශය පුරා විසිරී පැතිරුණු මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ග, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ග සහ ප්‍රාදේශීය සභාව සතු මාර්ග වශයෙන් මනාව සම්බන්ධිත මාර්ග ජාලයක් පැවතීම.*

සිතියම 5.2 මඟින් දැක්වෙන පරිදි මනා ලෙස සම්බන්ධිත මාර්ග ජාලයක් හා දුම්රිය ස්ථාන 6 කින් (පයාගල උතුර, පයාගල දකුණ, මග්ගොන, බේරුවල, හෙට්ටිමුල්ල, අලුත්ගම) සමන්විත දුම්රිය මාර්ගයන් තිබීම ප්‍රදේශය සතු ප්‍රබල විභවතාවයක් ලෙස හැඳින්විය හැකිය. මෙම සැලසුම් බල ප්‍රදේශය තුළ, මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් පාලනය වන මාර්ගයන් ලෙස කොළඹ-ගාල්ල මාර්ගය, හොරණ-අඟුරුවාතොට මාර්ගය හා අළුත්ගම මාර්ගය දැක්විය හැකිය. මේ අතර ගාල්ල හා කොළඹ "A" මාර්ගය ඉන් ප්‍රධාන තැනක් ගනී. එම මාර්ගයන්ගේ මුළු දිග ප්‍රමාණය කි.මී. 14.08 පමණ ක් වේ.

පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් පාලනය වන මාර්ගයන් පහත පරිදි වේ. එම මාර්ගයන්ගේ මුළු දිග ප්‍රමාණය කි.මී. 50 ක් පමණ වේ.

- *කංකානම්ගොඩ-කීරන්තිඩිය මාර්ගය*
- *අළුත්ගම්වීදිය-යටදොළවත්ත මාර්ගය*
- *බේරුවල අලුත්ගම වීදිය*
- *කලුවාමෝදර – කාලවිල මාර්ගය*
- *මග්ගොන – මුංහේන මාර්ගය*
- *පයාගල – නවුත්තුඩුව මාර්ගය*
- *පයාගල – මදිනකන්ද මාර්ගය*
- *පයාගල – කච්චගොඩ මාර්ගය*
- *පයාගල උතුර දුම්රියපොළ මාර්ගය*
- *ශාන්ත වින්සන් මාර්ගය*
- *වවුලුගල ස්කාගාර සංස්ථා පිවිසුම් මාර්ගය*
- *පයාගල – මලේගොඩ මාර්ගය යනාදිය හැඳින්විය හැකිය.*

මීට අමතරව බේරුවල නගර සභාව හා ප්‍රාදේශීය සභාව සතු මාර්ග ජාලයක් ද සමස්ථ සැලසුම් බලප්‍රදේශය පුරාම විහිදී ඇත. මෙසේ ජාලගත මාර්ග පද්ධතියක් පැවතීම සංචාරක, කෘෂිකර්මාන්තය, ධිවර හා මැණික් යන බහුවිධ ආර්ථිකයන් එකිනෙකට සම්බන්ධ කිරීමට උපයෝගී වේ.




*සිතියම 5.2 : බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පුරා විහිදී ඇති මාර්ග පද්ධතිය*

## දුර්වලතා | අරමුණ 01

### 1. මග්ගොන, බේරුවල යන ප්‍රදේශයන්හි පවතින දර්ශනීය මුහුදු තීරය අවහිරවන අයුරින් පවතින අනවසර ඉදිකිරීම්.

පයාගල සිට මග්ගොන දක්වාත් මග්ගොන සිට බේරුවල දක්වාත් මුහුදු තීරයන් වර්තමානය වනවිට සිදුකෙරෙන අනවසර ඉදිකිරීම් හා විශාල ප්‍රමාණයේ පෝස්ටර් හා බැනර් ප්‍රදර්ශනය හේතුවෙන් වෙරළ ඉම දර්ශනය සඳහා බාධාවන් එල්ල වී ඇත.. එය ප්‍රදේශයේ සංචාරක ආකර්ෂණය හීන වීම සඳහා බලපානු ලබයි. රූපය 3.6 මඟින් දැක්වූයේ මෙසේ අනවසර ඉදිකිරීම් හේතුවෙන් මුහුදු දර්ශනය ආවරණය වී ඇති ප්‍රදේශයන්ය.

### 2. බේරුවල නගරසභා බලප්‍රදේශයේ දිනකට එකතුවන කසළ ටොන් 21.4 ක පමණ ප්‍රමාණය නිසි අයුරින් කළමනාකරණය නොකර නගරසභා සීමාව ආසන්නයේ ඇති බෙරව ඇළට හා බේරුවල වරාය ප්‍රදේශයට අවිධිමත් ලෙස මුදා හැරීම.


වගුව 5.1 හි දැක්වෙන පරිදි වර්තමානයේ බේරුවල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ දිනකට කසළ ටොන් 24 ක් ද, නගර සභා බලප්‍රදේශයේ දිනකට කසළ ටොන් 21.4 ක් ද ලෙස සමස්ථ බලප්‍රදේශය තුළ ටොන් 45ක කසළ ප්‍රමාණයක් එකතු වේ.

| බලප්‍රදේශය | දිනකට එකතුවන මුළු කසළ ප්‍රමාණය (ටොන්) | කාබනික (%) | කඩදාසි (%) | වීදුරු (%) | ලෝහ (%) | පොලිතීන් සහ වෙනත් (%) |
|---|---|---|---|---|---|---|
| ප්‍රාදේශීය සභා බලප්‍රදේශය | 24 | 75 | 10 | 5 | 5 | 5 |
| නගර සභා බලප්‍රදේශය | 21.4 | 43.7 | 1.8 | 1.4 | 3.2 | 49.9 |

වගුව 5.1 : බේරුවල සැලසුම් බලප්‍රදේශය තුළ දිනකට එකතුවන කසළ වර්ගීකරණය 2017
මූලාශ්‍රය : බේරුවල ප්‍රාදේශීය සභාව සහ බේරුවල නගර සභාව 2017

බේරුවල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ එකතුවන කැලි කසළ දිරන සහ නොදිරන ලෙස වෙන් කිරීමත්, දැනට පාදාගොඩ පවතින කසළ අංගනය මඟින් දිරන කසළ සෑම දිනකම කොම්පෝස්ට් පොහොර බවට පරිවර්තනය කිරීමත් සිදු කරනු ලබයි. නමුත් බේරුවල නගර සභා බලප්‍රදේශය තුළ පවතින කැලි කසළ නිසි අයුරින් කළමනාකරණය වීමක් දැනට දක්නට නොලැබේ.

මේ හේතුවෙන් බේරුවල නගර සභා සීමාව ආසන්නයේ ඇති බෙරව ඇළ තුළට සහ වෙන්නිම්රාජපුර ඇළට කැලි කසළ මුදාහැරීම ප්‍රබලව දක්නට ලැබේ (රූපය 5.3). මෙම තත්ත්වය හේතුකොට ගෙන බේරුවල ධීවර වරාය ආශ්‍රිතව කුණු තැන්පත්වීමත් වැසි තත්ත්වයන්හිදී ජලයෙන් යටවීමත් හඳුනාගත හැකිය. එය ප්‍රදේශයේ සංචාරක ආකර්ෂණය දිනාගැනීමට බාධා පමුණුවයි.



රූපය 5.3 : අවිධිමත් ලෙස කැලි කසළ මුදා හැරීම නිසා සිදුවී ඇති පාරිසරික හානීන්
මූලාශ්‍රය : ඡායාරූප ගත කිරීම - බේරුවල සැලසුම් කණ්ඩායම, නාගරික සංවර්ධන අධිකාරිය - 2018.05.26

### 3. නාගරික සීමාව තුළ මුළු භූමි ප්‍රමාණයෙන් 9% ක පමණ භූමි ප්‍රමාණයක් ආවරණය කරමින් පිහිටා ඇති පහත්බිම් වන අක්කරගොඩ, මාගල්ලවෙල හා සිල්ලිය යන ප්‍රදේශයන්හි අවිධිමත් කසළ බැහැර කිරීම් සඳහා යොදා ගැනීම නිසා පාරිසරික සමතුලිතාවයට බලපෑමක් එල්ල වීම.

නාගරික සීමාව තුළ මුළු භූමි ප්‍රමාණයෙන් 9% ක පමණ භූමි ප්‍රමාණයක් ආවරණය කරමින් පිහිටා ඇති පහත්බිම් වන අක්කරගොඩ, මාගල්ලවෙල හා සිල්ලිය යන ප්‍රදේශයන්හි මෙලෙස අවිධිමත් කසළ බැහැර කිරීම් සඳහා යොදා ගැනීම හඳුනාගත හැකිය. උදාහරණයක් ලෙස, වෙත්තිමරාජපුර පහත්බිම දැක්විය හැකිය. එම පහත් බිමෙහි විශාල ජෛව විවිධත්වයන් දක්නට නොලැබුන ද, තෙත්බිම් ප්‍රදේශයෙහි වැවෙන ශාක දක්නට ලැබේ. කැලි කසළ විධිමත් සැලැස්මකින් තොරව බැහැරකරලීම සඳහා පහත් බිම් භාවිතා කිරීම ප්‍රධාන පාරිසරික ගැටළුවක් බවට පත්ව ඇති අතර ඒ හේතුවෙන් වෙත්තිමරාජපුර ප්‍රදේශය ඉතා සුළු වර්ෂාවකදී වුවද ගංවතුර තර්ජනයට මුහුණ දෙයි. සංචාරක ආකර්ෂණය දිනා ගත හැකි උක්ත ස්ථානයන් අවිධිමත් කසළ බැහැර කිරීම් හේතුවෙන් විනාශ වී යාම බරපතල ගැටලුවකි. රූපය 5.4 මඟින් දැක්වෙන්නේ එසේ කැලි කසළ බැහැර කිරීමෙන් විනාශයට පත්ව ඇති වෙත්තිමරාජපුර පහත්බිමයි.

### 4. අධ්‍යයන ප්‍රදේශයේ ගාලු පාරේ සිට ප්‍රදේශ අභ්‍යන්තරට පිවිසීමට ඇති පළාත්බද මාර්ග




රූපය 5.4 : කැලි කසළ බැහැරකිරීමෙන් විනාශයට පත්ව ඇති වෙත්තිමරාජපුර තෙත්බිම
මූලාශ්‍රය : ඡායාරූප ගත කිරීම - බේරුවල සැලසුම් කණ්ඩායම, නාගරික සංවර්ධන අධිකාරිය - 2018.01.25

*සංවර්ධනය අධිකාරිය සතු මාර්ගයන් අඩි 15 ක් පමණ පටු පළලකින් යුක්තවීම.*

ප්‍රදේශය පුරා විහිදුණු මාර්ග පද්ධතියක් පැවතිය ද ගාලුපාරේ සිට අභ්‍යන්තරයට පිවිසීමට ඇති පළාත්බද මාර්ග සංවර්ධනය අධිකාරිය සතු මාර්ග පද්ධතිය පටුවීම නිසා සැලසුම් බලප්‍රදේශයේ අභ්‍යන්තර ප්‍රදේශයන්ට ප්‍රවේශ වීම අපහසු වී ඇත.

පහත වගුව 5.2 මඟින් දැක්වෙන්නේ වර්තමානයේ අභ්‍යන්තරය හා සම්බන්ධ මාර්ග ජාලය හා එම මාර්ගයන්හි පළල යි.

| මාර්ගයේ නම | මාර්ගයේ හිමිකාරීත්වය | පළල (මීටර්) |
|---|---|---|
| කංකානම්ගොඩ - කීරන්තිඩිය මාර්ගය | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය | 5 |
| අලුත්ගම්වීදිය - යටදොලවත්ත මාර්ගය | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය | 5 |
| බේරුවල - අලුත්ගම්වීදිය මාර්ගය | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය | 5 |
| කළුවාමෝදර - කාලවිල මාර්ගය | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය | 5 |
| මග්ගොන - මුංහේන මාර්ගය | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය | 5 |
| පයාගල - නාගහදූව මාර්ගය | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය | 5 |
| පයාගල - නවුත්තුඩුව මාර්ගය | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය | 5 |
| පයාගල - මදීනාකන්ද මාර්ගය | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය | 5 |
| පයාගල - කච්චගොඩ මාර්ගය | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය | 5 |
| පයාගල උතුරු දුම්රියපොල මාර්ගය | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය | 5 |
| ශාන්ත වින්සන් මාර්ගය | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය | 5 |
| වවුළුගල ස්කාගාර සංස්ථා පිවිසුම් මාර්ගය | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය | 5 |
| පයාගල - මලේගොඩ මාර්ගය | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය | 5 |

*වගුව 5.2 : බේරුවල ප්‍රදේශයේ වර්තමාන මාර්ග ජාලය හා එම මාර්ගයන්හි පළල*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

## අවස්ථා | අරමුණ 01

1. *ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් 2017-2020 උපායමාර්ගික සැලසුම යටතේ බේරුවල බලප්‍රදේශය සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ලෙසින් හඳුනාගෙන තිබීම.*

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ දත්ත විශ්ලේෂණයන්ට අනුව හඳුනාගත් සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ලෙස, හික්කඩුව, බෙන්තොට, උණවටුන, ගල්කිස්ස, පින්නවල, මීගමුව, බේරුවල යනාදිය දැක්විය හැකිය. මෙහිදී එම අධිකාරිය මඟින් මෙම සංචාරක ප්‍රදේශයන්ට ජාත්‍යන්තර සංචාරක ආයතන සපයාදීමත්, එම ප්‍රදේශයන් සංචාරක ගමනාන්තයන් බවට පත්කිරීමත් අරමුණු කරයි. ඒ අනුව මෙය බේරුවල අධ්‍යයන බලප්‍රදේශය සංචාරක ගමනාන්තයක් බවට පත්කිරීම උදෙසා දැවැන්ත අවකාශයක් සපයයි.

රූපය 3.12 හා රූපය 3.13 දැක්වෙන පරිදි, සංචාරක සංවර්ධන අධිකාරිය විසින් බේරුවල ප්‍රදේශය ප්‍රධාන සංචාරක ගමනාන්තයක් ලෙසත්,යෝජිත සංචාරක ගමනාන්තයක් ලෙසත් හඳුනා ගෙන ඇත.

2. *පුළුල් පරාසයක විහිදුණු දර්ශනීය වෙරළ තීරයකින් සහ සංචාරක හෝටල්වලින් සමන්විත බෙන්තොට සංචාරක නිකේතනය සැලසුම් බලප්‍රදේශයේ දකුණු සීමාවට වන්නට පිහිටා තිබීම.*

බෙන්තොට වෙරළ තීරය කොළඹ සිට කි.මී.62 ක් පමණ දකුණු දෙසට වන්නට පිහිටා ඇති අතර එය සැලසුම් කරන ලද සංචාරක ප්‍රදේශයක් ද වේ. බෙන්තොට, පුළුල් පරාසයක විහිදුනු දර්ශනීය වෙරළ තීරයකින් සහ සංචාරක හෝටල්වලින් සමන්විත වේ. බේරුවල හා බෙන්තොට බෙන්තර ගඟ මඟින් සම්බන්ධවීම හේතුවෙන් බෙන්තරට පැමිණෙන සංචාරකයින්ගේ ආකර්ෂණය මොරගල්ල ප්‍රදේශයටද නිතැතින්ම යොමුවේ.

3. *දක්ෂිණ ලංකා අධිවේගී මාර්ගයට ආසන්නව පිහිටා තිබීම.
(දොඩන්ගොඩ අන්තර් හුවමාරුවේ සිට කිලෝමීටර 9 ක් දුරින් සහ, ලෙව්වන්දුව අන්තර් හුවමාරුවේ සිට කිලෝමීටර 12 ක් දුරින් පිහිටා තිබීම.)*

සැලසුම් බලප්‍රදේශයේ දක්ෂිණ ලංකා අධිවේගී මාර්ගයට ආසන්නව පිහිටා ඇති මාර්ගයන් ලෙස,

- *B157 හොරණ – අගුරුවාතොට – මතුගම පාර*
- *පයාගල – මලේගොඩ – දොඩංගොඩ පාර*
- පයාගල – නාගහදූව පාර

දැක්විය හැකිය.

එයද සැලසුම් බලප්‍රදේශය බහුවිධ සංචාරක ගමනාන්තයක් බවට පත්කරලීම සඳහා වන ප්‍රබලතම අවස්ථාවක් වේ.

### 4. *නීල ධජ (Blue Flag Certificate) අන්තර්ජාතික සහතිකය පිරිනැමීම සඳහා නිර්දේශිත කලාපයක් වන මොරගල්ල සංචාරක කලාපය අධ්‍යයන ප්‍රදේශය තුළ පිහිටා තිබීම.*

කළුතර දිස්ත්‍රික්කයේ දකුණු මායිමේ පිහිටා ඇති මොරගල්ල වෙරළ තීරය දෙස් විදෙස් සංචාරක ආකර්ෂණය දිනා ගත් වෙරළ කලාපයක් ලෙස ප්‍රචලිතය. පාරිසරික අධ්‍යාපන පදනම (Foundation for Environmental Education) නැමැති ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානය මඟින් පාරිසරික, සමාජයීය හා ගුණාත්මක තත්ත්වය ආදී නිර්නායකයන් 29 ක් පදනම් කරගනිමින් නිල ධජ (Blue Flag Certificate) අන්තර්ජාතික සහතිකය පිරිනමනු ලැබේ. ඒ සඳහා මොරගල්ල සංචාරක කලාපය නිර්දේශ වී ඇත. මේ තුළින් ජාත්‍යන්තර අගය කිරීමක් මෙම වෙරළ තිරයට ලැබෙන බැවින් අනාගත සංචාරක ආකර්ෂණය මේ කෙරෙහි යොමු වීම ප්‍රදේශයක් වශයෙන් ලබා ගන්නා මහඟු අවස්ථාවක් වේ.

## තර්ජන | අරමුණ 01

### 1. *වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මඟින් සිදුකළ වෙරළ ආශ්‍රිත පර්යේෂණ සහ සැලසුම් අංශයේ පර්යේෂණයන්ට අනුව 2025 වනවිට මුහුදු මට්ටම ඉහළ යාමෙන් සැලසුම් බලප්‍රදේශයේ යම් යම් ස්ථානයන්ට තර්ජන එල්ලවිය හැකි බව හඳුනාගෙන තිබීම.*

රූපය 3.3 හා රූපය 3.4 මඟින් දැක්වූ වර්ෂ 2025 දී මුහුදු මට්ටම ඉහළ යෑමෙන් තර්ජන ඇතිවිය හැකි බව තහවුරු කර ඇති ප්‍රදේශයන් හා එම උපද්‍රවයන් ඇතිවිය හැකි මට්ටම යන දත්ත අනුව පයාගල උතුර සිට මග්ගොන දක්වා ප්‍රදේශ සුනාමි අවධානමක් සහිත ප්‍රදේශ ලෙස හඳුනාගන්නා ලදී. එමෙන්ම දර්ගා නගරයද ගංවතුර බලපෑම් ඇති ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇත. මෙසේ සැලසුම් බලප්‍රදේශය තුළ අනාගත ආපදා අවදානමක් පැවතීම සංවර්ධන ඉලක්කයන් කෙරෙහි බාධා ඇති කරයි.

### 2. *ස්වාභාවික ආපදාවන් වන වෙරළ ඛාදනය, ගංවතුර සහ නායයෑම්වලට ලක්විය හැකි ප්‍රදේශයක් වීම.*

සැලසුම් බලප්‍රදේශය තුළ ඇතිවිය හැකි ස්වාභාවික ආපදා සහිත ප්‍රදේශයන් සිතියම 5.3 මඟින් දක්වා ඇති අතර ඒ එක් එක් ස්වාභාවික ආපදා පිළිබඳව කෙටි විස්තරයක් පහත දැක්වේ.

#### *වෙරළ ඛාදනය*


ප්‍රදේශයේ බස්නාහිර මායිම මුහුදු ප්‍රදේශයක් වන අතර, කුඩා පයාගල (උතුර), කුඩා පයාගල (දකුණ) මහා පයාගල, උතුරු මහා පයාගල, මග්ගොන බටහිර, මොරගල්ල, මුල්ලපිටිය, කුඩා මාගල් කන්ද හා මරක්කලා වත්ත යන ප්‍රදේශ වෙරළ ඛාදනයට ලක්වන ප්‍රදේශ ලෙස හැඳින්විය හැක.

## *ගංවතුර*

බෙන්තර ගඟ, කළුවාමෝදර හා දුම්මල්මෝදර ඇළ ප්‍රමුඛ රට සම්බන්ධ අතුරු ඇළ මාර්ග පද්ධතියක් ප්‍රදේශය තුළින් ගලා බසින අතර, අවධිමත් ගොඩනැගිලි ඉදිකිරීම හා තෙත්බිම් ගොඩකිරීම් යන කරුණු හේතුවෙන් ස්වභාවික ජලය බැස යාමට බාධා ඇති වී තිබේ. මේ හේතුවෙන් ප්‍රදේශයේ ස්ථාන රැසක් සුළු වර්ෂාපතනයකදී වුවද ගංවතුර තර්ජනයකට ලක් වේ.

## *නාය යෑම්*

භූගෝලීය වශයෙන් ගත් කළ සැලසුම් බලප්‍රදේශය සතුව උස් කඳුවැටිවලින් තොර සම භූමිවලින් යුත් පරිසරයක් පවතින නමුත්, මුහුදු මට්ටමින් කිලෝමීටර් 02 ක් පමණ රට අභ්‍යන්තරයට යන විට මුහුදු මට්ටමේ සිට අඩි 100 – 150 ත් අතර කඳු සහිත භූමි දක්නට ලැබේ. වේරගල, කුඩා මාගල් කන්ද, මරක්කලාවත්ත සහ මුණසිංහගොඩ වැනි උස් භූමි ප්‍රදේශ සුළු නාය යෑම් ඇතිවන ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇත. සැලසුම් බලප්‍රදේශය තුළ හඳුනාගෙන ඇති උපද්‍රව තත්ත්වයන් සිතියම 5.3 මඟින් දැක්වේ.




**ස්වභාවික උපද්‍රව තත්ත්වයන්**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 0.35 0.7 1.4 2.1 2.8 කි.මී

නාගරික සංවර්ධන අධිකාරිය
ජූනි 2018

බස්නාහිර පළාත් අංශය | බේරුවල සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

*සිතියම 5.3 : බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින ස්වභාවික ආපදා සහිත ප්‍රදේශ*

## අරමුණ 02

*වෙරළ ඉම කේන්ද්‍රකොටගත් සංවර්ධන පීඩනය පාලනය කර ගැනීම සඳහා ප්‍රදේශය පුරා විහිදුණු තුලනාත්මක සංවර්ධනයක් ඇති කිරීම.*

### ශක්තීන් | අරමුණ 02

1. ***අධ්‍යයන බලප්‍රදේශයේ වෙරළ ඉම ප්‍රදේශයන් සහ අභ්‍යන්තර ප්‍රදේශයන් ඒකාබද්ධ කරන්නාවූ ගාලු පාරේ සිට විහිදුණු පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ග පද්ධතියක් පැවතීම.***

බේරුවල සැලසුම් බලප්‍රදේශයෙහි මුහුදුබඩ සීමාව කේන්ද්‍රකොටගත් ගාලු පාර දෙපස ඉහළ සංවර්ධන පීඩනයක් පවතින අතර, එම රේඛීය සංවර්ධනය අභ්‍යන්තර ප්‍රදේශය කරා ව්‍යාප්ත කිරීමට පවතින එක් ප්‍රබලතාවයක් ලෙස මෙම ප්‍රදේශය පුරා විහිදුණු මාර්ග පද්ධතියක් පැවතීම හැඳින්විය හැකිය. සිතියම 5.4 මඟින් දැක්වෙන්නේ සැලසුම් බලප්‍රදේශය තුළ පවතින වර්තමාන මාර්ග පද්ධතියයි.

ඒ අනුව ගත්කළ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග (සිතියමෙහි දැක්වෙන පළමු ප්‍රමුඛතා මාර්ග) අභ්‍යන්තර ප්‍රදේශය තුළ පිහිටා නොමැති වුවත් අභ්‍යන්තර හා වෙරළ ඉම ප්‍රදේශයන් ඒකාබද්ධ කරන පළාත්බද මාර්ග පද්ධතියක් පිහිටා ඇත. එමෙන්ම එම මාර්ග හා ජාලගත වූ සංවර්ධනයක් කිරීමට හැකියාවක් ඇති ප්‍රාදේශීය සභා මාර්ග ජාලයක් ප්‍රදේශය පුරා විහිදී ඇත. ඒ අනුව ගත්කළ නව මාර්ග ඉදිකිරීම වෙනුවට පවත්නා මාර්ගයන්හි ප්‍රතිසංස්කරණයන් හා පුළුල් කිරීම් තුළින් වෙරළ ඉම සංවර්ධනය අභ්‍යන්තර ප්‍රදේශයන් වෙතට තල්ලු කිරීමට මෙම මාර්ග පද්ධතිය උපයෝගී වේ.




*සිතියම 5.4 : බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ව්‍යාප්තව පවතින වත්මන් මාර්ග පද්ධතිය*

### 2. *අධ්‍යයන බලප්‍රදේශයේ ප්‍රමුඛතම සේවා සපයන ස්ථානය බේරුවල නගර සභා ප්‍රදේශය වුවත් දැනටමත් ප්‍රදේශ අභ්‍යන්තරයේ තරඟකාරී උප නගර වන අලුත්ගම සහ දර්ගා නගරය යන නගරයන් පැවතීම.*

සැලසුම් බලප්‍රදේශයෙහි ප්‍රධාන සේවා සපයන ස්ථානය වන්නේ බේරුවල නගර සභා ප්‍රදේශයයි. එසේ වුවද වර්තමානය වනවිට ඒ හා තරඟ කිරීමට හැකියාවක් පවතින කුඩා උප නගර හා සේවා සපයන නේවාසික ස්ථාන දියුණු වෙමින් පැවතීම වෙරළ ඉම සංවර්ධනය අනෙක් ප්‍රදේශ කරා ව්‍යාප්ත කිරීමට පවතින එක් ප්‍රබලතාවයක් ලෙස හඳුනාගත හැකිය. අලුත්ගම හා දර්ගා යන නගර මෙසේ සංවර්ධනය වෙමින් පවතින උප නගරයන්ට උදාහරණ වන අතර නේවාසික ප්‍රදේශයක් සඳහා අවශ්‍ය මූලික පහසුකම්වලින් මෙම නගර සමන්විත වේ.

සිතියම 5.5 මඟින් දැක්වෙන පරිදි අනාගත සංවර්ධනය බේරුවල නගරසභා සීමාවෙන් ඔබ්බට ගොස් අනෙක් අභ්‍යන්තර ප්‍රදේශ කරා ද ව්‍යාප්ත වීමේ ප්‍රවනතාවයක් පවතී. බේරුවල නගරයෙහි මෙන්ම මෙම උප නගර කේන්ද්‍ර කොටගෙන පුළුල් පරාසයක පැතිරුණු පෝෂක ප්‍රදේශයක් පවතී. මෙසේ අභ්‍යන්තර ප්‍රදේශයෙහි උප නගර දියුණුවීම හේතුවෙන් ජනගහනය ඒ වෙතට ආකර්ශනය වීම වෙරළ ඉම සංවර්ධන පීඩනය ලිහිල් කිරීමට ඉවහල් වන එක් ප්‍රබල මාර්ගයකි.

### 3. *අභ්‍යන්තර ප්‍රදේශය වෙරළ ප්‍රදේශයට සාපේක්ෂව ස්වභාවික ආපදාවන් අවම කලාපයක් වීම.*


සැලසුම් බලප්‍රදේශය තුළ පවතින ආපදාමය තත්ත්වයන් සිතියම් ගතකිරීමේදී වෙරළ ඉම ප්‍රදේශයට සාපේක්ෂව අභ්‍යන්තර ප්‍රදේශයෙහි ස්වාභාවික ආපදා අවම මට්ටම්මක පවතින බව පෙනීයයි. සුළු ගංවතුර තත්ත්වයක් හෝ කුඩා පස් කඳු කිහිපයක් කඩා වැටීම වැනි හානි වලට අමතරව වෙරළ ඛාදනය, සුනාමි, සුළි කුනාටු වැනි තරමක් බරපතල අනතුරුවලින් තොර වීම අභ්‍යන්තර ප්‍රදේශය කරා සංවර්ධනය ගලා ඒමට හිතකර බලපෑමක් ඇතිකරයි.

### 4. *අනාගත සංවර්ධනය සඳහා යොදාගතහැකි දියුණු නොවූ සහ අඩු ඉඩම් වටිනාකමකින් යුතු ඉඩම් අභ්‍යන්තර ප්‍රදේශයන්හි පිහිටා තිබීම.*

දැනටමත් සංවර්ධනය නොවූ විශාල ඉඩම් ප්‍රමාණයක් අභ්‍යන්තර ප්‍රදේශයෙහි පවතින අතර එය හෙක්ටයාර 10,46.9 ක් පමණ වේ. (එය මුළු භූමි ප්‍රමාණයෙන් 26% පමණ වේ.) ඉන් බොහොමයක් රබර් සහ කටුපඳුරු සහිත ඉඩම් වේ. අනාගත සංවර්ධනය අභ්‍යන්තර ප්‍රදේශය කරා ව්‍යාප්ත වීමේදී ඒ සඳහා අවශ්‍ය ඉඩකඩද අඩු වටිනාකමකින් යුත් ඉඩම් අවම ආයෝජනයක් තුළින් ඉහළ ප්‍රතිලාභයක් ලබා ගැනීමට හැකියාව ලැබේ. සිතියම 3.4 මඟින් දැක්වෙන්නේ සැලසුම් බලප්‍රදේශය තුළ පවත්නා ඉඩම් වටිනාකම වෙරළ ඉම ප්‍රදේශයට සාපේක්ෂව අභ්‍යන්තර ප්‍රදේශයේ අඩු මට්ටමක පැවතීමයි.

### 5. *ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පවතින ඇතැම් මංසන්ධි දැනටමත් සේවා සපයන කුඩා මධ්‍යස්ථාන ලෙස වර්ධනය වීම දක්නට ලැබීම.*

බේරුවල, අලුත්ගම, දර්ගා ආදී ප්‍රධාන නාගරික මධ්‍යස්ථානයන්ට අමතරව හල්කඳවිල, පොතුවිල, අඹේපිටිය, පාදාගොඩ, කාලවිල, බඳනාගොඩ, හිරිගල්ගොඩැල්ල හා මුංහේන යනාදී අභ්‍යන්තර ප්‍රදේශයෙහි වර්ධනය වෙමින් පවතින කුඩා ප්‍රමාණයේ සේවා මධ්‍යස්ථාන ජාලයක් හඳුනා ගත හැකිය. මෙසේ වර්ධනය වන සේවා ජාලයක් පැවතීම දැනටමත් සංවර්ධනයේ දිශානතිය අභ්‍යන්තර ප්‍රදේශය කරා ද ව්‍යාප්ත වීමේ ප්‍රවනතාවයක් පවතින බව හඳුනාගැනීමට ඉවහල් වේ. වගුව 5.3 මඟින් දැක්වෙන්නේ දැනට එම මංසන්ධි කේන්ද්‍රකොටගෙන ව්‍යාප්තව ඇති සේවාවන්ය.




*සිතියම 5.5 : බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංවර්ධන පීඩන විශ්ලේෂණයට අනුව හඳුනා ගන්නා ලද උප නාගරික මධ්‍යස්ථාන සහ නාගරික මධ්‍යස්ථානයන්හි පිහිටීම - 2017.*

| සේවා මධස්ථාන | වර්තමානයේ පවත්නා පහසුකම් |
|---|---|
| හල්කඳවිල | බැංකු පහසුකම්, පාරිභෝගික වෙළඳසැල්, තැපැල් කාර්යාලය, ක්‍රීඩා පිට්ටනිය, ප්‍රජා ශාලා |
| පොතුවිල | පාරිභෝගික වෙළඳ සැල්, බැංකු පහසුකම්, පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානය, තැපැල් කාර්යාලය, ක්‍රීඩා පිට්ටනිය,පාසල |
| අඹේපිටිය | පාරිභෝගික වෙළඳ සැල්, පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානය, ප්‍රජා ශාලා |
| පාදාගොඩ | පාරිභෝගික වෙළඳ සැල්, බැංකු පහසුකම්, පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානය, පාසල, ක්‍රීඩා පිට්ටනිය, ප්‍රජා ශාලා |
| මුංහේන | බැංකු පහසුකම්, තැපැල් කාර්යාලය, ක්‍රීඩා පිට්ටනිය, පාරිභෝගික වෙළඳසැල්,පාසල |
| කාලවිල | බැංකු පහසුකම්, තැපැල් කාර්යාලය, පාරිභෝගික වෙළඳ සැල්, ප්‍රජා ශාලා, පාසල |
| බඳනාගොඩ | වෛද්‍ය මධ්‍යස්ථානය, තැපැල් කාර්යාලය, ක්‍රීඩා පිට්ටනිය,පාසල |
| හිරිගල්ගොඩැල්ල | පාසල, ප්‍රජා ශාලා, පාරිභෝගික වෙළඳ සැල්, ක්‍රීඩා පිට්ටනිය, තැපැල් කාර්යාලය |

වගුව 5.3 : සේවා මධ්‍යස්ථානයන්හි වර්තමානය වනවිට පවත්නා පහසුකම්
මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය (2018)

## දුර්වලතා | අරමුණ 02

### 1. ගාලු පාරේ සිට අභ්‍යන්තර ප්‍රදේශයන්ට විහිදුනු මාර්ග ජාලයක් පැවතියද එම මාර්ගයන් බොහොමයක් ප්‍රතිසංස්කරණය නොකළ සහ ප්‍රමාණවත් මාර්ග පළලක් නොමැති මාර්ගයන් වීම.

මෙසේ සංවර්ධනය නොවූ අවිධිමත් මාර්ග පද්ධතිය හා මූලික යටිතල පහසුකම් පවා ප්‍රමාණවත් නොවීම තුළ එය වෙරළ ඉම සංවර්ධනය පහසුවෙන් අභ්‍යන්තර ප්‍රදේශ කරා මුදා හැරීමට බාධා ඇතිකරයි.

### 2. ප්‍රදේශය අභ්‍යන්තරයේ හෙක්ටයාර 1430 ක භූමි ඉඩම් ප්‍රමාණයක් පාරිසරික සංවේදී කලාපයන් ලෙස පැවතීම.

සංවර්ධන පීඩනය අභ්‍යන්තර ප්‍රදේශය කරා පැතිරීමේදී පවතින ප්‍රධානතම බාධාව වන්නේ සිතියම 3.2 මඟින් දැක්වුණු පාරිසරික සංවේදී කලාපයයි. එය ප්‍රදේශය පුරා විසිරී ඇති හෙක්ටයාර් 1,430ක් පමණ වන කුඹුරු ඉඩම් සහ ඒ ආශ්‍රිත පහත් බිම් වලින් සමන්විත පාරිසරික සමතුලිතතාවය පවත්වා ගැනීමට වැදගත් කාර්යභාරයක් ඉටුකරන තෙත් භූමි මෙම සංවේදී කලාපයට අයත් වේ. ඉන් විශාල ප්‍රමාණයක් පවතින්නේ සැලසුම් බලප්‍රදේශ අභ්‍යන්තරය කේන්ද්‍රකොට ගෙනය. අනාගත සංවර්ධනය ව්‍යාප්ත වීම හේතුකොටගෙන මෙම සංවේදී කලාපයන්ට යම් අහිතකර බලපෑමක් සිදුවීමට ඉඩකඩ පවතින අතර එතුළින් පාරිසරික පද්ධතියට හානි වූ අසමතුලිත සංවර්ධනයක් ඇති වීමට ඉඩ ඇත. එබැවින් එම කලාප ආරක්ෂා කරගනිමින් සංවර්ධන පීඩනය අභ්‍යන්තර ප්‍රදේශයට මුදාහැරීම බාධාවක් මෙන්ම අභියෝගයක්ද වේ.

## අවස්ථා | අරමුණ 02

1. *2002 වසරේ සකසන ලද බස්නාහිර පළාත් භෞතික ව්‍යුහ සැලැස්මට අනුව අලුත්ගම හා දර්ගා යන නගර උප නාගරික මධ්‍යස්ථාන ලෙසින් හඳුනාගෙන සංවර්ධනය කිරීමට යෝජිතව තිබීම.*

දැනට පවත්නා ප්‍රධාන සේවා සපයන නගරය වන්නේ බේරුවල නගරය හා බැදුණු ප්‍රාදේශීය සභා බලප්‍රදේශයයි. 2002 වසරේ පිළියෙළ කරන ලද බස්නාහිර පළාත් භෞතික ව්‍යුහ සැලැස්ම අනුව "අළුත්ගම" හා "දර්ගා නගරය" උප නාගරික මධ්‍යස්ථාන ලෙස හඳුනාගනිමින් එම මධ්‍යස්ථාන අනාගත සංවර්ධනය සඳහා යොදා ගැනීමට යෝජිතය. එවිට බේරුවල නගරය හා තරගකාරී නගර අභ්‍යන්තර ප්‍රදේශයට වන්නට සංවර්ධනය වීම වෙරළ ප්‍රදේශයට හා බේරුවලට සීමා වූ සංවර්ධනය අලුතින් ගොඩනැගෙන උප නාගරික මධස්ථානය කරා ව්‍යාප්ත කිරීමට කදිම අවස්ථාවක් වේ.

## තර්ජන | අරමුණ 02

1. *බණ්ඩාරගම, හොරණ, මතුගම ආදී සැලසුම් බලප්‍රදේශයට පරිබාහිරව පිහිටි භෞතික හා පාරිසරික අතින් දියුණු පහසුකම් සහිත නගර අධ්‍යයන බලප්‍රදේශය ආසන්නයේ පැවතීම.*

බණ්ඩාරගම, හොරණ, මතුගම ආදී මධ්‍යස්ථානයන් බේරුවල ප්‍රදේශය හා තරඟකාරී වැඩි ඉල්ලුමක් සහිත නේවාසික මධ්‍යස්ථාන වන අතර ඒවා සැලසුම් බලප්‍රදේශයට පරිබාහිරව පිහිටා තිබේ. භෞතික හා පාරිසරික අතින් ඉතා දියුණු පහසුකම් සහිත බණ්ඩාරගම, හොරණ ආදී ප්‍රදේශ කොළඹ නගරයට ආසන්නව පිහිටීමත්, එම නගර දක්ෂිණ අධිවේගී මාර්ග පිවිසුම් දොරටු ආසන්නයේ පිහිටීමත් යන සාධක සලකා බැලීමේදී, බේරුවලට සාපේක්ෂව උක්ත නගරයන් තුළ නේවාසික කලාප හා ඒ හා බැදුණු සේවා නගර බිහිවීමේ ප්‍රවනතාවයක් පවතී. මෙය බේරුවල ප්‍රදේශයේ අභ්‍යන්තර කලාපය දක්වා සංවර්ධනය මුදා හැරීමේදී ජනතාව ඒ සඳහා පොලඹවා ගැනීමේදී තර්ජනයක් වී ඇත.

## අරමුණ 03

*ප්‍රදේශය තුළ පවතින පාරිසරික සම්පත් උපයෝගී කරගනිමින් ජනතාවට සුවපහසු නගරයක් බවට පත්කිරීම.*

### ශක්තීන් | අරමුණ 03

1. ***සැලසුම් බලප්‍රදේශයේ බටහිර මායිම දර්ශනීය වෙරළ තීරයකින් ද දකුණු මායිම බෙන්තර ගඟ ආශ්‍රිත පාරිසරික වශයෙන් වැදගත් ප්‍රදේශයකින් මායිම් ව තිබීම.***

ප්‍රදේශය හරහා ගලා බසින ප්‍රධාන ඇළ මාර්ග වන කළුවාමෝදර සහ දුම්මල්මෝදර යන ඇළ මාර්ගයන් ආශ්‍රිතවත්, ඒවා මඟින් ඇති වී ඇති අනෙකුත් කුඩා ඇළ මාර්ග පද්ධතිය ආශ්‍රිතවත් පාරිසරික සංවේදී කලාප බිහි වී තිබේ. මීට අමතරව, ප්‍රදේශය පුරා විසිරී ඇති හෙක්ටයාර් 1,430 ක් පමණ වන කුඹුරු ඉඩම් සහ ඒ ආශ්‍රිත පහත් බිම්ද පාරිසරික සමතුලිතතාවය පවත්වා ගැනීමට වැදගත් කාර්යභාරයක් ඉටුකරන තෙත් භූමි ලෙස හැඳින්විය හැකිය.

2. ***දේශගුණික වශයෙන් සෞම්‍ය දේශගුණයක් සහිත පහතරට තෙත් කලාපයට අයත් ප්‍රදේශයක් වීම.***

ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයට අයත් බේරුවල ප්‍රදේශීය සභා බලප්‍රදේශයේ වාර්ෂික වර්ෂාපතනය මී.මී. 60 – 100 අතර පවතී. භූගෝලීය වශයෙන් ගත් කළ විශේෂිත වූ කඳු වැටිවලින් තොරවූ භූමියක් පවතින නමුත් කි.මී. 2 ක් පමණ රට අභ්‍යන්තරයට යනවිට තැනිතලා බිම් අතර තැනින් තැන මුහුදු මට්ටමේ සිට අඩි 50–100 අතර කුඩා කඳු වැටි දක්නට ලැබේ. මේ අතර වේරගලකන්ද, පිංහේනකන්ද අඩි 100–200 ත් අතර උසකින් යුක්තවන අතර, ගොඩැල්ලගෙදර කන්ද, දියලගොඩ කන්ද වැනි කඳුවැටි කීපයක්ම මෙම කලාපයේ පවතී.

3. ***සංවර්ධන බලප්‍රදේශය තුළ තෙත් බිම් කුඹුරු හා පුරන් කුඹුරු ලෙස හෙක්ටයාර 1581.98 ක භූමි ප්‍රමාණයක් උද්‍යාන ලෙසින් සංවර්ධනය කිරීම සඳහා අවකාශය තිබීම.***

බේරුවල සැලසුම් බලප්‍රදේශයේ භූමි පරිභෝජනය අනුව 49% ක් පවතිනුයේ හරිත කලාපය ලෙසින් වන අතර ඒ අතරින් වැඩි ප්‍රතිශතයක් පවතින්නේ පාරිසරික වශයෙන් සංවේදී පරිසර පද්ධතීන් ලෙසයි. මෙසේ ප්‍රදේශය පුරා විහිදී ඇති සංවේදී පාරිසරික පද්ධතිය එක් අතකින් පාරිසරික තුලනාත්මකබව පවත්වාගෙන යාමටත් අනෙක් අතින් ජනතාවට සුවපහසු නගරයක් සඳහා පොදු එළිමහන් උද්‍යාන ලෙසත් යොදා ගැනීමටත් හැකියාව ලැබේ.

## දුර්වලතා | අරමුණ 03

### 1. මුහුදු ජලය ප්‍රදේශ අභ්‍යන්තරයට ගලා ඒමක් දක්නට ලැබීම නිසා එය පාරිසරික වශයෙන් දැඩි තර්ජනයක් වීම.

සැලසුම් බලප්‍රදේශය මුහුදු මට්ටමට සාපේක්ෂව පහත් බිමක පිහිටීම නිසා මුහුදු ජලය ප්‍රදේශ අභ්‍යන්තරයට ගලාඒමක් දක්නට ලැබීම. එනිසා එම ලවණ මිශ්‍රිත ජලය මිනිස් පරිභෝජනයට සහ කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගැනීම අභියෝගයක් වී ඇත. එසේම මෙය අනාගත සංවර්ධන ඉලක්කයන් කරා ළඟා වීමේදී පාරිසරික වශයෙන් දැඩි තර්ජනයක් ඇති කිරීමට හේතු වේ.

### 2. ගංගා රක්ෂිතයන් සහ ඇළ රක්ෂිතයන් අවිධිමත් නේවාසික භාවිතයන් සඳහා යොදා ගැනීම.

දැනට පවතින මුහුදු ඉම රක්ෂිත කලාපයන් බෙන්තර ගඟ, කළුවාමෝදර හා දුම්මල්මෝදර ආදී ඇළ රක්ෂිත කලාපයනුත් ආක්‍රමණය කරමින් අනවසර නේවාසික හා ව්‍යාපාරික ගොඩනැගිලි ඉදිකිරීම තුළින් ඇළ මාර්ගයන් තුළට කුණු මුදාහැරීම හා ඉවුරු බිඳී යාම වැනි පාරිසරික ගැටළු මතුවේ. මෙය පාරිසරික සුරක්ෂිතතාවයට තර්ජයකි. පහත වගුව 5.4 මඟින් දැක්වෙන්නේ වෙරළ ඉම රක්ෂිත ප්‍රදේශයන්, බෙන්තර ගඟ රක්ෂිත ප්‍රදේශයන් තුළ අනවසර ලෙස නේවාසික හා වාණිජ භාවිතයන් සඳහා යොදාගෙන ඇති භූමි ප්‍රමාණයන්ය. රූපය 3.7 මඟින් දැක්වෙන්නේ වර්තමානය වනවිට බෙන්තර ගඟ රක්ෂිතයේ අනවසර ඉදිකිරීම් සිදුකර ඇති ආකාරයයි.

| | රක්ෂිත ප්‍රදේශ තුළ ඇති භූමි ප්‍රමාණය ( හෙක්ටයාර) | නේවාසික හා වාණිජ භාවිතයන් සඳහා යොදාගෙන ඇති භූමි ප්‍රමාණයන් ( හෙක්ටයාර) |
|---|---|---|
| බෙන්තර ගඟ රක්ෂිතය | 15.07 | 6.78 |
| වෙරළ ඉම ප්‍රදේශය | 199.14 | 73.03 |

වගුව 5.4: රක්ෂිත ප්‍රදේශයන් තුළ අනවසර ලෙස ඉදිකර ඇති නේවාසික හා වාණිජ භාවිතයන්ගේ භූමි ප්‍රමාණයන්
මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - නාගරික සංවර්ධන අධිකාරිය (2018)

### 3. 177,410 පමණ වන වත්මන් ජනගහනයට සරිලන පරිදි පොදු හා විනෝද කටයුතු සඳහා ප්‍රමාණවත් ඉඩකඩ වෙන් නොවී තිබීම.

නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් රෙගුලාසිවලට අනුව ජනගහනය පුද්ගලයන් 1000 ට හෙක්ටයාර් 1.4 අවම වශයෙන් පොදු එළිමහන් විවෘත භූමි ලෙස සංවර්ධන සැලැස්ම සැකසීමේදී වෙන්කළ යුතුය. එනමුත්, 2015 භූමි පරිභෝජන දත්ත අනුව විවෘත භූමි සඳහා වෙන් කර ඇති මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර 66.9 කි. එනම් මුළු භූමි පරිභෝජනයෙන් 0.9% කි. බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2017 වසර වනවිට ජනගහනය 177,410 ලෙස සංගණන වාර්තාවේ දක්වා ඇත. දත්ත විශ්ලේෂණයට අනුව 2030 වනවිට ජනගහනය 216,238 ක් ලෙස පුරෝකථනය කර ඇත. ඒ අනුව 2030 වර්ෂය වනවිට පොදු එළිමහන් විවෘත භූමි ලෙස හෙක්ටයාර් 302 ක් වෙන්කළ යුතුව ඇත. ඒ අනුව වර්තමාන ජනගහනයට උචිත වන අයුරින් පොදු හා විනෝද කටයුතු සඳහා ඉඩ කඩ සැලසී නොමැත.

## අවස්ථා | අරමුණ 03

1. ***ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතිය හරහා තාක්ෂණික හා මුල්‍යමය ආධාර ලබාදීම.***

ඉවතලන කැලි කසළ හැකිතාක් දුරට නැවත ප්‍රයෝජනයට ගතහැකි අයුරින් සාරවත් බවට පත්කර අවසාන බැහැරලීම සඳහා යොමුවන කොටස පමණක් ඒ සඳහා යොමු කිරීම මෙම පිළිසරු ව්‍යාපෘතියෙහි අරමුණයි. මෙම ව්‍යාපෘතිය පළාත්පාලන ආයතන ඔස්සේ ක්‍රියාත්මක කිරීම සිදුකරන අතර, බේරුවල ප්‍රදේශයට ද මේ යටතේ අවශ්‍ය ප්‍රතිපාදන යොමුකර ඇත. ඒ අනුව කුරේවත්ත ප්‍රදේශයේ අක්කර 12 ක භූමි ප්‍රදේශයක් මේ සඳහා තෝරාගෙන ඇත. දැනට අවිධිමත් ලෙස කැලි කසළ මුදාහැරෙන වෙත්තිමරාජපුර හා බෙරව ඇළ ආදී පාරිසරික සංවේදී ප්‍රදේශයන්ට සිදුවන හානිය මෙමඟින් අවම කර ගැනීමට හැකියාව ලැබේ.

## තර්ජන | අරමුණ 03

1. ***වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මඟින් සිදුකළ වෙරළ ආශ්‍රිත පර්යේෂණ සහ සැලසුම් අංශයේ පර්යේෂණයන්ට අනුව 2025 වන විට මුහුදු මට්ටම ඉහළ යාමෙන් සැලසුම් බලප්‍රදේශයේ යම් යම් ස්ථානයන්ට තර්ජන එල්ලවිය හැකි බව හඳුනාගෙන තිබීම.***

අනාගතයේදී බේරුවල ප්‍රදේශය මුහුදු ජල මට්ටම ඉහළ යාම වැනි ස්වාභාවික ආපදා හේතුවෙන් නේවාසිකයන්ට ජීවත්වීමේදී ජන ජීවිතයට තර්ජන එල්ල විය හැකි බව හඳුනාගෙන ඇත. එය ප්‍රදේශයෙහි අනාගත සංවර්ධනයට විශාල තර්ජනයකි.

2. ***ස්වාභාවික ආපදාවන් වන වෙරළ ඛාදනය, ගංවතුර සහ නායයෑම් වලට ලක්වියහැකි ප්‍රදේශයක් වීම.***

වෙරළ ඛාදනය – කුඩා පයාගල,කුඩා පයාගල(උතුර), මහ පයාගල(දකුණ), උතුරු මහ පයාගල (උතුර), මග්ගොන බටහිර, මොරගොල්ල, මුල්ලපිටිය, කුඩා මාගල් කන්ද හා මරක්කලා වත්ත ප්‍රදේශ වෙරළ ඛාදනයට ලක්වන ප්‍රදේශ ලෙස හැදින්විය හැක.

ගංවතුර – බෙන්තර ගඟ, කළුවාමෝදර හා දුම්මල්මෝදර ඇළ ප්‍රමුඛ ඊට සම්බන්ධ අතුරු ඇළ මාර්ග පද්ධතියක් ප්‍රදේශය තුළින් ගලා බසින අතර, අවධිමත් ගොඩනැගිලි ඉදිකිරීම හා තෙත්බිම් ගොඩකිරීම් යන කරුණු හේතුවෙන් ස්වභාවික ජලය බැස යාමට බාධා ඇති වී තිබේ. මේ හේතුවෙන් ප්‍රදේශයේ ස්ථාන රැසක් සුළු වර්ෂාපතනයකදී වුවද ගංවතුර තර්ජනයකට ලක් වේ.

නාය යෑම්– වේරගල, කුඩා මාගල් කන්ද, මරක්කලාවත්ත සහ මුණසිංහ වැනි උස් භූමි ප්‍රදේශ සුළු නාය යෑම් වශයෙන් ඇතිවන ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇත.

මෙවැනි ස්වභාවික ආපදා සහිත ප්‍රදේශ අනාගත සංවර්ධනයට බාධා ඇතිකරයි.

06 පරිච්ඡේදය



# සංවර්ධන සැලැස්ම

වර්ෂ 2030 ඉලක්ක කොට ගෙන බේරුවල නගර සභා බලප්‍රදේශය හා ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ඒකාබද්ධ කරමින් ඉදිරිපත් කර ඇති මෙම සැලැස්මෙහි අනාගත දැක්ම සහ අරමුණු සාක්ෂාත් කරගැනීමත් පළමු වෙළුමෙහි පළමුවන කොටස මඟින් ඉදිරිපත් කරනලද සවිස්තරාත්මක දත්ත විශ්ලේෂණය තුළින් හඳුනාගන්නා ලද ගැටළු වලට විසඳුම් සෙවීමත්, ප්‍රදේශයේ සංවර්ධනය සඳහා යොදා ගත හැකි විභවතා ඵලදායි ලෙස යොදා ගනිමින් ප්‍රදේශය තුළ තිරසාර සංවර්ධනයක් ඇති කිරීමත් අරමුණු කර ගනිමින් බේරුවල සැලසුම් බලප්‍රදේශය සඳහා සැලසුම් සංකල්පය සහ භෞතික ව්‍යුහ සැලැස්ම සකස් කොට ඇත.

බේරුවල සංවර්ධන සැලැස්මෙහි සැලසුම් ව්‍යුහය සලකා බැලීමේදී එය ප්‍රධාන කාණ්ඩ 6 ක් යටතේ සාකච්ඡා කෙරේ. එනම්; යෝජිත භූමි පරිහරණ සැලැස්ම, අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම, ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම, තිරසර පරිසර සංවර්ධන උපායමාර්ග සැලැස්ම, ජනාවාස සංවර්ධන සැලැස්ම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම වශයෙනි. මෙම එක් එක් සැලසුම් ළඟා කර ගැනීම සඳහා වන උපායමාර්ග පිළිබඳව තවදුරටත් අවධානය යොමු කෙරේ.


## 6.1. සංකල්පිත සැලැස්ම

මෙහිදී මූලික වශයෙන් ඉදිරිපත්කරනුයේ සවිස්තරාත්මක දත්ත විශ්ලේෂණයන් මඟින් සැලසුම් බලප්‍රදේශය තුළ හඳුනාගන්නා ලද ගැටළු විසඳීමත් විභවතා ප්‍රශස්ත අයුරින් යොදා ගැනීමත් තුළින් අපේක්ෂිත අනාගත සංවර්ධන දැක්ම කෙබඳු දිශානතියක් කෙරෙහි යොමු වේද යන්න දළ රූ සටහනක දැක්වීමයි.

මෙසේ හඳුනාගන්නා ලද සංකල්පිත සැලැස්ම අනුව සැලසුම් බලප්‍රදේශය ප්‍රධාන කොරිඩෝ දෙකකට වෙන් කෙරේ. එනම් දැනට ආවරණය වී පවතින දර්ශනීය වෙරළ තීරය විවෘත කරමින් පයාගල සිට මොරගල්ල දක්වා වූ වෙරළ ප්‍රදේශය සංචාරක ආකර්ෂණය ඇති කරමින්, සංචාරක කටයුතු ආශ්‍රිත සංචාරක කොරිඩෝවක් ලෙසත් හරිත ප්‍රදේශ වැඩි වශයෙන් පවතින රට අභ්‍යන්තර ප්‍රදේශය හරිත කොරිඩෝව ලෙසත් වශයෙනි.

මීට අමතරව, දැනට මුහුදුබඩ ග්‍රාම නිලධාරි වසම් කේන්ද්‍රකොට ගනිමින් ව්‍යාප්තව ඇති ජනගහන ව්‍යාප්තිය රට අභ්‍යන්තරයෙහි හඳුනාගෙන ඇති සේවා මධ්‍යස්ථාන නවයක් වෙත ආකර්ෂණය කිරීමත් ඒ තුළින් වෙරළ ඉම කේන්ද්‍ර කොටගත් සංවර්ධන පීඩනය රට අභ්‍යන්තරයට විතැන් කිරීමත්, එම සේවා මධ්‍යස්ථාන අවට ඇති වන නේවාසික කලාපයන් සඳහා රට අදාළ සේවා සැපයීමට සේවා මධ්‍යස්ථාන ජාලයක් ඇති කිරීමටත් අපේක්ෂිතය. තවද එම සේවා මධ්‍යස්ථාන යා කරමින් වෙරළ ඉම ප්‍රදේශය හා සම්බන්ධ වන නව මාර්ග දෙකක් ඉදිකිරීමට ද යෝජිතය.

දැනට ප්‍රදේශය තුළ පවතින ප්‍රධාන නාගරික මධ්‍යස්ථානය වන බේරුවල හැරුනුකොට අලුත්ගම, දර්ගා නගරය සහ මග්ගොන යන උපනාගරික මධ්‍යස්ථාන කිහිපයක් ද හඳුනාගත හැකිය. එම උපනාගරික මධ්‍යස්ථානයන්හි පවතින සංවර්ධන විභවතා හඳුනාගෙන එම නගරවලට විශේෂිත වූ සංවර්ධන ක්‍රමවේදයන් යටතේ සංවර්ධනය කිරීම් කරනු ලබන අතර, එමඟින් ප්‍රදේශයට ආවේණිකව පවතින ප්‍රධාන ආර්ථික අංශයන් වන සංචාරක කර්මාන්තය, ධීවර කර්මාන්තය, මැණික් වෙළඳපොළ හා කෘෂිකර්මාන්තය යන අංශයන් ඒකාබද්ධ කරගත් ආර්ථික විවිධාංගීකරණයක් ඇති කිරීමට අරමුණු කරන අතර, පාරිසරික සංවේදී හා හරිත කලාපයන් ආරක්ෂා වන පරිදි සංවර්ධනය කිරීමට අපේක්ෂා කර ඇත.




*රූපය 6.1 : බේරුවල සැලසුම් බලප්‍රදේශය සඳහා යෝජිත සැලසුම් සංකල්පය*
*මූලාශ්‍රය : බේරුවල සැලසුම් කණ්ඩායම, කළුතර දිස්ත්‍රික් කාර්යාලය, (2017)*

එනම්, සැලසුම් බලප්‍රදේශයේ වෙරළ තීරය ආශ්‍රිතව දැනට සංචාරක කර්මාන්තය සඳහා විවෘතව ඇති ස්ථානයන්ට අමතරව හා රට අභ්‍යන්තරයට වන්නට පවතින සංස්කෘතික හා පුරා විද්‍යාත්මක වටිනාකමින් යුතු ප්‍රදේශ හඳුනාගනිමින් වෙරළ ඉම ප්‍රදේශයට කේන්ද්‍ර වූ සංචාරක කර්මාන්තය රට අභ්‍යන්තරට ව්‍යාප්තකිරීම තුළින් එම ස්ථාන ඵලදායී ලෙස සංවර්ධන ක්‍රියාවලියට යොදා ගැනීමට අපේක්ෂිතය.

උක්ත කරුණු සමෝදානය කරගත් සැලසුම් සංකල්පය තුළින් "දක්ෂිණ වෙරළ තීරය විවර කරන විසල් දොරටුවක් කරා" යන බේරුවල අනාගත දැක්මත් ඒ තුළින් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු හා පරමාර්ථ කරා ගමන් කිරීමට අවශ්‍ය මූලික දළ සැලැස්ම පිළිබඳව අවබෝධයක් රූපය 6.1 සැලසුම් සංකල්පය මඟින් ලබාගත හැකිය.

# 6.2. යෝජිත භූමි පරිහරණය සැලැස්ම

වර්ෂ 2030 සඳහා වන බේරුවල සංවර්ධන සැලැස්මෙහි "දක්ෂිණ වෙරළ තීරය විවර කරන විසල් දොරටුවක් කරා.." යන දැක්ම සාක්ෂාත් කරගැනීමේ පරමාර්ථය පෙරදැරි කර ගනිමින් සකස් කරන ලද යෝජිත ආර්ථික, පාරිසරික සහ අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලසුම් ක්‍රියාවට නැංවීම සඳහා වන යෝජිත උපායමාර්ගික ව්‍යාපෘති තුළින් බිහිවන අනාගත නාගරික ආකෘතිය කෙබඳුද යන්න පිළිබඳව යෝජිත භූමි පරිහරණ සැලැස්ම මඟින් නිරූපණය කෙරේ.

මෙහිදී සිදුකරන ලද නේවාසික ජනගහන පුරෝකතනයන්ට අනුව වර්ෂ 2030 වන විට සමස්ථ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනගහනය 207,294 ක් වන අතර එය 2017 වර්ෂයේ ජනගහනයට අනුව 31,590 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. එමෙන්ම සංචාරක, වාණිජ, ආයතනික හා කර්මාන්ත යන කටයුතු සඳහා වර්ෂ 2030 වන විට 106,047 ක සංසරණ ජනගහනයක් බලාපොරොත්තු විය හැකිය.

මෙම සියලු කරුණු සැලකිල්ලට ගනිමින්, වර්තමානය වනවිට පවතින වෙරළ ඉම කේන්ද්‍ර කොට ගත් සංවර්ධනය පීඩනය රට අභ්‍යන්තරයේ ඇති උස්බිම්වලට ආකර්ෂණය කර ගැනීම මෙම සංවර්ධන සැලැස්ම තුළින් බලාපොරොත්තු වේ. එහිදී, දක්ෂිණ අධිවේගී මාර්ගයට සහ ගාලු පාරට සමාන්තරව මහජනතාවට වඩා පහසුවෙන් සහ කාර්යක්ෂමව අභ්‍යන්තර ප්‍රදේශවලට ළඟාවිය හැකි නව අභ්‍යන්තර මාර්ග ජාලයක් සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබන අතර, එම මාර්ග ජාලය මුහුදුබඩ ප්‍රදේශ යාකරමින් රට අභ්‍යන්තරයට විහිදෙන මාර්ග ජාලයක් ලෙසින් සංවර්ධනය කිරීමට යෝජිතය.

මෙහිදී පළමුව බේරුවල, අලුත්ගම, මග්ගොන සහ දර්ගා නගරය යන නගර ප්‍රධාන නගර ලෙස සංවර්ධනය කිරීමට යෝජිත වේ. මෙයින් බේරුවල හා අලුත්ගම පළමුපෙළ නගර ලෙස එම නගර වලට ආවේනික ලක්ෂණ අනුව සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. බේරුවල පරිපාලන, ධීවර, වාණිජ යන අංශයන් කේන්ද්‍ර කොටගත් නගරයක් ලෙසත්, අලුත්ගම සංචාරක කර්මාන්තය කේන්ද්‍ර කොටගත් නගරයක් ලෙසත් මග්ගොන ධීවර කටයුතු ප්‍රධාන කොට ඇති සේවා සැපයුම් නගරයක් ලෙසත්, දර්ගා නගරය සුළු පරිමාණ කර්මාන්ත හා සිල්ලර වෙළඳාම කේන්ද්‍ර කොටගත් නගරයක් ලෙසත් සංවර්ධනය කිරීමට යෝජිත ය.







*රූපය 6.2 : බේරුවල සැලසුම් බලප්‍රදේශයේ යෝජිත ගොඩනැගිලි ආකෘතිය - හරස් පැතිකඩ I*
*මූලාශ්‍රය : බේරුවල සැලසුම් කණ්ඩායම කළුතර දිස්ත්‍රික් කාර්යාලය*

එම අන්තර් සම්බන්ධතාවය ඔස්සේ සංවර්ධන විභාවනාවයන් වැඩි දියුණු වන උස්බිම්වල පිහිටි දැනට දියුණු වෙමින් පවතින සහ නව සේවා ජාලයක් ඇති කිරීම මඟින් ඒවා වෙත අනාගත සංවර්ධනය සංකේන්ද්‍රණය කර ගැනීමට අපේක්ෂා කෙරේ. දැනට පවතින පාරිසරික සංවේදී ප්‍රදේශ සංරක්ෂණය වන අයුරින් මෙම උප නාගරික මධ්‍යස්ථානයන් ද පළමු පෙළ උප නගර හා දෙවන පෙළ උප නගර ලෙස සංවර්ධනය වීමට යෝජනා කෙරේ. රූපය 6.2 හි දැක්වෙන ගොඩනැගිලි ආකෘතිය මඟින් දක්වා ඇත්තේ ඉහත සඳහන් කරන ලද නාගරික ධූරාවලිය යටතේ වර්ෂ 2030 වනවිට සංවර්ධන දිශානතියේ පිළිබිඹුවයි.


එමෙන්ම ප්‍රදේශය තුළ පවතින ප්‍රධාන ආර්ථික විභවතාවයක් වන සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ ඉම ප්‍රදේශය සංචාරක කොරිඩෝවක් ලෙස නිර්මාණය කිරීමත් ඒ තුළින් වර්ෂ 2030 වනවිට බේරුවල සැලසුම් බලප්‍රදේශය සංචාරක පුරවරයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය උපාය මාර්ග හා ව්‍යාපෘති යෝජනා කෙරේ. රූපය 6.3 මඟින් දක්වා ඇති පරිදි පයාගල සිට අලුත්ගම දක්වා වෙරළ කලාපය අඩියර දෙකක් යටතේ විවෘත කිරීමත් වෙරළ ඉම ප්‍රධාන සේවා සපයන මධ්‍යස්ථානය ලෙස බේරුවල සංවර්ධනය කිරීමත් ඒ හා යාබදව පවතින ඉහළ සංචාරක ආකර්ශනයක් හා සංචාරක හෝටල් සහිත මොරගල්ල වෙරළ කලාපය ඉහළ ගොඩනැගිලි ඝනත්වයකින් යුතුව සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ.




*රූපය 6.3 : බේරුවල සැලසුම් බලප්‍රදේශයේ යෝජිත ගොඩනැගිලි ආකෘතිය - හරස් පැතිකඩ II*
*මූලාශ්‍රය : බේරුවල සැලසුම් කණ්ඩායම කළුතර දිස්ත්‍රික් කාර්යාලය*

විශේෂයෙන් ප්‍රදේශයේ අභ්‍යන්තරයට වන්නට පිහිටා ඇති පාරිසරික සංවේදී කලාපයන් ආරක්ෂා කරගනිමින් වෙරළ ඉම කේන්ද්‍ර කරගත් සංවර්ධන පීඩනය පාලනය කිරීම සඳහා අභ්‍යන්තර ප්‍රදේශයේ කුඩා සේවා මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. රූපය 6.4 මඟින් දැක්වෙන්නේ යෝජිත භූමි පරිහරණ සැලැස්ම තුළින් සැලසුම් බලප්‍රදේශයේ අභ්‍යන්තරයට වන්නට අපේක්ෂා කෙරෙන තුලිත සංවර්ධන ආකෘතියයි.

මෙසේ සකස් කරන ලද යෝජිත භූමි පරිහරණ සැලැස්ම සිතියම 6.1 මඟින් දැක්වෙන අතර මේ පිළිබඳව සවිස්තරාත්මක විශ්ලේෂණයක් දෙවනි වෙළුමෙහි එන "ගොඩනැගිලි හා සැලසුම් රෙගුලාසි" යන කෘතියෙහි විස්තර කෙරේ. මෙම අපේක්ෂිත සංවර්ධනය ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය සංවර්ධන කලාප, කලාපීකරණ රෙගුලාසි සහ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි මෙන්ම එක් එක් කලාපයන් සඳහා වන කලාප සංගුණකයන් පිළිබඳව සවිස්තරාත්මක විමසුමක් දෙවන වෙළුමහි මඟින් දැක්වේ.




*රූපය 6.4 : බේරුවල සැලසුම් බලප්‍රදේශයේ යෝජිත ගොඩනැගිලි ආකෘතිය - හරස් පැතිකඩ III*
*මූලාශ්‍රය : බේරුවල සැලසුම් කණ්ඩායම කළුතර දිස්ත්‍රික් කාර්යාලය*

N
W E
S

## සුචිය

- පළමු පෙළ ප්‍රමුඛතා මාර්ග
- දෙවන පෙළ ප්‍රමුඛතා මාර්ග
- තෙවන පෙළ ප්‍රමුඛතා මාර්ග
- යෝජිත උතුරු - දකුණු පිවිසුම් මාර්ගය (i)
- යෝජිත උතුරු - දකුණු පිවිසුම් මාර්ගය (ii)
- ඇවිදීමේ මංතීරු සහිත මාර්ග
- විශේෂ පිවිසුම් මාර්ග
- දුම්රිය මාර්ග
- දුම්රිය නැවතුම්පොළ
- බස් නැවතුම්පොළ
- පළමු පෙළ නාගරික සේවා මධ්‍යස්ථාන
- දෙවන පෙළ නාගරික සේවා මධ්‍යස්ථාන
- පළමු පෙළ අභ්‍යන්තරික සේවා මධ්‍යස්ථාන
- දෙවන පෙළ අභ්‍යන්තරික සේවා මධ්‍යස්ථාන
- ඓතිහාසික ස්ථාන
- යෝජිත ස්වභාවික හා ඓතිහාසික ස්ථාන ඒකාබද්ධ කරනු ලබන මාර්ගය
- යෝජිත අසල උද්‍යාන
- යෝජිත ඉතා කුඩා උද්‍යාන
- යෝජිත කුඩා උද්‍යාන
- යෝජිත රේඛිය උද්‍යාන
- දර්ශන ස්ථාන
- වෙරළ තීරය විවර කිරීම
- බේරුවල ධීවර වරාය ආශ්‍රිත ප්‍රදේශය සංචරක කටයුතු හා සම්බන්ධ කිරීම
- ජලාශ්‍රිත ප්‍රදේශ සංචාරක ප්‍රවර්ධන ප්‍රදේශ ලෙස සංවර්ධනය කිරීම
- නිල් ධජ විනෝදාත්මක කලාපය සංවර්ධනය කිරීම
- බෙන්තර නදී මුඛ කලාපය විනෝදාත්මක කලාපයක් ලෙස සංවර්ධනය කිරීම
- බාබේරියන් දූපත සංචාරකයන් සඳහා විවර කිරීම
- වරාය කලාපය ගැඹුරු කිරීම
- යෝජිත බෙන්තොට ගඟ ඇවිදන මංතිරුව
- බේරුවල ගොවිපොළ
- තට්ටු නිවාස, හෝටල් සහ වෙළඳ සංකීර්ණය - අලුත්ගම
- යෝජිත නගර උද්‍යානය
- සිල්ලිය ජලාශය වටා කලාපය ප්‍රවේශකත්වය වැඩි දියුණු වන අයුරින් සංවර්ධනය කිරීම
- මරදාන ධීවර වෙළඳපොල වැඩි දියුණු කිරීම
- රෝහල් සංවර්ධනය කිරීම - දර්ගා නගරය
- ජලාශ්‍රිත ක්‍රීඩා ප්‍රවර්ධනය - බෙන්තර හා කළුවාමෝදර ඇළ
- යෝජිත විවෘත හෝටලය
- යෝජිත ප්‍රජා මූලික කසළ කළමනාකරණ භූමිය හා වාහන නැවත තැබීමේ අංගනය
- යෝජිත ධීවර නැංගුරම් තොටුපොල
- යෝජිත විදේශිකයන් සඳහා තොරතුරු දැනගැනීමේ මධ්‍යස්ථානය
- යෝජිත වෙළඳ සංකීර්ණය සහ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය - කාලවිලවත්ත
- ස්වභාවික මංපෙත - කළුවාමෝදර ඇළ
- යෝජිත මහල් නිවාස සංකීර්ණය
- යෝජිත විශ්‍රාමික ගම්මානය
- දුම්රිය මාර්ගය සංවර්ධනය කිරීම - අලුත්ගම

### තෙත්බිම් වර්ගීකරණය

- විශේෂ කුඹුරු වගා කලාපය
- ස්වභාවික තෙත්බිම් සංරක්ෂණ කලාපය
- ජලවහන පද්ධතිය

### කලාපීකරණ වර්ගීකරණය

- ඉහළ ඝනත්ව නාගරික කලාපය 1
- ඉහළ ඝනත්ව නාගරික කලාපය 2
- ඉහළ ඝනත්ව නාගරික කලාපය 3
- මධ්‍ය ඝනත්ව නාගරික කලාපය
- මධ්‍ය ඝනත්ව අර්ධ නාගරික කලාපය
- මධ්‍ය ඝනත්ව අභ්‍යන්තර කලාපය
- පහළ ඝනත්ව අභ්‍යන්තර කලාපය
- ඉතා පහළ ඝනත්ව අභ්‍යන්තර කලාපය
- ඉහළ ඝනත්ව සංචාරක කලාපය
- පහළ ඝනත්ව සංචාරක කලාපය

0 0.5 1 2 3 4 කි.මී

**යෝජිත භූමි පරිහරණ සැලැස්ම – බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

**බේරුවල සංවර්ධන සැලැස්ම (2019 - 2030)**

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය



*සිතියම 6.1 : බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යෝජිත භූමි පරිහරණ සැලැස්ම*




බස්නාහිර පළාත් අංශය

නාගරික සංවර්ධන අධිකාරිය
දෙසැම්බර් 2018

# 6.3. අපරව්‍යුහ පහසුකම් සංවර්ධන කිරීමේ උපායමාර්ගික සැලැස්ම

වර්ෂ 2030 වන විට බේරුවල නගරය, දක්ෂිණ වෙරළ තීරයේ ආරම්භක ද්වාරය බවට පත්කරමින්, කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය හා මැණික් වෙළඳපොළ ඔස්සේ ලබන ආර්ථික සමෘද්ධියත්, සංචාරක කර්මාන්තයේ උන්නතියත් හේතුකොට ගෙන සමෘද්ධිමත් නගරයක් හා මානව හිතකාමී පරිසරයකින් හෙබි නගරයක් ලෙසින් දියුණුවට පත් කිරීමේ අරමුණින් යුතුව මෙම සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක වන බැවින් එම දැක්ම සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාජීය හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන සැලසුම ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

දැනට ප්‍රදේශයේ පවතින මාර්ග පද්ධතිය ඇතුළු මූලික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමටත්, වෙරළාසන්න කලාපයන්වල අධික පීඩනයකින් යුතුව ඒකරාශී වී ඇති ජනගහනය සංවර්ධන බලප්‍රදේශ අභ්‍යන්තරයට මුදා හැරීමටත් අවශ්‍ය උපායමාර්ගික සැලසුම් මෙමඟින් හඳුන්වා දීමටත් අපේක්ෂා කර ඇත.

ඒ අනුව මෙහිදී ප්‍රධාන අංශයන් දෙකක් කෙරෙහි අවධානය යොමු කරනු ලබයි. එනම් භෞතික වශයෙන් පවතින යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අදාළ උපායමාර්ගික සැලසුම් හා සමාජීය වශයෙන් පවතින යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අදාළ උපායමාර්ගික සැලසුම් වශයෙනි. මේ යටතේ පහත ක්ෂේත්‍රයන් පිළිබඳව අවධානය යොමු කෙරේ. එනම්,

- *සේවා කළමනාකරණ සැලැස්ම*
- *මාර්ග හා ප්‍රවාහන සැලැස්ම*
- *ජල සැපයුම් සැලැස්ම*
- *විදුලි සැපයුම් සැලැස්ම*
- *අපජල කළමනාකරණ සැලැස්ම*
- *ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම වශයෙනි.*

මෙම එක් එක් සැලසුම් පිළිබඳව සවිස්තරාත්මක විශ්ලේෂණයන් ඉදිරියේදී විමසා බැලෙන අතර මෙම සියලු සැලසුම් සඳහා පදනම වන අනාගත ජනගහනය හා ජන ඝනත්ව පුරෝකථනය පිළිබඳව මීළගට විමසා බැලේ.

## 6.3.1. ජනගහනය පුරෝකථනය

වගුව 6.1 මඟින් දක්වා ඇති පරිදි බේරුවල සැලසුම් බලප්‍රදේශය සඳහා ජනගහනය පුරෝකථනය සිදු කිරීම සඳහා යොදාගනු ලැබුයේ ස්වභාවික ජනගහන වර්ධන වේගයයි. පසුගිය අවුරුදු කිහිපය සලකා බැලීමේදී ජනගහන වර්ධනය සිදුවී ඇත්තේ ස්වභාවික වර්ධන වේගයට අනුවය. මෙහි ඇති සුවිශේෂීත්වය වනුයේ සැලසුම් බලප්‍රදේශයේ ඇති නගර සභා බලප්‍රදේශයේ හා ප්‍රදේශීය සභා බලප්‍රදේශයේ ජනගහන වර්ධනය ඒ ඒ ප්‍රදේශයන්ට අවේනික වූ ලක්ෂණ අනුව එකිනෙකට පැවතීමයි.

නගරසභා බලප්‍රදේශයේ ජනගහන වර්ධන වේගය සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා අතර එය 1.41% ක් වේ. ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ එය 1.23% ක සාපේක්ෂ අඩු අගයක් පෙන්නුම් කරයි.

මේ අනුව එක් එක් පරිපාලන ප්‍රදේශයන්හි ජනගහනය වර්ධනය පහත පරිදි පුරෝකථනය සිදු කරන ලදි.

| පරිපාලන ඒකකය | වර්ධන වේගය % | 2012 | 2017 | 2030 |
|---|---|---|---|---|
| නගර සභා බලප්‍රදේශය | 1.41 | 37,772 | 40,511 | 48,660 |
| ප්‍රාදේශීය සභා බලප්‍රදේශය | 1.23 | 127,176 | 135,192 | 158,633 |

වගුව 6.1 : ජනගහන පුරෝකථනය
මූලාශ්‍රය : බේරුවල සැලසුම් කණ්ඩායම, කළුතර දිස්ත්‍රික් කාර්යාලය (2018)



සමස්ථ සැලසුම් බලප්‍රදේශයේ ජනගහනය 2030 වන විට 207,294 ක් වන බව පුරෝකථනය කළ හැකිය. වර්තමාන ජනගහනයට අනුව එනම්, 2017 හා සංසන්දනාත්මකව බලන කළ එය 31,590 කින් පමණ වැඩිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 6.3.1.1. සංක්‍රමණික ජනගහන පුරෝකතනය

වසර 2030 වන විට සැලසුම් ප්‍රදේශය සඳහා බාහිරින් පැමිණෙන පුද්ගලයන් කොපමණද යන්න ගණනය කරන ලදී. මෙය ගණනය කිරීම සිදු කළ ආකාරය වෙළුම II හී යෝජිත කලාපීකරණ සැලැස්ම යටතේ වැඩි දුරටත් දක්වා ඇත. මෙහිදී සැලසුම් බලප්‍රදේශයේ සංචාරක, වාණිජ, කර්මාන්ත හා ආයතනික යන අංශ සඳහා කොපමණ ප්‍රමාණයක් පැමිණෙනවාද යන්න ගණනය කරන ලදී. ඒ අනුව 2030 වන විට සංසරණ ජනගහනය 106,047 ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එය වර්ෂ 2017 සංසරණ ජනගහනය වර්ෂ 2030 හා සන්සන්දාත්මකව බලන කළ 30,000 ක පමණ විට වැඩි වීමක් පෙන්නුම් කරයි.

මේ අනුව මෙම සංවර්ධන සැලැස්ම යටතේ සිදු කරනු ලබන සේවා කළමනාකරණ සැලැස්ම, ආර්ථික සංවර්ධන සැලැස්ම හා ජනාවාස සංවර්ධන සැලැස්ම සඳහා 2030 වන විට වැඩි වන ජනගහන පුරෝකතනයන්වලට අනුව සිදු කරන ලදී.

## 6.3.2. නිවාස ව්‍යාප්තිය සහ නිවාස ඝනත්වය

බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සම්පත් පැතිකඩ (වගුව 6.2 මඟින් දැක්වෙන පරිදි) අනුව 2016 වර්ෂයේ මුළු නිවාස සංඛ්‍යාව 37,363 ක් වන අතර, එයින් 33,148 ක් එනම්, 88.7% ක් ස්ථිර නිවාස වීම නේවාසික කලාපයක් වශයෙන් ගත්කළ ඉහළ විභවතාවයක් ලෙස පෙන්නුම් කළ හැක.

ස්ථිර, අර්ධ ස්ථිර, තාවකාලික සහ නිවාස නොමැති සංඛ්‍යාව ඉහළ යාම සඳහා ආසන්නතම හේතුව ලෙස සුනාමි විපත හඳුන්වාදිය හැකි අතර, ඉන් බොහොමයක් දෙනා ධීවර සහ මී රා කර්මාන්තය ජීවනෝපාය කරගත් වෙරළට සමීපව ස්ථානගතවූවන් වේ. සුනාමි උවදුර නිසා අවතැන් වූවන්ගෙන් කොටසක් සඳහා නිවාස ව්‍යාපෘති පර්යන්ත ප්‍රදේශවල ඉදිකොට ඇත.

| | නිවාසවල තත්ත්වය | | | නිවාස එකතුව | නිවාස නොමැති |
|---|---|---|---|---|---|
| | ස්ථිර | අර්ධ ස්ථිර | තාවකාලික | | |
| නිවාස ගණන | 33,148 | 3018 | 1197 | 37,363 | 1,406 |
| ප්‍රතිශතය(%) | 88.7 | 8.07 | 3.2 | 100.00 | |

වගුව 6.2 : බේරුවල නිවාසවල ස්වභාවය - 2016
මූලාශ්‍රය : බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සම්පත් පැතිකඩ (2016)

කෙසේවුවත්, නිවාස පහසුකම්, මිනිසාගේ මූලික අයිතිවාසිකමක් ලෙස සැලකෙන හෙයින් 12% ක ප්‍රතිශතයක් පෙන්නුම් කරන අර්ධ ස්ථිර සහ තාවකාලික නිවාසත්, නිවාස නොමැති 1,406 ත්, නිවාස ආශ්‍රිත ගැටළුවක් ලෙස සැලකිය යුතු වේ.

| වර්ෂය | ජනගහනයේ වැඩිවීම | පුරෝකථන ජනගහනය | නිවාස අවශ්‍යතාවය |
|---|---|---|---|
| 2015 | | 171,131 | 2,187 |
| 2018 | 4,572 | 175,703 | 2,488 |
| 2030 | 31,591 | 207,294 | 7,897 |
| එකතුව | | | 12,572 |

වගුව 6.3 : අනාගත නිවාස අවශ්‍යතාවය බේරුවල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය
මූලාශ්‍රය : බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සම්පත් පැතිකඩ (2016)

ඉහත වගුව 6.3 මඟින් දක්වා ඇති පරිදි සැලසුම් බලප්‍රදේශයේ නිවාස අවශ්‍යතාවය සළකා බැලීමේදී, 2015 වර්ෂයේ 171,131 ක ජනගහනයට 2187 ක නිවාස අවශ්‍යතාවයක් පවති අතර එය 2018 වනවිට 2488 ක් දක්වා වැඩි වේ. නමුත් 2030 වනවිට 207,294 ක් වන ජනගහනයට අවශ්‍ය නිවාස ප්‍රමාණය 7897 ක් වේ. මෙහිදී එක් පවුලක සාමාජිකයින් 4 ක් යැයි සලකා ගණනය කිරීම් සිදු කර ඇත. ඒ අනුව බේරුවල සැලසුම් බලප්‍රදේශය සඳහා වන මුළු නිවාස අවශ්‍යතාවය 12,572 ක් වනු ඇත.

මෙහිදී වැඩි වන ජනගහනය හා ජන ඝනත්වය යෝජිත භූමි පරිහරණ හා කලාපීකරණ සැලැස්මට අනුව එක් එක් කලාපවල ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

ඒ අනුව 2030 වනවිට මෙම සංවර්ධන සැලැස්ම තුළින් දැනට පවතින අවිධිමත් නිවාසයන් වෙනුවට විධිමත් නිවාස වැඩපිළිවෙලක අවශ්‍යතාවය හඳුනා ගැනේ. විශේෂයෙන්ම බෙන්තර ගඟ හා වෙරළ කලාපය ආශ්‍රිතව නිවාස ඉදිකිරීමේදී හඳුනාගත් ගොඩනැගිලි හා සැලසුම් රෙගුලාසිවලට අනුකූලව ඉදිකිරීමට යෝජනා කෙරේ. මේ වනවිට සුනාමි උවදුරු අවදානම් තත්ත්වය සහිත කලාපවල නැවත අනවසරයෙන් පදිංචි වී ඇති ධීවර ජනතාව වෙනුවෙන් සියලු පහසුකම් සහිතව නිවාස සංකීර්ණයක් ඉදි කිරීමට යෝජනා කෙරේ.

## 6.3.2.1. නිවාස ඝනත්වය

බේරුවල සැලසුම් බලප්‍රදේශය තුළ වැඩිම නිවාස ඝනත්වයක් පවතින ග්‍රාම සේවක වසම් ලෙස හෙට්ටියාකන්ද,සීනවත්ත, වැලිපිටිය, පොතුවිල බටහිර, මහගම්මැද්ද, අක්කරමලය, ගඟඅද්දර. ගනේගම සහ කුඩා පයාගල දකුණ හඳුන්වා දිය හැකි අතර පරණකඩේ,කංකානම්ගොඩ දන්වත්තගොඩ, බඳනාගොඩ, හිරිගල්ගොඩැල්ල සහ කාලවිල යන වසම්වල අඩු නිවාස ඝනත්වයක් හඳුනාගත හැකිය. පොදු පහසුකම්වල පවතින ඌණතාවය, වාණිජ හා පරිපාලන කටයුතු එම ප්‍රදේශවල ස්ථානගත වී තිබීම සහ පදිංචිය සඳහා සුදුසු ඉඩම් නොමැති වීම මෙම අඩු නිවාස ඝනත්වය සඳහා හේතු වී ඇත.

## 6.3.3. සේවා කළමනාකරණ සැලැස්ම

සැලසුම් බලප්‍රදේශයේ සමාජීය අපරවයුහ පහසුකම් සඳහා වන අනාගත සැලසුම් සහ ආයෝජන අවස්ථාවලට මඟපෙන්වීම සහ සැලසුම් බලප්‍රදේශයේ වැඩිවන ජනගහනයත් සමඟ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට සමාජීය අපරවයුහ පහසුකම් කෙසේ සංවර්ධනය විය යුතු ද යන්න පිළිබඳව මෙමඟින් විස්තර කෙරේ.

මෙම උපායමාර්ගික සැලැස්ම යටතේ වැඩිවන ජනගහනයත් සමඟ සෞඛ්‍ය හා අධ්‍යාපනික පහසුකම් සංවර්ධනය කිරීමටත් රට අභ්‍යන්තරයේ වාසය කරනු ලබන ජනතාව වෙනුවෙන් පවතින පහසුකම් වැඩි දියුණු කිරීමටත් අපේක්ෂා කෙරේ. බේරුවල සැලසුම් බලප්‍රදේශයේ දැනට පවතින සමාජීය යටිතල පහසුකම් වැඩිවන ජනගහනයට ප්‍රමාණවත් අයුරින් පැවතියද එම පහසුකම් නව නවත් සංවර්ධනය කරමින් වැඩි වන ජනගහනයට සේවාවන් සැපයිම මෙහි මූලික අරමුණ වේ.

### 6.3.3.1. අධ්‍යාපනික පහසුකම්

බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අධ්‍යාපන පහසුකම් පිළිබඳව අවධානය යොමු කිරීමේදී, පාසල් වර්ගීකරණය තුළ ජාතික හා පළාත් පාසල් ඇතුළු මුළු පාසල් 50 ක් පිහිටා ඇති අතර ඉන් 1 AB කාණ්ඩයට අයත් පාසල් 8 ක් ද, 1 C කාණ්ඩයට අයත් පාසල් 8 ක් ද, 2 කාණ්ඩයට අයත් පාසල් 26 ක් හා 3 කාණ්ඩයට අයත් පාසල් 6 ක් වශයෙන් පිහිටා ඇත.

වර්තමානය වනවිට 30,894 ක ශිෂ්‍ය සංඛ්‍යාවක් මෙම ප්‍රදේශය තුළ අධ්‍යාපනය ලබන අතර සිංහල, දෙමළ යන මාධ්‍ය දෙකටම අයත් පාසල් ප්‍රදේශය පුරා විහිදී ඇත. තවද පෞද්ගලික පාසල් 7 ක් පමණ පවතින අතර දර්ගා නගරය ආශ්‍රිතව එම පාසල් වැඩි වශයෙන් ව්‍යාප්තව ඇත. ප්‍රදේශය තුළ රජයේ කාර්මික විද්‍යාල මෙන්ම පෞද්ගලික අංශයේ විද්‍යාලද පිහිටා ඇත. මේ අනුව බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අධ්‍යාපන ආයතන වල පිහිටීමේ සිට කිලෝමීටර එකක හා කිලෝමීටර දෙකක පරිධියක් යටතේ සිදු කළ අධ්‍යාපන සේවා පහසුකම් විශ්ලේෂණය යටතේ සමස්ථ සැලසුම් බලප්‍රදේශය පුරා විහිදී පැතිරුණු අධ්‍යාපන පහසුකම් ව්‍යාප්තවීම හඳුනා ගත හැකිය. එම අධ්‍යාපන පහසුකම් හි ව්‍යාප්තිය සිතියම 6.2 මඟින් දැක්වේ.

තවද, මාර්ග සංවර්ධන සැලැස්ම මඟින් සිදුකරන පවත්නා මාර්ගයන්හි තත්ත්වය වැඩි දියුණු කිරීමත් නව මාර්ගයන් හඳුන්වා දීමත් යනාදිය මඟින් අභ්‍යන්තර ප්‍රදේශවල සිසුන් හට නාගරික පාසල් වෙත ප්‍රවේශ වීමේ පහසුකම් තවදුරටත් ඇති කෙරේ. මෙම දත්ත අනුව වර්තමාන හා අනාගත ජනගහනයට අවශ්‍ය අධ්‍යාපන පහසුකම් ලබා දීම සඳහා වන අධ්‍යාපන ආයතනයන්හි පැවතීම සතුටුදායක මට්ටමක පවතින බව තහවුරු කළ හැකිය.

එමෙන්ම වර්ෂ 2030 වන විට බේරුවල සැලසුම් බලප්‍රදේශය සඳහා අපේක්ෂිත සංචාරක ආකර්ෂණ-යන්ගේ ඉහළ යාම වසරකට 30,000 ක් පමණ වේ. වර්තමාන ලෝකයේ භාවිත වන නව සංචාරක ආකර්ශනීය ක්‍රමෝපායන් ලෙස නව ආයුර්වේද ක්‍රම, නව ආහාර රටාවන් ආදී සංචාරක ආකර්ශනය දිනාගත හැකි ආගන්තුක සත්කාරය පිළිබඳව ගවේෂණාත්මක ඉගැන්වීම සහිත සංචාරක පාසලක අවශ්‍යතාවයක් පවතී. එමඟින්, ප්‍රදේශයේ තරුණ තරුණයින්ට නව අධ්‍යාපන දිශානතියක් ලබාදෙන අතර ඒ මඟින් ප්‍රදේශය තුළ සංචාරක කර්මාන්තය ආශ්‍රිත රැකියා විශාල ප්‍රමාණයක් ජනනය කිරීමට ද ඉඩ ප්‍රස්ථාව සැලසේ.




**වර්තමානය වනවිට පවත්නා**
**අධ්‍යාපන පහසුකම්වල පැතිරීම**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 0.35 0.7 1.4 2.1 2.8 කි.මී

නාගරික සංවර්ධන අධිකාරිය
දෙසැම්බර් 2018



*සිතියම 6.2 : බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වර්තමානය වනවිට පවත්නා අධ්‍යාපනික පහසුකම් වල පැතිරීම*

## 6.3.3.2. සෞඛ්‍ය පහසුකම්

බේරුවල සැලසුම් බලප්‍රදේශය තුළ සෞඛ්‍ය සේවා පහසුකම් සැපයීම සඳහා බේරුවල දිසා රෝහල, අලුත්ගම ග්‍රාමීය රෝහල හා දර්ගා නගර පර්යන්ත රෝහල ලෙස ප්‍රධාන රෝහල් 3 ක් පිහිටා ඇත. අවට ප්‍රදේශවල ජනතාව සෞඛ්‍ය පහසුකම් සඳහා මෙම රෝහල් සඳහා පැමිණෙන අතර වැඩිදුර ප්‍රතිකාර සඳහා නාගොඩ මහා රෝහල කරා ගමන් කරනු ලැබේ. මීට අමතරව, පෞද්ගලික රෝහල් 3 ක්, ආයුරුවේද රෝහල් 2 ක් හා පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන විශාල ප්‍රමාණයක් ප්‍රදේශය පුරා පිහිටා ඇත. බේරුවල දිසා රෝහල වාට්ටු 3 කින් හා ඇඳන් 63 කින් ද, අලුත්ගම ග්‍රාමීය රෝහල වාට්ටු 4 කින් හා ඇඳන් 50 කින් සහ දර්ගා නගර පර්යන්ත රෝහල වාට්ටු 3 කින් හා ඇඳන් 59 කින් සමන්විත වේ.

මේ අනුව බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සෞඛ්‍ය මධ්‍යස්ථානවල පිහිටීමේ සිට කිලෝමීටර දෙකක හා කිලෝමීටර හතරක පරිධියක් යටතේ සිදු කළ විශ්ලේෂණයන්ට අනුව සමස්ථ සැලසුම් බලප්‍රදේශය පුරා විහිදී පැතිරුණු සෞඛ්‍ය පහසුකම්වල ව්‍යාප්තවීම සිතියම 6.3 අනුව හඳුනා ගත හැකිය. ඒ අනුව වර්තමාන ජනගහනය සඳහා මෙම සෞඛ්‍ය මධ්‍යස්ථාන ප්‍රමාණවත් මට්ටමක පැවතියද අනාගතයේදී නේවාසික ජනගහනය හා ප්‍රදේශයට ආකර්ෂණය වන ජනගහනය සැලකීමේදී බේරුවල දිසා රෝහලේහි වෛද්‍යවරුන් සංඛ්‍යාව හා රෝහල් පහසුකම් ප්‍රමාණවත් මට්ටමක නොවතින අතර එය මූලික රෝහලක් දක්වා ඉහළ නැංවීමටත්, අලුත්ගම හා දර්ගා නගර රෝහල්වල පහසුකම් ඉහළ නැංවීමට ද මෙම සැලසුම යටතේ අපේක්ෂා කෙරේ.

තවද, සංචාරක කර්මාන්තය හා බැඳුනු නූතන ආයුර්වේද ක්‍රම සහිත ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන ඇති කිරීමටත්, ජනාවාස සංවර්ධන සැලැස්ම තුළින් හඳුනා ගන්නා ලද නේවාසික හා සේවා මධ්‍යස්ථාන සඳහා සෞඛ්‍ය සායන ඇතිකිරීමත් මෙම සැලැස්ම තුළින් සිදුකිරීමට බලාපොරොත්තු වේ.

## 6.3.3.3. පොදු සේවා පහසුකම්

සැලසුම් බලප්‍රදේශයේ සමාජීය අපරව්‍යුහ පහසුකම් සඳහා වන අනාගත සැලසුම් හා ආයෝජන අවස්ථා වලට මඟ පෙන්වීම සහ සැලසුම් බලප්‍රදේශය සඳහා අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට 2030 වන විට පොදු පහසුකම් වල පැතිරීම පිළිබඳ හඳුනා ගැනීම වැදගත් වේ.

මෙහිදී ජනාවාස ප්‍රමුඛතාගත කිරීමට අනුව සැලසුම් බලප්‍රදේශයට අවශ්‍ය පොදු පහසුකම් මොනවාද යන්න ජනාවාස සංවර්ධන සැලැස්ම යටතේ සාකච්ඡා කෙරේ.

මෙහිදී පවතින උප නාගරික මධ්‍යස්ථාන තුළ සංකේන්ද්‍ර වූ සංවර්ධනයක් ඇති කරලීම සඳහාත් උප නාගරික මධ්‍යස්ථාන තුළ ජනයාට සුව පහසු අන්දමට තම අවශ්‍යතා ඉටු කර ගැනීමට හැකි පරිදි මූලික පහසුකම් සපයා දීම සඳහා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කෙරේ.

ඒ අනුව පවතින විභවතා සහ වර්තමාන තත්ත්වය සලකා බලමින් මෙම නාගරික හා උප නාගරික මධ්‍යස්ථාන වලට අවශ්‍ය මූලික පහසුකම් සැපයීමට යෝජනා කෙරෙන අතර වර්තමානයේ පවත්නා මූලික පහසුකම් වල ව්‍යාප්තිය සිතියම 6.4 පරිදි වේ.





**වර්තමානය වනවිට පවත්නා**
**සෞඛ්‍ය පහසුකම්වල පැතිරීම**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 0.35 0.7 1.4 2.1 2.8 කි.මී

නාගරික සංවර්ධන අධිකාරිය
දෙසැම්බර් 2018



*සිතියම 6.3 : බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වර්තමානය වනවිට පවත්නා සෞඛ්‍ය පහසුකම්වල පැතිරීම*




**වර්තමානය වනවිට පවත්නා**
**මූලික සේවා පහසුකම්වල පැතිරීම**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 0.35 0.7 1.4 2.1 2.8 කි.මී

නාගරික සංවර්ධන අධිකාරිය
දෙසැම්බර් 2018

බස්නාහිර පළාත් අංශය | බේරුවල සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

*සිතියම 6.4 : බේරුවල ප්‍රාදේශයේ වර්තමානය වනවිට පවත්නා මූලික සේවාවන්*

## 6.3.4. මාර්ග හා ප්‍රවාහන සැලැස්ම

වත්මන් මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම ප්‍රදේශයේ සංවර්ධන ක්‍රියාවලියේදී වැදගත් සහ ප්‍රධාන මෙහෙයක් ඉටු කරනු ලබන අතර, එය ප්‍රාදේශීය සංවර්ධනයට ද සෘජුවම ඉවහල් වේ. එම නිසා මෙය බේරුවල ප්‍රදේශයේ අපේක්ෂිත සංවර්ධනයේ මූලික අඩිතාලම වන අතර, මෙම සැලසුම තුළින් මාර්ග සංවර්ධනය හා සබැඳුනු උපායමාර්ගික ව්‍යාපෘතීන් සහ ක්‍රියාමාර්ග හඳුනාගෙන ඇත.

බේරුවල ප්‍රාදේශීය සභා සහ නගර සභා බලප්‍රදේශය තුළ දැනට ප්‍රදේශය පුරා විසිරුණු විධිමත් මාර්ග ජාලයක් පැවතුන ද එම මාර්ගවල පළල, භෞතික තත්ත්වය, ප්‍රවේශකත්වය සහ ධාරිතාවය, පවතින ජනාවාසවල අවශ්‍යතාවයට පවා ප්‍රමාණවත් නොවන පරිදි ඉතා දුර්වල තත්ත්වයක පවතී. මේ නිසා අනාගතයේ වැඩිවන ජනගහනයටත්, ජනගහන වර්ධනයත් සමඟ සැලසුම් බලප්‍රදේශ අභ්‍යන්තරයට ගමන් කරන්නා වූ ජනගහනයටත්, සංචාරක කර්මාන්තය සහ යෝජිත ව්‍යපෘතීන් දිරි ගැන්වීම සඳහාත් හඳුනාගත් මාර්ග ජාලයක් සංවර්ධනය කිරීමට මෙම සංවර්ධන සැලසුම යටතේ අපේක්ෂා කෙරේ. එය සිතියම 6.5 මඟින් දැක්වේ.

තවදුරටත් මාර්ග සංවර්ධනය බලාත්මක කිරීම සඳහා වන නීති හා රෙගුලාසි දෙවන වෙළුම හි එන සංවර්ධන කලාප හා කලාපීය රෙගුලාසි පරිච්ඡේද 1 මඟින් වැඩිදුරටත් විස්තර කෙරේ.

### වත්මන් මාර්ග පද්ධතිය


දැනට පවතින මාර්ග පද්ධතිය පිළිබඳව අවධානය යොමු කිරීමේදී, එම මාර්ගයන්හි හිමිකාරීත්වය පිළිබඳව සලකා බැලීමේදී, පළමු පෙළ ප්‍රමුඛත්වයක් ඇති මාර්ගයන් මාර්ග සංවර්ධන අධිකාරිය යටතටත්, දෙවන පෙළ ප්‍රමුඛත්වයක් ඇති මාර්ගයන් පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය යටතට සහ තෙවන පෙළ ප්‍රමුඛත්වයක් ඇති සියලුම මාර්ගයන් පළාත් පාලන ආයතනයන් යටතටත් හිමි වේ. එසේ ව්‍යාප්තව පවතින වත්මන් මාර්ග පද්ධතිය සිතියම 6.6 මඟින් දැක්වේ.

### යෝජිත මාර්ග පද්ධතිය

2030 වන විට යෝජිත මාර්ග පද්ධතිය පිළිබඳව අවධානය යොමු කිරීමේදී, එම මාර්ගයන් මාර්ග හිමිකාරීත්වය මත පදනම්ව වගුව 6.4 හි දැක්වෙන පරිදි කාණ්ඩ කළ හැකිය. එම යෝජිත මාර්ග පද්ධතිය සිතියම 6.7 මඟින් දැක්වේ.

| මාර්ගයේ වර්ගය | හිමිකාරීත්වය |
|---|---|
| පළමු පෙළ ප්‍රමුඛත්වයක් ඇති මාර්ගයන් | මාර්ග සංවර්ධන අධිකාරිය |
| දෙවන පෙළ ප්‍රමුඛත්වයක් ඇති මාර්ගයන් | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය |
| තෙවන පෙළ ප්‍රමුඛත්වයක් ඇති මාර්ගයන් | පළාත් පාලන ආයතන |
| විශේෂ පිවිසුම් මාර්ග | පළාත් පාලන ආයතන |
| යෝජිත උතුරු දකුණු සීමා සම්බන්ධ මාර්ගය (i) | පළාත් පාලන ආයතන |
| යෝජිත උතුරු දකුණු සීමා සම්බන්ධ මාර්ගය (ii) | පළාත් පාලන ආයතන |

*වගුව 6.4 : සැලසුම් බලප්‍රදේශය තුළ පවත්නා යෝජිත මාර්ග පද්ධතිය සහ ඒවායෙහි හිමිකාරීත්වය*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - ක්ෂේත්‍ර සමීක්ෂණය 2018*




**ඒකාබද්ධ මාර්ග සංවර්ධන සැලැස්ම**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 0.35 0.7 1.4 2.1 2.8 කි.මී

නාගරික සංවර්ධන අධිකාරිය
අගෝස්තු 2018

බස්නාහිර පළාත් අංශය | බේරුවල සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

*සිතියම 6.5 : බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යෝජිත ඒකාබද්ධ මාර්ග සංවර්ධන සැලැස්ම*





**වත්මන් මාර්ග පද්ධතිය**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 0.35 0.7 1.4 2.1 2.8 කි.මී

නාගරික සංවර්ධන අධිකාරිය
අගෝස්තු 2018

බස්නාහිර පළාත් අංශය | බේරුවල සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

**සිතියම 6.6 :** *බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින වර්තමාන මාර්ග පද්ධතිය*




**සිතියම 6.7 :** *බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යෝජිත මාර්ග පද්ධතිය*

## යෝජිත උපාය මාර්ග

මෙම මාර්ග සංවර්ධන සැලසුම යටතේ ගාලු පාර (මොරගල්ල සිට අළුත්ගම දක්වා වූ කලාපය) මංතීරු හතරක් යටතේ පුළුල් කිරීමටත්, බේරුවල මරදාන මොරගල්ල මාර්ගය පළමු පෙළ ප්‍රමුඛතාවයක් ඇති මාර්ගයක් ලෙසින් සංවර්ධනය කිරීමටත් යෝජනා කෙරෙන අතර තවදුරටත් ගාලු පාරේ සිට අභ්‍යන්තර ප්‍රදේශයන් යා කෙරෙන ප්‍රධාන මාර්ග (පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ගයන්) පද්ධතිය විධිමත් අයුරින් සංවර්ධනය කිරීමට ද යෝජනා කෙරේ.

එසේම අභ්‍යන්තර ප්‍රදේශයන් ඔස්සේ නගර මධ්‍යස්ථාන සම්බන්ධ කරමින් දිවෙන මාර්ගයන් දෙකක් ද මේ යටතේ සංවර්ධනය කිරීමට යෝජිතය.

- යෝජිත උතුරු – දකුණු ප්‍රවේශ මාර්ගය (i)
- යෝජිත උතුරු – දකුණු ප්‍රවේශ මාර්ගය (ii)

තවදුරටත් විශේෂ සේවාවන් සපයන පිවිසුම් මාර්ගයන් ලෙස හඳුනාගත් මාර්ග (සුනාමි නැවත පදිංචි කිරීමේ ස්ථානයන්හි ප්‍රවේශ මාර්ගයන්, වෙරළ ප්‍රවේශ මාර්ගයන්,බෙන්තර ගඟ ප්‍රවේශ මාර්ගයන් සහ සංචාරක ප්‍රදේශයන් සඳහා වූ ප්‍රවේශ මාර්ගයන් සහ පැරණි ගාලු පාරේ සිට නව ගාලු පාර වෙතට පිවිසීම සඳහා වූ කෙටි පටුමග) කිහිපයක් පුළුල් කිරීමටද යෝජනා කෙරේ.

මෙම සංවර්ධනය කිරීමට යෝජිත මාර්ග දැනට පවතින මාර්ගයන් ඔස්සේ සංවර්ධනය කිරීමට යෝජනා කර ඇත.

මෙම උපායමාර්ගික ව්‍යාපෘතිය යෝජිත සංවර්ධන සැලසුමෙහි මූලික අඩිතාලම වන අතර, මෙම වැඩපිළිවෙල ඉහළ ප්‍රමුඛතාවයක් සහිත වැඩපිළිවෙලක් ලෙස සලකා මාර්ග සංවර්ධන අධිකාරිය සහ අනෙකුත් මූල්‍ය දායකත්වය ලබාගත හැකි ආයතන සම්බන්ධ කරගනිමින් පහත පරිදි ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කෙරේ.

මෙම මාර්ග පද්ධතීන් පුළුල් කරමින් ඉදිරියේදී සංවර්ධනය කිරීමට යෝජනා කරන අතර, ඒ අනුව ඉදිරි සංවර්ධන අවශ්‍යතාවය සලකා මෙම මාර්ග පද්ධතියට ගොඩනැගිලි සීමා සහ වීථි රේඛා සීමා පනවා ඒවා බලාත්මක කරනු ලැබේ.

## යෝජිත මාර්ග සංවර්ධනය

නාගරික ප්‍රදේශ හා ග්‍රාමීය ප්‍රදේශ එකිනෙකට ඒකාබද්ධ කිරීමේ අරමුණින් සැලසුම් බලප්‍රදේශය පුරා විහිදුණු අභ්‍යන්තර මාර්ග ජාලය පුළුල් කිරීමට යෝජනා කෙරේ. එම සංවර්ධනය කොටස් කිහිපයක් යටතේ හඳුනා ගත හැකිය.

1. අභ්‍යන්තර කලාපවල නගර මධ්‍යස්ථාන සම්බන්ධ කරමින් යෝජිත මාර්ග සංවර්ධනය
2. විශේෂ සේවාවන් සැපයීම සඳහා යෝජිත මාර්ග සංවර්ධනය
3. කුඹුරු ඉඩම් සහ පහත්බිම් හරහා යෝජිත මාර්ග සංවර්ධනය


## I. සංවර්ධනය කිරීමට යෝජිත මාර්ග පද්ධතිය

### A. *ගාලු පාර (මොරගල්ල සිට අළුත්ගම දක්වා වූ කලාපය) මංතීරු හතරක් සහිතව පුළුල් කිරීම.*

වර්තමානයේදී මොරගල්ල සිට අලුත්ගම දක්වා පවතින මීටර් 9–12 අතර පළල සහිත ගාලු පාර මීටර් 18–20 දක්වා පුළුල් කිරීමට යෝජනා කෙරේ. එහිදී, යෝජිත පහසුකම් ලෙස,

- *රථවාහන ගමනාගමන මංතීරු (3.5 මීටර් x 4 = 14 මීටර්)*
- *රථ වාහන නවතා තැබීමේ පහසුකම් තෝරාගත් ස්ථානයන්හිදී ලබාදීම.(2.5 මීටර්)*
- *හරිත තීරු සහිත පදිකයන් සඳහා වෙන්වූ මංතීරු ( 1.5 මීටර් – 2 මීටර්)*

මේ අනුව සංවර්ධනය කිරීමට යෝජිත මාර්ගයෙහි දළ හරස්කඩක් රූපය 6.5 මඟින් දැක්වේ.





රූපය 6.5 : පුළුල් කිරීමට යෝජිත ගාලු පාරේ දළ හරස්කඩ
මූලාශ්‍රය : බේරුවල සැලසුම් කණ්ඩායම, කළුතර දිස්ත්‍රික් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය, (2018)

### B. *බේරුවල මරදාන මොරගල්ල මාර්ගය පළමු පෙළ ප්‍රමුඛතාවයක් ඇති මාර්ගයක් ලෙසින් සංවර්ධනය කිරීම.*

අනාගතයේ වැඩිවන ජනගහනයත් සමඟ රථවාහන තදබදයක් අපේක්ෂා කරන ගාලු පාරේ තදබදය මුදාහැරිය හැකි විකල්ප මාර්ගයක් ලෙසින් මෙම බේරුවල මරදාන මොරගල්ල මාර්ගය පළමු පෙළ පිවිසුම් මාර්ගයක් ලෙසින් පහත රූපය 6.6 මඟින් දැක්වෙන පරිදි සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ.

#### *යෝජිත පහසුකම්*

- *රථවාහන ගමනාගමන මංතීරු (5 මීටර්)*
- *පාපැදි සඳහා වෙන් වූ මංතීරු (2 මීටර්)*
- *හරිත තීරු සහිත පදිකයන් සඳහා වෙන්වූ මංතීරු (2 මීටර්)*




*රූපය 6.6 : සංවර්ධනය කිරීමට යෝජිත බේරුවල මරදාන මොරගල්ල මාර්ගයේ දළ හරස්කඩ*
*මූලාශ්‍රය : බේරුවල සැලසුම් කණ්ඩායම, කළුතර දිස්ත්‍රික් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය, (2018)*

### C. *පුළුල් කිරීමට යෝජිත, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග (මංතීරු දෙකක් සහිත මාර්ග ලෙස)*

පුළුල් කිරීමට යෝජිත පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ගයන්හි පවතින හා යෝජිත පළල වගුව 6.5 මඟින් දැක්වේ.

| | පුළුල් කිරීමට යෝජිත මාර්ගය | පවතින පළල (මීටර්) | යෝජිත පළල (මීටර්) |
|---|---|---|---|
| 1 | පයාගල - දොඩන්ගොඩ මාර්ගය | 5 | 9 |
| 2 | පාලයන්ගොඩ - නාගහදුව මාර්ගය | 5 | 9 |
| 3 | විහාරකන්ද මාර්ගය | 5 | 9 |
| 4 | පයාගල - කව්වේගොඩ මාර්ගය | 5 | 9 |
| 5 | පයාගල - නාවත්තුඩුව මාර්ග | 5 | 9 |
| 6 | ශාන්ත වින්සෙන්ති මාර්ගය | 5 | 9 |
| 7 | මග්ගොන, මුංහේන, හල්කඳවිල මාර්ගය | 5 | 9 |
| 8 | කංකානම්ගොඩ, කීරන්තිඩිය මාර්ගය | 5 | 9 |
| 9 | බේරුවල - අළුත්ගම්වීදිය මාර්ගය | 5 | 9 |
| 10 | ෆතා හජ්පියාර් මාවත | 5 | 9 |
| 11 | කලුවාමෝදර - කාලවිල මාර්ගය | 5 | 9 |
| 12 | පිංහේන - පාදාගොඩ මාර්ගය | 5 | 9 |
| 13 | චීන කොටුව මාර්ගය | 5 | 9 |

වගුව 6.5 : පුළුල් කිරීමට යෝජිත, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - ක්ෂේත්‍ර සමීක්ෂණය – 2018

මෙම පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ගයන් පුළුල් කිරීමේ ප්‍රධානතම අපේක්ෂාව වනුයේ, දැනට වෙරළබඩ ප්‍රදේශයන් වල ඒකරාශී වී ඇති අධික ජනගහනය, 2030 වන විට සංවර්ධන බලප්‍රදේශයේ අභ්‍යන්තර ප්‍රදේශයන් කරා ගෙනයාමයි.

### යෝජිත පහසුකම්

- රථවාහන ගමනාගමන මංතීරු (5 මීටර්)
- පාපැදි සඳහා වෙන් වූ මංතීරු (2 මීටර්)
- හරිත තීරු සහිත පදිකයන් සඳහා වෙන්වූ මංතීරු (මීටර් 2 – මීටර් 3)

### D. යෝජිත නව මාර්ගයන්

I. උතුරු – දකුණු ප්‍රවේශ මාර්ගය – i
II. උතුරු – දකුණු ප්‍රවේශ මාර්ගය– ii

මෙම යෝජිත උතුරු දකුණු සීමාවන් සම්බන්ධ කරන ප්‍රවේශ මාර්ගයන් ඉදිවන්නේ සංවර්ධන බලප්‍රදේශය අභ්‍යයන්තරයේ වර්තමානය වන විට පවතින සංවර්ධනය නොවූ පටු මාර්ගයන් ඔස්සේය. මෙලෙසින් දැනට නොදියුණු තත්ත්වයේ පවතින පටු මාර්ගයන් සංවර්ධනය කිරීමට අපේක්ෂා කරනුයේ 2030 වන විට වැඩිවන ජනගහනයට පහසුකම් ලබා දීමටත් සංවර්ධන පීඩනය සංවර්ධන බලප්‍රදේශ අභ්‍යන්තරයට මුදා හැරීමටත් අභ්‍යන්තරයේ පවතින උපනාගරික කලාපයන් සංවර්ධනය කිරීමටත්ය.




**යෝජිත උතුරු - දකුණු ප්‍රවේශ මාර්ගය (i)**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 0.35 0.7 1.4 2.1 2.8 කි.මී

නාගරික සංවර්ධන අධිකාරිය
අගෝස්තු 2018

බස්නාහිර පළාත් අංශය | බේරුවල සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

*සිතියම 6.8 : බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යෝජිත උතුරු දකුණු ප්‍රවේශ මාර්ගය*

## I. යෝජිත උතුරු – දකුණු ප්‍රවේශ මාර්ගය – i

| සංවර්ධනය කිරීමට යෝජිත මාර්ගය | සංවර්ධනය කිරීමට යෝජිත කොටස | | යෝජිත දිග (කි.මී.) | යෝජිත පළල (මී.) |
|---|---|---|---|---|
| | සිට | දක්වා | | |
| යක්වත්ත පාර | අධිකාරීගොඩ | පාදාගොඩ | 1.3 | 09 |
| පාදාගොඩ - අඹේපිටිය මාර්ගය | පාදාගොඩ | අඹේපිටිය | 2.6 | 09 |
| අඹේපිටිය - මුංහේන මාර්ගය (පවතින මාර්ගයන් සහ යෝජිත නව මාර්ග සම්බන්ධතාවය) | අඹේපිටිය | මුංහේන | 4.0 | 09 |
| මුංහේන - පොතුවිල මාර්ගය (පවතින මාර්ගයන් සහ යෝජිත නව මාර්ග සම්බන්ධතාවය) | මුංහේන | පොතුවිල | 2.28 | 09 |
| පොතුවිල හංදියේ සිට කච්චේරිගොඩ පාර හරහා නාගහදූව පාරට ඇති මාර්ගය (පවතින මාර්ගයන් සම්බන්ධතාවය) | පොතුවිල හංදිය | නාගහදූව පාර | 1.0 | 09 |
| **මුළු දිග** | | | **11.18** | **45** |


*වගුව 6.6 : යෝජිත උතුරු - දකුණු ප්‍රවේශ මාර්ගය i සම්බන්ධ කෙරෙන මාර්ගයන්*
*මූලාශ්‍රය : මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - ක්ෂේත්‍ර සමීක්ෂණය (2018)*

## II. යෝජිත උතුරු – දකුණු ප්‍රවේශ මාර්ගය – ii

| සංවර්ධනය කිරීමට යෝජිත මාර්ගය | සංවර්ධනය කිරීමට යෝජිත කොටස | | යෝජිත දිග (කි.මී.) | යෝජිත පළල (මී.) |
|---|---|---|---|---|
| | සිට | දක්වා | | |
| අලුත්ගම්වීදිය යටදොලවත්ත මාර්ගය | අඹගහ හංදිය | කාලවිල | 3.1 | 09 |
| කාලවිල - බඳනාගොඩ මාර්ගය | කාලවිල | බඳනාගොඩ | 3.5 | 09 |
| බඳනාගොඩ - හල්කඳවිල මාර්ගය | බඳනාගොඩ | හල්කඳවිල | 3.6 | 09 |
| හල්කඳවිල - හිරිගල්ගොඩැල්ල (පවතින මාර්ගයන් සහ යෝජිත නව මාර්ග සම්බන්ධතාවය | හල්කඳවිල | හිරිගල්ගොඩැල්ල | 3.7 | 09 |
| **මුළු දිග** | | | **13.9** | **36** |

*වගුව 6.7 : යෝජිත උතුරු - දකුණු ප්‍රවේශ මාර්ගය ii සම්බන්ධ කෙරෙන මාර්ගයන්*
*මූලාශ්‍රය : මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - ක්ෂේත්‍ර සමීක්ෂණය (2018)*

යෝජිත උතුරු – දකුණු ප්‍රවේශ මාර්ගයන් වගුව 6.6 හා 6.7 මඟින් දැක්වෙන මාර්ගයන් යා කරමින් ඉදිකිරීමට යෝජිත අතර එම මාර්ගයන් සිතියම් 6.8 හා සිතියම් 6.9 මඟින් දැක්වේ.




**යෝජිත උතුරු - දකුණු ප්‍රවේශ මාර්ගය (ii)**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 0.35 0.7 1.4 2.1 2.8 කි.මී

නාගරික සංවර්ධන අධිකාරිය
අගෝස්තු 2018

| | | |
|---|---|---|
| බස්නාහිර පළාත් අංශය | බේරුවල සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය |

*සිතියම 6.9 : බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යෝජිත උතුරු දකුණු ප්‍රවේශ මාර්ගය ii*

E. *පුළුල් කිරීමට යෝජිත සුනාමි නැවත පදිංචි කිරීමේ ස්ථානයන්හි ප්‍රවේශ මාර්ගයන්,*

1. ජෝසප් සෝබාස් මාර්ගය
2. සාගර මාවත
3. ශාන්ත මරියා මාර්ගය
4. ඇත්පන්තිය මාර්ගය
5. පොතුවිල මාර්ගය
6. විහාරකන්ද මාර්ගය
7. මුණසිංහගොඩ මාර්ගය

පුළුල් කිරීමට යෝජිත සුනාමි නැවත පදිංචි කිරීමේ ස්ථානයන්හි ප්‍රවේශ මාර්ගයන්ගේ පවතින දිග, පළල සහ යෝජිත පළල වගුව 6.8 මඟින් දැක්වේ.


| | පුළුල් කිරීමට යෝජිත මාර්ගය | පවතින දිග (මීටර්) | පවතින පළල (මීටර්) | යෝජිත පළල (මීටර්) |
|---|---|---|---|---|
| 1 | ජෝසප් සෝබාස් මාර්ගය | | | 7 |
| 2 | සාගර මාවත | | | 7 |
| 3 | ශාන්ත මරියා මාර්ගය | 217.58 | 6.05 | 7 |
| 4 | ඇත්පන්තිය මාර්ගය | 424.35 | 4.03 | 7 |
| 5 | පොතුවිල මාර්ගය | | 3.93 | 7 |
| 6 | විහාරකන්ද මාර්ගය | | | 7 |
| 7 | මුණසිංහගොඩ මාර්ගය | | 6.67 | 7 |

*වගුව 6.8 : පුළුල් කිරීමට යෝජිත සුනාමි නැවත පදිංචි කිරීමේ ස්ථානයන්හි ප්‍රවේශ මාර්ගයන්ගේ පවතින හා යෝජිත පළල සීමාවන්*
*මූලාශ්‍රය : මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - ක්ෂේත්‍ර සමීක්ෂණය (2018)*

සුනාමියෙන් අවතැන් වූවන් සඳහා වූ නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වන ස්ථානයන්හි ජනගහනයට ගැලපෙන අයුරින් පුළුල් කිරීමට යෝජිත මාර්ග පද්ධතිය සිතියම 6.10 මඟින් දැක්වෙන අතර එම මාර්ග රූපය 6.7 හි දැක්වෙන පරිදි සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

## යෝජිත පහසුකම්

රථවාහන ගමනාගමන මංතීරු (5 මීටර්)
හරිත තීරු සහිත පදිකයන් සඳහා වෙන්වූ මංතීරු (2 මීටර්)





**පුළුල් කිරීමට යෝජිත සුනාමි නැවත පදිංචි කිරීමේ ස්ථානයන්හි ප්‍රවේශ මාර්ග**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 0.1 0.2 0.4 0.6 0.8 කි.මී

නාගරික සංවර්ධන අධිකාරිය
අගෝස්තු 2018



*සිතියම 6.10 : බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුළුල් කිරීමට යෝජිත සුනාමි නැවත පදිංචි කිරීමේ ස්ථානයන්හි ප්‍රවේශ මාර්ග*





*රූපය 6.7 : පුළුල් කිරීමට යෝජිත සුනාමි නැවත පදිංචි කිරීමේ ස්ථානයන්හි ප්‍රවේශ මාර්ගයන්හි දළ හරස්කඩ*
*මූලාශ්‍රය : බේරුවල සැලසුම් කණ්ඩායම, කළුතර දිස්ත්‍රික් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය, (2018)*

## F. පුළුල් කිරීමට යෝජිත වෙරළ ප්‍රවේශ මාර්ගයන් සහ සංචාරක ප්‍රදේශයන් සඳහා වූ ප්‍රවේශ මාර්ගයන්

2030 වන විට සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කරමින් දේශීය සහ විදේශීය සංචාරක ආකර්ෂණය ඉහළ නැංවීමේ අරමුණින් වෙරළ ප්‍රවේශ මාර්ගයන් සහ සංචාරක ප්‍රදේශයන් සඳහා ප්‍රවේශ වන මාර්ගයන් පුළුල් කිරීමට අපේක්ෂා කෙරේ. එම පුළුල් කිරීමට අපේක්ෂිත මාර්ගයන් සහ එම මාර්ගයන්ගේ පවතින දිග, පළල සහ යෝජිත පළල සිතියම් 6.11 සහ වගුව 6.9 මඟින් දැක්වේ.

### යෝජිත පහසුකම්

රථවාහන ගමනාගමන මංතීරු (5 මීටර්)
හරිත තීරු සහිත පදිකයන් සඳහා වෙන්වූ මංතීරු (2 මීටර්)




**සංවර්ධනය කිරීමට යෝජිත**
**සංචාරක ප්‍රදේශයන් සඳහා වූ පිවිසුම් මාර්ග**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 0.1 0.2 0.4 0.6 0.8 කි.මී

නාගරික සංවර්ධන අධිකාරිය
අගෝස්තු 2018

බස්නාහිර පළාත් අංශය | බේරුවල සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

*සිතියම 6.11 : බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංවර්ධනය කිරීමට යෝජිත සංචාරක ප්‍රදේශයන් සඳහා වූ පිවිසුම් මාර්ග*

| | පුළුල් කිරීමට යෝජිත මාර්ගය | පවතින දිග (මීටර්) | පවතින පළල (මීටර්) | යෝජිත පළල (මීටර්) |
|---|---|---|---|---|
| 1 | 7 වන පටුමග | 706.41 | 4.57 | 9 |
| 2 | 6 වන පටුමග | 691.06 | 4.11 | 9 |
| 3 | 5 වන පටුමග | 493.20 | 3.79 | 9 |
| 4 | 4 වන පටුමග | 539.18 | 4.47 | 9 |
| 5 | ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයකි | 302.01 | 5.02 | 9 |
| 6 | ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයකි | 193.19 | 4.11 | 9 |
| 7 | ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයකි | 117.64 | 4.47 | 9 |
| 8 | ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයකි | 143.57 | 4.63 | 9 |
| 9 | ලංකා කුමරිය හෝටල් මාර්ගය | 128.79 | 4.26 | 9 |
| 10 | ගඟබඩ මාර්ගය | 976.29 | 4.66 | 9 |
| 11 | පද්මිණි පීරිස් මාවත | 205.00 | 4.67 | 9 |
| 12 | 1 වන පටුමග | 196.42 | 4.47 | 9 |
| 13 | ගඟ මාවත | 190.96 | 4.55 | 9 |

වගුව 6.9 : පුළුල් කිරීමට යෝජිත වෙරළ ප්‍රවේශ මාර්ග සහ සංචාරක ප්‍රවේශ මාර්ගයන්හි පවතින හා යෝජිත පළල සීමාවන්
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - ක්ෂේත්‍ර සමීක්ෂණය (2018)

## G. පුළුල් කිරීමට යෝජිත පැරණි ගාලු පාරේ සිට නව ගාලු පාර වෙතට ප්‍රවේශ වීම සඳහා වූ කෙටි පටුමග




දැනට කෙටි පටුමගක් ලෙසින් පවතින මෙම මාර්ගය වාහන ගමනාගමනය සඳහා ඉඩ කඩ සලස්වා දීමකින් තොරව මගී ගමනාගමන පහසුව වැඩි කිරීමේ අරමුණින් පුළුල් කිරීමට යෝජනා කෙරේ. එම පුළුල් කිරීමට යෝජිත කෙටි මාර්ගය රූපය 6.8 මඟින් දැක්වේ.


රූපය 6.8 : ගාලු පාර සහ මරදාන පාර සම්බන්ධ කෙරෙන යෝජිත කෙටි මාර්ගය සංවර්ධනය
මූලාශ්‍රය : Google Earth Map (2018)

## H. *පුළුල් කිරීමට යෝජිත දුම්රිය ප්‍රවේශ මාර්ගයන්*

ඇවිදීමේ පහසුකම් වැඩි දියුණු කරමින් පුළුල් කිරීමට යෝජිත දුම්රිය ප්‍රවේශ මාර්ගයන්හි පවතින දිග, පළල සහ යෝජිත පළල වගුව 6.10 මඟින් දැක්වේ. එම මාර්ගයන්හි දළ හරස්කඩක් රූපය 6.9 මඟින් දැක්වේ.

| | **පුළුල් කිරීමට යෝජිත මාර්ගය** | **පවතින දිග (මීටර්)** | **පවතින පළල (මීටර්)** | **යෝජිත පළල (මීටර්)** |
|---|---|---|---|---|
| 1 | පයාගල උතුර දුම්රිය පිවිසුම් මාර්ගය | 241.36 | 4.95 | 7 |
| 2 | බේරුවල දුම්රිය පිවිසුම් මාර්ගය | 63.86 | 5.60 | 7 |
| 3 | හෙට්ටිමුල්ල දුම්රිය පිවිසුම් මාර්ගය | 401.92 | 5.64 | 7 |
| 4 | අළුත්ගම දුම්රිය පිවිසුම් මාර්ගය | 282.58 | 6.22 | 7 |

*වගුව 6.10 : පුළුල් කිරීමට යෝජිත දුම්රිය ප්‍රවේශ මාර්ගයන්හි පවතින හා යෝජිත පළල සීමාවන්*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - ක්ෂේත්‍ර සමීක්ෂණය (2018)*




*රූපය 6.9 : පුළුල් කිරීමට යෝජිත දුම්රිය ප්‍රවේශ මාර්ගයන්හි දළ හරස්කඩ*
*මූලාශ්‍රය : බේරුවල සැලසුම් කණ්ඩායම, කළුතර දිස්ත්‍රික් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

## 6.3.5. ජල සැපයුම් සැලැස්ම

දැනට සැලසුම බලප්‍රදේශයේ පවතින ජනගහනයට ප්‍රමාණවත් අයුරින් ජල සැපයුම සිදු වුවද එය 2030 වසර වන විට වැඩිවන ජනගහනයට උචිත අයුරින් ලබාදීම සඳහා ජල සම්පාදන සැලැස්මක අවශ්‍යතාවය පවතී. බේරුවල බලප්‍රදේශයේ පානීය ජල මූලාශ්‍ර සැලකීමේ දී නල ජලය ආරක්ෂිත ළිං මඟින් එදිනෙදා පානීය ජල අවශ්‍යතා සපුරා ගනී.

2030 වන විට 207.294 ක් නේවාසික ජනගහනයටත් 75000 ක සංසරණ ජනගහනයට අවශ්‍ය පානීය ජලය හා අනෙකුත් ජල අවශ්‍යතාවයන් මෙම සංවර්ධන සැලැස්ම මඟින් සපයනු ඇත.

වර්තමානයේදී ප්‍රදේශයට අවශ්‍ය නල ජල සැපයුම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් සිදු කරනු ලබන්නේ කළු ගඟ මූලික කරගත් කෙත්හේන ප්‍රදේශයේ පිහිටුවා ඇති පිරිසිදු කිරීමේ මධ්‍යස්ථානය මඟිනි.

වර්තමානයේ පවතින ජල සැපයුම හා ජල ධාරිතාව වගුව 6.11 මඟින් දැක්විය හැකිය.

| ජල ටැංකි ප්‍රදේශය | ධාරිතාව (ඝන මීටර්) |
|---|---|
| පයාගල | 455 |
| බේරුවල | 1,360 |
| මග්ගොන | 227 |
| දර්ගා නගරය | 1,500 |

වගුව 6.11 : වර්තමානයේ සැලසුම් බලප්‍රදේශය තුළ පවතින ජල සැපයුම හා ජල ධාරිතාව
මූලාශ්‍රය : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

නමුත් 2030 වන විට බේරුවල ප්‍රදේශය සංචාරක හා ධීවර අංශය මුල්කොටගත් ආර්ථික සංවර්ධනයක් බලාපොරොත්තුවන බැවින් අධික ජල ඉල්ලුමක් පවතී.

එක් එක් කාර්යයන් සඳහා 2030 වන විට අවශ්‍ය දෛනික ජල අවශ්‍යතාවය වගුව 6.12 මඟින් දැක්වේ.

| ක්‍රියාකාරකම | ජනගහනය | එක් පුද්ගලයෙකුට අවශ්‍ය ජලය (දිනකට ලීටර්) | අවශ්‍ය සම්පූර්ණ ජල අවශ්‍යතාව (දිනකට ලීටර්) |
|---|---|---|---|
| වාණිජ | 123,858 | 20 | 2,477,160 |
| සංචාරක | 45,696 | 180 | 8,225,280 |
| නේවාසික | 207,294 | 135 | 27,984,690 |
| ආයතනික | 48,221 | 10 | 482,210 |
| කර්මාන්ත | 7,226 | 50 | 361,300 |
| | | | **39,530,640** |

වගුව 6.12 : වර්ෂ 2030 වනවිට සැලසුම් බලප්‍රදේශය තුළ පවතින ජල සැපයුම සහ ජලඅවශ්‍යතාවය
මූලාශ්‍රය : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

ඒ අනුව දෛනික ජල අවශ්‍යතාව කියුබික් මීටර් 39,530ක් වේ.

යෝජිත අගලවත්ත – දොඩන්ගොඩ – මතුගම ජල ව්‍යාපෘතිය මඟින් බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් 82 ක ආවරණ වනු ඇත. ඒ අනුව 2030 වන විට බේරුවල බලප්‍රදේශයට අවශ්‍ය පානීය ජලය හා අනෙකුත් ජල අවශ්‍යතා මෙම ව්‍යාපෘතිය මඟින් සැපිරෙනු ඇත.

## 6.3.6. විදුලි සැපයුම් සැලැස්ම

බේරුවල සංවර්ධන සැලසුම් බලප්‍රදේශයේ විදුලිබල හා සන්නිවේදන පහසුකම්, පවතින ජනගහනයට ප්‍රමාණවත් අයුරින් පවතින අතර එය 2030 වන විට වැඩිවන ජනගහනයට තම අවශ්‍යතාවයන් සපුරාගැනීම සඳහා අවශ්‍ය වන අයුරින් සම්පාදනය කිරීමේ අරමුණින් බේරුවල සංවර්ධන සැලසුම යටතේ විදුලිබල සැපයුම කෙරෙහි අවධානය යොමු කරනු ලබයි.

සංවර්ධන සැලසුම් බලප්‍රදේශයේ බේරුවල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය සඳහා විදුලි බලය සැපයීම ලංකා විදුලිබල (පුද්ගලික) සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය මඟින් සිදු කරනු ලබන අතර බේරුවල නගර සභා බලප්‍රදේශය සඳහා විදුලි බලය සැපයීම විදුලිබල පුද්ගලික සමාගම මඟින් සිදුකරනු ලබයි. මෙම විදුලිබල සැපයුම දැනට සංවර්ධන බලප්‍රදේශයේ පවත්නා ජනගහනයට ප්‍රමාණවත් අයුරින් පවතී. එම පවතින විදුලිබල සැපයුම 2030 වන විට වැඩිවන ජනගහනයට උචිත වන අයුරින් ලබාදීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ඒකාබද්ධ වී කටයුතු සැලසුම් කිරීමට යෝජිතය.

2030 වන විට නව ප්‍රබෝධයකට පත්වන සංචාරක කර්මාන්තය ඉහළ නැංවීම සඳහා ස්වභාවික සූර්ය බල ශක්තිය උපයෝගී කර ගැනීමට ද අපේක්ෂා කෙරේ.

## 6.3.7. මළාපවහන, අපජල හා ජලාපවහන කළමනාකරණ සැලැස්ම

### *මළාපවහන හා අපජල කළමනාකරණය*

සැලසුම් බලප්‍රදේශයේ මේ වන විට මළාපවාහන පහසුකම් නොමැති අතර ප්‍රාදේශීය සභා බලප්‍රදේශය සඳහා මළාපවාහන පද්ධතියක අවශ්‍යතාවයක් නොමැති අතර නගර සභා බලප්‍රදේශය සඳහා මළාපවාහන පද්ධතියක අවශ්‍යතාවය ඇත. මේ වන විට නගර සභා බලප්‍රදේශයේ පවුල් සංඛ්‍යාවෙන් 99% ක් පමණ ජල මුද්‍රිත වැසිකිළි භාවිතා කරයි.

මෙම ප්‍රදේශය මේ වන විට මුහුණ පාන ගැටළුවක් ලෙස හඳුනාගත් සුළු වර්ෂාවකදී වුව ජල මට්ටම ඉහළ යාම හා ජල මූලාශ්‍ර දූෂිත තත්ත්වයට පත්වීම දැක්විය හැකිය. මේ නිසා ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වයන් පිළිබඳ අවධානය යොමු කල යුතුය.

නගරයේ වැසියන්ගෙන් බහුතරය මුස්ලිම් ජනතාව බැවින් ඔවුන් එකිනෙකා සමඟ එකට වාසය කිරීමට වැඩි කැමැත්තක් දැක්වීම නිසා පවතින ඉඩම් කුඩා කොටස් වලට බෙදීමේ වැඩි නැඹුරුතාවයක් පවතී. මරදාන, මාළිගාහේන, කංකානම්ගොඩ වැනි ප්‍රදේශ වල පවතින අධික ජන ඝනත්වය නිසා ජලමූලාශ්‍ර දූෂිත වීම ප්‍රධාන හේතුවක් ලෙස හඳුනාගෙන ඇත.

තවද බේරුවල සහ බෙන්තර ගඟ ආශ්‍රිත සංචාරක කලාපය ජලය පදනම් කරගත් ක්‍රියාකාරකම් සහිත සංචාරක කටයුතු සඳහා ප්‍රචලිත වන බැවින් බෙන්තර ගඟෙහි සහ ඒ ආශ්‍රිත මුහුදු තීරයෙහි ජලයෙහි පිරිසිදු ගුණාත්මකභාවය ඉහළ අගයක පවත්වාගෙන යාම ඉතා වැදගත් වේ. විශේෂයෙන්ම "බ්ලූ ෆ්ලැග්" විනෝදාශ්වාද කලාපය අනාගතයේ දී ආකර්ශනීය සංචාරක වෙරළ තීරයක් ලෙස ජාත්‍යන්තර ප්‍රකාශයට පත් කිරීම්දී මුහුදු ජලයෙහි ගුණාත්මකභාවය අතිශය වැදගත් වේ.

දැනට මෙම කලාපය තුළ ඒකාබද්ධ අප ජල කළමනාකරණ වැඩසටහනක් නොමැති බැවින් මහා පරිමාණ හෝටල් තුළ ස්වයං අප ජල කළමනාකරණ වැඩ පිළිවෙල ( Treatments plants) ක්‍රියාත්මක වන අතර එම කළමනාකරණ වැඩ පිළිවෙලින් පසු පිරිපහදු නල ජලය බෙන්තර ගඟ වෙත මුදා හරිනු ලැබේ.

අනාගතයේදි වැඩිවන සංචාරක ප්‍රමාණයට මෙම අප ජල කළමනාකරණ වැඩ පිළිවෙල තුළින්ම අපජලය පිරිපහදු කිරීමට යෝජනා කෙරේ.

## ජලාපවහන කළමනාකරණය

නව දුරටත් සලකා බැලීමේදී, දැනට බේරුවල නගර සභාව තුළ පවතින ජල මූලාශ්‍ර බොහොමයක් කැලිකසළ බැහැරකිරීම මඟින් දූෂිත තත්ත්වයට පත්ව ඇත. එය රූපය 6.10 මඟින් දැක්වේ.

ලොව බොහොමයක් රටවල නගර මෙලෙස දූෂිත ජල මූලාශ්‍රයන් පිරිසිදු කිරීමේ ක්‍රමෝපායක් ලෙස "තිරසාර නාගරික ජලාපවහන පද්ධති" යන සංකල්පය යොදා ගනිමින් නාගරික ප්‍රදේශයන්හි පිරිසිදු ජලවහන පද්ධතියක් ඇතිකිරීමත් ගංවතුර ආදී ස්වාභාවික ආපදා අවමකර ගැනීමත් සිදුකර ඇත.

මේ අනුව තිරසාර ජලාපවහන ක්‍රමෝපාය මඟින් බේරුවල නගරසභා බලප්‍රදේශය තුළ දැනට පවතින ඇළ මාර්ග සම්බන්ධකර නිසි පරිදි ජලාපවහන සැලැස්මක් හඳුන්වාදීමත් මතුපිට ජලවහනය ක්‍රමානුකූල වන පරිදි පවතින ඇළ මාර්ග පද්ධතියක් වැඩිදියුණු කිරීම හා නව ඇළ මාර්ග පද්ධතියක් හඳුන්වා දීමත් සිදුකිරීමට යෝජිතය. එම යෝජිත තත්ත්වය රූපය 6.11 මඟින් දැක්වේ.



*රූපය 6.10 : බේරුවල නගර සභා බලප්‍රදේශයේ පවතින වර්තමාන ඇළ මාර්ග හා කාණු පද්ධතිය*
*මූලාශ්‍රය : ඡායාරූප ගත කිරීම, බේරුවල සැලසුම් කණ්ඩායම, කළුතර දිස්ත්‍රික් කාර්යාලය, 2018.05.21 (2018)*



*රූපය 6.11 : සංවර්ධනය කිරීමට යෝජිත කාණු පද්ධතිය හා ඇළ මාර්ග*
*මූලාශ්‍රය : TripAdvisor වෙබ් අඩවිය (2018)*

## 6.3.8. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම

වර්ෂ 2030 වන විට ආර්ථික ක්ෂේත්‍රයේ ඉහළ වර්ධනයක් ළඟාකර ගැනීමේ අරමුණින් සිදුකරන සංචාරක ක්ෂේත්‍රය ආශ්‍රිත පහසුකම් සංවර්ධනය කිරීමත් ඒ ආශ්‍රිතව ආකර්ෂණය වන සංචාරකයන් ප්‍රමාණය ඉහළ යාමත් හේතුවෙන් ප්‍රදේශය තුළ ජනනය වන කැලි කසළ ප්‍රමාණය මනා කළමනාකරණයකින් යුතුව බැහැර කිරීමටත් ප්‍රදේශය තුළ වැඩිවන ජනගහනයට අවශ්‍ය ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ සැලැස්මක් ඇති කිරීම තුළින් පාරිසරික සුරක්ෂිත භාවයක් ඇති කිරීමටත්, මිනිසාට සුව පහසු වටපිටාවක් ඇති කිරීමටත් සැලසුම් බලප්‍රදේශය තුළ නිසි ඝන අපද්‍රව්‍ය කළමනාකරණයක් පවත්වා ගැනීමටත් මෙම සැලැස්ම ඉදිරිපත් කෙරේ.

වර්තමානයේ බේරුවල නගර සභා බලප්‍රදේශයේ දිනකට කසළ ටොන් 21.4ක් ද, ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ දිනකට කසළ ටොන් 24ක් ද ලෙසින් සමස්ථ බලප්‍රදේශය තුළ ටොන් 45ක කසළ ප්‍රමාණයක් එකතු වේ. එසේ එකතුවන කසළ වර්ගීකරණයන්ගේ ප්‍රමාණයන් වගුව 6.13 මඟින් දැක්වේ.

| *බලප්‍රදේශය* | *දිනකට එකතුවන මුළු කසළ ප්‍රමාණය (ටොන්)* | *කාබනික (%)* | *කඩදාසි (%)* | *වීදුරු (%)* | *ලෝහ (%)* | *පොලිතීන් සහ වෙනත් (%)* |
|---|---|---|---|---|---|---|
| *ප්‍රාදේශීය සභා බලප්‍රදේශය* | *24* | *75* | *10* | *5* | *5* | *5* |
| *නගර සභා බලප්‍රදේශය* | *21.4* | *43.7* | *1.8* | *1.4* | *3.2* | *49.9* |

*වගුව 6.13 : සැලසුම් බලප්‍රදේශය තුළින් දෛනිකව එකතුවන ඝන අපද්‍රව්‍යය ප්‍රමාණයන්*
*මූලාශ්‍රය : බේරුවල ප්‍රාදේශීය සභාව සහ බේරුවල නගර සභාව (2016)*

බේරුවල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ එකතුවන කැලි කසළ දිරන සහ නොදිරන ලෙස වෙන් කිරීමත්, දැනට පාදාගොඩ පවතින කසළ අංගනය (සිතියම 6.12) මඟින් දිරන කසළ සෑම දිනකම කොම්පෝස්ට් පොහොර බවට පරිවර්තනය කිරීමත් සිදු කරනු ලබයි. නමුත් බේරුවල නගර සභා බලප්‍රදේශය තුළ පවතින කැලි කසළ නිසි අයුරින් කළමනාකරණය වීමක් දැනට දක්නට නොලැබේ.


මේ හේතුවෙන් බේරුවල නගර සභා සීමාව ආසන්නයේ ඇති බෙරව ඇළට සහ වෙන්නිම්රජපුර ඇළට කැලි කසළ මුදාහැරීම ප්‍රබලව දක්නට ලැබේ. මෙම තත්ත්වය හේතුකොට ගෙන බේරුවල ධීවර වරාය ආශ්‍රිතව කුණු නැන්පත්වීමත් වැසි තත්ත්වයන්හිදී ජලයෙන් යටවීමත් හඳුනාගත හැකිය. එය ප්‍රදේශයේ සංචාරක ආකර්ෂණය දිනාගැනීමට බාධා පමුණුවයි. මෙනිසා මෙම ප්‍රදේශයට ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුමක අවශ්‍යතාවය පවතී.

වර්ෂ 2030 වන විට යෝජිත කලාපීකරනයන්ගේ ජනගහන පුරෝකථනයට අනුව උත්පාදනය වන කැලි කසළ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 240 කි. එය වගුව 6.14 මඟින් දැක්වේ.

| කලාප අංකය | කලාපය | සංක්‍රමණික ජනගහනය | නේවාසික ජනගහනය | මුළු ජනගහනය | එක් පුද්ගලයකු විසින් ජනනය කරනු ලබන කැලි කසළ ප්‍රමාණය (දිනකට) | කිලෝ ග්‍රෑම් | මෙට්‍රික් ටොන් |
|---|---|---|---|---|---|---|---|
| 1 | ඉහළ ඝනත්ව නාගරික කලාපය 1 | 12,391 | 21,394 | 33,784 | 0.7 | 14,976 | 14.98 |
| 2 | ඉහළ ඝනත්ව නාගරික කලාපය 2 | 19,779 | 22,614 | 42,393 | 0.7 | 15,830 | 15.83 |
| 3 | ඉහළ ඝනත්ව නාගරික කලාපය 3 | 77,605 | 23,458 | 101,064 | 0.7 | 16,421 | 16.42 |
| 4 | මධ්‍ය ඝනත්ව නාගරික කලාපය | 4,088 | 56,773 | 60,861 | 0.6 | 34,064 | 34.06 |
| 5 | මධ්‍ය ඝනත්ව අර්ධ නාගරික කලාපය | 3,977 | 32,713 | 36,690 | 0.6 | 19,628 | 19.63 |
| 6 | මධ්‍ය ඝනත්ව අභ්‍යන්තර කලාපය | 1,209 | 8,450 | 9,658 | 0.5 | 4,225 | 4.23 |
| 7 | පහළ ඝනත්ව අභ්‍යන්තර කලාපය | 2,068 | 12,626 | 14,694 | 0.4 | 5,050 | 5.05 |
| 8 | ඉතා පහළ ඝනත්ව අභ්‍යන්තර කලාපය | 2,763 | 4,528 | 7,291 | 0.4 | 1,811 | 1.81 |
| 9 | ඉහළ ඝනත්ව සංචාරක කලාපය | 39,370 | 16,897 | 56,267 | 0.7 | 11,828 | 11.83 |
| 10 | පහළ ඝනත්ව සංචාරක කලාපය | 3,571 | 7,841 | 11,412 | 0.4 | 3,136 | 3.14 |
| | **එකතුව** | **106,047** | | | | **126,969** | **127** |

වගුව 6.14 : යෝජිත කලාපයන් සඳහා වර්ෂ 2030 වන විට එකතුවන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණයන්
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන ලද පර්යේෂණාත්මක ක්‍රමවේද (2018)

මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා දැනටමත් පිළිසරු ජාතික කසළ කළමනාකරණ වැඩසටහන යටතේ අක්කර 12 කින් යුක්ත කුරේවත්ත නමින් හඳුන්වන, දැනට මුඩු බිමක්ව පවතින මෙම ප්‍රදේශයේ කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීමට යෝජිතය (යෝජිතය කොම්පෝස්ට් අංගනය සිතියම 6.13 මඟින් දැක්වේ). මෙම සැලැස්ම යටතේ පාරිසරික සුරක්ෂිතතාවය ආරක්ෂා වන පරිදි හරිත කොරිඩෝ කිහිපයක් පිහිටුවීමට ද සැලසුම් කර ඇත.





**වර්තමාන ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථාන**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 0.35 0.7 1.4 2.1 2.8 කි.මී

**නාගරික සංවර්ධන අධිකාරිය**
දෙසැම්බර් 2018

බස්නාහිර පළාත් අංශය | බේරුවල සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

*සිතියම 6.12: බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වර්තමාන ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථාන*




**යෝජිත ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථාන**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 0.35 0.7 1.4 2.1 2.8 කි.මී

නාගරික සංවර්ධන අධිකාරිය
දෙසැම්බර් 2018



*සිතියම 6.13: බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යෝජිත ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථාන*

# 6.4. ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම.

සංවර්ධන සැලසුම් බලප්‍රදේශයේ ඉදිරි දැක්ම පිළිබඳව බලපාන්නා වූ ප්‍රබලතම අංගයක් වනුයේ එම ප්‍රදේශයේ පවත්නා ආර්ථික තත්ත්වය සහ ඉදිරි අනාගත සංවර්ධන ව්‍යාපෘතීන්ය. ඒ අනුව බේරුවල සංවර්ධන සැලසුම් බලප්‍රදේශයේ ආර්ථිකය ප්‍රධාන වශයෙන් සංචාරක කර්මාන්තය, ධීවර කර්මාන්තය සහ කෘෂිකර්මාන්තය යන ප්‍රධාන අංශ තුන මත පදනම් වූ නිෂ්පාදන සේවා සැපයීම සහ අගය එකතු කිරීමේ කර්මාන්ත යන ආර්ථික අංශ මත සංවර්ධනය වී ඇත.

දකුණු වෙරළ තීරයෙහි ආරම්භක ද්වාරය වන බේරුවල සැලසුම් බලප්‍රදේශය, ඉන් ඔබ්බට ව්‍යාප්ත වී ඇති ධීවර, මැණික්, කෘෂි කර්මාන්තය සහ සංචාරක යන අංශයන්හි සම්පිණ්ඩනයක් මත රඳා පැවති බේරුවල ආර්ථිකය, බහුවිධ ආර්ථික සංවර්ධනයක් කරා ගෙන යාම යන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මෙම ආර්ථික සැලසුම ඉවහල් වේ. සංවර්ධන සැලැස්මෙහි ප්‍රධාන අරමුණු වලින් එකක් වන, සැලසුම් බලප්‍රදේශය, නිරිතදිග වෙරළ තීරයෙහි බහුවිධ සංචාරක පුරවරයක් බවට පත් කිරීම යන්න ලඟාකර ගැනීම සඳහා සංචාරක කර්මාන්තය ඇතුළු ප්‍රධාන ආර්ථික විභවතාවයන් ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් ප්‍රදේශයේ පවතින ආර්ථික විවිධාංගීකරණයෙහි ප්‍රතිලාභ ප්‍රදේශය පුරා ව්‍යාප්ත කරලීම සඳහා අවශ්‍ය උපාය මාර්ග හඳුනා ගැනීම ආර්ථික සංවර්ධන සැලැස්ම මඟින් සිදුවේ.

මෙම ආර්ථික විභාවනාවයන් ප්‍රශස්ථ ලෙස භාවිතා කරමින් ප්‍රදේශයේ පවතින ආර්ථික විවිධාංගීකරණයෙහි ප්‍රතිලාභ ප්‍රදේශය පුරා ව්‍යාප්ත කරලීම සඳහා අවශ්‍ය උපාය මාර්ග හඳුනා ගැනීම මෙම ආර්ථික සංවර්ධන සැලසුමෙහි අරමුණ වේ. මෙහිදී ප්‍රධාන වශයෙන්,

- *ඒකාබද්ධ සංචාරක කර්මාන්ත සංවර්ධන උපායමාර්ගික සැලැස්ම.*
- *ධීවර කර්මාන්ත සංවර්ධන උපායමාර්ගික සැලැස්ම.*
- *මැණික් කර්මාන්තය සංවර්ධන උපායමාර්ගික සැලැස්ම*
- *කෘෂි කර්මාන්ත සංවර්ධන උපායමාර්ගික සැලැස්ම.*

යනුවෙන් අංශ හතරක් ඔස්සේ සාකච්ඡා කරනු ලබයි.

## 6.4.1. ඒකාබද්ධ සංචාරක කර්මාන්ත සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

සංචාරක කර්මාන්තයේ උන්නතිය උදෙසා සැලකිය යුතු විභවතා ප්‍රමාණයක් බේරුවල ප්‍රදේශය තුළ විසිරී ඇති අතර ඉන් ආකර්ශනීය වෙරළ තීරය, ජෛව විවිධත්වයෙන් යුතු කඩොලාන හා අනෙකුත් පරිසර පද්ධති, ආගමික හා ඓතිහාසික සිද්ධස්ථාන යන විභවතාවයන් ප්‍රධාන වේ. එම නිසා සැලසුම් බලප්‍රදේශයේ අලුත්ගම සහ බේරුවල යන ප්‍රධාන නගර ආශ්‍රිතව සංචාරක කර්මාන්තය ආශ්‍රිත පහසුකම් වැඩි දියුණු කිරීමට යෝජනා කෙරේ.

එමෙන්ම ධීවර, මැණික් සහ කෘෂිකර්මය යන අංශයන් සංචාරක කර්මාන්තය හා ඒකාබද්ධ කර ගනිමින් එම එක් එක් කර්මාන්තවල දියුණුව වැඩි කිරීම මඟින් සංචාරක ආකර්ශනය වැඩිකර ගැනීම ඒකාබද්ධ සංචාරක කර්මාන්ත සංවර්ධනය උපායමාර්ගික සැලසුම තුළින් අපේක්ෂා කෙරේ.

බේරුවල ප්‍රදේශය, දැනට මහා පරිමාණ සංචාරක කර්මාන්තය ප්‍රමුඛ කරගෙන සංවර්ධනය වී ඇති බැවින්, සංචාරකයින් සැලසුම් බලප්‍රදේශයෙහි වූ ප්‍රධාන පෙළේ හෝටල් වල නැවතුම් ගෙන දිවයිනේ අනෙකුත් ප්‍රදේශවල පිහිටි ස්ථාන නැරඹීමට යාමට පෙළඹී ඇත. මෙයට හේතුවනුයේ සංචාරකයින් සඳහා වන ආකර්ශනීය විභවතාවයන් විධිමත් අයුරින් භාවිතයට නොගැනීමයි. මෙනිසා ප්‍රදේශයේ ආර්ථිකයට සංචාරක කර්මාන්තයෙන් වන දායකත්වය ඉතා අඩු මට්ටමක පවතින අතර සංචාරක කර්මාන්තයේ ප්‍රතිලාභ ප්‍රදේශය පුරා විහිදී යෑමේ අඩු ප්‍රවණතාවයක් දක්නට ලැබේ.

මෙම තත්ත්වය මඟ හරවා ගැනීමට සැලසුම් බලප්‍රදේශය පුරා විසිරී පවතින අයුරින් සංචාරක කර්මාන්තය ප්‍රචලිත කළහැකි අනෙකුත් අංග දියුණු කර, නොයෙකුත් ක්‍රියාකාරකම් පදනම් කරගත් පරිසර හිතකාමී සංචාරක ආකර්ශනීය විභවතාවයන් සැලකිල්ලට ගනිමින් ප්‍රදේශය ප්‍රධාන කොටස් දෙකක් යටතේ සංවර්ධනය කිරීමට යෝජිතය. ඒ අනුව,

1. පයාගල සිට අලුත්ගම දක්වා වූ වෙරළ තීරය, ප්‍රමුඛ සංචාරක කොරිඩෝවක් ලෙසටත්,
2. ස්වභාවික, ඓතිහාසික හා සංස්කෘතික ස්ථාන ඒකාබද්ධ කරමින් සංචාරක කොරිඩෝවක් නිර්මාණය කිරීමත්,

යන ද්විත්වය සංචාරක ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා යොදා ගත් ප්‍රධාන උපාය මාර්ගයන් ලෙස දැක්විය හැකිය.


සංචාරක කර්මාන්ත සංවර්ධන උපායමාර්ගික සැලැස්ම යටතේ බලාත්මක කිරීම සඳහා වන නීති හා රෙගුලාසි දෙවන වෙළුම හි එන "ගොඩනැගිලි හා සැලසුම් රෙගුලාසි" යටතේ වැඩිදුරටත් විස්තර කෙරේ.

### 1. *පයාගල සිට අලුත්ගම දක්වා වූ වෙරළ තීරය ඔස්සේ සංචාරක කොරිඩෝවක් නිර්මාණය කිරීම.*

මේ යටතේ කොටස් 5 ක් හඳුනා ගන්නා ලදී. එනම්,

I. වෙරළ තීරය විවෘත කිරීම (Oceanic Visible Recreational Sphere)
II. බේරුවල ධීවර වරාය ආශ්‍රිත ප්‍රදේශය සංචාරක කටයුතු හා සම්බන්ධ කිරීම (Baberian Fishery Entertainment Sphere)
III. ජලාශ්‍රිත ප්‍රදේශ සංචාරක ප්‍රවර්ධන ප්‍රදේශ ලෙස සංවර්ධනය කිරීම (Aquatic Amusing Sphere )
IV. නිල් ධජ විනෝදාත්මක කලාපය සංවර්ධනය කිරීම. (Blue Flag Recreational Sphere)
V. බෙන්තර නදී මුඛ කලාපය විනෝදාත්මක කලාපයක් ලෙස සංවර්ධනය කිරීම, (Bentara Estuary  Amusement Sphere)

සිතියම 6.14 මඟින් දැක්වෙනුයේ බේරුවල සැලසුම් බලප්‍රදේශය සඳහා වන ඒකාබද්ධ සංචාරක සංවර්ධන සැලැස්මයි.




**ඒකාබද්ධ සංචාරක සංවර්ධන සැලැස්ම**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මුලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 0.35 0.7 1.4 2.1 2.8 කි.මී

**නාගරික සංවර්ධන අධිකාරිය**
අගෝස්තු 2018

බස්නාහිර පළාත් අංශය | බේරුවල සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

*සිතියම 6.14: බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඒකාබද්ධ සංචාරක සංවර්ධන සැලැස්ම*

බේරුවල සැලසුම් බලප්‍රදේශයෙහි වෙරළ තීරයන් විවෘත කිරීම ප්‍රධාන කලාප දෙකක් යටතේ සිදු කෙරේ. සංචාරක කොරිඩෝවක් නිර්මාණය කිරීමේදී හඳුනාගන්නා ලද කලාපයන්හි සවිස්තරාත්මක විස්තරයක් පහත පරිදි වේ.

## I. වෙරළ තීරය විවෘත කිරීම. (Oceanic Visible Recreational Sphere)

සංචාරක කොරිඩෝවේ ආරම්භක දර්ශනීය පෙත ලෙස වෙරළ තීරය විවෘත කිරීම හැදින්විය හැකිය. පයාගල සිට මග්ගොන නගරය දක්වා වූ වෙරළ තීරය තුළ ඇති සියලු අනවසර ඉදිකිරීම් ඉවත් කොට එම දර්ශනීය වෙරළ තීරය ආකර්ෂණීය ලෙස සංවර්ධනය කිරීමෙන් එය විවෘත වෙරළ තීරයක් බවට පත් කිරීම මෙහි මූලික අරමුණ වේ.

ගාලු පාරේ කොළඹ සිට දක්ෂිණ වෙරළ තීරය දෙසට ගමන් ගන්නා සංචාරකයන් හට නව ප්‍රාරම්භයක් ලබාදිය හැකි පරිදි මෙම වෙරළ තීරය වඩාත් ආකර්ශනීය ලෙස සංවර්ධනය කිරීමට මෙමඟින් අපේක්ෂා කෙරේ. සංවර්ධන සැලැස්මේ ප්‍රධාන අරමුණු වලින් එකක් වන නිරිතදිග වෙරළ තීරයෙහි බහුවිධ සංචාරක පුරවරයක් බවට පත්කරලීම සඳහා අපේක්ෂිත පරමාර්ථයක් වන වර්ෂ 2020 වන විට බේරුවල සංචාරක ආකර්ශනය වැඩි කිරීම සඳහා වර්ග කි.මී.0.13 ක වෙරළ තීරය එළිමහන් ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීම යන පරමාර්ථය සාක්ෂාත්කර ගැනීම සඳහා පයාගලින් දර්ශනය වන මුහුදු තීරය මග්ගොන දක්වා අදියර දෙකකින් සංවර්ධනය කිරීමට අපෙක්ෂා කෙරේ. මෙමඟින් දැනට ඉදිකර තිබෙන අනවසර ඉදිකිරීම් ඉවත්කර වෙරළ තීරයෙහි සුන්දරත්වය තීව්‍ර වන අයුරින් නිර්මාණාත්මක ඉදිකිරීම් හා ක්‍රියාකාරකම් ඇති කිරීමට යෝජනා කෙරේ.

## II. බේරුවල ධීවර වරාය ආශ්‍රිත ප්‍රදේශය සංචාරක කර්මාන්තය හා සම්බන්ධ කිරීම. (Baberian Fishery Entertainment Sphere)

වර්තමානයේදී වර්ග හෙක්ටයාර් 2 ක් පමණ විශාල වූ බේරුවල ධීවර වරාය මත්ස්‍ය වරායක් ලෙස පමණක් යොදා ගන්නා අතර මෙහි ඇති භූගෝලීය පිහිටීම හේතුකොටගෙන සංචාරක කටයුතු සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ. එම නිසා මෙම කලාපය තුළ ධීවර වරාය සමඟ සබැඳුනු සංචාරක ක්‍රියාකාරකම් සහිත ප්‍රදේශයක් ලෙසින් සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ.

ලොව සංචාරක කර්මාන්තයේ නව ප්‍රවණතාවයක් ලෙස ධීවර කර්මාන්තය ආශ්‍රිත කටයුතු හා ඒ හා සබැඳුනු සංචාරක කර්මාන්තය දැක්විය හැකිය. ධීවර කලාප ආශ්‍රිතව පවතින අපූර්වතම අත්දැකීම් විඳ ගැනීමට සංචාරකයන් ආකර්ෂණය වේ. ඒ සඳහා ලෝකයේ බොහෝ රටවල් විසින් භාවිත කරන සංකල්පයක් ලෙස “Gastronomy Economy” හැදින්විය හැකිය. එබැවින්, බේරුවල ධීවර වරාය ආශ්‍රිතව පවතින මෙම සංස්කෘතිකමය වත්කම් හා ස්වාභාවික වත්කම් (Cultural Assets and Natural Assets) වඩාත් ඵලදායි ලෙස හා ආකර්ශනීය ලෙස සංවර්ධනය කිරීම සඳහා මෙම සංකල්පය යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

දැනට හිස් ඉඩමක් ලෙස පවතින වෙරළ උද්‍යානය මෙම ප්‍රදේශයේ පවතින වටිනා විභවතාවක් බැවින් මෙම ඉඩම් සංවර්ධනය සඳහා අවශ්‍ය ව්‍යාපෘතීන් හඳුනා ගන්නා ලදී. සංචාරක ආකර්ශනය උදෙසා සංවර්ධනය සිදු කරන බැවින් ඊට උචිත අයුරින් ව්‍යාපෘතීන් හඳුනා ගන්නා ලදී.

මේ වන විට බේරුවල නගරයට හා අවට ප්‍රදේශවලට සංස්කෘතික කටයුතු පැවැත්වීම සඳහා ගොඩනැගිල්ලක අවශ්‍යතාවයක් පවතින අතර එය චීන කොටුව මැණික් වෙළඳාම සඳහා පැමිණෙන වෙළඳුන්ට යෝග්‍ය වන අයුරින් සහ සංචාරකයන්ට නව අත්දැකීමක් එක්කරදෙන අයුරින් ධීවර වරාය ආශ්‍රිත ක්‍රියාකාරකම් අත්විදීම හැකිවන ලෙස ඉදිකිරීමට අපේක්ෂා කෙරේ.

ඇවිදින මංතීරු සහ බයිසිකල් මංතීරු මග්ගොන සිට බටහිර ජැටිය ඔස්සේ බේරුවල ධීවර වරාය දක්වා දිගු කිරීම තුළින් සංචාරකයන්ට විවේකයෙන් සහ විනෝදාස්වාදයෙන් යුතුව ගමන් කිරීමට ඉඩ ප්‍රස්ථාව සලසා දෙමින් මෙම ප්‍රදේශය දෙසට සංචාරක ආකර්ෂණය වැඩි කර දීමට අපේක්ෂිතය. එමෙන්ම දැනට වරායේ පවතින ජැටි දෙක යා කරමින් බෝට්ටු වලට ගමන් කළහැකි පරිදි පාලමක් ඉදිකිරීම ද මේ තුළින් අපේක්ෂිතය. එපමණක්ද නොව, මෙතුළින් කිච්චිමලේ පල්ලිය, බේරුවල වෙරළ තීරය කරා පහසුවෙන් ප්‍රවේශ වීමට ඉඩ හසර උදාකර දෙන අතර, ධීවර වරාය පිළිබඳ බොහෝ අත්දැකීම් ලබා ගැනීමට සංචාරකයන්ට හැකිවනු ඇත.

නිරිතදිග වෙරළ තීරයෙහි බහුවිධ සංචාරක පුරවරයක් බවට පත්කිරීම යන අරමුණ හා සැබදුණු තවත් එක් පර්මාර්ථයක් වන වර්ෂ 2025 වන විට ධීවර වරාය කේන්ද්‍රකොටගත් සංචාරක ක්‍රියාකාරකම් දිරිමත් කිරීම සඳහා බේරුවල ධීවර වරාය හා බාබේරියන් දූපත ආශ්‍රිත කලාපය නවීකරණය කිරීම යන පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා බේරුවල ධීවර වාරාය හා අවට කලාපය ආකර්ශනීය ලෙස සංවර්ධනය කිරීම මෙමඟින් සිදු කෙරේ.

## III. ජලාශ්‍රිත ප්‍රදේශ සංචාරක ප්‍රවර්ධන ප්‍රදේශ ලෙස සංවර්ධනය කිරීම. (Aquatic Amusing Sphere)

සංචාරක කොර්ඩෝවේ සිල්ලිය තෙත්බිම් හා බාබේරියන් දූපත ආශ්‍රිත ප්‍රදේශය විවේක හා විනෝදාස්වාද කටයුතු සඳහා ප්‍රවර්ධනය කිරීමට යෝජනා කෙරේ. ජලාශ්‍රිත ප්‍රදේශ ආශ්‍රිතව මේ වන විට දක්නට ලැබෙන අවිධිමත් කැළි කසළ බැහැර කිරීම්, ජලමූලාශ්‍ර දූෂිත තත්ත්වයට පත්වීම හා අනවසර ඉදිකිරීම් හේතු කොට ගෙන විවිධාකාර පාරිසරික ගැටළු වලට මුහුණ පාමින් සිටී.

මෙහිදී මරදාන පාර, මෙම සංවර්ධන සැලැස්මේ ගමනාගමන පහසුකම් සැලසීමේ උපාය මාර්ග යටතේ මංතීරු දෙකක් සහිත මාර්ගයක් ලෙස පුළුල් කෙරෙන අතර, යෝජිත විවේක හා විනෝදාස්වාද කටයුතු කලාපය සඳහා එය විභවතාවයක් වනු ඇත.

එමෙන්ම මේ වන විට වැඩි ජන ඝනත්වයක් පවතින මරදාන වැනි ප්‍රදේශ වලට පොදු හා විනෝදාස්වාද කටයුතු සඳහා අවකාශයක් නොමැති වීමද මෙම ව්‍යාපෘතිය යෝජනා කිරීමේ එක් අරමුණක් ලෙස දැක්විය හැකිය.

මෙම කලාප සංවර්ධනයේදී අංශයන් දෙකක් කෙරෙහි අවධානය යොමු කිරීමට නියමිතය. ඒ යටතට බාබේරියන් දූපත සංචාරක ආකර්ශනීය ස්ථානයක් බවට පත් කිරීම සහ සිල්ලිය ඇළ මාර්ගය විනෝදාස්වාද කටයුතු සඳහා සංවර්ධනය කිරීම දැක්විය හැකිය.

බේරුවල නගරය සංචාරක ගමනාන්තයක් බවට පත්කිරීම (Best multi sectoral tourism destination) යන අරමුණ සාක්ෂාත් කරගැනීම උදෙසා සිල්ලිය තෙත්බිම් ආශ්‍රිත කලාපය සහ බාබේරියන් දූපත ආශ්‍රිත කලාපය සංචාරක පාරාදීසයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කරයි.

බේරුවල ධීවර වරායට මීටර් 500 ක් පමණ දුරින් පිහිටි බාබේරියන් දූපතට ඓතිහාසික වශයෙන් ඉතා වැදගත් තැනක් හිමිව ඇත. එහි ඇති ප්‍රදීපාගාරය හා ආකර්ශනීය මුහුද නිසා මෙහි සුන්දරත්වය තවත් තීව්‍ර වී ඇත. මේ වන විට ප්‍රදීපාගාරය සහිත දූපත වෙත අනවසරයෙන් කිසිවෙකුට ඇතුළුවීමට අවසර නොමැති අතර, ඉතාමත් රමණීය ස්ථානයක් වන මෙය සංචාරක ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කරයි. අක්කර 3 ක පමණ ප්‍රදේශය සංචාරකයින් සඳහා විවෘත කිරීම මෙමම ව්‍යාපෘතියේ අරමුණ වේ. බෝට්ටු සවාරි හා මසුන් ඇල්ලීම, ඒ ආශ්‍රිත ආහාර වර්ග, ධීවර රටාවන් පිළිබඳ සංචාරයන් මහත් සේ උනන්දු වන බැවින් මෙය සංචාරක කර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් ඉතා වැදගත් ව්‍යාපෘතියක් වනු ඇත.

වර්තමානයේ සංචාරක කර්මාන්තයේ ජනප්‍රිය කර්මාන්තයක් ලෙස (Pesca Tourism Trips) බෝට්ටු සවාරි මඟින් සංචාරකයින්ට අත්දැකීම් ලබාදීම හා ධීවර නිෂ්පාදනයන් පිළිබඳ නවමු අත්දැකීම් ලබාදීම (Gastronomy Economy) ආදී නව සංචාරක ප්‍රවණතාවයන් මේ ආශ්‍රිත ප්‍රදේශයන්වල සංචාරක ගමනාන්තයන් හා මුසු කරමින් සංචාරක කර්මාන්තය නගා සිටුවීම මෙම කලාපය තුළින් සිදුවනු ඇත.

### IV. නිල් ධජ විනෝදාත්මක කලාපය සංවර්ධනය කිරීම. (Blue Flag Recreational Sphere)

මොරගල්ල වෙරළ තීරය සහ කළුවාමෝදර සංචාරක ආකර්ශනය නොමඳව දිනාගත් ස්ථානයක් ලෙස ජනප්‍රියව ඇති මෙම ප්‍රදේශයෙහි අනාගතයේදී වැඩිවන සංචාරක ප්‍රමාණයට සරිලන සංචාරක සංවර්ධනයක් පැවතිය යුතු බැවින්, සංචාරක හෝටල් හා ඒ ආශ්‍රිත විනෝදාස්වාද කටයුතු සංවර්ධනය වියයුතු ආකාරය මෙම කලාපයෙන් අපේක්ෂා කරයි.

වර්ෂ 2030 වන විට මෙම ප්‍රදේශයේ සංචාරක ප්‍රමාණය 30,000 පමණ වැඩි වෙනු ඇතැයි පුරෝකතනය කර ඇත. දැනට මෙහිදී වර්ෂ 2025 වන විට ධීවර වරාය කේන්ද්‍රකොටගත් සංචාරක ක්‍රියාකාරකම් දිරිමත් කිරීම සඳහා ධීවර වරාය මෙන්ම බාබේරියන් දූපත ආශ්‍රිත කලාපය නවීකරණය කිරීම යන පරමාර්ථ ළඟාකර ගැනීමට ව්‍යාපෘතීන් සහ යෝජනා හඳුනා ගැනේ. වර්ෂ 2020 වන විට මෙම සංචාරක ප්‍රමාණය 30,000 කින් පමණ වැඩි කිරීමට අපේක්ෂා කරන අතර, ඒ සඳහා අවශ්‍ය පහසුකම් ද වැඩිවිය යුතුයි. දැනට මෙම ප්‍රදේශයේ ඇති ආකර්ශනීය වෙරළ ආශ්‍රිත පහසුකම් සංවර්ධනය කිරීම, කඩොලාන පද්ධතිය ආශ්‍රිත සංචාරක ආකර්ශනය සඳහා පහසුකම් සංවර්ධනය කිරීම හා ක්‍රීඩාගාර, හෝටල්, ආපනශාලා ඇතුළු පහසුකම් වෙරළ පිවිසුම් මාර්ගයන් සංවර්ධනය තුළින් සංචාරක ආකර්ශනය වැඩිකිරීම අපේක්ෂා කරයි.

වර්තමානය වනවිට මොරගල්ල ප්‍රදේශය ආශ්‍රිත හෝටල් කර්මාන්ත ක්ෂේත්‍රයේ නව ප්‍රවණතාවයක් ලෙස සංචාරක ආයුර්වේද හා සම්බාහනය දැක්විය හැකිය. එබැවින් එම අවශ්‍යතා සපුරාලීමට මෙම ප්‍රදේශය ආශ්‍රිත එවැනි පහසුකම් සංවර්ධනය කළයුතුය. එවැනි සේවා සපයන ස්ථානයක් පිහිටා තිබීමද සංචාරක ආකර්ෂණය එම ප්‍රදේශයට ආකර්ෂණය කර ගනිමින් සංචාරක කර්මාන්තය දියුණු කරලීමට හේතුවක් වේ.

### V. බෙන්තර නදී මුඛ කලාපය විනෝදාත්මක කලාපයක් ලෙස සංවර්ධනය කිරීම. (Bentara Estuary Amusement Sphere)

බෙන්තර ගං මෝය යනු බේරුවල සැලසුම් බලප්‍රදේශයේ සීමාව මෙන්ම බස්නාහිර පළාතේ මායිම ලෙසද හැඳින්විය හැකිය. එබැවින් මෙම සුන්දර ගං මෝය ඉතාමත් ආකර්ශනීය ලෙස සංවර්ධනය කොට සංචාරක ආකර්ශනය වැඩිකිරීම මෙම කලාපයේ මුඛ්‍ය පරමාර්ථය වේ.

දක්ෂිණ වෙරළ තීරය විවර කරන විසල් දොරටුවක් කරා යන දැක්ම වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම විසල් දොරටුව යන්න මනා ලෙස පිළිබිඹු කළහැකි ස්ථානයක් ලෙස බෙන්තර ගඟ ආශ්‍රිත කලාපය හැඳින්විය හැක.

වර්තමානයේදී පවා ජලාශ්‍රිත ක්‍රීඩා, හෝටල් වැනි සංචාරක ක්‍රියාකාරකම් සඳහා සංචාරකයන් නොබඳව මෙම ප්‍රදේශය කරා ඇදී එයි. නමුත් මෙම කලාපය ආශ්‍රිතව පවතින අවිධිමත් කැළිකසළ බැහැර කිරීම් හේතු කොට ගෙන ස්වභාවික සුන්දරත්වය අහිමි වෙමින් පවතී. ගං මෝය ආශ්‍රිත කැළි කසළ, බැහැර කිරීම් නිසා දුර්ගන්ධය වැනි ගැටළු නිසා සංචාරක ආකර්ශනය අඩු වියහැක.

එමෙන්ම ගංගාව ප්‍රවේශ කිරීමට ඇති මාර්ගයන්වල පටු ඉඩකඩ නිසා වාහනවලට ගමන් කිරීමට හා සංචාරකයින්ට ඇවිද යෑමට අපහසුතා ඇත.

එමෙන්ම දක්ෂිණ වෙරළ තීරයේ සිට පැමිණෙන සංචාරකයින් හට මෙම ප්‍රදේශයට පිවිසෙන අවස්ථාවේ මෙහි ආකර්ශනීය බව වැඩිකළ හැකි ආකාරයේ විභවතා සැලකිල්ලට ගෙන සංවර්ධනය කිරීම ද මෙම කලාපයෙන් අපේක්ෂා කරයි.

බෙන්තර පැරණි පාලම මේ වන විට කිසිදු කටයුත්තක් සඳහා යොදා ගෙන නොමැත. නමුත් මෙලෙස ගංමෝයන් ආශ්‍රිත ප්‍රදේශයන් විදෙස් රටවල සංචාරක පාරාදීසයන් ලෙස සංවර්ධනය කොට සංචාරක කර්මාන්තය නගා සිටුවා ඇත. එබැවින් මෙම විභවතාවන් ද මෙම සැලැස්ම තුළින් සළකා බලනු ලැබේ.

අලුත්ගම දුම්රිය ස්ථානය දක්වා ඇති මාර්ගයන්ද මේ වන විට පටු ඉඩකඩ නිසා වාහන හා පදිකයින් අපහසුතාවයට ලක් වී ඇත. එබැවින් රාත්‍රියේ පවා ආරක්ෂිතව ඇවිද යා හැකි මංතීරු සහිතව සංවර්ධනය කොට සංචාරක ක්ෂේත්‍රය තිව්‍ර කිරීමට ද අපෙක්ෂා කරයි.

මෙලෙස බෙන්තර නදී මුඛ කලාපය සංචාරක කොරිඩෝවේ වඩාත් ආකර්ෂණීය ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා ප්‍රදේශය ආශ්‍රිතව පවතින විභවතා සැලකිල්ලට ගෙන සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රය නගා සිටුවීමට සංචාරක සංවර්ධන සැලැස්ම මඟින් අපේක්ෂා කරයි.

## 2. *ස්වභාවික, ඓතිහාසික හා සංස්කෘතික ස්ථාන ඒකාබද්ධ කරමින් සංචාරක කොරිඩෝවක් නිර්මාණය කිරීම.*


ලාංකීය ඉතිහාසය ගොඩ නැංවීමෙහි ලා මහෝපකාරීවන පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථානයන් බොහොමයක් බේරුවල ප්‍රදේශයේදී හඳුනා ගත හැකිය.

සංචාරක කර්මාන්තයේ අභිවෘර්ධිය උදෙසා මෙම ප්‍රදේශයේ පවතින ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක, ස්වාභාවික ස්ථාන මූලික කරගත් ස්ථාන ඒකාබද්ධ කරමින් සංචාරක කොරිඩෝවක් නිර්මාණය කිරීමට මෙමඟින් අපේක්ෂා කරයි.

මෙහිදී, ස්වභාවික සම්පත් මුල් කරගත් බ්‍රිෆ් උද්‍යානය ආදී වාස්තු විද්‍යාත්මක වටිනාකම් ඇති ස්ථාන ද, ඓතිහාසික වටිනාකම් පදනම් කරගත් කන්දේ විහාරය, වේරගල කන්ද රජමහා විහාරය, ශාන්ත ජෝශප් පල්ලිය –මග්ගොන, සපුගොඩ විහාරය, මහදෙනිය පන්සල ආදී ස්ථාන ද ප්‍රදේශය පුරා විහිදී ඇති සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා විභවතාවයක් පවතින ගොවිපළවල් ද මූලික කර ගනිමින් සංචාරක මංපෙතක් (සිතියම 6.15) නිර්මාණය කිරීමට යෝජිතය.

මෙසේ සංචාරකයන් මුල් කරගනිමින් විවිධ ව්‍යාපෘතීන් 2030 වසර වනවිට බේරුවල සැලසුම් බලප්‍රදේශයෙහි ක්‍රියාවට නැංවීමෙන් සංචාරක කර්මාන්තයෙහි ප්‍රබෝධයක් ඇති කරමින් සමස්ථ ආර්ථිකය නගා සිටුවීමටද අපේක්ෂා කෙරේ.

සැලසුම් බලප්‍රදේශය තුළ පිහිටා ඇති දෙස් විදෙස් සංචාරක ආකර්ශනය හිමි ප්‍රධාන පූජනීය ස්ථානයක් ලෙස කන්දේ විහාරය හැඳින්විය හැකිය. මෙම සංචාරක උපායමාර්ගික සැලැස්ම යටතේ තවදුරටත් එම ප්‍රදේශයේ සංචාරකයන් සඳහා අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම බේරුවල සංවර්ධන සැලැස්මෙහි අරමුණයි.




**යෝජිත ස්වභාවික හා ඓතිහාසික ස්ථාන ඒකාබද්ධ කරනු ලබන මාර්ග පද්ධතිය**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 0.35 0.7 1.4 2.1 2.8 කි.මී

නාගරික සංවර්ධන අධිකාරිය
සැප්තැම්බර් 2018



*සිතියම 6.15: බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යෝජිත ස්වභාවික හා ඓතිහාසික ස්ථාන ඒකාබද්ධ කරනු ලබන මාර්ග පද්ධතිය*

## 6.4.2. මැණික් කර්මාන්ත සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

බේරුවල සංවර්ධන සැලසුම් බලප්‍රදේශයේ ආර්ථිකය සංවර්ධනය කිරීමෙහිලා ප්‍රබල දායකත්වයක් සපයන මැණික් වෙළඳාම් කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ වූ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට මෙම උපායමාර්ගික සැලසුම යටතේ යෝජනා කෙරේ. මෙය වර්ග මීටර් 400 ක පමණ භූමි ප්‍රමාණයක ඉදිකිරීමට යෝජිත අතර එය කුඩා ප්‍රමාණයේ අපනශාලාවන්ගෙන්, බැංකු හා මූල්‍ය කටයුතු සඳහා වූ පහසුකම් වලින් සහ වාහන නවතා නැබීමේ පහසුකම් වලින් සමන්විත වේ. මෙතුළින් මැණික් වෙළඳාමෙහි නිරතව සිටින වෙළඳුන් දිරි ගැන්වීමට අපේක්ෂා කෙරේ.

සංචාරක කර්මාන්තය සංවර්ධන සැලැස්මෙහි එන උපාය මාර්ගයන් ධීවර සංවර්ධන සැලැස්ම,කෘෂි කර්ම සංවර්ධන සැලැස්ම, හා යටිතල පහසුකම් සංවර්ධන සැලැස්ම හා ඒකාබද්ධ වේ.

## 6.4.3. ධීවර කර්මාන්ත සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

බේරුවල ධීවර වරාය අතීතයේ සිටම ශ්‍රී ලංකාවේ ප්‍රධාන ධීවර වරායන්ගෙන් එකක් ලෙසට සලකුණු කර ඇති අතර, එය ජාතික මත්ස්‍ය නිෂ්පාදනයට 8% ක පමණ සැලකිය යුතු දායකත්වයක් මේ වන විට සපයන අතර මෙම සංවර්ධන සැලැස්මේ යෝජිත උපාය මාර්ග තුළින් එම දායකත්වය ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. තවද බේරුවල වරාය ආශ්‍රිත ධීවර කලාපය සංචාරක කර්මාන්තය හා ඒකාබද්ධ කරමින් සංචාරක ආකර්ෂණය ඉහළ නැංවීමට ද අපේක්ෂා කෙරේ. ඒ අනුව, ධීවර කර්මාන්තය ආශ්‍රිතව සිදු කරනු ලබන ප්‍රධාන උපාය මාර්ගයක් ලෙස බේරුවල වරාය ආශ්‍රිත ධීවර කලාපය සංචාරක කර්මාන්තය හා ඒකාබද්ධ කරමින් සංචාරක ආකර්ෂණය ඉහළ නැංවීමට ද අපේක්ෂා කෙරේ.

ඒ අනුව මෙම සැලැස්ම තුළින් වසර 2025 වන විට ධීවර වරාය ආශ්‍රිත කටයුතු සංචාරක කර්මාන්තය හා ඒකාබද්ධ කිරීම මෙන්ම මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම යන පරමාර්ථයන් ඉටුකර ගැනීමට අපේක්ෂා කෙරේ. මෙහිදී පහත සඳහන් උපක්‍රම හා යෝජනා දැක්විය හැකිය.

1. *නේවාසික, මත්ස්‍ය තොටුපලවල් හා අනෙකුත් යටිතල පහසුකම් වල ගුණාත්මක මට්ටම ඉහළ නැංවීම.*
2. *ධීවර ජනතාව සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.*
3. *මත්ස්‍ය වෙළඳාම ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.*

### 1. *නේවාසික, මත්ස්‍ය තොටුපලවල් හා අනෙකුත් යටිතල පහසුකම් වල ගුණාත්මක මට්ටම ඉහළ නැංවීම.*

මෙහිදී මූලිකවම අවධානය යොමු කරනුයේ ධීවර කර්මාන්තය හා සැබඳුනු සම්පත් වල ගුණාත්මක හා ධාරිතාමය සංවර්ධනය ඉහළ නැංවීම පිළිබඳවයි. මත්ස්‍ය තොටුපලවල්, ධීවර යාත්‍රා නැවැත්වීමේ පහසුකම්, ශීතාගාර පහසුකම් ඇතුළු ධීවර කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් වසර 2025 වන විට මත්ස්‍ය නිෂ්පාදනය මගින් දළ දේශීය නිශ්පාදනයට සිදු කරන ආංශික දායකත්වය 1% කින් ඉහළ නැංවීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මින් සිදුකෙරේ. මේ තුළින් ප්‍රදේශයේ දළ දේශීය නිශ්පාදිනය වැඩිවනවාසේම ජනතාවට ඉහළ ජීවන තත්ත්වයක් ලඟාකර ගැනීම සඳහාද හේතුවනු ඇත.

මෙහිදී වර්තමානයේදී බේරුවල වරාය ආශ්‍රිතව කැලි කසළ හා රොන්මඩ තැන්පත් වීම හේතුකොට ගෙන ධීවර වරාය ආශ්‍රිත වැඩි ඉඩකඩ ප්‍රමාණයක් අපතේ ගොස් ඇත. එබැවින් මේ තුළින් පාරිසරික ගැටළු නිර්මාණය වී ඇත.

මග්ගොන ධීවර වරාය ඉතා ආකර්ශනීය වෙරළ තීරයකින් සමන්විත වන අතර එය සංචාරක ආකර්ශනය සඳහා මෙන්ම මත්ස්‍ය නිශ්පාදනයට දායකත්වයක් දෙනු ලබන ධීවර නොටුපලක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂිතය. මාදැල් ඇදීම, මාළු පිලිස්සීම, මසුන් ඇල්ලීම වැනි ක්‍රියාකාරකම් වලට අවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීම තුළින් මේ ආශ්‍රිත ධීවර කර්මාන්තය සංචාරක කර්මාන්තය හා මුසු කිරීමට මෙහිදී අපේක්‍ෂා කෙරේ. ඒ තුළින් වඩාත් ඵලදායී ප්‍රදේශයක් බවට මෙම ප්‍රදේශය පත්කර ගත හැක.

යටිතල පහසුකම් පමණක් නොව ධීවර කර්මාන්තයෙහි නියැලෙන ධීවර ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා වැඩ පිළිවෙලක්ද මෙම උපායමාර්ගික සැලැස්ම තුළින් යෝජනා කෙරේ.

## 2. *ධීවර ජනතාව සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.*

වර්තමානය වන විට බේරුවල නගර සභා බලප්‍රදේශය තුළ  විශාල වශයෙන් පැල්පත් නිවාස ව්‍යාප්ත වෙමින් පවතී. එම ප්‍රදේශවල ජනතාවට ප්‍රමාණවත් ඉඩකඩක් සහිත නිවාස නොමැති වීම, නිසි මලාපවහන හා ජලාපවහන පද්ධතියක් නොමැති වීම, කැලි කසළ නිසිලෙස බැහැර නොකිරීම හේතුවෙන් කාණු පද්ධති අවහිර වීම,  ආදී කරුණු හේතු කොටගෙන පාරිසරික ගැටලු සහ සෞඛ්‍ය  ගැටළු උද්ගතව ඇත. එමෙන්ම බේරුවල නගරසභා බලප්‍රදේශය සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේදී නිසි පරිදි කළමනාකරණය නොවූ පැල්පත් නිවාස පැවතීම  නගරයේ අලංකරණය  සඳහා බාධා ඇති කරයි.

ධීවර කර්මාන්තය ආශ්‍රිත රැකියාවන්හි නිරතවන ජනතාව ප්‍රදේශයේ වෙරළ තීරයට ආසන්නව පදිංචිව සිටින අතර ඇතැම් ජනතාව  මීටර් 100 ක සුනාමි රක්ෂිත තුළ ද අනවසර ඉදිකිරීම් සිදුකරගෙන ඇත. එම නිසා බේරුවල  නගර සභා බලප්‍රදේශය ආශ්‍රිතව මුඩුක්කු නිවාස වර්ධනය වීමත් ඒ හේතුවෙන් නාගරික බලප්‍රදේශය තුළ නිවාස තදබදය වර්ධනය ඉහළ යාමත් දක්නට ලැබේ.

එම කරුණු හේතු කොටගෙන එයට පිළියමක් ලෙස දැනට මුඩුක්කු හා පැල්පත පවතින ප්‍රදේශයෙහිම එම ජනතාව සඳහා තට්ටු නිවාස දෙකක් ඉදි කිරීමට අපේක්ෂිතය එයට හේතු වී ඇත්තේ, එම ජනතාවගෙන් බොහෝමයකගේ ප්‍රධාන ජීවනෝපාය ධීවර කර්මාන්තය බැවින් වරායට ඉතා ආසන්නව ධීවර ජනතාවට අවශ්‍ය නිවාස අවශ්‍යතාවය සැපයීම යෝග්‍ය වේ.

## 3. *මත්ස්‍ය වෙළඳාම ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම*

ආර්ථික වශයෙන් ගත්කළ බේරුවල මත්ස්‍ය වෙළඳපොළට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. එය සැලසුම් බලප්‍රදේශයේ ආර්ථිකය සවිබල ගැන්වීමෙහි ලා ප්‍රබල දායකත්වයක් සපයයි. මීට අමතරව දෙවන විශාලතම මත්ස්‍ය වෙළඳපොළ වන මරදාන මත්ස්‍ය වෙළඳපොලත් ප්‍රදේශය පුරා විහිදී ඇති අනෙකුත් කුඩා ධීවර වෙලඳපොලවල් සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කරමින් සංවර්ධන සැලැස්මෙහි දැක්ම සාක්ෂාත් කර ගැනීමට මෙමඟින් අපේක්ෂා කෙරේ. ඒ සඳහා යෝජිත ව්‍යාපෘතීන් පිළිබඳව සවිස්තරාත්මක විග්‍රහයක් ව්‍යාපෘති සාරාංශයෙහි දැක්වේ.

උක්ත උපායමාර්ග ඔස්සේ බේරුවල ධීවර කර්මාන්තය ආශ්‍රිත ධාරිතා සංවර්ධනයක් සිදුකිරීමෙන්  එය සංචාරක කර්මාන්තය හා සම්බන්ධ කිරීම තුළින් වර්ෂ 2030 වනවිට ප්‍රාදේශීය ආර්ථිකයට පුළුල් දායකත්වයක් ලබාගැනීමට අපේක්ෂා කෙරේ.

## 6.4.4. කෘෂිකර්මාන්ත සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

බේරුවල සංවර්ධන සැලසුම් බලප්‍රදේශයෙහි තවත් එක් ආර්ථික විභවතාවයක් ලෙසින් සැලසුම් බලප්‍රදේශයේ අභ්‍යන්තර කලාප වල ව්‍යාප්ත වී ඇති කෘෂි කර්මාන්තයෙන් ස්වයංපෝෂිත බිම් කොටස් දක්විය හැකිය. 2030 වසර වන විට මෙම කෘෂි කාර්මික බිම් කොටස් වලින් උපරිම ප්‍රයෝජන ගනිමින් සමස්ථ ආර්ථිකය සවිබල ගැන්වීමට කෘෂිකාර්මික උපායමාර්ගික සැලසුම යටතේ අපේක්ෂා කෙරේ. ඒ අනුව ප්‍රදේශයේ පවතින කෘෂිකාර්මික භූමි සංචාරක කර්මාන්තය හා සම්බන්ධ කරමින් භාවිතයට ගැනීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

යෝජිත උපාය මාර්ග ලෙස,

1. *යෝජිත කෘෂි ගම්මාන.*
2. *ගොවි බිම් සංරක්ෂණය කිරීම.*
3. *සංචාරකයන්ගේ විනෝදාස්වාදය සඳහා වූ ස්වභාවික මංතීරු කෘෂි බිම් සම්බන්ධ කර ගනිමින් නිර්මාණය කිරීම.*

### 1. *යෝජිත කෘෂි ගම්මාන.*

මෙහිදී සංචාරකයන් සඳහා නව කෘෂි අත්දැකීමක් ලබා ගැනීමට එම වටපිටාවන් සමඟ සම්බන්ධ වෙමින් කෘෂි ගම්මානයක් නිර්මාණය කිරීමට අපේක්ෂා කෙරේ. මෙහිදී කුඩා දරුවන්ටද ස්වභාවික වටපිටාව සමඟ සම්බන්ධ වෙමින් අලුත් අත්දැකීම් ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථාව උදා වේ.

### 2. *ගොවි බිම් සංරක්ෂණය කිරීම.*

කුඹුරු ඉඩම් සංරක්ෂණය කිරීම පිළිබඳ වැඩිදුර විස්තර පරිසර සංරක්ෂණ උපායමාර්ගික සැලැස්මෙහි විස්තරාත්මකව දැක්වේ.

### 3. *සංචාරකයන්ගේ විනෝදාස්වාදය සඳහා වූ ස්වභාවික මංතීරු කෘෂි බිම් සම්බන්ධ කර ගනිමින් නිර්මාණය කිරීම*

මෙහිදී සංචාරකයන්හට ප්‍රායෝගිකව කෘෂිකර්මාන්තය හා ඒකාබද්ධවීමට ඉඩ ප්‍රස්තාව ලැබේ. මෙසේ යෝජිත කෘෂිකාර්මික ප්‍රදේශ සංචාරක සංවර්ධන උපායමාර්ගික සැලසුමෙහි දෙවන උපාය මාර්ගය යටතේ සාකච්ඡා කෙරෙන යෝජිත ඓතිහාසික හා සෞන්දර්යාත්මක ස්ථාන යා කෙරෙමින් ඉදිකෙරෙන මාර්ග ජාලය හා සම්බන්ධ කිරීමට යෝජිතය.

ඒ අනුව ඉහත සකච්ඡාකළ බේරුවල ප්‍රධාන ආර්ථික විභාවතාවයන් වන සංචාරක, ධීවර, මැණික් සහ කෘෂිකර්මාන්තය, යන අංශයන් වර්ෂ 2030 වන විට සංවර්ධනය කරමින් සමස්ත ආර්ථිකයට ප්‍රශස්ත දායකත්වයක් ලබා ගැනීමටත් ඒ තුළින් සැලසුම් බලප්‍රදේශය අනාගත සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීමත් මේ තුළින් අපේක්ෂිතය.

# 6.5. තිරසර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

බේරුවල සැලසුම් බලප්‍රදේශය තුළ පවතින භූමි පරිහරණයෙන් 51% ක් හරිත වැස්මකින් සමන්විත වේ. එබැවින් මෙම සංවර්ධන සැලැස්ම තුළින් 2030 වන විට අපේක්ෂා කරන්නා වූ සංවර්ධනය පරිසර හිතකාමී සංවර්ධනයක් විය යුතුයි. ප්‍රදේශයේ භෞතික පරිසරය එහි ස්වභාවික පරිසරය හා තුලනාත්මකව සංවර්ධනය කළ හැකිවන පරිදි හා දැනට අවධානමට ලක්ව ඇති පාරිසරික හා ස්වභාවික සම්පත් වැඩිදියුණු කර, ප්‍රදේශයේ ජනතාවට පාරිසරික හිතකාමී නේවාසික පරිසරයක් ඇති කිරීම මෙම සැලැස්මේ පරමාර්ථය වේ. පාරිසරික සැලසුම ප්‍රධාන වශයෙන් ප්‍රදේශයේ පවතින පාරිසරික සම්පත් ආරක්ෂා කරගැනීම, පාරිසරික උවදුරු අවම කර ගැනීම සහ ප්‍රදේශයේ භෞතික හා පාරිසරික තත්ත්වය ඉහළ නැංවීමට අවශ්‍ය කරන වැඩපිළිවෙල හඳුනාගැනීම යන මූලික කරුණු පදනම් කරගෙන පිළියෙළ කර ඇත. එය අනාගත පරපුර වෙත සුරක්ෂිත කිරීමත් ස්වභාවික ආපදා අවම වන පරිදි තුලනාත්මක තිරසාර සංවර්ධනයක් ලබා ගන්නා අකාරය තිරසර පරිසර සංවර්ධන උපායමාර්ග සැලැස්ම තුළින් සාකච්ඡා කෙරේ. ඒ අනුව මෙම සැලැස්ම පොදු උපාය මාර්ග 3ක් යටතේ විග්‍රහ කෙරේ.

- *පාරිසරික සංරක්ෂණ සැලැස්ම.*
- *ආපදා කළමනාකරණ සැලැස්ම.*
- *පොදු හා විනෝදකටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම.*

මෙම එක් එක් සැලසුම් උපායමාර්ග පිළිබඳව ඉදිරියේදී තවදුරටත් සලකා බලනු ඇත.

## 6.5.1. පාරිසරික සංරක්ෂණ සැලැස්ම.

මෙහිදී පරිසර සංරක්ෂණ සැලැස්ම යටතේ සැලසුම් බලප්‍රදේශයේ ඇති ප්‍රධාන කලාපයන් දෙකක් හඳුනා ගන්නා ලදී. එම කලාපයන් සිතියම 6.16 පරිදි වේ.

1. තෙත් බිම් ස්වභාවික සංරක්ෂණ කලාපය
2. විශේෂ කුඹුරු වගා කලාපය

### 1. *තෙත් බිම් ස්වභාවික සංරක්ෂණ කලාපය*

ඉහළ ජෛව විවිධත්වයක් ඇති තෙත් බිම් මේ යටතේ හඳුනා ගන්න ලදී. හෙක්ටයාර 1463.238 ප්‍රමාණයක පැතිර ඇති තෙත් බිම් ස්වභාවික සංරක්ෂණ කලාපයට ජලය බැස යාමේ ප්‍රදේශ, ජල රැඳවුම් ප්‍රදේශ ඇතුළු ජෛව විවිධත්වයකින් යුතු තෙත් බිම් අයත් වේ. තිරසාර ආර්ථික සහ පාරිසරික භාවිතයන් සඳහා පහත් බිම් යොදා ගැනීමත්, ඒවායේ විභවයන් සලකා බලා ජලය රඳවා ගැනීමේ හැකියාව සහ අනෙකුත් පාරිසරික ප්‍රතිලාභ සැලකිල්ලට ගැනීමත් එමඟින් අනවසර අත්පත් කරගැනීම සහ නුසුදුසු භාවිතයන් වළක්වා ගැනීමත් මෙහි ප්‍රධාන ඉලක්කය වේ.

ප්‍රදේශය හරහා ගලා බසින ප්‍රධාන ඇළ මාර්ග වන කළුවාමෝදර සහ දුම්මල්මෝදර යන ඇළ මාර්ග ආශ්‍රිතවත්, ඒවා මඟින් ඇතිවී ඇති අනෙකුත් කුඩා ඇළමාර්ග පද්ධතීන් ආශ්‍රිතවත් පාරිසරික සංවේදී කලාප බිහිවී තිබේ. මීට අමතරව ප්‍රදේශය පුරා විසිරී ඇති හෙක්ටයාර 1463.238 පමණ වන කුඹුරු ඉඩම් සහ ඒ ආශ්‍රිත පහත් බිම්ද පාරිසරික සමතුලිතතාවය පවත්වාගැනීමට වැදගත් කාර්යභාරයක් ඉටුකරන තෙත් භූමි ලෙස හැඳින්විය හැකිය. ප්‍රදේශයේ බටහිර මුහුදු සීමාව ආශ්‍රිතව ලංකාවේ සීඝ්‍රයෙන් විනාශ වී යන කඩොලාන පරිසර පද්ධතීන්ද හඳුනාගත හැකිවේ. වැසි අධික දිනවල ඇති වන ජල ගැලීම් පාලනය කිරීමට සක්‍රීය දායකත්වයක් ලබාදෙන ඉහත කී කුඹුරු සහ පහත් බිම් වැඩිවන ජනගහනය සමඟ වැඩි වන භූමි වටිනාකම හේතුවෙන් අනවසර ගොඩකිරීම් වැනි තර්ජනයන්ට ලක් වී ඇති අතර ඇළ මාර්ග

දෙපස ඉදිකිරීම් හේතුවෙන් ස්වභාවික ජල බැසයාම අවහිර වී ප්‍රදේශය සුලු වර්ෂාවකදී වුවද ගංවතුර තර්ජනයට ලක්වේ. (සම්පත් පැතිකඩ 2016).

නාගරික සීමාව තුළ ඇති මුළු භූමි ප්‍රමාණයෙන් 3.90% ක් පමණ පහත් බිම් වන අතර, ඒවා අක්කරගොඩ, මාගල්ගලවෙල හා සිල්ලිය යන ප්‍රදේශවල පැතිර පවතී. අවිධිමත් කසළ බැහැරලීම තවත් ප්‍රධාන පාරිසරික ගැටළුවක් බවට පත්ව ඇති අතර මේ හේතුවෙන් පාරිසරික සමතුලිතතාවය බරපතල තර්ජනයකට ලක් වී ඇත.

බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දැනට හඳුනාගත හැකි තෙත්බිම් ලෙස,


- සිල්ලිය පහත් භූමි ප්‍රදේශය
- බේරුවල කලපුව
- පුරන් වී ඇති කුඹුරුබිම්
- වගා කරන කුඹුරු බිම්
- අනෙකුත් තෙත් බිම් කෘෂිකාර්මික ප්‍රදේශ
- ඇළ මාර්ග

යනාදිය දැක්විය හැකිය.

මෙම උපායමාර්ගික සැලැස්ම යටතේ, හඳුනා ගන්නා ලද ප්‍රධාන ගැටළු කිහිපයකට විසඳුම් ලබාදීමට අපේක්ෂා කෙරේ. මේ යටතේ හඳුනාගන්නා ලද ප්‍රධානතම ගැටළුවක් ලෙස නියමිත සැලසුමක් සහ පාලනයකින් තොරව ඉතා සීඝ්‍ර ලෙස පහත්බිම් සහ වගුරු බිම් ගොඩකිරීම හේතුවෙන් අතිරික්ත ජලය රැඳීමට ඇති භූමි ප්‍රදේශය අඩුවීම දැක්විය හැකිය. මේ හේතුවෙන් සුළු වර්ෂාවකදී පවා බොහෝ ප්‍රදේශ ජලයෙන් යටවීම හඳුනාගත හැකිය. උදාහරණයක් ලෙස, දැනට සීඝ්‍රයෙන් ගොඩකිරීමේ තර්ජනයට භාජනය වෙමින් පවතින සිල්ලිය තෙත්බිම දැක්විය හැකිය. මෙම ගැටළුව සඳහා පිළියම් යෙදීම සඳහා වන වගකිවයුතු ආයතන, කොන්දේසි සහ මාර්ගෝපදේශයන් පිළිබඳව දෙවන වෙළුමෙහි සවිස්තරව දැක්වේ.

මෙමඟින් හඳුනාගන්න ලද තවත් එක් පාරිසරික ගැටළුවක් ලෙස පහත්බිම් ආශ්‍රිත අනවසර ඉදිකිරීම්, කැලි කසළ බැහැර කිරීම හා මළාපවහන කටයුතු සම්බන්ධයෙන් ඇතිවන පාරිසරික ගැටළු හඳුනාගත හැකිය. මෙම ගැටලුව මැඩපැවැත්වීම සඳහා පරිසර හිතකාමී කැලි කසළ අපද්‍රව්‍ය, අප ජලය කළමනාකරණ ක්‍රමවේදයන් සැලසුම් කර ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට මෙම උපායමාර්ගික සැලැස්ම යටතේ අපේක්ෂිතය.

එමෙන්ම ප්‍රධාන ඇළ මාර්ග හා අතුරු ඇළ මාර්ග නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා ජලාපවහන නිසි පරිදි සිදු නොවීම හා ඒවායේ ආක්‍රමණකාරී පැලෑටි බහුලව තිබීම නිසා ජල බැස්මට අවහිරතාවයන් මතුවීම, නිසියාකාරව නඩත්තු නොකරන පොදු වැසිකිළිවලින් හා නිවෙස්වලින් පිටකරන අපද්‍රව්‍ය පොදු කාණු හා පහත්බිම්වලට මුදා හැරීම, මහා මාර්ග දෙපස, වෙරළ ආසන්නව හා පොදු ස්ථාන ආශ්‍රිත කුණු කසළ බැහැර කිරීම සහ නේවාසික ප්‍රදේශවල ප්‍රමාණවත් නොවන බිම් කට්ටි තුළ සත්ව පාලනය (කුකුල්, එළු හා ඌරු) පවත්වාගෙන යෑම නිසා දුර්ගන්ධය හා අපද්‍රව්‍ය අනිසි ලෙස බැහැරලීම නිසා ඇති වන පරිසර දූෂණ තත්ත්වයන් වැනි පාරිසරික ගැටළුද මෙම උපායමාර්ගික සැලැස්ම යටතේ හඳුනාගන්න ලදී. මෙම ගැටලුකාරී තත්ත්වයන් මඟහරවා ගැනීම සඳහා වන කොන්දේසි, මාර්ගෝපදේශයන් සහ රෙගුලාසි දෙවන වෙළුමෙහි සවිස්තරාත්මකව දැක්වේ.




**යෝජිත තෙත්බිම් කලාපීකරණය**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 0.35 0.7 1.4 2.1 2.8 කි.මී

**නාගරික සංවර්ධන අධිකාරිය**
දෙසැම්බර් 2018

බස්නාහිර පළාත් අංශය | බේරුවල සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

**සිතියම 6.16:** *බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා යෝජිත තෙත්බිම් කලාපීකරණය*

## 2. *විශේෂ කුඹුරු වගා කලාපය*

හෙක්ටයාර 384.5 ක වපසරියක පැතිර ඇති විශේෂ කුඹුරු වගා කලාපය සඳහා අයත් වනුයේ දැනට පවතින කුඹුරු වගාවන් සහ පුරන් වූ කුඹුරු බිම්ය. ඉහත සඳහන් තෙත් බිම සංරක්ෂණ කලාපයට හා විශේෂ කුඹුරු වගා කලාපයට අයත් සාමාන්‍ය කොන්දේසි, මාර්ග හා අනුමත භාවිතයන් ආදිය පිළිබඳව සවිස්තරාත්මක විග්‍රහයක් වෙළුම දෙකෙහි දැක්වෙන පොදු රෙගුලාසි යටතේ විස්තර කෙරේ.

### *රබර් ඉඩම් ආරක්ෂණය කිරීමේ උපාය මාර්ගය*

තෙත් බිම් පරිසර පද්ධතිය සේම ප්‍රදේශයේ ඇති හරිත වැස්ම අතර තවත් එක් වගාවක් ලෙස රබර් ඉඩම් දැක්විය හැකිය. හෙක්ටයාර 1089.64 ක පැතිර ඇති රබර් වගාව තුළින් ප්‍රදේශයට ආර්ථික මෙන්ම පාරිසරික වැදගත්කමක්ද ලබා දෙයි. නමුත් මේ වන විට බොහෝ රබර් ඉඩම් කට්ටි කොට සංවර්ධන කටයුතු සඳහා යොදා ගනිමින් පවතී. ප්‍රයෝජනයට නොගන්නා රබර් ඉඩම් මෙලෙස සංවර්ධනය සඳහා යොදා ගැනීම සංවර්ධන විභවතාවයක් ලෙස දැකිය හැකි වුවද පාලනය කළ නොහැකි ලෙස මෙලෙස සංවර්ධනය සඳහා රබර් ඉඩම් යොදාගැනීමේදී සිදු වන පාරිසරික බලපෑම කෙරෙහිද අවධානය යොමු කළ යුතුය. සැලසුම් බලප්‍රදේශයේ අභ්‍යන්තරයට වන්නට ඉහළ භූ විෂමතාවක් පවතින බැවින් අධික උන්නංශයක් ඇති ඉඩම් සංවර්ධනය සඳහා යොදාගැනීමේදී, නායයෑම් වැනි පාරිසරික ගැටළු මතු වී තිබේ. එබැවින් මෙම සංවර්ධන සැලැස්ම තුළින් අනාගතයේදී සිදු වන රබර් ඉඩම් සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමේදී පහත සඳහන් ක්‍රියා මාර්ග අනුගමනය කිරීමට යෝජනා කෙරේ. රබර් සංවර්ධන මණ්ඩලයේ නිර්දේශය පහත සඳහන් අවස්ථා වලදී ලබා ගත යුතු යැයි යෝජනා කෙරේ.

1. අවුරුදු 20 ට වඩා වැඩි ඉඩම්හි භාවිතය වෙනස් කිරීම.
2. අක්කර 50ට වඩා වැඩි රබර් ඉඩම්හි භාවිතය වෙනස් කිරීම.
3. මීටර් 60 ක උන්නතාංශයකින් යුතු වන ඉඩම්හි භාවිතය වෙනස් කිරීම.

ප්‍රදේශය තුළ පවතින පාරිසරික සම්පත් උපයෝගී කරගනිමින් ජනතාවට සුවපහසු නගරයක් බවට පත්කිරීම යන අරමුණ සාක්ෂාත් කර ගැනීමේදී ජනතාවට සුවපහසු නගරයක් ඇති කිරීම උදෙසා පවතින පාරිසරික සම්පත් නිසි ලෙස යොදා ගනිමින් තුලනාත්මක සංවර්ධනයක් ඇති කිරීම බලාපොරොත්තු වේ.

## 6.5.2. ආපදා කළමනාකරණ සැලැස්ම

ආපදා කළමනාකරණ සැලැස්ම මඟින් සැලසුම් බලප්‍රදේශය 2030 වනවිට ස්වභාවික අපදා අවම වන පරිදි අනාගත සංවර්ධනයන් නිවැරදි දිශානතියකට යොමු කිරීමට අවශ්‍ය ක්‍රමෝපායන් හා මාර්ගෝපදේශයන් හඳුනා ගන්න ලදී.

බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පසුගිය දශක කිහිපය තුළ ස්වභාවික විපත් එනම්, ගංවතුර, වෙරළ ඛාදනය, සුළු නාය යාම් තත්ත්වයන්ට හා 2004 වර්ෂයේ ඇති වූ සුනාමි ව්‍යසනයෙන් බලපෑමට ලක්වී තිබේ. මෙමඟින් ජනතාවගේ ජීවන රටාවට දැඩි බලපෑමක් සිදුවන අතර, නියමිත සැලසුමක් සහ පාලනයකින් තොරව ඉතා සීඝ්‍ර ලෙස පහත්බිම් සහ වගුරු බිම් ගොඩකිරීම (උදා: සිල්ලිය), ජලය අපවහනය කරන ඇළ මාර්ග හා කාණු පද්ධතිය නඩත්තු නොකිරීම, නගරයේ ස්වාභාවික ජල රඳවන ප්‍රදේශවල ධාරිතාව අඩු වී තිබීම සහ සැලසුම් රහිත ඉඩම් පරිහරණය හේතුවෙන් බේරුවල නගර සභා ප්‍රදේශයේ ඇතැම් ස්ථාන සුළු වර්ෂාවකදී වුවද හදිසි ජල ගැලීම්වලට ලක්වේ. ප්‍රදේශයේ මාර්ග ජලයෙන් යටවීමෙන් එදිනෙදා සාමාන්‍ය කටයුතුවලට බාධා ඇති කෙරේ.

ප්‍රදේශයේ බස්නාහිර මායිම මුහුදු ප්‍රදේශයක් වන අතර, කුඩා පයාගල, උතුරු– කුඩා පයාගල, දකුණු –මහා පයාගල, උතුරු –මහා පයාගල, මග්ගොඩ –බටහිර, මොරගල්ල, මුල්ලපිටිය, කුඩා මාගල් කන්ද හා මරක්කලා වත්ත යන ප්‍රදේශ වෙරළ ඛාදනයට ලක්වන ප්‍රදේශ ලෙස හැඳින්විය හැකිය. (මූලාශ්‍රය: ප්‍රාදේශීය ලේකම් කාර්යාලය – බේරුවල)

බෙන්තර ගඟ, කළුවාමෝදර හා දුම්මල මෝදර ඇළ ප්‍රමුඛ රට සම්බන්ධ අතුරු ඇළ මාර්ග ප්‍රදේශය තුළින් ගලා බසින අතර, අවධිමත් ගොඩනැගිලි ඉදිකිරීම හා පහත්බිම් ගොඩකිරීම් යන කරුණු හේතුවෙන් ස්වභාවික ජල බැස යාමට බාධා ඇති වී තිබේ. මේ හේතුවෙන් ප්‍රදේශයේ ස්ථාන රැසක් සුළු වර්ෂාපතනයකදී වුවද ගංවතුර තර්ජනයට ලක්වන බවට වාර්තා වේ.

මෙහි ප්‍රතිඵලයක් ලෙස ජනතාව කුඹුරු වගා කටයුතු වලින් ඈත්වීම, මහා මාර්ග යටවී ගමනා ගමනයට බාධා ඇති වීම සහ නිවාස හා දේපළ හානි ඇති වීම ආදීය වාර්තා වේ. බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති පොල්කොටුව, කංකානම්ගොඩ, අක්කරගොඩ, චීනකොටුව, මරදාන, මහගොඩ, මස්සල්ගොඩ යන ප්‍රදේශ ද ගංවතුර තත්ත්වයන්ට ලක්වන බවට වාර්තා වේ.

භූගෝලීය වශයෙන් ගත් කල ඉතා උස් කඳුවැටි වලින් තොර සම භූමි වලින් යුත් පරිසරයක් පවතින නමුත්, මුහුදු මට්ටමින් කිලෝමීටර් 02 ක් පමණ රට අභ්‍යන්තරයට යන විට මුහුදු මට්ටමේ සිට අඩි 100–150 ත් අතර කඳු සහිත භූමි දක්නට ලැබේ. වේරගල, කුඩා මාගල් කන්ද, මරක්කලාවත්ත සහ මුණසිංහ සහ හෙට්ටියාකන්ද වැනි උස් භූමි ප්‍රදේශ සුළු නායයෑම් ඇතිවන ප්‍රදේශ ලෙස හඳුනාගත හැක.

2004 වර්ෂයේ ඇතිවූ සුනාමි ව්‍යසනය හේතුවෙන් බේරුවල නගරයේ වෙරළාශ්‍රිත ප්‍රදේශවලට දැඩි හානි සිදුවී තිබේ. සුනාමි ව්‍යසනයෙන් ආපදාවට ලක්වී ඇති ග්‍රාම සේවා වසම් ලෙස මරදාන, කංකානම්ගොඩ, පොල්කොටුව, පරණකඩේ යන ප්‍රදේශ දැක්විය හැක. (වගුව 6.15 හා ඇමුණුම 05 මඟින් මේ හා සම්බන්ධ සංඛ්‍යාත්මක දත්ත දක්වනු ලැබේ.)

සැලසුම් බලප්‍රදේශය තුළ සිදුවන ස්වභාවික ආපදාවන් ඇමුණුම 05 මඟින් දැක්වෙන අතර මෙම ආපදා මඟින් ජනතාවට සිදුවන අවදානම හා ආපදාවන් අවම කිරීම සඳහා යෝජිත ආපදා විපත් අවම කිරීමේ සැලැස්ම මඟින් උපක්‍රමික සැලසුම් හා ව්‍යාපෘති හඳුනාගෙන ඇති අතර ඒවා පහත පරිදි වේ.

| ග්‍රාම සේවා වසම් | ජීවිත හානි | නිවාස හානි | අනෙකුත් ගොඩනැගිලි |
|---|---|---|---|
| මරදාන | 05 | 421 | 58 |
| පරණ කඩේ | 06 | 234 | 178 |
| පොල්කොටුව | 14 | 148 | 93 |

*වගුව 6.15 : යෝජිත කලාපයන් සඳහා වර්ෂ 2030 වන විට එකතුවන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණයන්*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන ලද පර්යේෂණාත්මක ක්‍රමවේද (2018)*

## යෝජිත උපායමාර්ග

### I. ඇළ මාර්ග නවීකරණය

සැලසුම් බලප්‍රදේශය පුරා ප්‍රධාන ලෙස කාවයියන් ඇළ, බෙරව ඇළ හා සිල්ලි ඇළ යන ඇළ මාර්ගයන් ව්‍යාප්තව ඇති අතර ඇළ මාර්ග පද්ධති නඩත්තු කිරීමක් නොමැතිවීමෙන් ගොඩවීම් හා දූෂිත තත්ත්වයන්ට පත්ව ඇත. මෙම ඇළ මාර්ග නව තාක්ෂණික ක්‍රමවේද උපයෝගී කරගනිමින් නවීකරණය කළයුතු අතර නිසි ආකාරයෙන් ජල ගලාබැස්ම තුළින් ගංවතුර අවධානම අවම කරගත හැකිවේ.

ඇළ මාර්ගවලට කසළ බැහැර කිරීම හා ආක්‍රමණකාරී පැලෑටි බහුලව පැතිරීම හේතුවෙන් ජලාපවහනය නිසි පරිදි සිදු නොවීම පවතින ප්‍රබල ගැටළුවක් වන අතර ප්‍රදේශයේ ඇතිවන හදිසි ජල ගැලීම් වලටද ඉහත කී කාරණා හේතු වී ඇත. මේ සඳහා විසඳුම් ලෙස ආක්‍රමණික ජලජ ශාක ඉවත් කිරීමත් ස්වභාවික තත්ත්වයෙන්ම ඇළ මාර්ග පවත්වාගැනීමත් සුදුසු බවට මෙම සැලැස්මෙන් යෝජනා කෙරේ.

නවද මුහුදු රළ ඉහළ යාම නිසා දුම්මල්මෝදර ඇළ සහ කළුවාමෝදර ඇළ අවට කලාපය වසර 2025 වනවිට පිටාරගැලීම්ලට භාජනය විය හැකි කලාප ලෙස වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ ආපදා කලමනාකරණ මධ්‍යස්ථානය ඒකාබද්ධව කරන ලද අධ්‍යයනයකින් හඳුනාගෙන ඇත. හෙට්ටිමුල්ල ගල්හේන, මුල්ලපිටිය, මදුරුදූව හා පඹේ එම කලාපවලින් කීපයක් ලෙස හඳුන්වා දිය හැකිය. එම නිසා එම ආයතන හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඒකාබද්ධව මෙම ඇළ මාර්ග සඳහා සුවිශේෂී සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට හඳුනා ගත යුතුව ඇත.

මෙහිදී වාර්මාර්ග දෙපාර්තමේන්තුව හා සුළු වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරනු ලබන ඇළ මාර්ගයන්හි පළල් කිරීමට යෝජිත ඇළ මාර්ගයන්හි සවිනරාත්මක තොරතුරු වෙළුම 2 හි පොදු හා සාමාන්‍ය රෙගුලාසි යටතේ විස්තර කෙරේ.

### II. අවදානම් කලාපවල සංවර්ධනයන් අධෛර්යමත් කිරීම.

මෙහිදී රෙගුලාසි බලාත්මක කිරීම තුළින්ද අභ්‍යන්තර කලාප තුළ ඇති විභවතාවයන් ඉස්මතු කරලීමෙන් මෙම උපාය මාර්ගය සාක්ෂාත් කරගැනීමට යෝජනා කෙරේ.

*අ.) අවදානම් කලාපවල සිදුවන ඉදිකිරීම් සඳහා විශේෂ රෙගුලාසි බලාත්මක කිරීම*

අවධානම් කලාපවල සිදුවන ඉදිකිරීම් උදෙසා විශේෂ ඉංජිනේරු තාක්ෂණික උපක්‍රම භාවිතයට රෙගුලාසි බලාත්මක කිරීම, මෙම අවධානම් කලාපවල සිදුවන ඉදිකිරීමක් වේ. නම් ඒ සඳහා අනුකූලතාවය ලබාදිය යුත්තේ, ඊට අදාළ වු අනුමත වන්නා වු ආපදා උදෙසා ඇති ඉංජිනේරුමය තාක්ෂණික ක්‍රම උපයෝගී කරගෙන එම ගොඩනැගිලි ඉදිකිරීමට සැලසුම් කර ඇත්නම් පමණි.

*ආ.) සංරක්ෂණ කලාප, විවෘත භූමි හා වෙරළ උද්‍යාන ඇති කිරීම.*

*ඇ.) ඉදිකිරීම් සඳහා මාර්ගෝපදේශ හඳුන්වාදීම.*

## III. සුනාමි ව්‍යසනයේදී භාවිතා කළ හැකි ආරක්ෂක මංපෙත් පිළිබඳ සැලැස්ම.

දැනට පවතින සුනාමි පූර්ව දැනුම්දීමේ කුළුණු මඟින් සුනාමි අනතුරු හැඟවීම් හා ආරක්ෂාකාරීව බැහැරවීම් සඳහා මනා මෙහෙයක් ඉටුවේ. දැනට බේරුවල නගර සභාව තුළ සුනාමි අනතුරු ඇඟවීමේ එක් කුළුණක් ඇති අතර එය අභිනවාරාම පන්සල භූමි පරිශ්‍රය තුළ ස්ථාපිත කර ඇත. සුනාමි අනතුරකදී බැහැරවීමේ ආරක්ෂක මංපෙත් හඳුනාගැනීම හා ආරක්ෂක ස්ථාන හඳුනා ගැනීම මඟින් සුනාමි අනතුරකදී ජනතාවට වඩාත් ආරක්ෂාවක් ලබාදීමට හැකිවේ.

එවැනි හදිසි අවස්ථාවකදී බලප්‍රදේශය තුළින් පිටවීමට සුදුසු ස්ථාන ලෙස හඳුනාගත් මාර්ග ගණනාවක සංඥා පුවරු සවිකර තිබේ. මෙමඟින් සුනාමි අනතුරකදී ජනතාවට වඩාත් ආරක්ෂාවක් සැලසෙන බැවින් මෙම සැලැස්ම පිළිබඳව ප්‍රදේශයේ ජනතාව නිසිලෙස දැනුවත් කිරීම කළ යුතුය. සංචාරක මාර්ගෝපදේශ සඳහාද එම සැලසුම් ඇතුළත් කිරීම කළ යුතුය.

## IV. නාගරික මධ්‍යස්ථාන තුළ පවතින කාණු පද්ධතිය නවීකරණය කිරීම.

ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන ආශ්‍රිතව පවතින ජල බස්නා කාණු පද්ධති නිශ්චිත ක්‍රමවේදයක් අනුව නඩත්තු නොවීම නිසා ඒවායේ ක්‍රියාකාරීත්වය අක්‍රීය වී ඇත. එම නිසා ඇතැම් ස්ථාන තද වර්ෂා කාලවලදී පිටාර ගැලීම්වලට භාජනය වේ. හල්කඳවිල, දර්ගා නගර අවට (රෝහල අසළ, සීනවත්ත ප්‍රධාන මාර්ගයෙන් කැනල් පාර ආරම්භ වන ස්ථානය) යනාදිය උදාහරණ ලෙස දැක්විය හැකිය. අනවසර ඉදිකිරීම් ඇළ මාර්ග රක්ෂිතවල සිදුව තිබීමද මේ කෙරෙහි බලපා ඇත. එම නිසා පවතින කාණු පද්ධතිය නවීකරණය කිරීමට අදාළ ආයතනවල සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රමවත් සැලැස්මක් සකස් කිරීම සුදුසු බවට මේ යටතේ යෝජනා කෙරේ. පහත්බිම් ආශ්‍රිත අක්‍රමවත් ලෙස සිදුවන අනවසර ඉදිකිරීම සම්බන්ධයෙන් ඇතිවන පාරිසරික ගැටළු අවම කරගැනීම සඳහා සංවර්ධන සැලැස්ම මඟින් යෝජනා කරනු ලබන, පහත් බිම් සංවර්ධනයන් සඳහා භාවිතා කිරීමේදී අනුගමනය කළ යුතු සංවර්ධන නියමයන් පිළිපැදිය යුතු වේ. එසේම සියලුම අනවසර ඉදිකිරීම් ඉවත්කිරීමට පියවර ගත යුතුය.

## V. වෙරළ ඛාදනය වැළැක්වීම සඳහා ගල්වැටි දැමීම හා ගස් සිටුවීම

බේරුවල සැලසුම් බලප්‍රදේශය තුළ ඇති සුන්දර වෙරළ තීරයට සුවිශේෂී තැනක් හිමිවන අතර, වෙරළ ඛාදනයට ලක්වීම ප්‍රධාන ගැටළුවක් ලෙස පෙන්වා දිය හැකිය. එය වලක්වාගැනීම සඳහා වෙරළ තීරය තුළ ගල්වැටි දැමීම සහ ගස් සිටුවීම සුදුසු බවට මෙම සැලැස්ම මඟින් යෝජනා කෙරේ.

තවද මුහුදු රළ ඉහළ යාම නිසා දුම්මල්මෝදර ඇළ සහ කළුවාමෝදර ඇළ අවට කලාපය වසර 2025 වනවිට පිටාරගැලීම්ලට භාජනය විය හැකි කලාප ලෙස වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඒකාබද්ධව කරන ලද අධ්‍යයනයකින් හඳුනාගෙන ඇත. හෙට්ටිමුල්ල, ගල්හේන, මුල්ලපිටිය, මදුරුදූව හා පඹේ එම කලාපවලින් කීපයක් ලෙස හඳුන්වා දිය හැකිය. එම නිසා මෙම ආයතන හා වාර්මාර්ග දෙපාර්තමේන්තුව ඒකාබද්ධව මෙම ඇළ මාර්ග සඳහා සුවිශේෂී සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට හඳුනා ගත යුතුව ඇත.

VI. හඳුනාගත් නායයාම් පවතින ස්ථාන සඳහා ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.


බේරුවල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය සෙසු ප්‍රදේශවලට සාපේක්ෂව නායයෑම් අඩු ප්‍රදේශයක් ලෙස ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මඟින් නම්කර ඇත. නමුත් එම ආයතනය නම් කර ඇති සුවිශේෂී නිර්ණායකයන් අනුව භූමියේ විශේෂතා පදනම් කරගෙන ඉඩම් හා ගොඩනැගිලි අනුමත කිරීමේදී ප්‍රාදේශීය සභා හරහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ ලබාගැනීම සිදුකෙරේ. ඒ අනුව මෙම සැලැස්ම තුළින් එම නිර්දේශ ලබාගැනීම ඉදිරියටද ක්‍රියාත්මක කළ යුතු බව යෝජනා කෙරේ.

## 6.5.3. පොදු හා විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම

### *සැලසුම් අරමුණු*

ප්‍රදේශයේ යෝජිත අනාගත සංවර්ධන අවශ්‍යතාවයට ගැලපෙන පොදු හා විනෝදකටයුතු ස්ථාන සංවර්ධනය හා ඒවා ප්‍රදේශය තුළ සිටින සියලුම ජන කොටස් සඳහා විවෘත කිරීම මෙම උපායමාර්ගික සැලැස්මෙහි අරමුණ වේ.

නාගරික සංවර්ධන අධිකාරියේ ගණනය කිරීම්වලට අනුව ජනගහනය පුද්ගලයන් 1000 ට හෙක්ටයාර 1.4 අවම වශයෙන් පොදු එළිමහන් විවෘත භූමි ලෙස සංවර්ධන සැලැස්ම සැකසීමේදී වෙන්කල යුතුය. බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2017 වසර වනවිට ජනගහනය 175,703 ක් ලෙසත් වර්ෂ 2030 වන විට එම ජනගහනය 207,294 ක් දක්වා වර්ධනය වන බව ද පුරෝකථනය කර ඇත. ඒ අනුව 2030 වර්ෂය වනවිට පොදු එළිමහන් විවෘත භූමි ලෙස හෙක්ටයාර 290.211 ක් වෙන්කළ යුතුව ඇත. නමුත් පවතින සීමිත බිම් ප්‍රමාණය හේතුවෙන් විවෘත භූමි සඳහා එතරම් ඉඩම් ප්‍රමාණයක් වෙන්කල නොහැකි වීම නිසා ජනගහනය 1000 ට හෙක්ටයාර 1 ක් ලෙස සලකා 2030 දී අවශ්‍යය වන පොදු එළිමහන් විවෘත භූමි ප්‍රමාණය හෙක්ටයාර 207.294 ක් අවම වශයෙන් ඒ සඳහා වෙන් කල යුතු වේ. ඒ අනුව හඳුනා ගන්නා ලද යෝජිත විවෘත භූමි පරිහරණය සිතියම 6.17 මඟින් දැක්වේ.




**යෝජිත විවෘත භූමි පරිහරණය**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 0.35 0.7 1.4 2.1 2.8 කි.මී

නාගරික සංවර්ධන අධිකාරිය
දෙසැම්බර් 2018

බස්නාහිර පළාත් අංශය | බේරුවල සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

*සිතියම 6.17: බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා යෝජිත විවෘත භූමි පරිහරණය*

බේරුවල නාගරික ප්‍රදේශයේ ජනගහනයට සාපේක්ෂව විවේක හා විනෝද පහසුකම් කටයුතු සඳහා අවශ්‍ය අවම ඉඩ ප්‍රමාණය නොමැති අතර ප්‍රදේශයේ පාසැල්වලට අයත් ක්‍රීඩාංගන කිහිපයක් ඇති අතර නගර සභා බලප්‍රදේශය තුළ මහජන ක්‍රීඩාංගනයක් නොමැත.

නවමත් ග්‍රාමීය ලක්ෂණවලින් යුතු විශාල ප්‍රදේශයක් ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පවතින බැවින් අනාගත අවශ්‍යයතාවට වඩා විවෘත භූමි ප්‍රමාණයක් මෙම ප්‍රදේශය තුළ පවතින නමුත් විධිමත් වූ පහසුකම් වලින් යුත් පොදු විනෝදකටයුතු ස්ථානවල හිඟයක් පවතී.

| ප්‍රා.ලේ.කො. තුළ පවතින විවෘත භූමි | භූමි ප්‍රමාණ (හෙක්ටයාර) |
|---|---|
| ක්‍රීඩා පිටි උද්‍යාන | 21.66 |
| තෙත්බිම් | 1463.238 |
| මුළු ඉඩම් ප්‍රමාණය | 1483.898 |

*වගුව 6.16 : සැලසුම් බලප්‍රදේශය තුළ පවතින විවෘත භූමි ප්‍රමාණයන් - 2018*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය—පරිසර හා භූ දර්ශන අංශය (2018)*

විවේක හා විනෝද පහසුකම් සෘජු හා වක්‍ර ලෙස ප්‍රධාන කොටස් දෙකක් යටතේ සලකා බලනු ලැබේ. ක්‍රීඩා කිරීම, පිහිනීම, දිවීම, ඇවිදීම, බෝට්ටු පැදීම, මාලු ඇල්ලීම ආදිය සෘජු විනෝද පහසුකම් යටතට ගැනෙන අතර වක්‍ර විනෝද පහසුකම් යටතට සිනමා ශාලා, ගෘහස්ත ක්‍රීඩාගාර ආදිය අයත් වේ. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන ප්‍රදේශය පුරා පැතිර පවතින පොදු හා විනෝද කටයුතු ස්ථාන ලෙස සංවර්ධනය කිරීමේ විභවතාවයකින් යුතු ස්ථාන හඳුනාගෙන සංවර්ධනය කිරීමට මෙම සැලැස්ම යටතේ හඳුනාගෙන ඇති අතර ඒ සඳහා වන යෝජිත උපායමාර්ගයන් පහතින් දැක්වේ. ඒ අනුව දැනට පවතින සහ යෝජිත විවෘත භූමි සැලැස්ම වගුව 6.16 මඟින් හා ඇමුණුම 04 මඟින් දක්වා ඇත.

## *යෝජිත උපායමාර්ග*

I. පවතින නාගරික ප්‍රදේශ සහ යෝජිත අභ්‍යන්තර කලාප වල ජනාවාස ආශ්‍රිතව පවතින පොදු විනෝද කටයුතු ස්ථාන සංවර්ධනය සහ නව පොදු විවෘත භූමි ඇති කිරීම.

*අ.) පවතින නාගරික ප්‍රදේශ සහ යෝජිත අභ්‍යන්තර කලාප වල ජනාවාස ආශ්‍රිතව දැනට පවතින පොදු ක්‍රීඩාංගන, පොදු මහජනයා රැස්වන ස්ථාන, ළමා උද්‍යාන ආදිය හඳුනාගෙන ඒවායෙහි පහසුකම් සංවර්ධනය කිරීමට මෙමඟින් යෝජනා කෙරේ.*

*ආ.) අවශ්‍යතාවය අනුව යෝජිත ජනාවාස සංවර්ධන කලාප ආශ්‍රිතව නව පොදු විනෝද කටයුතු ස්ථාන හඳුනාගෙන සංවර්ධනය කිරීමට යෝජනා කෙරෙන අතර එහිදී පවතින ස්ථානීය විභවතාවයන් සැලකිල්ලට ගෙන එවැනි ස්ථාන හඳුනාගෙන සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ.*

II. ප්‍රදේශයේ පවතින දර්ශනීය ස්ථාන, පාරිසරික වශයෙන් සංවේදී ස්ථාන ආශ්‍රිතව ක්‍රියාකාරී ව්‍යාපෘති හඳුනාගෙන සංවර්ධනය කිරීම.

*අ.) වෙරළ තීරය, කඩොලාන පරිසර පද්ධති, බෙන්තර ගඟ මෝය ආශ්‍රිත ස්ථාන ආදී හඳුනාගත් ස්ථාන ආශ්‍රිතව භූ දර්ශනය කිරීමේ සහ පොදු එළිමහන් ස්ථාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති මෙහි ක්‍රියාකාරී ව්‍යාපෘති යටතේ හඳුනාගෙන ඇත.*

ආ.) දර්ශනීය සහ පරිසර සංවේදී ප්‍රදේශ සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම.

III. නාගරික ප්‍රදේශ සහ සේවා මධ්‍යස්ථාන ආශ්‍රිතව සිනමා ශාලා, පොදු රැස්වීම් ශාලා, එළිමහන් රංග ශාලා ප්‍රජා ශාලා ආදි ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම.

IV. ප්‍රජා මූලික නාගරික පරිසර තත්ත්වය උසස් කිරීමේ වැඩපිළිවෙලක් හඳුන්වාදීම. Community based urban landscape transformation program.

වෙරළතීරය, කඩොලාන පරිසර පද්ධති, බෙන්තර ගඟ මෝය, සිල්ලිය පහත් බිම ආදී හඳුනාගත් ස්ථාන ආශ්‍රිතව භූ දර්ශනය කිරීමේ සහ පොදු එළිමහන් ස්ථාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති මෙහි ක්‍රියාකාරී ව්‍යාපෘති යටතේ හඳුනාගෙන ඇත.

V. මරදාන පාර දර්ශනීය මං පෙතක් (Scenic Route) ලෙස භාවිතා කිරීම සඳහා ප්‍රතිසංවර්ධනය කිරීම.

VI. ප්‍රදීපාගාරය පිහිටි බාබේරියන් දූපත විවේක හා විනෝද පහසුකම් කටයුතු සපයන සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා භාවිතා කල හැකි දර්ශනීය ස්ථානයකි. එම ස්ථානයේ දේශීය,විදේශීය සංචාරකයන්ට අවශ්‍යය පහසුකම් වැඩිදියුණු කිරීම මඟින් සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම.

VII. නිසි නඩත්තු කටයුතු සිදු කිරීමෙන් පසු "කලපුව" ජල ක්‍රීඩා සඳහා සහ ඒ ආශ්‍රිත ප්‍රදේශයේ ආසන පහසුකම් සලසා විවේකී ලෙස ගත කළ හැකි ස්ථානයක් ලෙස විධිමත් භූ දර්ෂණ සැලැස්මකට අනුව සංවර්ධනය කිරීම.

මෙම පාරිසරික සංවේදී ප්‍රදේශ සඳහා වන මාර්ගෝපදේශනයන් දෙවන වෙළුම පොදු රෙගුලාසි යටතේ විස්තර කෙරේ.

ප්‍රාදේශීය සභා ප්‍රදේශය තවමත් ග්‍රාමීය ලක්ෂණ වලින් යුතුවන අතර සෑම නිවසකටම පාහේ සැලකිය යුතු වපසරියකින් යුත් ඉඩම් පවතී. එමෙන්ම මුළු භූමි ප්‍රමාණයෙන් වැඩි ප්‍රතිශතයක් කුඹුරු බිම් සහ අනෙකුත් පහත් බිම් ආශ්‍රිතව තෙත් බිම් ලෙස පවතින බැවින් විවෘත භූමි සඳහා වන අවශ්‍යතාවය එම භූමි යොදාගනිමින් වියළි කාලගුණික තත්ත්ව යටතේදී පමණක් ක්‍රීඩා සඳහා භාවිතා කළ හැකි (Dry weather play grounds) ලෙස යොදාගැනීමට යෝජනා කෙරේ. ප්‍රදේශය පුරා ඉතා දර්ශණීය ස්ථාන රාශියක් පවතින අතර ඒවාද විවෘත භූමි සඳහා වන අවශ්‍යතාවය සපුරාලීමට ප්‍රයෝජනයට ගත හැකි ය. ප්‍රදේශයේ ජනතාවට සාහිත්‍ය උත්සව, ප්‍රදර්ශන ආදිය පැවැත්විය හැකි සංස්කෘතික මධ්‍යස්ථාන ස්ථාපිත වී නොමැති අතර ජනතාවගේ රසාස්වාදය සඳහා වන සිනමා ශාලා, පුස්තකාල වැනි පහසුකම්ද නොමැත. බලප්‍රදේශය තුළ ඇති වක්‍ර විවේක හා විනෝද පහසුකම් ලෙස නගර ශාලාවක්, ප්‍රජා ශාලා 25 සහ පුස්තකාල 13 හැඳින්විය හැකි අතර මේවා ද නගර සීමාවෙන් පිටත ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පිහිටුවා ඇත. පොදු එළිමහන් විනෝද කටයුතු සඳහා පවතින ඉතාමත් සීමිත ඉඩකඩ මෙවන් සංස්කෘතික මධ්‍යස්ථාන, සිනමා ශාලා, පුස්තකාල ස්ථාපනය කිරීම තුළින් එම අවශ්‍යයතාව සපුරාගත යුතු බවට මෙම සැලැස්මෙන් යෝජනා කරනු ලැබේ.

# 6.6. ජනාවාස සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

ජනාවාස සංවර්ධන උපායමාර්ගික සැලැස්ම මඟින් සංවර්ධන සැලැස්මෙහි එක් මූලික අරමුණක් වන "වෙරළ ඉම කේන්ද්‍රකොටගත් සංවර්ධන පීඩනය පාලනය කර ගැනීම සඳහා ප්‍රදේශය පුරා විහිදුණු තුලනාත්මක සංවර්ධනයක් ඇති කිරීම" සාක්ෂාත්කර ගැනීම සඳහා මෙම සැලැස්ම සකස් කෙරේ.

මෙම ජනාවාස සංවර්ධන සැලසුම ප්‍රධාන උපාය මාර්ග 02 ක් යටතේ සාකච්ඡාකරනු ලබයි. එනම්,

1. අභ්‍යන්තර ප්‍රදේශවල ජනාවාස සංවර්ධන උපාය මාර්ගය.
2. පවතින නාගරික ප්‍රදේශයන් සංවර්ධනය කිරීමේ උපාය මාර්ගය.


## 1. *අභ්‍යන්තර ප්‍රදේශවල ජනාවාස සංවර්ධන උපාය මාර්ගය*

අභ්‍යන්තර කලාපවල නේවාසික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමට ප්‍රදේශ තෝරා ගැනීමේදී පහත දැක්වෙන නිර්ණායක පදනම්කර ගන්නා ලදි.

- *ජනගහන සංරචකය*
- *ඉඩම් භාවිත සංරචකය*
- *ප්‍රවේශ මාර්ග සංරචකය*

මෙම සංරචකයන් පදනම්කොට ගනිමින් යෝග්‍යතා විශ්ලේෂණය (Suitability Analysis) තුළින් ප්‍රදේශයේ නේවාසික සංවර්ධනය සඳහා වඩාත් සුදුසු ප්‍රදේශ හඳුනාගන්නා ලදි. එමෙන්ම මංසන්ධි විශ්ලේෂණය (Node Analysis) තුළින් දැනට පවතින කුඩා මංසන්ධි හා ඒවා අතර ඇති සම්බන්ධතාව හඳුනාගනිමින් අනාගත සංවර්ධනය සඳහා යොදා ගතහැකි ප්‍රදේශ හඳුනාගන්නා ලදි.

එම හඳුනාගත් මංසන්ධි ප්‍රමුඛතාවය මත වර්ගීකරණය කළ අතර එය සිතියම 6.18 පරිදි වේ.




*සිතියම 6.18: බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රමුඛතාවය මත සේවා මධ්‍යස්ථාන වර්ගීකරණය*

මෙලෙස හඳුනාගත් උප නාගරික කලාපයන් සංවර්ධනය කිරීමට ප්‍රථම ග්‍රාමීය මට්ටමේ උප නාගරික මධ්‍යස්ථානයන් සංවර්ධනය කිරීමට තිබිය යුතු අවම පහසුකම් මොනවාද යන්න සාහිත්‍ය, සඟරා, සමීක්ෂණ, අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදී. එය ඇමුණුම 06 මඟින් දැක්වේ. ඒ අනුව හඳුනාගන්නා ලද උප නාගරික මධ්‍යස්ථානයන්හී මූලික පහසුකම් වල පැවතීම වගුව 6.17 මඟින් දැක්වේ.

| *උප නාගරික පහසුකම්* | හල්කඳවිල | පොතුවිල | අඹේපිටිය | පාදගොඩ | වලහර | කාලවිල | බැදනාගොඩ | හිරිගල්ගොඩැල්ල | මුංහේන |
|---|---|---|---|---|---|---|---|---|---|
| මූල්‍යමය ආයතන | × | × | × | × | × | | × | | |
| තැපැල් | × | × | | | × | | × | × | × |
| පිට්ටනි | × | | | × | × | | | × | × |
| කඩ වීදි | × | × | × | × | × | × | × | × | × |
| සෞඛ්‍ය මධ්‍යස්ථාන | | × | × | × | | × | | | |
| පූජා ශාලා | × | × | × | × | | | × | × | × |
| පාසල් | | × | | × | × | × | × | × | × |

*වගුව 6.17 : හඳුනාගන්නා ලද උපනාගරික මධ්‍යස්ථානයන්හි පවතින පොදු පහසුකම්*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - කළුතර දිස්ත්‍රික් කාර්යාලය*

මෙසේ හඳුනා ගන්නා ලද සේවා මධ්‍යස්ථානයන්හි මූලික පහසුකම් පදනම්කර ගනිමින් එම නේවාසික මධ්‍යස්ථාන පළමු හා දෙවන පෙළ මධ්‍යස්ථාන ලෙස මට්ටම් දෙකක් යටතේ වර්ගීකරණය කළ අතර එය වගුව 6.18 පරිදි දැක්විය හැකිය.

| ප්‍රමුඛතා මට්ටම | උප නාගරික මධ්‍යස්ථාන | වර්තමාන ජනගහනය | 2030 ජනගහනය |
|---|---|---|---|
| පළමු මට්ටම | හල්කඳවිල | 1933 | 2159 |
| | පොතුවිල | 2015 | 2244 |
| | පාදගොඩ | 1718 | 1913 |
| දෙවන වන මට්ටම | වලහර | 3848 | 4286 |
| | අඹේපිටිය | 5027 | 5599 |
| | හිරිගල්ගොඩැල්ල | 2458 | 2738 |
| | මුංහේන | 3056 | 3404 |
| | පාලයන්ගොඩ | 2219 | 2471 |
| | කාලවිල | 2494 | 2778 |

*වගුව 6.18 : හඳුනාගන්නා ලද උප නාගරික මධ්‍යස්ථානයන්හි වර්ෂ 2030 සඳහා ජනගහන ප්‍රරෝකථනය*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - කළුතර දිස්ත්‍රික් කාර්යාලය*

අභ්‍යන්තර කලාපවල ජනාවාස ප්‍රචලිත කිරීම යටතේ හල්කඳවිල නගරයට ප්‍රධාන ස්ථානක් හිමි වේ. දැනටමත් සංවර්ධනය වූ සේවා මධ්‍යස්ථානයක් වීමත් දොඩංගොඩ ප්‍රදේශයට සෘජුව සම්බන්ධ වීමට ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීමට හඳුනාගෙන තිබීමත් නිසා හල්කඳවිල පළමු පෙළ නේවාසික මධ්‍යස්ථානයක් ලෙස හඳුනාගෙන ඇත. මෙනිසා මේ ආශ්‍රිතව පහත දැක්වෙන උපායමාර්ගික ව්‍යාපෘති හඳුනාගෙන ඇති අතර එය ව්‍යාපෘති සාරාංශයෙහි සවිස්තරාත්මකව දැක්වේ.

## 2. පවතින නාගරික ප්‍රදේශයන් සංවර්ධනය කිරීමේ උපාය මාර්ගය


නාගරික ප්‍රදේශ සංවර්ධනය කිරීමේ උපාය මාර්ගය යටතේ බේරුවල සැලසුම් බලප්‍රදේශය තුළ බේරුවල, අලුත්ගම, දර්ගා නගරය හා මග්ගොන ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන ලෙස හඳුනා ගත හැකි අතර වගුව 6.19 මඟින් හා සිතියම 6.19 මඟින් දැක්වෙන්නේ එම නාගරික මධ්‍යස්ථායන්හි පවතින පොදු පහසුකම් පිළිබඳව විග්‍රහයකි.

| නාගරික මධ්‍යස්ථාන පහසුකම් | අලුත්ගම | බේරුවල | දර්ගා නගරය | මග්ගොන |
|---|---|---|---|---|
| බැංකු පහසුකම් | × | × | × | × |
| බස් නැවතුම්පළ | × | | | |
| දුම්රිය නැවතුම්පළ | × | × | × | × |
| රෝහල් | × | × | × | |
| පොදු උද්‍යාන | | × | | |
| පාසල් | | × | | × |

*වගුව 6.19 : ප්‍රධාන නාගරික මධ්‍යස්ථානයන්හි පවතින මූලික පහසුකම්*
*මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය – නාගරික සංවර්ධන අධිකාරිය –2018*

මෙම උපායමාර්ගික සැලැස්ම යටතේ බේරුවල සැලසුම් බලප්‍රදේශයෙහි පවතින ප්‍රධාන නාගරික මධ්‍යස්ථානයන් ලෙස බේරුවල, අලුත්ගම, දර්ගා නගරය සහ මග්ගොන යන නගර හඳුනාගන්නා ලදී. ඒ අනුව බේරුවල නගරය සංචාරක සහ ධීවර යන අංශයන් මුල්කරගත් සේවා සපයන නගරයක් ලෙසත්,අළුත්ගම නගරය සංචාරක කර්මාන්තය කේන්ද්‍ර කරගත් සේවා සැපයීමේ මධ්‍යස්ථානයක් ලෙසත්, දර්ගා නගරය තොග සහ සිල්ලර වෙළඳාම කේන්ද්‍ර කරගත් කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශයන්ට සේවා සපයන නගරයක් ලෙසත්, මග්ගොන නගරය ධීවර කර්මාන්තය ආශ්‍රිත සේවා සපයන නගරයක් ලෙසත් සංවර්ධනය කිරීමට අපේක්ෂිතය. එමෙන්ම මෙම සංවර්ධන ක්‍රියාදාමයේදී එම සංවර්ධන අංශයන් සමඟ සබැඳුනු යටිතල පහසුකම්ද සංවර්ධනය කිරීමත්, නගරය ආශ්‍රිතව හඳුනාගත් ගැටළුවලට පිළියම් සැලසීම සහ පවතින ඉඩම් ප්‍රශස්ථ භාවිතයට යෙදවීමටත් යෝජිතය.

ඉහත සඳහන් කරන ලද නාගරික මධ්‍යස්ථානයන්හි අපේක්ෂිත සංවර්ධනය අත්පත් කර ගැනීම සඳහා වූ ක්‍රියාකාරී ව්‍යාපෘතීන් පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයක් "ව්‍යාපෘති සාරාංශයෙහි" අන්තර්ගත වේ.




**සංවර්ධනය කිරීමට යෝජිත උප නාගරික මධ්‍යස්ථානයන්හි පවතින පොදු පහසුකම්**
**බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 0.35 0.7 1.4 2.1 2.8 කි.මී

නාගරික සංවර්ධන අධිකාරිය
දෙසැම්බර් 2018

බස්නාහිර පළාත් අංශය | බේරුවල සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

*සිතියම 6.19: බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංවර්ධනය කිරීමට යෝජිත උප නාගරික මධ්‍යස්ථානයන්හි පවතින පොදු පහසුකම්*

# 6.7. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම

ක්‍රියාත්මක කිරීමේ සැලසුම තුළින් හඳුනාගෙන ඇති යෝජිත සංවර්ධන සැලසුමෙහි හඳුනාගත් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන ආකාරයයි. මෙහිදී ප්‍රධාන නිර්නායකයන් කිහිපයකට අනුව හඳුනාගත් ව්‍යාපෘතීන්වල ප්‍රමුඛතාවය මත පෙළ ගස්වා ඇත

1. *ප්‍රතිලාභදායි ව්‍යාපෘතීන්*

    - *පාරිසරික වශයෙන් ප්‍රතිලාභ ලැබෙන ව්‍යාපෘතීන්*
    - *සමාජීය වශයෙන් ප්‍රතිලාභ ලැබෙන ව්‍යාපෘතීන්*

2. *පිරිවැය අනුව*

    - *පාරිසරික පිරිවැය*
    - *සමාජයීය පිරිවැය*
    - *මූල්‍ය පිරිවැය*

3. *සංවර්ධන සැලසුමෙහි දැක්ම හා අරමුණු ලඟා කරගතහැකි ව්‍යාපෘතීන්*

4. *එක් එක් ව්‍යාපෘතීන් අන්‍යෝන්‍ය වශයෙන් අනෙක් ව්‍යාපෘතීන් හා බලපානු ලබන ආකාරය*

මෙම නිර්ණායකයන්ට අනුව ව්‍යාපෘතීන්වල පෙළ ගැස්ම

I. *පළමු පෙළ ප්‍රමුඛතාවයක් ඇති ව්‍යාපෘතීන්*
II. *දෙවන පෙළ ප්‍රමුඛතා සහිත ව්‍යාපෘතීන්*
III. *තෙවන පෙළ ප්‍රමුඛතා සහිත ව්‍යාපෘති*

*ලෙස පෙළ ගැස්විය හැක*

## *පළමු පෙළ ප්‍රමුඛතාවයක් ඇති ව්‍යාපෘතීන්*

1. *නිරසාර නාගරික ජලාපවහන පද්ධතියක් නිර්මාණය කිරීම (බේරුවල නගර සභා බලප්‍රදේශය, මොරගල්ල සංචාරක කලාපය සඳහා)*
2. *යෝජිත කුරේවත්ත කසළ කලමනාකරණ අංගනය*
3. *යෝජිත නාගරික වෙරළ උද්‍යානය – බේරුවල*
4. *බාබේරියන් දූපත සංචාරකයන් සඳහා විවෘත කිරීම.*
5. *සිල්ලිය ජලාශය වටා කලාපයේ ප්‍රවේශකත්වය වැඩිදියුණු වන අයුරින් සංවර්ධනය කිරීම.*
6. *ගාලු පාර පුළුල් කිරීම (මග්ගොන සිට බේරුවල දක්වා සහ මොරගල්ල සිට අලුත්ගම දක්වා)*
7. *වෙරළ තීරය විවර කිරීම අදියර I*
8. *වෙරළ තීරය විවර කිරීම අදියර II*
9. *යෝජිත සංචාරක තොරතුරු දැනගැනීමේ මධ්‍යස්ථානය.*
10. *යෝජිත කාලවිලවත්ත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය.*

11. *මග්ගොන සිට සිල්ලිය දක්වා ඇවිදීමේ මංතීරු සහ බයිසිකල් මංතීරු.*
12. *යෝජිත සංචාරක වැඩිහිටි ගම්මානය හා කෘෂිකර්මය මුල්කරගත් ගම්මානය.*
13. *පවතින ධීවර තොටුපොලවල තත්ත්වය ඉහළ නැංවීම. (බේරුවල, මග්ගොන හා අලුත්ගම)*
14. *බෙන්තර පැරණි පාලම මත යෝජිත විවෘත අවන්හල.*
15. *යෝජිත උතුරු දකුණු ප්‍රවේශ මාර්ගය I*
16. *කළුවාමෝදර ඇළ වටා නිර්මාණය කිරීමට යෝජිත ස්වාභාවික මංපෙත.*
17. *බේරුවල මරදාන මොරගල්ල මාර්ගය පළමුපෙළ ප්‍රමුඛතාවයක් ඇති මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම.*
18. *වෙරළ පිවිසුම් මාර්ගයන් පුළුල් කිරීම.*
19. *යෝජිත මැණික් වෙළඳාම් කටයුතු සඳහා ඉදිකරන ගොඩනැගිල්ල.*
20. *ඉදිරිලිගොඩැල්ල ඇළ ප්‍රතිසංස්කරණය කිරීම.*
21. *වැසි ජලය බැස යාමේ කාණු පද්ධතිය නවීකරණය කිරීම – දර්ගා නගරය.*
22. *යෝජිත මළාපවහන පද්ධතිය – (බේරුවල නගර සභා සීමාව, මොරගල්ල සංචාරක කලාපය)*

## දෙවන පෙළ ප්‍රමුඛතාවයක් ඇති ව්‍යාපෘතීන්

1. *බෙන්තොට ගඟ වටා ඉදිකිරීමට යෝජිත පදික මාර්ගය.*
2. *ප්‍රදර්ශනාගාරයක් සහිත සංස්කෘතික මධ්‍යස්ථානය.*
3. *මරදාන මත්ස්‍ය වෙළඳපොළ වැඩි දියුණු කිරීම.*
4. *යෝජිත ධීවර ප්‍රජාව වෙනුවෙන් ඉදිකරන නිවාස සංකීර්ණය.*
5. *යෝජිත ආයුර්වේද සහ සංචාරක මධ්‍යස්ථානය.*
6. *ජැටි යා කරමින් ඉදිකිරීමට යෝජිත පාලම.*
7. *යෝජිත සාප්පු සංකීර්ණය – දර්ගා නගරය.*
8. *ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ යෝජිත හෝටල් සහ සාප්පු සංකීර්ණය.*
9. *මුන්හේන මංසන්ධිය සඳහා ප්‍රවේශ වීමට ඇති විකල්ප මාර්ගය සංවර්ධනය කිරීම.*
10. *මොරගල්ල වෙරළ වෙත අබාධිත වූවන් සඳහා වූ විශේෂ පිවිසුම් මාර්ගයක් ඇතිකිරීම.*
11. *මග්ගොන පොදු ක්‍රීඩාංගනය හා වැසි ජල කාණු පද්ධතිය සංවර්ධනය කිරීම.*
12. *බේරුවල මත්ස්‍ය වෙළඳපොළ සංවර්ධනය කිරීම.*
13. *සංවර්ධන බලප්‍රදේශයේ අභ්‍යන්තරයට ගමන්කළ හැකි හඳුනාගත් මාර්ග මංතීරු දෙකක් සහිත මාර්ග ලෙසින් පුළුල් කිරීම.*
14. *යෝජිත නව සාප්පු සංකීර්ණය සංවර්ධනය කිරීම – බේරුවල*
15. *ෆතා හජ්ජියාර් මාවත සංවර්ධනය කිරීම.*
16. *දුම්රිය ප්‍රවේශ මාර්ගයන් ඇවිදීමේ පහසුකම් සහිත මාර්ගයන් ලෙසින් සංවර්ධනය කිරීම.*

## *තෙවන පෙළ ප්‍රමුඛතාවයක් ඇති ව්‍යාපෘතීන්*

1. *අලුත්ගම පොදු වෙළඳපොල සඳහා වාහන නවතා තැබීමේ පහසුකම් සැපයීම.*
2. *මරදාන මාර්ගයේ සිට නව ගාලු පාර වෙතට ප්‍රවේශ වීම සඳහා වූ කෙටි පටුමග පුළුල් කිරීම.*
3. *කන්දේ විහාර පූජා කලාප සංවර්ධනය.*
4. *පැරණි ලිච්චම් සිනමා ශාලාව ඇති ඉඩම සහ පද්මිණි පීරිස් මාර්ගය සඳහා වාහන නවතා තැබීමේ පහසුකම් සැපයීම.*
5. *මග්ගොන නගර මධ්‍ය සාප්පු සංකීර්ණය සංවර්ධනය කිරීම.*
6. *හල්කඳවිල උප නගර සංවර්ධන ව්‍යාපෘතිය.*
7. *නාගරික සංවර්ධන අධිකාරිය සතු අවන්හල සංවර්ධනය කිරීම.*
8. *යෝජිත කෘෂිකර්මය මූලික කරගත් ගම්මානය.*
9. *දර්ගා නගර පොදු ක්‍රීඩාංගනය සහ වාහන නවතා තැබීමේ පහසුකම් සැපයීම.*
10. *බේරුවල, මග්ගොන හා දර්ගා නගරය තුළ පවතින රජයේ රෝහල සංවර්ධනය කිරීම.*
11. *විශේෂ පිවිසුම් මාර්ග සංවර්ධන කිරීම.*
12. *යෝජිත සංචාරක පාසල.*
13. *අළුත්ගම පොළ ආශ්‍රිත කලාපය, නව වෙළඳපල සංකීර්ණයක් හා සංචාරක අවන්හල් ඇති කිරීම.*
14. *සුනාමි නැවත පදිංචි කිරීමේ ස්ථානයන්හි ප්‍රවේශ මාර්ගයන් සංවර්ධනය කිරීම.*

යෝජිත සංවර්ධන සැලසුමෙහි හඳුනාගෙන ඇති ක්‍රියාකාරී ව්‍යාපෘතීන් 2019-2030 යන කාල සීමා තුළදී ක්‍රියාත්මක කළ යුතු බැවින් ඉහත දී හඳුනා ගත් පළමුපෙළ ප්‍රමුඛතා ව්‍යාපෘති,දෙවනපෙළ ප්‍රමුඛතා ව්‍යාපෘති,හා තෙවන පෙළ ප්‍රමුඛතා ව්‍යාපෘතීන් හි ක්‍රියාත්මක කිරීමේ විභවතාවය මත දිගු කාලීන හා කෙටි කාලීන වශයෙන් හඳුනා ගන්නා ලදී. (වගුව 6.20 වගුව 6.21 සහ වගුව 6.22 මඟින් දැක්වේ)

මෙලෙස හඳුනා ගන්නා ලද එක් එක් ව්‍යාපෘතීන් කුමන අංශයකට අයත්ද, ව්‍යාපෘතිය යෝජිත ප්‍රදේශය,ඉඩමේ ප්‍රමාණය, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය හා ක්‍රියාත්මක කිරීමේ ආයතනය ආදී තොරතුරුවල සංක්ෂිප්ත විස්තරයක් "ව්‍යාපෘති සාරාංශයෙහි" දැක්වේ. තවද, මෙම එක් එක් ව්‍යාපෘතීන්හි ආයතනික වගකීම පිළිබඳව පෙළ ගැස්මක් වගුව 6.23 මඟින් දැක්වේ.

# පළමු පෙළ ප්‍රමුඛතාවයක් ඇති ව්‍යාපෘතීන්

| | ව්‍යාපෘති | 2019 | | | | 2020 | | | | 2021 | | | | 2022 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3 Q |
| 1 | තිරසාර නාගරික ජලාපවහන පද්ධතියක් නිර්මාණය කිරීම<br>(බේරුවල නගර සභා බලප්‍රදේශය, මොරගල්ල සංචාරක කලාපය සඳහා) | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ |
| 2 | යෝජිත කුරේවත්ත කසළ කලමනාකරණ අංගණය. | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | | | |
| 3 | යෝජිත නාගරික වෙරළ උද්‍යානය - බේරුවල. | ■ | ■ | ■ | ■ | | | | | | | | | | | |
| 4 | බාබේරියන් දූපත සංචාරකයන් සඳහා විවර කිරීම. | | | | | | | | | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ |
| 5 | සිල්ලිය ජලාශය වටා කලාපය ප්‍රවේශකත්වය වැඩි දියුණු වන අයුරින් සංවර්ධනය කිරීම. | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | | | | | | | |
| 6 | ගාලු පාර පුළුල් කිරීම. (මග්ගොන සිට බේරුවල දක්වා සහ මොරගල්ල සිට අලුත්ගම දක්වා) | ■ | ■ | ■ | ■ | | | | | | | | | | | |
| 7 | වෙරළ තීරය විවර කිරීම අදියර I | ■ | ■ | ■ | | | | | | | | | | | | |
| 8 | වෙරළ තීරය විවර කිරීම අදියර II | ■ | ■ | ■ | | | | | | | | | | | | |
| 9 | යෝජිත සංචාරක තොරතුරු දැනගැනීමේ මධ්‍යස්ථානය. | ■ | ■ | ■ | ■ | ■ | ■ | | | | | | | | | |
| 10 | යෝජිත කාලවිලවත්ත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය. | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | | | | | | | |
| 11 | මග්ගොන සිට සිල්ලිය දක්වා ඇවිදීමේ මංතීරු සහ බයිසිකල් මංතීරු. | | | | | | | | | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ |
| 12 | යෝජිත සංචාරක වැඩිහිටි ගම්මානය හා කෘෂිකර්මය මුල්කරගත් ගම්මානය. | | | | | | | | | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ |
| 13 | පවතින ධීවර තොටුපොලවල් වල තත්ත්වය ඉහල නැන්වීම. (බේරුවල, මග්ගොන, අලුත්ගම) | ■ | ■ | ■ | | | | | | | | | | | | |
| 14 | බෙන්තර පැරණි පාලම මත යෝජිත විවෘත අවන්හල | | | | | | | | | ■ | ■ | ■ | ■ | | | |
| 15 | යෝජිත උතුරු දකුණු සීමා මාර්ගය I | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | | | |
| 16 | කලුවාමෝදර ඇළ වටා නිර්මාණය කිරීමට යෝජිත ස්වභාවික මංපෙත. | | | | | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | |
| 17 | බේරුවල මරදාන මොරගල්ල මාර්ගය පළමුපෙළ ප්‍රමුඛතාවයක් ඇති මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම. | | | | ■ | ■ | ■ | ■ | ■ | ■ | | | | | | |
| 18 | වෙරල පිවිසුම් මාර්ගයන් පුළුල් කිරීම. | | | | | | | | | | | | ■ | ■ | ■ | ■ |
| 19 | යෝජිත මැණික් වෙළඳාම් කටයුතු සඳහා ඉදිකරන ගොඩනැගිල්ල | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | | | | | | | | |
| 20 | ඉදිරිලිගොඩැල්ල ඇළ ප්‍රතිසංස්කරණය. | | | | | ■ | ■ | ■ | ■ | | | | | | | |
| 21 | වැසි ජලය බැස යාමේ කාණු පද්ධතිය නවීකරණය කිරීම - දර්ගා නගරය | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ |
| 22 | යෝජිත මලාපවහන පද්ධතිය - (බේරුවල නගර සභා සීමාව, මොරගල්ල සංචාරක කලාපය) | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ |

*වගුව 6.20 : පළමු පෙළ ප්‍රමුඛතාවයක් ඇති ව්‍යාපෘතීන්*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය- කළුතර දිස්ත්‍රික් කාර්යාලය*

| 2 | | 2023 | | | | 2024 | | | | 2025 | | | | 2026 | | | | 2027 | | | | 2028 | | | | 2029 | | | | 2030 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |

# දෙවන පෙළ ප්‍රමුඛතාවයක් ඇති ව්‍යාපෘතීන්

| | ව්‍යාපෘති | 2019 | | | | 2020 | | | | 2021 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qt |
| 1 | බෙන්තොට ගඟ වටා ඉදිකිරීමට යෝජිත පදික මාර්ගය. | | | | | | | | | | | | | | | | |
| 2 | ප්‍රදර්ශනාගාරයක් සහිත සංස්කෘතික මධ්‍යස්ථානය. | | | | | | | | | | | | | | | | |
| 3 | මරදාන මත්ස්‍ය වෙළඳපොල වැඩි දියුණු කිරීම. | | | | | | | | | | | | | | | | |
| 4 | යෝජිත ධීවර ප්‍රජාව වෙනුවෙන් ඉදිකරන නිවාස සංකීර්ණය. | | | | | | | | | | | | | | | | |
| 5 | යෝජිත ආයුර්වේද සහ සංචාරක මධ්‍යස්ථානය | | | | | | | | | | | | | | | | |
| 6 | ජැටි යා කරමින් ඉදිකිරීමට යෝජිත පාලම. | | | | | | | | | | | | | | | | |
| 7 | යෝජිත සාප්පු සංකීර්ණය - දර්ගා නගරය. | | | | | | | | | | | | | | | | |
| 8 | ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ යෝජිත හෝටල් සහ සාප්පු සංකීර්ණ. | | | | | | | | | | | | | | | | |
| 9 | මුංහේන මංසන්ධිය සඳහා ප්‍රවේශ වීමට ඇති විකල්ප මාර්ගය සංවර්ධනය කිරීම. | | | | | | | | | | | | | | | | |
| 10 | මොරගල්ල වෙරළ වෙත අබාධිත චුවන් සඳහා වූ විශේෂ පිවිසුම් මාර්ගයක් ඇතිකිරීම. | | | | | | | | | | | | | | | | |
| 11 | මග්ගොන පොදු ක්‍රීඩාංගනය හා වැසි ජල කාණු පද්ධතිය සංවර්ධනය කිරීම. | | | | | | | | | | | | | | | | |
| 12 | බේරුවල මත්ස්‍ය වෙළඳපොළ සංවර්ධනය කිරීම. | | | | | | | | | | | | | | | | |
| 13 | සංවර්ධන බලප්‍රදේශයේ අභ්‍යන්තරයට ගමන්කළ හැකි හඳුනාගත් මාර්ග මංතීරු දෙකක් සහිත මාර්ග ලෙසින් පුළුල් කිරීම. | | | | | | | | | | | | | | | | |
| 14 | යෝජිත වෙළඳපොල සංවර්ධනය කිරීම - බේරුවල. | | | | | | | | | | | | | | | | |
| 15 | ෆතා හජ්පියාර් මාවත සංවර්ධනය කිරීම. | | | | | | | | | | | | | | | | |
| 16 | දුම්රිය ප්‍රවේශ මාර්ගයන් ඇවිදීමේ පහසුකම් සහිත මාර්ගයක් ලෙසින් සංවර්ධනය කිරීම. | | | | | | | | | | | | | | | | |

*වගුව 6.21 : දෙවන පෙළ ප්‍රමුඛතාවයක් ඇති ව්‍යාපෘතීන්*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය- කළුතර දිස්ත්‍රික් කාර්යාලය*

# තෙවන පෙළ ප්‍රමුඛතාවයක් ඇති ව්‍යාපෘතීන්

| | ව්‍යාපෘති | 2019 | | | | 2020 | | | | 2021 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qt |
| 1 | අලුත්ගම පොදු වෙළඳපොල සඳහා වාහන නවතා තැබීමේ පහසුකම් සැපයීම. | | | | | | | | | | | | | | | | |
| 2 | මරදාන මාර්ගයේ සිට නව ගාලු පාර වෙතට ප්‍රවේශ වීම සඳහා වූ කෙටි පටුමග පුළුල් කිරීම. | | | | | | | | | | | | | | | | |
| 3 | කන්දේ විහාර පූජා කලාප සංවර්ධනය. | | | | | | | | | | | | | | | | |
| 4 | පරණ ලිව්වම් සිනමා ශාලාව ඇති ඉඩම සහ පද්මිණී පීරිස් මාර්ගය සඳහා වාහන නවතා තැබීමේ පහසුකම් සැපයීම. | | | | | | | | | | | | | | | | |
| 5 | මග්ගොන නගර මධ්‍ය සාප්පු සංකීර්ණය සංවර්ධනය කිරීම. | | | | | | | | | | | | | | | | |
| 6 | හල්කඳවිල උප නගර සංවර්ධන ව්‍යාපෘතිය. | | | | | | | | | | | | | | | | |
| 7 | නාගරික සංවර්ධන අධිකාරිය සතු තානායම වැඩිදියුණු කිරීම. | | | | | | | | | | | | | | | | |
| 8 | යෝජිත කෘෂිකර්මය මුල් කරගත් ගම්මානය. | | | | | | | | | | | | | | | | |
| 9 | දර්ගා නගර පොදු ක්‍රීඩාංගනය සහ වාහන නවතා  තැබීමේ පහසුකම් සැපයීම. | | | | | | | | | | | | | | | | |
| 10 | බේරුවල, මග්ගොන හා දර්ගා නගරය තුළ පවතින රජයේ රෝහල සංවර්ධනය කිරීම. | | | | | | | | | | | | | | | | |
| 11 | විශේෂ පිවිසුම් මාර්ග සංවර්ධනය කිරීම. | | | | | | | | | | | | | | | | |
| 12 | යෝජිත සංචාරක පාසල. | | | | | | | | | | | | | | | | |
| 13 | අලුත්ගම පොළ ආශ්‍රිත කලාපය, නව වෙළඳපල සංකීර්ණයක් හා සංචාරක අවන්හල් ඇති කිරීම. | | | | | | | | | | | | | | | | |
| 14 | සුනාමි නැවත පදිංචි කිරීමේ ස්ථානයන්හි ප්‍රවේශ මාර්ගයන් සංවර්ධනය කිරීම. | | | | | | | | | | | | | | | | |

*වගුව 6.22 : තෙවන පෙළ ප්‍රමුඛතාවයක් ඇති ව්‍යාපෘතීන්*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය- කළුතර දිස්ත්‍රික් කාර්යාලය*

| | 2023 | | | | 2024 | | | | 2025 | | | | 2026 | | | | 2027 | | | | 2028 | | | | 2029 | | | | 2030 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |

| | 2023 | | | | 2024 | | | | 2025 | | | | 2026 | | | | 2027 | | | | 2028 | | | | 2029 | | | | 2030 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr | 1st Qtr | 2nd Qtr | 3rd Qtr | 4th Qtr |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |

## 6.7.1 ආයතනික වගකීම

| ව්‍යාපෘතියේ නම | | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය |
|---|---|---|
| **සංචාරක සංවර්ධන සැලැස්ම** | | |
| 1. | ආයුර්වේද/සංචාරක මධ්‍යස්ථානය. | පෞද්ගලික ආයෝජන. |
| 2. | කළුවාමෝදර ඇළ ඔස්සේ ස්වභාවික මංපෙත නිර්මාණය කිරීම. | නාගරික සංවර්ධන අධිකාරිය. |
| 3. | වෙරළ තීරය විවෘත කිරීම i සහ ii (පයාගල සිට මග්ගොන දක්වා සහ මග්ගොන සිට බේරුවල දක්වා) | නාගරික සංවර්ධන අධිකාරිය. |
| 4. | යෝජිත කාලවිලවත්ත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය. | නාගරික සංවර්ධන අධිකාරිය.<br>පෞද්ගලික ආයෝජන. |
| 5. | යෝජිත නාගරික වෙරළ උද්‍යානය - බේරුවල. | නාගරික සංවර්ධන අධිකාරිය. |
| 6. | ජැටි යා කරමින් ඉදිකිරීමට යෝජිත පාලම. | ශ්‍රී ලංකා වරාය අධිකාරිය. |
| 7. | යෝජිත සංචාරක තොරතුරු මධ්‍යස්ථානය. | නාගරික සංවර්ධන අධිකාරිය. |
| 8. | සිල්ලිය ඇළ සංවර්ධනය කිරීම. | නාගරික සංවර්ධන අධිකාරිය. |
| 9. | බාබේරියන් දූපත සංචාරකයන් සඳහා විවෘත කිරීම. | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය. |
| 10. | යෝජිත මැණික් වෙළඳාම් කටයුතු සඳහා ඉදිකරන ගොඩනැගිල්ල. | බේරුවල නගර සභාව. |
| 11. | ඉදිරිලිගොඩැල්ල ඇළ ප්‍රතිසංස්කරණය. | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව, බේරුවල ප්‍රාදේශීය සභාව. |
| 12. | යෝජිත සංචාරක වැඩිහිටි ගම්මානය හා යෝජිත කෘෂිකර්මය මුල් කරගත් ගම්මානය. | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය. |
| 13. | බෙන්තර පැරණි පාලම මත යෝජිත විවෘත අවන්හල. | නාගරික සංවර්ධන අධිකාරිය.<br>පෞද්ගලික ආයෝජන. |
| 14. | ප්‍රදර්ශන සහිත සංස්කෘතික ගොඩනැගිල්ල. | නාගරික සංවර්ධන අධිකාරිය.<br>ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය. |
| 15. | කන්දේ විහාර පූජා කලාප සංවර්ධනය. | සංස්කෘතික සංවර්ධනය. |
| 16. | නාගරික සංවර්ධන අධිකාරිය සතු අවන්හල සංවර්ධනය කිරීම. | නාගරික සංවර්ධන අධිකාරිය. |
| 17. | යෝජිත සංචාරක පාසල. | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය. |
| **ධීවර කර්මාන්තය සංවර්ධන සැලැස්ම** | | |
| 18. | යෝජිත ධීවර ප්‍රජාව සඳහා ඉදි කරන නිවාස සංකීර්ණය | නිවාස සංවර්ධන අධිකාරිය |
| 19. | මරදාන මත්ස්‍ය වෙළඳපොල වැඩි දියුණු කිරීම | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය |
| 20. | බේරුවල මත්ස්‍ය වෙළඳපොළ වැඩි දියුණු කිරීම | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය |
| 21. | පවතින ධීවර තොටුපොලවල් වල තත්ත්වය ඉහළ නැංවීම. (බේරුවල, මග්ගොන, අලුත්ගම) | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය |

| ව්‍යාපෘතියේ නම | | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය |
|---|---|---|
| | **මාර්ග සංවර්ධන සැලැස්ම** | |
| 22. | බේරුවල මරදාන මොරගල්ල මාර්ගය පළමු පෙළ ප්‍රමුඛතාවයක් ඇති මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම. | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 23. | ගාලු පාර පුළුල් කිරීම. (මග්ගොන සිට බේරුවල දක්වා වූ කලාපය සහ මොරගල්ල සිට අලුත්ගම දක්වා වූ කලාපය) | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 24. | උතුරු දකුණු ප්‍රවේශ මාර්ගය i සහ උතුරු දකුණු ප්‍රවේශ මාර්ගය ii | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 25. | සංවර්ධන බලප්‍රදේශයේ අභ්‍යන්තරයට ගමන්කළ හැකි හඳුනාගත් මාර්ග මංතීරු දෙකක් සහිත මාර්ග ලෙසින් පුළුල් කිරීම. | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 26. | විශේෂ සේවාවන් සපයන මාර්ගයන් සංවර්ධනය කිරීම.<br>A. මොරගල්ල වෙරළ වෙත පිවිසුම සඳහා ආබාධිත වූවන් හට පහසුකම් සපයන මාර්ග සංවර්ධනය කිරීම.<br>B. සුනාමි නැවත පදිංචි කිරීමේ ස්ථානයන්හි ප්‍රවේශ මාර්ගයන් සංවර්ධනය කිරීම.<br>C. වෙරළ ප්‍රවේශ මාර්ගයන් සහ සංචාරක ප්‍රදේශයන් සඳහා වූ ප්‍රවේශ මාර්ගයන් සංවර්ධනය කිරීම.<br>D. පැරණි ගාලු පාරේ සිට නව ගාලුපාර වෙතට ප්‍රවේශ වීම සඳහා වූ කෙටි පටුමග සංවර්ධනය කිරීම. (ඇවිදයාමේ පහසුකම් සහිත මාර්ගයක් ලෙස)<br>E. දුම්රිය ප්‍රවේශ මාර්ගයන් ඇවිදීමේ පහසුකම් සහිත මාර්ගයක් ලෙසින් සංවර්ධනය කිරීම.<br>F. කුඩාව විකල්ප මාර්ගය සංවර්ධනය කිරීම.<br>G. බෙන්තර ගඟ ප්‍රවේශ මාර්ගයන් සංවර්ධනය කිරීම.<br>H. B 157 අලුත්ගම - මතුගම මාර්ගය සංවර්ධනය කිරීම. | මාර්ග සංවර්ධන අධිකාරිය |
| | **නේවාසික සංවර්ධන සැලැස්ම** | |
| 27. | යෝජිත මලාපවහන පද්ධතිය - බේරුවල නගර සභා සීමාව. | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| 28. | යෝජිත කුරේවත්ත කසළ කළමනාකරණ අංගනය. | බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.<br>බේරුවල ප්‍රාදේශීය සභාව. |
| 29. | තිරසාර නාගරික ජලාපවහන පද්ධතියක් නිර්මාණය කිරීම (බේරුවල නගර සභා බලප්‍රදේශය, මොරගල්ල සංචාරක කලාපය සඳහා) | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය. |
| 30. | පැරණි ලිච්චමි සිනමා ශාලාව තිබූ ස්ථානය සහ පද්මිණී පීරිස් මාර්ගය ආශ්‍රිත ප්‍රදේශය සඳහා වාහන නවතා තැබීමේ පහසුකම් සැපයීම. | බේරුවල ප්‍රාදේශීය සභාව. |
| 31. | හල්කඳවිල උප නගර සංවර්ධනය කිරීම. | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය.<br>බේරුවල ප්‍රාදේශීය සභාව.<br>නාගරික සංවර්ධන අධිකාරිය. |
| 32. | මග්ගොන ක්‍රීඩාංගනය හා වැසි ජල කාණු පද්ධතිය සංවර්ධනය කිරීම. | බේරුවල ප්‍රාදේශීය සභාව. |
| 33. | බේරුවල වෙළඳපොළ සංවර්ධනය කිරීම. | බේරුවල ප්‍රාදේශීය සභාව. |
| 34. | දර්ගා නගර පොදු ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම සහ වාහන නවතා තැබීමේ පහසුකම් සැපයීම. | නාගරික සංවර්ධන අධිකාරිය.<br>බේරුවල ප්‍රාදේශීය සභාව. |
| 35. | වැසි ජලය බැස යාමේ කාණු පද්ධතිය නවීකරණය කිරීම - දර්ගා නගරය | බේරුවල ප්‍රාදේශීය සභාව. |

| ව්‍යාපෘතියේ නම | | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය |
|---|---|---|
| 36. | බේරුවල, මග්ගොන හා දර්ගා නගරය තුළ පවතින රජයේ රෝහල සංවර්ධනය. | සෞඛ්‍ය අමාත්‍යාංශය.<br>බේරුවල ප්‍රාදේශීය සභාව.<br>නාගරික සංවර්ධන අධිකාරිය. |
| 37. | අලුත්ගම පොළ ආශ්‍රිත කලාපය, නව වෙළඳපල සංකීර්ණයක් හා සංචාරක අවන්හල් ඇති කිරීම. | නාගරික සංවර්ධන අධිකාරිය. |
| 38. | යෝජිත සාප්පු සංකීර්ණය - දර්ගා නගරය. | නාගරික සංවර්ධන අධිකාරිය.<br>බේරුවල ප්‍රාදේශීය සභාව. |
| 39. | ෆතා හජ්ජියාර් මාවත සංවර්ධනය කිරීම. | මාර්ග සංවර්ධන අධිකාරිය. |

වගුව 6.23 : ආයතනික වගකීම

## 6.7.2. ව්‍යාපෘති සාරාංශය

ඉහත සාකච්ඡා කරන ලද එක් එක් සැලසුම් යටතේ දැක්වෙන උපාය මාර්ගයන් සාක්ෂාත් කරගැනීම සඳහා යෝජිත ව්‍යාපෘතීන්හි සාරාංශගත විස්තරයක් එක් එක් සංවර්ධන සැලසුම යටතේ පහත දැක්වෙන පරිදි සලකා බැලේ.

## 01.

1. **ව්‍යාපෘතියේ නම :** *ආයුර්වේද / සංචාරක මධ්‍යස්ථානය*
2. **පිහිටීම :**



3. **ව්‍යාපෘති අංශය :** සංචාරක සංවර්ධන

4. **ව්‍යාපෘති විස්තරය :**

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

| **පළාත** | **දිස්ත්‍රික්කය** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** | **ග්‍රාම නිලධාරී වසම** | **පිහිටීම** |
|---|---|---|---|---|
| බස්නාහිර | කළුතර | බේරුවල | මොරගල්ල | මොරගල්ල වෙරළ |

*4.2. ඉඩමේ ප්‍රමාණය : හෙක්ටයාර් 0.8*

*4.3. වර්තමාන තත්ත්වය / භාවිතය :*

වර්තමානයෙහි මෙම ස්ථානය කිසිඳු භාවිතයක් සඳහා යොදා ගෙන නොමැති අතර, සුනාමිය මඟින් විනාශ වූ හෝටලයක් මෙහි පිහිටා ඇත. පෞද්ගලික ඉඩමකි.

*4.4 යෝජිත අපේක්ෂිත තත්ත්වය :*

ප්‍රධාන පෙලේ සංචාරක ආකර්ශණීය හෝටල් වලින් සමන්විත මොරගල්ල වෙරළ තීරයෙහි පිහිටා ඇති මෙම ඉඩම ආයුර්වේද හා සංචාරක සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජිතය.

"නිල් ධජ (Blue Flag)" අන්තර්ජාතික තත්ත්ව සහතිකය සහිත වෙරළක් ලෙස අනාගතයේදී බෙහෙවින් සංචාරකයන් ආකර්ශනය වන ප්‍රදේශයක් ලෙස මෙම ව්‍යාපෘතිය පහත සඳහන් පහසුකම් සහිතව සංවර්ධනය කිරීමට යෝජිතය.

- *සම්බාහන මධ්‍යස්ථාන*
- *රාත්‍රී විදුලි ආලෝකකරණය*
- *දේශීය ආහාර*
- *වාහන නැවතුම්පල*
- *දේශීය ආයුර්වේද ක්‍රම*

5. **ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :**

බේරුවල සැලසුම් බලප්‍රදේශයේ 2030 වන විට ඉහළ සංචාරක වර්ධනයක් අපේක්ෂිත බැවින් එම වර්ධනය මූලික කර ගනිමින් සංචාරක ආකර්ෂණය බහුලව ඇති කලාපයක සංචාරකයන්ගේ ඉල්ලුමට සහ අවශ්‍යතාවයට ගැලපෙන අයුරින් සේවාවන් සැපයීම සඳහා සංචාරක ආයුර්වේද මධ්‍යස්ථානයක අවශ්‍යතාවය පවතී.

6. **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :** පෞද්ගලික ආයෝජන

## 02.

1. ***ව්‍යාපෘතියේ නම :*** *කළුවාමෝදර ඇළ ඔස්සේ ස්වභාවික මංපෙත නිර්මාණය කිරීම*
2. ***පිහිටීම :***



3. ***ව්‍යාපෘති අංශය : ***සංචාරක සංවර්ධන*
4. ***ව්‍යාපෘති විස්තරය :***

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

| **පළාත** | **දිස්ත්‍රික්කය** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** | **ග්‍රාම නිලධාරී වසම** | **පිහිටීම** |
|---|---|---|---|---|
| *බස්නාහිර* | *කළුතර* | *බේරුවල* | *කළුවාමෝදර* | *කළුවාමෝදර ඇළ පෙදෙස* |

*4.2. ඉඩමේ ප්‍රමාණය : කි.මී.2.*

*4.3. වර්තමාන තත්ත්වය / භාවිතය :*

ඉතා ආකර්ශනීය කඩොලාන පද්ධතියකි. වර්තමානයේදී සංචාරකයින් බෝට්ටු සෆාරි මඟින් කඩොලාන පද්ධතිය නැරඹීම සිදු කරයි.

*4.4. යෝජිත අපේක්ෂිත තත්ත්වය :*

කළුවාමෝදර ඇළ මොරගල්ල සංචාරක ආකර්ශණීය ප්‍රදේශයට ආසන්නව පිහිටා ඇති බැවින් ද, මෙම වැදගත් පරිසර පද්ධතිය ආරක්ෂා කිරීමට හා කඩොලාන පද්ධතිය වෙත නවත් සංචාරක ආකර්ශනය වැඩි කිරීම සඳහාත් මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට යෝජිතය .


5. ***ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :***

මොරගල්ල සංචාරක කලාපයට ආසන්නයේ පිහිටා ඇති කළුවාමෝදර ඇළ ඔස්සේ ස්වභාවික මංපෙත නිර්මාණය කිරීම තුළින් සංචාරකයන් සඳහා නවමු අත්දැකීමක් එක් කරමින් ස්වභාව සෞන්දර්ය වින්දනය කර ගැනීමට අවකාශය උදා කරදීම සඳහා මෙන්ම කඩොලාන පරිසර පද්ධතිය සංරක්ෂණය කිරීම සඳහා ද මෙවන් ව්‍යාපෘතියක අවශ්‍යතාවයක් පවතී.

6. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *නාගරික සංවර්ධන අධිකාරිය*

## 03.

1. ***ව්‍යාපෘතියේ නම :*** *වෙරළ තීරය විවෘත කිරීම I සහ II*
   *(පයාගල සිට මග්ගොන දක්වා සහ මග්ගොන සිට බේරුවල දක්වා)*
2. ***පිහිටීම :***



3. ***ව්‍යාපෘති අංශය :*** *සංචාරක සංවර්ධන*

4. ***ව්‍යාපෘති විස්තරය :***

*4.1 ව්‍යාපෘති සීමාවන් :*

| ***පළාත*** | ***දිස්ත්‍රික්කය*** | ***ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*** | ***පිහිටීම*** |
|---|---|---|---|
| *බස්නාහිර* | *කළුතර* | *බේරුවල* | *පයාගල සිට මග්ගොන දක්වා හා මග්ගොන සිට බේරුවල දක්වා ගාලු පාරට ආසන්න වෙරළ තීරය* |

*4.2. දිග ප්‍රමාණය : පයාගල දුම්රියපොළ සිට මග්ගොන දක්වා - කි.මී. 3.7*
*මග්ගොන පල්ලිය සිට බේරුවල වරාය දක්වා - කි.මී. 2.41*

*4.3 වර්තමාන තත්ත්වය / භාවිතය :*

ගාලු පාර හා මුහුදු සීමාව අතර මුහුදු දර්ශනය වන කලාපයකි. වෙරළ රක්ෂිතයට අයත් කලාපයක් වන අතර වර්තමානයේ ඇතැම් ස්ථාන වල අනවසර ඉදිකිරීම් සිදුකරමින් පවතින බැවින් එය වෙරළ තීරය දර්ශනය වීමට බාධාවක්ව පවතී.

*4.4 යෝජිත අපේක්ෂිත තත්ත්වය :*

වෙරළ තීරය තුළ මේ වන විට ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කොට ස්වභාවික වෙරළ තීරය වඩාත් සුන්දර ලෙස විඳ ගැනීමට අවකාශය සලසා දීම සඳහා මෙම ව්‍යාපෘතිය යෝජනා කරන ලදී. ඒ අනුව මෙම වෙරළ තීරය ආශ්‍රිත කලාපය පහත සඳහන් පහසුකම් සහිතව සංවර්ධනය කිරීමට යෝජිතය.

- විවෘත භූමි/ ආසන, ඉතා කුඩා අවන්හල්, වාහන නැවතුම්,නැනින්නැනට ගෙන යා හැකි අමුද්‍රව්‍ය වලින් නිම වූ ආකෘතින් හා ආසන
- රාත්‍රි වෙරළ ආලෝකකරණය

5. ***ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :***

සුනාමි ව්‍යවසනය නිසා අධික ලෙස හානියට පත් වූ වෙරළ තීරයෙහි වර්තමානය වනවිට සිදුකර ඇති අනවසර ගොඩනැගිලි හා ඉදිකිරීම් අවම කිරීම සඳහාත් එම ප්‍රදේශය පොදු හා විනෝද කලාපයක් ලෙසින් කලාපීකරණය කර ඇති පයාගල සිට මග්ගොන දක්වා වෙරළ තීරයත් මග්ගොන සිට බේරුවල දක්වා වන වෙරළ තීරයත් සංවර්ධනය කිරීම සඳහා මෙම ව්‍යාපෘතියෙහි අවශ්‍යතාවය පවතී. ගාලු පාරට ඉතා සමීපව පිහිටන මෙම වෙරළ තීර දෙක මෙම ප්‍රදේශය පසුකර යන බොහෝ පිරිස් මදකට නැවතී සිය විඩාව නිවාගෙන යාමට භාවිතා කරනු ලබයි. එමෙන්ම බොහෝ සංචාරකයින් රාත්‍රී කාලයේ වෙරළ ආශ්‍රිත ප්‍රදේශයන්හි ඇවිදීමට ඇලුම් කරන බැවින් ඒ සඳහා ආරක්ෂිත පරිසරයක් තිබිය යුතුය. ඒ අනුව, රාත්‍රි වෙරළ ආලෝකකරණය මඟින් වෙරළ සුන්දරත්වය සංචාරකයන්ට විඳ ගැනීම සඳහා අවකාශය ලබා දීම මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂා කෙරේ. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන මෙම වෙරළ තීරයන් දෙක මහජනයා වෙත විවර කර දෙමින් වෙරළ උද්‍යාන ලෙස සංවර්ධනය කිරීමට මෙමඟින් යෝජනා කර ඇත.

6. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *නාගරික සංවර්ධන අධිකාරිය*

# 04.

1. ***ව්‍යාපෘතියේ නම :*** *යෝජිත කාලවිලවත්ත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය*
2. ***පිහිටීම :***



3. ***ව්‍යාපෘති අංශය :*** *සංචාරක හා නගර සංවර්ධන*
4. ***ව්‍යාපෘති විස්තරය :***

*4.1 ව්‍යාපෘති සීමාවන් :*

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරී වසම | පිහිටීම |
|---|---|---|---|---|
| බස්නාහිර | කළුතර | බේරුවල | මොරගල්ල | මොරගල්ල ප්‍රදේශයේ ගාලුපාර ආසන්නව |

*4.2. ඉඩමේ ප්‍රමාණය : හෙක්ටයාර් 1.88*

*4.3. වර්තමාන තත්ත්වය/භාවිතය :*

- හිස් ඉඩමකි. ප්‍රදේශ වාසීන් විසින් ක්‍රීඩාංගනයක් ලෙස වර්තමානයේ භාවිතා කරයි.
- නාගරික සංවර්ධන අධිකාරිය විසින් වන්දි ගෙවීමෙන් පසු අත්පත්කර ගන්නා ලද ඉඩමකි.

*4.4. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

ප්‍රධාන පෙළෙහි හෝටල් හා නිල්ධජ (Blue Flag) තත්ත්වය සහතික ලත් මොරගල්ල වෙරළ තීරය ආශ්‍රිත ප්‍රදේශයට ආසන්නව පිහිටා ඇති බැවින්, අනාගතයේ සංචාරක ආකර්ශනය වැඩිවීම යන අරමුණ සාක්ෂාත්කර ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය යෝජනා කෙරේ. ඒ අනුව මෙම ඉඩම පහත සඳහන් පහසුම් සහිතව සංවර්ධනය කිරීමට යෝජිතය.

- සුපිරි වෙළඳසල්/භෝජනාගාර
- වාහන නැවතුම් පොළවල්
- ගෘහස්ත ක්‍රීඩාංගන
- සිනමා ශාලා
- දේශීය අමුද්‍රව්‍ය වලින් සැදූ කලාත්මක විසිතුරු භාණ්ඩ හා කලාගාරය

**5. *ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :***

මොරගල්ල සංචාරක කලාපයට ආසන්නයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත මෙම ව්‍යාපෘතිය තුළින් ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂිත සංචාරක ආකර්ෂණය නව දුරටත් ඉහළ නැංවීම සහ එම සංචාරකයන්ට අවශ්‍ය සේවාවන් සැපයීමේ අවශ්‍යතාවය හේතුවෙන් මෙවන් ව්‍යාපෘතියක අවශ්‍යතාවයක් පවතී.

**6. *ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, පෞද්ගලික ආයෝජන*

## 05.

1. ***ව්‍යාපෘතියේ නම :*** *යෝජිත නාගරික වෙරළ උද්‍යානය -බේරුවල*
2. ***පිහිටීම :***



3. ***ව්‍යාපෘති අංශය :*** *සංචාරක සංවර්ධන*

4. ***ව්‍යාපෘති විස්තරය :***

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරී වසම | පිහිටීම |
|---|---|---|---|---|
| බස්නාහිර | කළුතර | බේරුවල | බේරුවල | ධීවර වරාය අසල ඇති හිස් ඉඩම |

*4.2. ඉඩමේ ප්‍රමාණය : අක්කර 8*

*4.3. වර්තමාන තත්ත්වය / භාවිතය :*

වර්තමානයේ මෙම ඉඩමේ කොටසක ළමා උද්‍යානයක් පමණක් දක්නට ලැබේ. නමුත් එයද දැනට ක්‍රියාකාරී මට්ටමක නොපවතී. බේරුවල නගර මධ්‍යයේ පිහිටි ඉඩමක් බැවින් සංචාරක සංවර්ධනය සඳහා විභවතාවයක් සහිත ඉඩමක් ලෙසින් හැඳින්විය හැකිය.

*4.4. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

බේරුවල ධීවර වරාය, වෙරළ තීරය ආශ්‍රිත කලාපය සංචාරක අංශයෙන් සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන බැවින් මෙම ස්ථානය සඳහා වෙරළ උද්‍යානයක් යෝජනා කෙරේ. එම වෙරළ උද්‍යානය පහත සඳහන් අංග වලින් යුතුව සංවර්ධනය කිරීමට අපේකෂිතය.

- වාහන නැවතුම්පළ
- ළමා උද්‍යාන
- BBQ / ආහාර පාන / මාළු සහිත අවන්හල්
- භූමි අලංකරණ සහිත උද්‍යාන පහසුකම්

5. ***ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :***

බේරුවල පළමු පෙළ නගරයක් ලෙස සංවර්ධනය වීමේ දී විවේක හා විනෝදාස්වාද ක්‍රියාකාරකම් හා පොදු ස්ථාන පැවතීම අත්‍යවශ්‍ය කාරණයකි.

එමෙන්ම නගර මධ්‍යයේ ඇති මෙම ඉඩම සංවර්ධන කිරීමේදී සංචාරක සංවර්ධන ප්‍රමුඛතාව අනුව මෙම ව්‍යාපෘතිය යෝජනා කරන ලදී.

ලොව සංචාරක ගමනාන්තයන් අතර ප්‍රචලිත වී ඇති සංකල්පයක් ලෙස "Gastronomy Economy" හෙවත් ධීවර කලාපයන් ආශ්‍රිතව සංචාරය කිරීම හා එම අත්දැකීම් විඳගැනීම දක්වියහැකිය. එබැවින්, ධීවර වරාය ආශ්‍රිත සුන්දර වෙරළ කලාපයක් පිහිටි ඇති බේරුවල ප්‍රදේශයට මෙම ව්‍යාපෘතිය තුළින් සංචාරක සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

එමෙන්ම අනාගත සංචාරක ආකර්ශනය වැඩිවීමත්, මැණික් වෙළඳාම ආශ්‍රිත කටයුතු ප්‍රසාරණය වීමත් හේතුවෙන් වාහන නැවතුම් පහසුකම් / පොදු අවකාශ ආදි පහසුකම් තිබිය යුතුය. එබැවින් මෙම ඉඩම සංචාරක සංවර්ධනය අරමුණු කොට ගෙන වෙරළ උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීම තුළින් බේරුවල නගරය පළමු පෙළ නගරයක් ලෙස ඉහළ නැංවීම අපේක්ෂා කරයි.

6. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *නාගරික සංවර්ධන අධිකාරිය*

# 06.

1. ***ව්‍යාපෘතියේ නම :*** *ජැටි යා කරමින් ඉදිකිරීමට යෝජිත පාලම*
2. ***පිහිටීම :***




3. ***ව්‍යාපෘති අංශය :*** *සංචාරක සංවර්ධන*
4. ***ව්‍යාපෘති විස්තරය :***

*4.1. ඉඩමේ සීමාවන් :*

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | පිහිටීම |
|---|---|---|---|---|
| බස්නාහිර | කළුතර | බේරුවල | බේරුවල | වෙරළ උද්‍යානය අසළ සිට කිච්චිමලේ පල්ලිය දක්වා |

*4.2. ඉඩමේ ප්‍රමාණය : මීටර් 400*

*4.3. වර්තමාන තත්ත්වය / භාවිතය :*

ධීවර වරාය ආශ්‍රිතව මේ වන විට ජැටි 2 ක් පවතී. කිච්චිමලේ පල්ලිය සිට ධීවර බෝට්ටු පැමිණෙන ස්ථානය දක්වා ඇති ජැටිය කරවල වේලීම ආදී කටයුතු සඳහා යොදා ගනිමින් පවතී.

*4.4. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

ධීවර බෝට්ටු වරායෙන් පිටත යාමට හා ධීවර කටයුතු අවසන් කර පැමිණෙන බෝට්ටු වරායට ඇතුළු වීමට ඇති ඉඩකඩ පවත්වා ගනිමින් දැනට පවතින ජැටි යා කරමින් පාලමක් ඉදිකිරීමට යෝජනා කෙරේ. බෝට්ටු වලට ගමන් කළහැකි පරිදි ජැටි වල දිගට සමානුපාතික ලෙස මෙම පාලම ඉදි කිරීමට යෝජනා කෙරේ.

5. ***ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :***

සංචාරක සංවර්ධනය අතින් බේරුවල නගරයට ප්‍රමුඛතාවයක් දීම මෙම සංවර්ධන සැලැස්මේ එක් අරමුණක් බැවින් මෙම යෝජිත ව්‍යාපෘතිය මඟින් බේරුවල නගරයට අනන්‍යතාවයක් එක් කිරීම හා දැනටම මෙම ජැටි මතින් ගමන් ගන්නා විට සුන්දර මුහුදු තීරය දර්ශනය වීම තව තවත් තීව්‍ර කිරීම සඳහාත් නැරඹුම් ස්ථානයක් ලෙසත් මෙම පාලම ඉදිකිරීමට යෝජනා කෙරේ.

වර්තමානය වන විට බේරුවල නගරය හා ධීවර වරාය ආශ්‍රිත කලාපය කැලි කසළ මඟින් දූෂිත තත්ත්වයට පත් වී ඇති බැවින් අනාගතයේ මෙම ගැටලු වළක්වා ගනිමින් සංචාරක අංශය සංවර්ධනය කිරීමට අපේක්ෂා කරයි.

6. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *ශ්‍රී ලංකා වරාය අධිකාරිය*

## 07.

1. ***ව්‍යාපෘතියේ නම :*** *යෝජිත සංචාරක තොරතුරු මධ්‍යස්ථානය*
2. ***පිහිටීම :***



3. ***ව්‍යාපෘති අංශය :*** *සංචාරක සංවර්ධන*

**4. ව්‍යාපෘති විස්තර :**

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | පිහිටීම |
|---|---|---|---|---|
| බස්නාහිර | කළුතර | බේරුවල | මොරගල්ල | මොරගල්ල වෙරළ ආශ්‍රිත පැරණි පොලිස් මුරපොළ ආශ්‍රිත ඉඩම |

*3.1. ව්‍යාපෘති සීමාවන් :*

*3.2. ඉඩමේ ප්‍රමාණය : හෙක්ටයාර් 0.01*

*3.3. වර්තමාන තත්ත්වය / භාවිතය :*

වර්තමානයේ මෙම ස්ථානය කිසිදු භාවිතයක් සඳහා යොදා ගෙන නොමැත. පොලිස් නැවතුම් ප්‍රදේශයක් ලෙස පිහිටා ඇත.

*3.4. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

මොරගල්ල වෙරළ තීරය ආශ්‍රිත සංචාරක කටයුතු බහුලව සිදුවන කලාපයක් හා අනාගතයේ දී බේරුවල බලප්‍රදේශයට පැමිණෙන සංචාරක ප්‍රමාණය සැලකිල්ලට ගෙන මෙම ව්‍යාපෘතිය යෝජනා කරන ලදී.

**5. ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :**

මෙම ප්‍රදේශයට දැනට සංචාරක තොරතුරු මධ්‍යස්ථානයක් නොමැති වීම හා බේරුවල ප්‍රදේශයේ අනාගතයේ අපේක්ෂිත සංචාරක ආකර්ෂණය සැලකිල්ලට ගනිමින් සංචාරක තොරතුරු මධ්‍යස්ථානයක් යෝජනා කරන ලදී.

මොරගල්ල වෙරළ තීරය ආශ්‍රිතව මෙම ව්‍යාපෘතිය යෝජනා කිරීමට ප්‍රධානතම හේතු ලෙස මොරගල්ල ප්‍රදේශය සඳහා අනාගතයේ ඇති වන අන්තර් ජාතික වෙරළ තත්ත්ව සහතිකයන් ( blue flag certificate) ඒ සමඟ ඇතිවන සංචාරක අකර්ශනයන් සඳහන් කළ හැකිය.

**6. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :** *නාගරික සංවර්ධන අධිකාරිය.*

# 08.

1. ***ව්‍යාපෘතියේ නම :*** *සිල්ලිය ඇළ සංවර්ධන ව්‍යාපෘතිය*
2. ***පිහිටීම :***




3. ***ව්‍යාපෘති අංශය :*** *සංචාරක සංවර්ධන*
4. ***ව්‍යාපෘතිය :***

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | පිහිටීම |
|---|---|---|---|---|
| බස්නාහිර | කළුතර | බේරුවල | මරදාන | මරදාන පාර සිල්ලිය ඇළ ආශ්‍රිතව |

*4.2. වර්තමාන තත්ත්වය / භාවිතය:*

මරදාන පාරේ පිහිටි වැදගත් පරිසර පද්ධතියක් සහිත සිල්ලය ඇළ මේ වන විට තවත් එක් නෙත් බිමක් ලෙස දක්නට ලැබේ. එමෙන්ම එය කැලි කසළ එක් කිරීමෙන් දූෂිත තත්ත්වයට පත්ව ඇත.

*4.3. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

සංචාරක සංවර්ධනය කිරීමේ අරමුණින් පහත සඳහන් පහසුකම් වලින් යුතුව සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

- භූමි අලංකරණ
- බෝට්ටු සවාරි
- කුඩා අවන්හල් හා ආසන පහසුකම්
- ඇවිදින මංතීරු


5. ***ව්‍යාපෘති අවශ්‍යතාවය :***

බේරුවල මරදාන පාරේ පිහිටා ඇති මෙම ඇළ මාර්ගය ආශ්‍රිත ප්‍රදේශය මේ වන විට කැළිකසළ මුදා හැරීම්, ඉඩම් ගොඩ කිරීම් වැනි පාරිසරික ගැටලු නිසා අවට පරිසරය දූෂිත තත්ත්වයට පත්ව ඇත. එබැවින් මෙවැනි ව්‍යාපෘතියක් තුළින් එම පාරිසරික ගැටලු මග හරවා ගැනීමට මෙන්ම සංචාරක ආකර්ශනය වැඩි කර ගැනීමටද අපේක්ෂා කෙරේ.

6. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *නාගරික සංවර්ධන අධිකාරිය*

# 09.

1. ***ව්‍යාපෘතියේ නම :*** *බාබේරියන් දූපත සංචාරකයන් සඳහා විවෘත කිරීම*
2. ***පිහිටීම :***




3. ***ව්‍යාපෘති අංශය :*** *සංචාරක සංවර්ධනය*
4. ***ව්‍යාපෘතිය :***

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

| **පළාත** | **දිස්ත්‍රික්කය** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** | **ග්‍රාම නිලධාරී කොට්ඨාසය** | **පිහිටීම** |
|---|---|---|---|---|
| *බස්නාහිර* | *කළුතර* | *බේරුවල* | *මරදාන* | *බාබේරියන් දූපත ආශ්‍රිත කලාපය* |

*4.2. වර්තමාන තත්ත්වය / භාවිතය:*

ප්‍රදීපාගාරය ආශ්‍රිත දූපත මේ වන විට ආරක්ෂිත හේතූන් මත සංචාරකයින් සඳහා විවෘත කර නොමැත.

*4.3. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

අනාගතයේදී සංචාරක කොරිඩෝවක් ලෙස සංවර්ධනය වන බේරුවල නගරයට ඉතා ඉහළ වටිනාකමක් ලබාදෙන බාබේරියන් දූපත හා ප්‍රදීපාගාරය ආශ්‍රිත මෙම කලාපය පහත සඳහන් පහසුකම් වලින් යුතුව සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

- බෝට්ටු සවාරි
- BBQ අවන්හල්
- ඇවිදින මංතීරු
- භූමි අලංකරණ
- රාත්‍රි විදුලි ආලෝකකරණය


5. ***ව්‍යාපෘති අවශ්‍යතාවය :***

1928 දී බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ ඉදිකර ඇති මෙම ප්‍රදීපාගාරය බාබේරියන් දූපතෙහි තද පාෂාණ සහිත ස්ථානයක ගලක් මත ඉදිකර ඇත. මෙවන් ඓතිහාසික පසුබිමක් ඇති මෙම කලාපයට මනා ලෙස අලංකාරව නැරඹිය හැකි බැවින් සංචාරක ආකර්ශනය ඇද ගැනීම සඳහාත්, බේරුවල, අලුත්ගම කලාපය ආශ්‍රිතව වර්ධනය වී ඇති සංචාරක කර්මාන්තය තව තවත් වර්ධනය කර ගැනීම සඳහාත් මෙමඟින් ඉඩ ප්‍රස්ථාව සැලසේ.

6. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

## 10.

1. ***ව්‍යාපෘතියේ නම :*** *යෝජිත මැණික් වෙළඳාම් කටයුතු සඳහා ඉදිකරන ගොඩනැගිල්ල*
2. ***පිහිටීම :***



3. ***ව්‍යාපෘති අංශය :*** *ආර්ථික සංවර්ධනය*

4. ***ව්‍යාපෘතිය***

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

| **පළාත** | **දිස්ත්‍රික්කය** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** | **ග්‍රාම නිලධාරී කොට්ඨාසය** | **පිහිටීම** |
|---|---|---|---|---|
| *බස්නාහිර* | *කළුතර* | *බේරුවල* | *දීනගොඩ* | *චීන කොටුව* |

*4.2. වර්තමාන තත්ත්වය / භාවිතය:*

බේරුවල චීන කොටුව ප්‍රදේශයේ සිදුවන මැණික් වෙළඳාම මේ වන විට, චීන කොටුව මාර්ගය පුරා සිදුකරනු ලබයි. එය වාහන ගමනාගමනයට මෙන්ම මගී ගමනාගමනයට ද බාධා ඇති කරයි. එමෙන්ම මූල්‍ය ආයතන හා ආරක්ෂිත පහසුකම් මේ වන විට නොමැති අතර, එම පහසුකම් වල අවශ්‍යතාවයක් පවතී.

*4.3. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

දැනට මැණික් වෙළඳාම සිදුකරන චීන කොටුව ප්‍රදේශයේ තදබදය අවම කිරීම සඳහා මෙන්ම ඔවුනට අවශ්‍ය සේවා පහසුකම් සැපයීමේ අරමුණින් මෙවන් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අපේක්ෂිතය. එහි පහසුකම් පහත පරිදි දැක්විය හැකිය.

- මූල්‍යායතන
- එළිමහන් මැද මිදුලක්
- මැණික් වෙළඳාම සඳහා කඩකාමර

5. ***ව්‍යාපෘතියේ අවශ්‍යතාව :***

මැණික් වෙළඳාම යනු බේරුවල නගරයට ඈත අතීතයේ සිටම ආර්ථිකමය වටිනාකමක් එක් කළ පාරම්පරික වෙළඳාමකි. බේරුවලට හිමි ආර්ථික අංශ වලින් එකක් වන මැණික් වෙළඳාම මගින් මෙම ප්‍රදේශයේ ආර්ථිකය නව නවත් ශක්තිමත් කිරීම සඳහාත්, වෙළඳාමේ නිරත වන්නන් හට වඩාත් ආරක්ෂාකාරී පහසුකම් සහිත ස්ථානයක් ඇති කිරීම සඳහාත් මෙම ව්‍යාපෘතිය යෝජනා කෙරේ.

6. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *බේරුවල නගර සභාව*

## 11.

1. ***ව්‍යාපෘතියේ නම :*** *ඉදිරිලිගොඩැල්ල ඇළ ප්‍රතිසංස්කරණය*
2. ***පිහිටීම :***




3. ***ව්‍යාපෘති අංශය :*** *ඇළ මාර්ග සංවර්ධන*
4. ***ව්‍යාපෘතිය :***

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | පිහිටීම |
|---|---|---|---|---|
| *බස්නාහිර* | *කළුතර* | *බේරුවල* | *මග්ගොන* | *මග්ගොන ගාලුපාර පිහිටි ඇළ අසල* |

*4.2. ඉඩමේ ප්‍රමාණය : හෙක්ටයාර් 7.01/ පර්චස් 17.32*

*4.3. වර්තමාන තත්ත්වය / භාවිතය*

ගාලුපාරට ආසන්නව පිහිටි ප්‍රධාන ඇළ මාර්ගයක් වන මෙම ඇළ දෙපස ගොඩවීමේ තර්ජනයකට ලක්වී ඇත. මේ තුළින් ජල මූලාශ්‍ර දූෂිත තත්ත්වයකට පත් වෙමින් පවතී.

*4.4. අපේක්ෂිත තත්ත්වය*

අනාගතයේදී මග්ගොන දෙවන පෙළ ප්‍රමුඛතා නගරයක් ලෙස සංවර්ධනය වීමේ දී පොදු හා විනෝදාස්වාද කටයුතු සඳහා යෝග්‍ය ස්ථානයක් ලෙස පහත පහසුකම් සහිතව සංවර්ධනය කිරීමට යෝජිතය.

- ආසන පහසුකම්
- ඇවිදින මංතීරු
- කුඩා අවන්හල්
- රාත්‍රි විදුලි ආලෝකකරණය


5. ***ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :***

මග්ගොන ප්‍රදේශයේ ජලවහන පද්ධතිය සැලකිල්ලට ගත්කළ ඉදිරිලිගොඩ ඇළ සුවිශේෂීතාවයක් දක්වයි. එමෙන්ම මෙම ඇළ උස් භූමිවලින් වටවී පවතී. නවද දෙපස පවතින භාවිතයන් නිසා ගොඩවීමේ තර්ජන ද ඇති බැවින් අක්‍රීය විවෘත භූමියක් ලෙස ඇති මෙම ස්ථානය සක්‍රීය විනෝද කටයුතු වලින් සමන්විත පොදු ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ. ඒ තුළින් මග්ගොන නගර දෙවන පෙළ ප්‍රමුඛතාවයක් සහිත නගරයක් ලෙස සංවර්ධනය කිරීමත් පරිසර පද්ධතියේ තිරසාර බව තහවුරු කිරීමත් මෙම ව්‍යාපෘතිය යටතේ අපේක්ෂා කෙරේ.

6. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව, බේරුවල ප්‍රාදේශීය සභාව.*

## 12.

1. ***ව්‍යාපෘතියේ නම :*** *යෝජිත සංචාරක වැඩිහිටි ගම්මානය හා යෝජිත කෘෂිකර්මය මුල් කරගත් ගම්මානය*
2. ***පිහිටීම :***



3. ***ව්‍යාපෘති අංශය :*** *සංචාරක සංවර්ධන*

4. ***ව්‍යාපෘතිය :***

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

| **පළාත** | **දිස්ත්‍රික්කය** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** | **ග්‍රාම නිලධාරී කොට්ඨාසය** | **පිහිටීම** |
|---|---|---|---|---|
| *බස්නාහිර* | *කළුතර* | *බේරුවල* | *කීරන්තිඩිය* | *බුන්වලාකන්ද* |

*4.2. ඉඩමේ ප්‍රමාණය : හෙක්ටයාර 10*

*4.3. වර්තමාන තත්ත්වය / භාවිතය :*

කීරන්තිඩිය ප්‍රදේශයේ පවතින මෙම යෝජිත ප්‍රදේශය ඉතාම මනරම් සුවදායි පරිසරයකින් යුතු අතර රබර් වගාව හා තෙත් බිම් ඇතුළු හරිත වැස්මකින් යුතු ප්‍රදේශයකි.

*4.4. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

සුවදායක පරිසර පද්ධතියක පිහිටා ඇති යෝජිත ප්‍රදේශය, පහත සඳහන් පහසුකම් සහිතව විශ්‍රාමිකයන් සඳහා වන ගම්මානයක් ලෙසින් සංවර්ධනය කිරීමට අපේක්ෂිතය

- විශේෂිත වූ කාමර / නිවාස පහසුකම්.
- සෞඛ්‍ය පහසුකම්
- විවේක හා විනෝද කටයුතු
- භාවනා මධ්‍යස්ථාන
- භෞතික චිකිත්සක මධ්‍යස්ථාන
- සනීපාරක්ෂක පහසුකම්

5. ***ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :***

බොහෝ සංවර්ධිත රටවල් වල පවතින අධික ජීවන තත්ත්වය නිසා ඇතැම් සංවර්ධිත රටවල් එම වයස්ගත ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙතින් රටවල වයස්ගත පුද්ගලයන් සඳහා වූ පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානවල රඳවා රැකබල ගැනීමට කටයුතු සලසා දී ඇත.

මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකාව ප්‍රචලිතව ඇති ආගන්තුක සත්කාර ගුණාංගය විභවතාවක් ලෙස සලකා විදේශිකයන් අරමුණු කරගත් විශ්‍රාමිකයන් සඳහා වූ ගම්මානය සෞම්‍ය දේශගුණයක් සහිත කාලවිල කීරන්තිඩිය ප්‍රදේශයේ ස්ථාපනය කිරීමට යෝජනා කෙරේ.

6. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන :*** *ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

## 13.

1. **ව්‍යාපෘතියේ නම :** *බෙන්තර පැරණි පාලම මත යෝජිත විවෘත අවන්හල*
2. **පිහිටීම :**



3. **ව්‍යාපෘති අංශය : සංචාරක සංවර්ධන**
4. **ව්‍යාපෘතිය :**

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | පිහිටීම |
|---|---|---|---|---|
| බස්නාහිර | කළුතර | බේරුවල | අලුත්ගම | බෙන්තර පැරණි පාලම |

*4.2. ඉඩමේ හිමිකාරීත්වය : මාර්ග සංවර්ධන අධිකාරිය*

*4.3. වර්තමාන තත්ත්වය / භාවිතය :*

මෙය බෙන්තර ගඟ හරහා යෙදී ඇති පැරණි පාලමක් වන බැවින් මෙය කිසිදු කටයුත්තක් සඳහා යොදා ගෙන නොමැත.

*4.4. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

මෙම ස්ථානය අවන්හල් පහසුකම් සහිත විවෘත වෙළඳපොලක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ. එහි යෝජිත පහසුකම් ලෙස, ආපන ශාලා පහසුකම්, විවෘත වෙළඳපොළ පහසුකම්, භූ දර්ශනය කිරීම, වීථි ආලෝකකරණය යනාදිය දැක්විය හැක.

5. ***ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :***

අළුත්ගම නගරයට ආසන්නව ඇති බෙන්තර ගඟ සීමාවේ පැරණී පාලම මේ වන විට අත් හැර දමා ඇති ස්ථානයකි. බස්නාහිර පළාතේ සීමාව හා දකුණු පළාතේ සීමාව ලෙස සලකන බෙන්තර ගඟ මත ඉදිකිරීමට යෝජිත පාවෙන අවන්හල ව්‍යාපෘතිය තුළින් අනාගත සංචාරක ආකර්ශනය වැඩි වනවා සේම අලුත්ගම ප්‍රදේශය සංචාරක පහසුකම් වලින් සපිරි නගරයක් ලෙස සංවර්ධනය වීමට ද රැකුල් දෙන්නක් ලෙස හැඳින්විය හැකිය.

6. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *පෞද්ගලික අංශයේ ආයෝජන, නාගරික සංවර්ධන අධිකාරිය*

## 14.

1. ***ව්‍යාපෘතියේ නම :*** *ප්‍රදර්ශනාගාරය සහිත සංස්කෘතික ගොඩනැගිල්ල*
2. ***පිහිටීම :***




3. ***ව්‍යාපෘති අංශය :*** *සංචාරක සංවර්ධන*
4. ***ව්‍යාපෘතිය :***

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරී කොට්ඨාසය* | *පිහිටීම* |
|---|---|---|---|---|
| *බස්නාහිර* | *කළුතර* | *බේරුවල* | *බේරුවල* | *වෙරළ උද්‍යානය ආශ්‍රිත කලාපය* |

*4.2. ඉඩමේ ප්‍රමාණය : පර්චස් 80*

*4.3. වර්තමාන තත්ත්වය / භාවිතය :*

යෝජිත වෙරළ උද්‍යානය ඉදිකිරීමට අපේක්ෂිත මෙම ඉඩම මේ වන විට හිස් ඉඩමකි.

*4.4. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

මැණික් වෙළඳාම ආශ්‍රිත ප්‍රදර්ශනාගාරයක් හා සංස්කෘතික ගොඩනැගිල්ල පහත සඳහන් පහසුකම් වලින් යුතුව සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ.

- ශ්‍රවණාගාර පහසුකම්
- ශාරීරික ව්‍යායාම මධ්‍යස්ථානයක්
- ප්‍රදර්ශනාගාරයක්
- කුඩා කඩ සාප්පු

මෙම ගොඩනැගිල්ල මුහුද ආශ්‍රිතව ඉදිකෙරෙන බැවින් දර්ශනයට බාධා නොවන පරිදි විනිවිදව පෙනෙන ආකාරයට ගොඩනැගිල්ල ඉදිකිරීමට අපේක්ෂා කරයි

**5. *ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :***

සංචාරක ආකර්ශනය වැඩි කිරීමේ අරමුණින් බේරුවල ධීවර වරාය ආශ්‍රිත මෙම කලාපය බාබේරියන් විනෝදාස්වාද කටයුතු කලාපය ලෙස සංවර්ධන සැලැස්මෙන් හඳුනාගෙන ඇත. ඒ අනුව එම කලාපයේ වෙරළ උද්‍යානය අසල ඉදිකෙරෙන මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම තුළින් මැණික් වෙළඳාම සඳහා පැමිණෙන විදේශකයින් මෙන්ම දේශීය සංචාරකයන් සඳහා ද සියලු පහසුකම් වලින් යුතුව ඉදිකෙරෙනු ඇත.

**6. *ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය.*

## 15.

1. ***ව්‍යාපෘතියේ නම :*** *කන්දේ විහාර පූජා කලාප සංවර්ධනය*
2. ***පිහිටීම :***




3. ***ව්‍යාපෘති අංශය :*** *සංස්කෘතික සංවර්ධන*
4. ***ව්‍යාපෘති විස්තරය :***

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

| ***පළාත*** | ***දිස්ත්‍රික්කය*** | ***ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*** | ***ග්‍රාම නිලධාරී කොට්ඨාසය*** | ***පිහිටීම*** |
|---|---|---|---|---|
| *බස්නාහිර* | *කළුතර* | *බේරුවල* | *කළුමෝදර* | *කන්දේ විහාරය* |

*4.2. වර්තමාන තත්ත්වය / භාවිතය :*

පොහොය දිනවලදී හා විශේෂ ආගමික වැඩ සටහන් පවතින දිනවලදී කන්දේ විහාර භූමිය ආශ්‍රිතව අධික තදබදයක් පවතී.

*4.3. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

පොහොය දිනවලදී සහ විශේෂ ආගමික වැඩසටහන් පවතින දිනවලදී විහාර භූමියේ ඇතිවන අධික තදබදය යන ගැටළු නිරාකරණය කිරීම සඳහාත් කන්දේ විහාර භූමිය ආශ්‍රිත පහසුකම් සංවර්ධනය කිරීම සඳහාත් පහත ව්‍යාපෘති හඳුනාගෙන ඇත. එනම්, අතුරු මාර්ග සංවර්ධනය හා යෝජිත වාහන නැවතුම්පල ඉදි කිරීමයි.

5. ***ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :***

ඓතිහාසික වශයෙන් හා ආගමික වශයෙන් ඉතා වැදගත් ස්ථානයක් හිමිකරගන්නා කන්දේ විහාර පූජා භූමියට දිනපතා දහස් ගණන් බැතිමතුන් පැමිණෙන අතර පොහොය දිනවලදී අධික තදබදයක් පවතී.

දැනට වාහන ගමන් ගන්නා මාර්ගය වෙනුවට විකල්ප මාර්ගයක් හා වාහන නැවතුම්පලක් සංවර්ධනය කිරීම තුළින් වාහන නිසා සිදුවන අධික තදබදය අවම කිරීමට අපේක්ෂා කෙරේ.

6. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *බේරුවල ප්‍රාදේශීය සභාව, පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය*

## 16.

1. ***ව්‍යාපෘතියේ නම :*** *නාගරික සංවර්ධන අධිකාරිය සතු අවන්හල සංවර්ධනය කිරීම*
2. ***පිහිටීම :***



3. ***ව්‍යාපෘති අංශය :*** *සංචාරක සංවර්ධනය*
4. ***ව්‍යාපෘති විස්තරය***

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | පිහිටීම |
|---|---|---|---|---|
| බස්නාහිර | කළුතර | බේරුවල | බේරුවල | මරදාන පාර වෙරළ උද්‍යානය ඉදිරිපිට |

4.2. *ඉඩමේ ප්‍රමාණය : පර්චස් 40*

4.3. *වර්තමාන තත්ත්වය / භාවිතය :*

වර්තමානයේ මෙය නාගරික සංවර්ධන අධිකාරිය සතු අවන්හලක් ලෙසින් පවතී.

4.4. *යෝජිත / අපේක්ෂිත තත්ත්වය :-*

මෙහිදී මෙම අවන්හල පාරිභෝගිකයන්ට උපරිම සේවාවන් සපයන සහ සංචාරකයන් ආකර්ෂණය කරගත හැකි අයුරින් සංවර්ධනය කිරීමට අපේක්ෂිතය.

**5. *ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :***

දැනට මෙම අවන්හල ස්ථාපිතව ඇති ස්ථානයෙහි අනාගතයේදී සංචාරක අංශයේ සංවර්ධනයක් අපේක්ෂා කරන බැවින් එම සංචාරක ආකර්ෂණය මෙම අවන්හල වෙතට ළඟා කරගැනීමට අපේක්ෂා කෙරේ. එනිසා සංචාරක ආකර්ෂණය සහිත කලාපයක සංචාරකයන්ට සේවාවන් සපයන මෙවන් ස්ථානයක අවශ්‍යතාවය පවතී.

**6. *ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *නාගරික සංවර්ධන අධිකාරිය*

## 17.

1. ***ව්‍යාපෘතියේ නම :*** *යෝජිත සංචාරක පාසල - මග්ගොන*
2. ***පිහිටීම :***



3. ***ව්‍යාපෘති අංශය :*** *සංචාරක සංවර්ධනය*

4. ***ව්‍යාපෘති විස්තරය***

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

| **පළාත** | **දිස්ත්‍රික්කය** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** | **ග්‍රාම නිලධාරී කොට්ඨාසය** | **පිහිටීම** |
|---|---|---|---|---|
| *බස්නාහිර* | *කළුතර* | *බේරුවල* | | |

*4.2. ඉඩමේ ප්‍රමාණය : අක්කර 2*

*4.3. වර්තමාන තත්ත්වය / භාවිතය :*

වර්තමානය වන විට බේරුවල ප්‍රදේශය සදහා සංචාරක පාසලක් නොමැත.

*4.4. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :-*

සංචාරක අධ්‍යාපනය පිළිබඳ ඇතුලත් වන පරිදි සංචාරක අධ්‍යාපන ආයතනයක් ප්‍රතිෂ්ටාපනය කිරීම සදහා යෝජනා කෙරේ.

5. ***ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :***

2030 වන විට සංචාරක පුරවරයක් කිරීම යන අරමුණ ලග කර ගැනීම සදහා මෙවන් ව්‍යාපෘතියක අවශ්‍යතාවයක් ඇත. සංචාරකයන් වඩාත් ආකර්ෂණය වන පරිදි සේවාවන් සපයන ආකාරය පිලිබදව අධ්‍යාපනය ලබා දීමට හා සැලසුම් බලප්‍රදේශය පුරා විසිරී පවතින සංචාරක කර්මාන්තය ප්‍රචලිත කළ හැකි අනෙකුත් අංග දියුණු කර නොයෙකුත් ක්‍රියාකාරකම් පදනම් කරගත් පරිසර හිතකාමී සංචාරක කර්මාන්තයක් ස්ථාපිත කිරීමට මෙයින් අපේක්ෂා කෙරේ. ආහාර රටා, ආගන්තුක සත්කාර දේශීය හා වෛද්‍ය ක්‍රම ඇතුළු ප්‍රදේශයේ පවතින විභවතාවන් වඩාත් උචිත ලෙස ප්‍රයෝජනයට ගනිමින් සංචාරක සංවර්ධනය සිදු කරන ආකාරය පිලිබදව අධ්‍යාපනයක් ලබා දීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම මෙම ව්‍යාපෘතිය තුලින් ප්‍රදේශය තුල සංචාරක කර්මාන්තය ආශ්‍රිතව රැකියා උත්පාදනය සදහාද හේතු වනු ඇත.

6. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

# 18.

1. ***ව්‍යාපෘතියේ නම :*** *යෝජිත හෝටල් සහ සාප්පු සංකීර්ණය ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල (අළුත්ගම)*
2. ***පිහිටීම :***



3. ***ව්‍යාපෘති අංශය :*** *සංචාරක සංවර්ධනය*
4. ***ව්‍යාපෘති විස්තරය***

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

| ***පළාත*** | ***දිස්ත්‍රික්කය*** | ***ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*** | ***ග්‍රාම නිලධාරී කොට්ඨාසය*** | ***පිහිටීම*** |
|---|---|---|---|---|
| *බස්නාහිර* | *කළුතර* | *බේරුවල* | *අළුත්ගම* | *අළුත්ගම ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල* |

*4.2. ඉඩමේ ප්‍රමාණය : වර්ග මීටර් 1350*

*4.3. වර්තමාන තත්ත්වය / භාවිතය :*

වර්තමානයේ මෙම ස්ථානයෙහි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල පවතී. ගාලු පාරට මුහුණලා පවතින මෙම ස්ථානයෙන් ප්‍රාදේශීය සභා කාර්යාලය ඉවතට ගෙනයන බැවින් ඒ සඳහා ව්‍යාපෘතිය යෝජනා කෙරේ.

*4.4. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :-*

අළුත්ගම සංචාරක කර්මාන්තය මුල්කරගත් සංවර්ධනයක් අපේක්ෂා කරන බැවින් වැඩිවන සංචාරකයන් සඳහා හෝටල් සහ සාප්පු සංකීර්ණයක් යෝජනා කෙරේ.

5. ***ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :***

ගාලු පාරට මුහුණලා පැවතීම හා බෙන්තර ගඟට ආසන්නයේ පිහිටා ඇති මෙම ස්ථානය සඳහා වඩාත් සුදුසු වනුයේ සාප්පු සංකීර්ණයක් හා හෝටලයකි. ඒ තුලින් සංචාරකයින්ට අවශ්‍ය වාණිජ අවශ්‍යතා ඉටුකරදීම අපේක්ෂා කෙරේ.

6. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *නාගරික සංවර්ධන අධිකාරිය*

## ධීවර කර්මාන්තය සංවර්ධන සැලැස්ම

## 19.

1. ***ව්‍යාපෘතියේ නම :*** *යෝජිත ධීවර ප්‍රජාව සඳහා ඉදි කරන නිවාස සංකීර්ණය*
2. ***පිහිටීම :***



3. ***ව්‍යාපෘති අංශය :*** *සමාජ සංවර්ධන*
4. ***ව්‍යාපෘති විස්තරය :***

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

| ***පළාත*** | ***දිස්ත්‍රික්කය*** | ***ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*** | ***ග්‍රාම නිලධාරී කොට්ඨාසය*** | ***පිහිටීම*** |
|---|---|---|---|---|
| *බස්නාහිර* | *කළුතර* | *බේරුවල* | *මරදාන* | *මරදාන පාර සිල්ලිය අසල* |

*4.2. ඉඩමේ ප්‍රමාණය : අක්කර 1.05*

*4.3. වර්තමාන තත්ත්වය / භාවිතය :*

වර්තමානයේ මෙම ඉඩම් ආශ්‍රිතව පෞද්ගලික නිවාස දක්නට ලැබේ. පෞද්ගලික ඉඩමක් ලෙසින් සැලකිය හැකිය.

*4.4. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

බේරුවල ධීවර කටයුතු වල නිරත වන ධීවර ප්‍රජාව සඳහා යෝජිත නිවාස සංකීර්ණය පහත සඳහන් පහසුකම් වලින් යුතුව ඉදිකිරීමට යෝජනා කෙරේ.

- ළමා උද්‍යාන
- වාහන නැවතුම් පළ
- විවෘත භූමි

5. ***ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :***

බේරුවල ප්‍රදේශය ආශ්‍රිත ධීවර ප්‍රජාවෙන් බොහෝ දෙනා මේ වන විට සුනාමි රක්ෂිත මීටර් 100 සීමාව තුළ අනවසර ලෙස පදිංචි වී ඇත.

වෙරළ ආශ්‍රිත පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීමටත් ධීවර ප්‍රජාවගේ නිවාස අවශ්‍යතාව හා ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

6. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *නිවාස සංවර්ධන අධිකාරිය*

## 20.

1. ***ව්‍යාපෘතියේ නම :*** *මරදාන මත්ස්‍ය වෙළඳපොළ වැඩි දියුණු කිරීම.*
2. ***පිහිටීම :***




3. ***ව්‍යාපෘති අංශය :*** *ධීවර අංශය සංවර්ධනය*
4. ***ව්‍යාපෘති විස්තරය :***

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | පිහිටීම |
|---|---|---|---|---|
| බස්නාහිර | කළුතර | බේරුවල | මරදාන | මරදාන ධීවර තොටුපළ අසළ |

*4.2. වර්තමාන තත්ත්වය / භාවිතය :*

දැනට බේරුවල ප්‍රදේශයේ පවතින දෙවන විශාල මත්ස්‍ය වෙළඳපොළ ලෙස ප්‍රසිද්ධියක් උසුලන මෙහි දෛනිකව මාළු මිලදී ගැනීම සඳහා වාහන බහුල වශයෙන් පැමිණෙන අතර මේ වනවිට, මාළු අලෙවි කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් නොමැත.

*4.3. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

පහසුකම් සහිත නව වෙළඳපොලක් ඉදිකිරීමටත්, වෙළඳාම සඳහා පැමිණෙන රථ වාහන සඳහා වාහන නැවතුම් පහසුකම් සැපයීමටත්, ප්‍රවේශ වීමේ පහසුකම් ලබා දීමේ අරමුණින් මරදාන මාර්ගය මංතීරු දෙකක් සහිත මාර්ගයක් ලෙස පුළුල් කිරීමට ත් අපේක්ෂිතය.

5. ***ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :***

බේරුවල ප්‍රදේශයේ මත්ස්‍ය වෙළඳාම සඳහා ඉහළ ඉල්ලුමක් පවතින අතර ඉන් නැවුම් මාළු මිලදී ගැනීම සඳහා මරදාන වෙළඳපොළ කරා විශාල ගැණුම්කරුවන් ප්‍රමාණයක් පැමිණේ. එම නිසා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් ගැණුම්කරුවන්ට පහසුකම් සැපයීමටත් ඒ තුළින් ප්‍රාදේශීය ආර්ථිකයට ඉහළ දායකත්වයක් ලබා ගැනීමටත් මේ තුළින් හැකිවේ.

6. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය*

## 21.

1. ***ව්‍යාපෘතියේ නම :*** *බේරුවල මත්ස්‍ය වෙළඳපොළ වැඩි දියුණු කිරීම.*
2. ***පිහිටීම :***




3. ***ව්‍යාපෘති අංශය :*** *ධීවර අංශය සංවර්ධනය*

**4. *ව්‍යාපෘති විස්තරය :***

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

| **පළාත** | **දිස්ත්‍රික්කය** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** | **ග්‍රාම නිලධාරී කොට්ඨාසය** | **පිහිටීම** |
|---|---|---|---|---|
| බස්නාහිර | කළුතර | බේරුවල | මරදාන | බේරුවල වරාය අසළ |

*4.2. වර්තමාන තත්ත්වය / භාවිතය :*

බේරුවල දැනට පවතින විශාලම තොග මත්ස්‍ය වෙළඳපොළ මෙය වේ. එය ගොඩනැගිලි දෙකකින් සමන්විත වේ.

*4.3. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

දැනට පවත්නා වෙළඳපොළෙහි පහසුකම් නවදුරටත් වර්ධනය කිරීම හා පවත්නා වෙළඳපොළ නවදුරටත් පුළුල් කිරීමට අපේක්ෂා කෙරේ.

**5. *ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :***

දෛනිකව ගැණුම්කරුවන් විශාල ප්‍රමාණයක් බේරුවල මත්ස්‍ය වෙළඳපොළ කරා පැමිණෙන අතර වෙළඳපොළෙහි දැනට පවතින පහසුකම්වල ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීම තුළින් ප්‍රාදේශීය ආර්ථිකයට ඉහළ දායකත්වයක් ලබාගත හැකිය.

**6. *ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය*

## 22.

1. ***ව්‍යාපෘතියේ නම :*** *බේරුවල ධීවර තොටුපළවල්වල තත්ත්වය වැඩි දියුණු කිරීම.*
2. ***පිහිටීම :***



3. ***ව්‍යාපෘති අංශය :*** *ධීවර අංශය සංවර්ධනය*
4. ***ව්‍යාපෘති විස්තරය :***

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | පිහිටීම |
|---|---|---|---|---|
| බස්නාහිර | කළුතර | බේරුවල | බේරුවල,<br>මග්ගොන<br>මරදාන | බේරුවල වරාය<br>මග්ගොන ධීවර තොටුපළ<br>මරදාන ධීවර තොටුපළ |

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

*4.2. වර්තමාන තත්ත්වය / භාවිතය :*

බේරුවල වරාය හැර අනෙකුත් ධීවර තොටුපළවල්වල බෝට්ටු නැංගුරම්ලෑම සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැත. බේරුවල වාරයෙහි රොන්මඩ තැන්පත්වීම නිසා යාත්‍රා නැංගුරම්ලෑම සඳහා ඇති ඉඩකඩ ප්‍රමාණවත් නොවේ.

*4.3. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

බේරුවල සැලසුම් බලප්‍රදේශය තුළ පිහිටා ඇති කුඩා තොටුපළවල් සඳහා යාත්‍රා නැංගුරම්ලෑමට අවශ්‍ය පහසුකම් සැපයීම සහ බේරුවල වරයෙහි යාත්‍රා නැංගුරම්ලෑම සඳහා වරාය මීටර් 7 පමණ ගැඹුරු කිරීම මෙම ව්‍යාපෘතිය තුළින් අපේක්ෂිතය.

5. ***ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :***

මෙසේ මත්ස්‍ය තොටුපළවල් සංවර්ධනය කිරීම තුළින් මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමට හැකියාව ලැබේ. එමෙන්ම මත්ස්‍ය නිෂ්පාදනයන් ඔස්සේ ප්‍රදේශයේ ආර්ථිකයට ලබා දෙන්නා වූ දායකත්වය ඉහළ නැංවීමටද අවකාශය උදාවේ.

6. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය*

## 23.

1. ***ව්‍යාපෘතියේ නම :*** *බේරුවල මරදාන මොරගල්ල මාර්ගය පළමු පෙළ ප්‍රමුඛතාවයක් ඇති මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම.*
2. ***පිහිටීම :***



3. ***ව්‍යාපෘති අංශය :*** *මාර්ග සංවර්ධන*

4. ***ව්‍යාපෘති විස්තරය :***

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

| **පළාත** | **දිස්ත්‍රික්කය** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** | **පිහිටීම** |
|---|---|---|---|
| *බස්නාහිර* | *කළුතර* | *බේරුවල* | *බේරුවල සිට මරදාන දක්වා ගාලු පාර* |

*4.2. වර්තමාන තත්ත්වය/භාවිතය : පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ගයකි. දැනට එය පටු ප්‍රවේශ පථයක් සහිත මාර්ගයක් ලෙස පවතී.*

*4.3. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

අනාගතයේ වැඩිවන ජනගහනයත් සමඟ රථවාහන තදබදයක් අපේක්ෂා කරන ගාලු පාරේ තදබදය මුදා හැරීම සඳහා භාවිතාකළ හැකි විකල්ප මාර්ගයක් ලෙසින් මෙම මාර්ගය පළමු පෙළ පිවිසුම් මාර්ගයක් ලෙසින් සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව,

- රථවාහන ගමනාගමන මංතීරු (මීටර් 5)
- පාපැදි සඳහා වෙන්වූ මංතීරු (මීටර් 2)
- හරිත තීරු සහිත පදිකයන් සඳහා වෙන්වූ මංතීරු (මීටර් 2)

ඇති කිරීමට අපේක්ෂිතය.

5. ***ව්‍යාපෘති අවශ්‍යතාවය :***

වර්ෂ 2030 වන විට වැඩි වන ජනගහනයත් සමඟ අපේක්ෂිත රථ වාහන තදබදයට පිළියමක් ලෙසින් මෙම විකල්ප මාර්ගය පළමු පෙළ ප්‍රමුඛත්වයක් ඇති මාර්ගයක් ලෙසින් සංවර්ධනය කිරීමට අවශ්‍ය වේ. එමෙන්ම බේරුවල හා මරදාන යන ධීවර වෙළඳපොළවල් අනාගතයේදී නවදුරටත් සංවර්ධනය කිරීම තුළින් වැඩිවන ගැණුම්කරුවන් සඳහා අවශ්‍ය ප්‍රවේශ මාර්ගයක් ලෙස මෙය යොදා ගැනීමේ හැකියාව ඇත.

6. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *මාර්ග සංවර්ධන අධිකාරිය*

## 24.

1. ***ව්‍යාපෘතියේ නම :*** *ගාලුපාර පුළුල් කිරීම*
   *මග්ගොන සිට බේරුවල දක්වා වූ කලාපය*
   *මොරගල්ල සිට අලුත්ගම දක්වා වූ කලාපය*
2. ***ව්‍යාපෘති අංශය :*** *මාර්ග සංවර්ධන*
3. ***ව්‍යාපෘති විස්තරය :***

*3.1. ව්‍යාපෘති සීමාවන් :*

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරී වසම පිහිටීම* |
|---|---|---|---|
| *බස්නාහිර* | *කළුතර* | *බේරුවල* | *මග්ගොන සිට අලුත්ගම දක්වා ගාලු පාර* |

*3.3. වර්තමාන තත්ත්වය / භාවිතය : මංතීරු දෙකක් සහිත මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ගයක් ලෙස පවතී.*

*3.4. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

සැලසුම් බලප්‍රදේශයේ ඇති ප්‍රධානම මාර්ගයක් ලෙසින් ගාලු පාර, පදිකයන් සඳහා සුවපහසු අයුරින් පුළුල් කිරීමට මෙහිදී අපේක්ෂා කෙරේ. ඒ අනුව මෙම මාර්ගය රථවාහන ගමනාගමන මංතීරු, හරිත තීරු, පදිකයන් සඳහා වෙන්වූ මංතීරු සහ රථවාහන නවතා නැබීමේ පහසුකම්ද සහිතව පුළුල් කිරීමට යෝජිතය.

- රථවාහන ගමනාගමන මංතීරු (මීටර් 3.5 x4 = මීටර් 14)
- රථවාහන නවතා නැබීම් පහසුකම් තෝරාගත් ස්ථානයන්හීදී ලබාදීම (මීටර් 2.5)
- හරිත තීරු සහිත පදිකයන් සඳහා වෙන්වූ මංතීරු (මීටර් 1.5 – 2.0)

4. ***ව්‍යාපෘති අවශ්‍යතාව :***

වර්ෂ 2030 වන විට අලුත්ගම මග්ගොන ආශ්‍රිත කලාපය සංචාරක ආකර්ෂණයෙන් අනූන කලාපයක් ලෙසින් සංවර්ධනය කිරීමට යෝජිතය. මෙම තත්ත්වය හේතුවෙන් උද්ගත වන රථ වාහන තදබදයට පිළියමක් ලෙසින් එම ප්‍රදේශයේ ගාලු පාර මංතීරු හතරක් සහිතව පුළුල්කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

5. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *මාර්ග සංවර්ධන අධිකාරිය*

## 25.

1. ***ව්‍යාපෘතියේ නම :*** *උතුරු දකුණු ප්‍රවේශ මාර්ගය (i)*
   *උතුරු දකුණු ප්‍රවේශ මාර්ගය (ii)*
2. ***පිහිටීම :***







3. ***ව්‍යාපෘති අංශය :*** *මාර්ග සංවර්ධනය*
4. ***ව්‍යාපෘති විස්තරය :***

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

| ***පළාත*** | ***දිස්ත්‍රික්කය*** | ***ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*** |
|---|---|---|
| *බස්නාහිර* | *කළුතර* | *බේරුවල* |

*4.2. වර්තමාන තත්ත්වය / භාවිතය :*

ප්‍රාදේශීය සභා හිමිකාරීත්වයක් ඇති මාර්ගයන් ලෙස පවතී.
වර්තමානයේ මෙම මාර්ගයන් නොදියුණු පටු මාර්ගයන් ලෙසින් පවතී.

*4.3. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

මෙම යෝජිත ප්‍රවේශ මාර්ගයන් ඉදිවන්නේ සංවර්ධන බලප්‍රදේශ අභ්‍යන්තරයේ පවතින නොදියුණු පටු මාර්ගයන් මුල්කර ගනිමිනි. මෙලෙසින් දැනට නොදියුණු තත්ත්වයේ පවතින පටු මාර්ගයන් සංවර්ධනය කිරීමේ මූලික පරමාර්ථය වනුයේ 2030 වන විට වැඩිවන ජනගහනය සංවර්ධන බලප්‍රදේශ අභ්‍යන්තරයට මුදා හැරීමටත් අභ්‍යන්තරයේ පවතින උපනාගරික කලාපයන් සංවර්ධනය කිරීමත්ය.

5. ***ව්‍යාපෘති අවශ්‍යතාවය :***

සංවර්ධන බලප්‍රදේශ අභ්‍යන්තර කලාපයන් ඔස්සේ දිවෙන මෙම මාර්ගයන් සංවර්ධනය තුළින් අපේක්ෂිත සංවර්ධනය බලප්‍රදේශ අභ්‍යන්තරයේ ඇති කිරීමටත් මෙම මාර්ගයන් ඔස්සේ ඇති උපනාගරික කලපයන් සංවර්ධනය කිරීම සඳහා මෙම මාර්ගයන් යෝජනා කිරීම අවශ්‍ය වේ.

6. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *මාර්ග සංවර්ධන අධිකාරිය*

## 26.

1. ***ව්‍යාපෘතියේ නම :*** *සංවර්ධන බලප්‍රදේශයේ අභ්‍යන්තරයට ගමන්කළ හැකි හඳුනාගත් මාර්ග මංතීරු දෙකක් සහිත මාර්ග ලෙසින් පුළුල් කිරීම.*

2. ***පිහිටීම :***



3. **ව්‍යාපෘති අංශය :** මාර්ග සංවර්ධනය
4. **ව්‍යාපෘති විස්තරය :**

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
|---|---|---|
| බස්නාහිර | කළුතර | බේරුවල |

*4.2. වර්තමාන තත්ත්වය / භාවිතය :*

| පුළුල් කිරීමට යෝජිත මාර්ගය | පවතින පළල (මීටර්) |
|---|---|
| පයාගල- දොඩන්ගොඩ මාර්ගය | 5 |
| පාලයන්ගොඩ - නාගහදූව | 5 |
| විහාරකන්ද මාර්ගය | 5 |
| පයාගල - කච්චේගොඩ | 5 |
| පයාගල - නාවත්තුඩුව | 5 |
| ශාන්ත වින්සෙන්ති මාර්ගය | 5 |
| මග්ගොන - මුංහේන හල්කඳවිල මාර්ගය | 5 |
| කංකානම්ගොඩ - කීරන්තිඩිය | 5 |
| බේරුවල - අළුත්ගම්වීදිය මාර්ගය | 5 |
| ෆතා හජිජියාර් මාවත | 5 |
| කළුවාමෝදර - කාලවිල මාර්ගය | 5 |
| පිංහේන - පාදගොඩ මාර්ගය | 5 |
| චීනකොටුව මාර්ගය | 5 |

මෙයින් බහුතරයක් මාර්ගයන් දැනට තනි මංතීරු සහිත පළාත්බඳ මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ගයන් වේ. එමෙන්ම මංතීරු එකක් සහිත ප්‍රාදේශීය සභා මාර්ගයන් වන චීන කොටුව මාර්ගය සහ ෆතා හජ්ජියාර් මාවතද මංතීරු දෙකක් සහිත මාර්ගයන් ලෙසින් පුළුල් කිරීමට යෝජිතය.

*4.3. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

මෙම මාර්ගයන් පුළුල් කිරීමේ ප්‍රධානතම අපේක්ෂාව වනුයේ දැනට වෙරළබඩ ප්‍රදේශයන්වල අධික පීඩනයකින් යුතුව ඒකරාශී වී ඇති ජනගහනය 2030 වන විට සංවර්ධන බලප්‍රදේශයේ අභ්‍යන්තරයට ගෙනයාහැකි සුවපහසු මාර්ග පද්ධතියක් ඇති කිරීමයි. ඒ අනුව යෝජිත පහසුකම් ලෙස

- රථවාහන ගමනාගමන මංතීරු (මීටර් 5)
- පාපැදි සඳහා වෙන්වූ මංතීරු (මීටර් 2)
- හරිත මංතීරු සහිතව පදිකයන් සඳහා වෙනුවූ මංතීරු (මීටර් 2 – මීටර් 3)

යනාදිය දැක්විය හැකිය.

5. ***ව්‍යාපෘති අවශ්‍යතාවය :***

වර්ෂ 2030 වන විට වෙරළාසන්න කලාපයන් වල අපේක්ෂිත ඉහළ ජන ඝනත්වය සංවර්ධන බලප්‍රදේශ අභ්‍යන්තරයට මුදා හැරීම සඳහා මෙම මාර්ගයන්ගේ සංවර්ධනයක් අවශ්‍ය වේ.

6. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *මාර්ග සංවර්ධන අධිකාරිය*

## 27.

1. ***ව්‍යාපෘතියේ නම :*** *විශේෂ සේවාවන් සපයන මාර්ගයන් සංවර්ධනය කිරීම*

   A. *මොරගල්ල වෙරළ වෙත පිවිසුම සඳහා ආබාධිත වූවන් හට පහසුකම් සපයන මාර්ග සංවර්ධනය කිරීම.*
   B. *සුනාමි නැවත පදිංචි කිරීමේ ස්ථානයන් හි ප්‍රවේශ මාර්ගයන් සංවර්ධනය කිරීම*
   C. *වෙරළ ප්‍රවේශ මාර්ගයන් සහ සංචාරක ප්‍රදේශයන් සඳහා වූ ප්‍රවේශ මාර්ගයන් සංවර්ධනය කිරීම.*
   D. *පැරණි ගාලු පාරේ සිට නව ගාලුපාර වෙතට ප්‍රවේශ වීම සඳහා වූ කෙටි පටුමග සංවර්ධනය කිරීම (ඇවිදයාමේ පහසුකම් සහිත මාර්ගයක් ලෙස).*
   E. *දුම්රිය ප්‍රවේශ මාර්ගයන් ඇවිදීමේ පහසුකම් සහිත මාර්ගයක් ලෙසින් සංවර්ධනය කිරීම*
   F. *තුඩාව විකල්ප මාර්ගය සංවර්ධනය කිරීම.*
   G. *බෙන්තර ගඟ ප්‍රවේශ මාර්ගයන් සංවර්ධනය කිරීම.*
   H. *B – 157 අලුත්ගම - මතුගම මාර්ගය සංවර්ධනය කිරීම.*

2. ***ව්‍යාපෘති අංශය :*** *මාර්ග සංවර්ධනය*
3. ***ව්‍යාපෘති විස්තරය :***

   *3.1 ව්‍යාපෘති සීමාවන් :*

| ***පළාත*** | ***දිස්ත්‍රික්කය*** | ***ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*** |
|---|---|---|
| *බස්නාහිර* | *කළුතර* | *බේරුවල* |

   *3.3. වර්තමාන තත්ත්වය / භාවිතය :*

වර්තමානයේ නොදියුණු පටු මාර්ග ලෙස පවතී.

   *3.4. යෝජිත / අපේක්ෂිත තත්ත්වය*

- වෙරළ ප්‍රවේශ මාර්ගයන් සහ සංචාරක ප්‍රදේශයන් සඳහා වූ ප්‍රවේශ මාර්ගයන්, 2030 වන විට සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කරමින් දේශීය හා විදේශීය සංචාරක ආකර්ශනය ඉහළ නැංවීමේ අරමුණින් සංවර්ධනය කිරීමට යෝජිතය.
- පැරණි ගාලුපාරේ සිට නව ගාලු පාර වෙතට ප්‍රවේශ වීම සඳහා වූ කෙටි පටුමග සහ දුම්රිය ප්‍රවේශ මාර්ගයන් වාහන ගමනාගමය සඳහා ඉඩකඩ සලස්වා දීමකින් තොරව මාර්ග ගමනාගමන පහසුව වැඩි කිරීමේ අරමුණින් හරිතනීරු සහිතව සංවර්ධනය කිරීමට යෝජිතය.
- සුනාමි නැවත පදිංචි කිරීමේ ස්ථානයන්හි ප්‍රවේශ මාර්ගයන් එම ප්‍රදේශයන්හි පදිංචි ජනගහනයට උචිත අයුරින් සංවර්ධනය කිරීමට යෝජිතය

4. ***ව්‍යාපෘති අවශ්‍යතාවය :***

සංචාරක කලාපයන් මුල්කරගනිමින් ව්‍යාප්ත වී ඇති මෙම මාර්ගයන් සංචාරකයන්ට ඇවිද යාමේ පහසුකම් සහිතව සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය පවතී.

5. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *මාර්ග සංවර්ධන අධිකාරිය*

## නේවාසික සංවර්ධන සැලැස්ම

## 28.

1. ***ව්‍යාපෘතියේ නම :*** *යෝජිත කුරේවත්ත කසළ කලමනාකරණ අංගනය*
2. ***ව්‍යාපෘති අංශය :*** *නගර සංවර්ධන*
3. ***ව්‍යාපෘති විස්තරය :***

*3.1 ව්‍යාපෘති සීමාවන් :*

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | පිහිටීම |
|---|---|---|---|---|
| බස්නාහිර | කළුතර | බේරුවල | කුරේවත්ත | බේරුවල |

*3.2 ඉඩමේ ප්‍රමාණය : අක්කර 12 යි.*

*3.3 වර්තමාන තත්ත්වය / භාවිතය :*

වර්තමානය වන විට බේරුවල කසළ බැහැර කිරීම සිදුකරනුයේ බේරුවල නගර සභා බලප්‍රදේශයේ වෙත්තිමරාජපුර තෙත්බිම් ආශ්‍රිතව හා බේරුවල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ දර්ගා නගරය හා හිරිගල්ගොඩැල්ල ආශ්‍රිතවයි.

අනාගතයේදී වැඩිවන ජනගහනය හා සංසරණ ජනගහනය හේතුකොටගෙන ඝණ අපද්‍රව්‍ය ප්‍රමාණයද සැලකිය යුතු අයුරින් වැඩිවේ. ඒ අනුව මේ සඳහා දිරන කසළ සහ නොදිරන කසළ ක්‍රමවත් ලෙස බැහැර කිරීම සඳහා ස්ථානයක් අවශ්‍ය වේ.

*3.4 යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

දිරන කුණු කසළ හා නොදිරන කුණු කසළ බැහැර කිරීම සඳහා කුරේවත්ත ප්‍රදේශයේ අක්කර 12 ක ඉඩමක් යෝජනා වී තිබේ.

4. ***ව්‍යාපෘති අවශ්‍යතාවය :***

වර්තමානයේ බේරුවල නගරයේ කසළ බැහැර කිරීම තෙත්බිම් මුල් කරගනිමින් සිදුවේ. මෙම අහිතකර තත්ත්වය මඟහරවා ගැනීම සඳහා කසළ අංගනයක අවශ්‍යතාවය පවතී.

5. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බේරුවල ප්‍රාදේශීය සභාව*

## 29.

1. ***ව්‍යාපෘතියේ නම :*** *තිරසාර නාගරික ජලාපවහන පද්ධතිය (බේරුවල නගර සභා සීමාව හා මොරගල්ල සංචාරක කලාපය)*
2. ***ව්‍යාපෘති අංශය :*** *නගර සංවර්ධන*
3. ***ව්‍යාපෘතිය :***

*3.1 ව්‍යාපෘති සීමාවන් :*

| ***පළාත*** | ***දිස්ත්‍රික්කය*** | ***ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*** | ***ග්‍රාම නිලධාරී වසම පිහිටීම*** |
|---|---|---|---|
| *බස්නාහිර* | *කළුතර* | *බේරුවල* | *මග්ගොන සිට අලුත්ගම දක්වා ගාලු පාර* |

*3.2 ඉඩමේ ප්‍රමාණය : නගර සභා බලප්‍රදේශය*

*3.3. වර්තමාන තත්ත්වය/භාවිතය :*

වර්තමානය වන විට බේරුවල නගරසභා බලප්‍රදේශය සඳහා ක්‍රමවත් කාණු පද්ධතියක් නොමැතිවීමෙන් වර්ෂාකාලවලදී කාණු වලින් ජලය බැසයාමේ ගැටළුවක් ඇති වේ. එම ගැටළුකාරී තත්ත්වය හේතුවෙන් බේරුවල නගර සභා බලප්‍රදේශය සුළු වර්ෂාවන් හිදී පවා ගංවතුර තත්ත්වයන්ට මුහුණ දෙමින් පවතී. බෙරව ඇළ, කාවයියන් ඇළ, ආදී ඇළ මාර්ගයන්වල කුණු හිරවීම නිසා වැසි ජලය පිරීමෙන් කාණු උතුරා යාමක්ද සිදුවේ.

*3.4. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

මෙම ගංවතුර තත්ත්වය අවම කිරීම හා සුපිරිසිදු නගරයක් ඇති කිරීම යන අරමුණු පෙරදැරිකොට ගෙන තිරසාර නාගරික ජලපවහන පද්ධතියක් යෝජනා කෙරේ. බොහෝ රටවල මෙම සංකල්පය මඟින් දූෂිත කාණු හා ඇළ මාර්ගයන් පිරිසිදුකොටගෙන ජලවහන රටාව ක්‍රමවත් කිරීමට මෙන්ම සුවදායී නාගරික වටපිටාවක්ද ඇතිකර ඇති බවට නිදසුන් තුළින් පෙන්විය හැකිය.

4. ***ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :***

ඒ අනුව තිරසාර නාගරික ජලාපවහන පද්ධතියක් තුළින් බේරුවල නගරයේ ගංවතුර අවම කරමින් සුවදායී නාගරික පසුබිමක් බිහි කිරීම මෙම ව්‍යාපෘතිය තුළින් අපේක්ෂා කරයි.

5. ***ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය*

# 30.

1. ***ව්‍යාපෘතියේ නම :*** *පැරණි ලිව්වම් සිනමා ශාලාව තිබූ ස්ථානය සහ පද්මිණී පීරිස් මාර්ගය ආශ්‍රිත ප්‍රදේශය සඳහා වාහන නවතා තැබීමේ පහසුකම් සැපයීම.*
2. ***පිහිටීම :***




3. ***ව්‍යාපෘති අංශය :*** *නගර සංවර්ධන*
4. ***ව්‍යාපෘතිය :***

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරී කොට්ඨාසය* | *පිහිටීම* |
|---|---|---|---|---|
| *බස්නාහිර* | *කළුතර* | *බේරුවල* | *අළුත්ගම* | *අලුත්ගම බස් නැවතුම්පොළ අසළ* |

*4.2 ඉඩමේ ප්‍රමාණය : අළුත්ගම පොළ අසළ - අක්කර 0.2*
*ලිව්වම් සිනමා ශාලාව තිබූ ඉඩම - අක්කර 0.07*

*4.3. වර්තමාන තත්ත්වය / භාවිතය : අත්හැර දමන ලද ඉඩමකි.*

*4.4. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

වාහන නැවතුම්පල, කුඩා අවන්හල් සහ විවේක ගැනීමේ ස්ථාන සහිතව සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ.

5. ***ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :***

මෙම සැලසුමට අනුව අලුත්ගම නගරය සංචාරක අංශය කේන්ද්‍රකර ගනිමින් සේවා සැපයීමේ මධ්‍යස්ථානයක් ලෙස යෝජනා කොට ඇති අතර, ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කළයුතුය. ඒ අනුව හඳුනාගත් මෙම ප්‍රදේශයන්හි වාහන නැවතුම්පළ හා අදාළ සේවා සැපයීම තුළින් අනාගතයේ වැඩිවන සංසරණ හා නේවාසික ජනගහනයට අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම මෙමඟින් අපේක්ෂා කරයි

6. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *බේරුවල ප්‍රාදේශීය සභාව*

## 31.

1. ***ව්‍යාපෘතියේ නම :*** *හල්කඳවිල උප නගර සංවර්ධනය*
2. ***පිහිටීම :***




3. ***ව්‍යාපෘති අංශය :*** *නගර සංවර්ධන*
4. ***ව්‍යාපෘති විස්තරය :***

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරී කොට්ඨාසය* | *පිහිටීම* |
|---|---|---|---|---|
| *බස්නාහිර* | *කළුතර* | *බේරුවල* | *හල්කඳවිල* | *හල්කඳවිල උප නගර සීමාව* |

*4.1. ව්‍යාපෘති සීමාවන් :*

*4.2. වර්තමාන තත්ත්වය / භාවිතය.*

හල්කඳවිල උප නගරය දැනට සේවා සැපයීමේ මධ්‍යස්ථානයක් ලෙසින් පවතී. පොළ, සුළු වෙළඳ මධ්‍යස්ථාන, පුස්තකාල ආදී සේවා වර්තමානය වන විට හල්කඳවිල උප නාගරික කලාපය තුළ ඒකරාශී වී ඇත.

*4.3. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

2030 අපේක්ෂිත සංවර්ධන සැලැස්මට අනුව හල්කඳවිල අභ්‍යන්තරික උපනාගරික කලාපයක් ලෙසින් ද හඳුනාගෙන ඇත. මෙම උප නගර සංවර්ධනය පහත සඳහන් පහසුකම් වලින් යුතුව සංවර්ධනය කිරීමට යෝජිතය.

- නගර උද්‍යාන පහසුකම් සංවර්ධනය
- වැසි ජලය බැස යාමේ පද්ධතිය නවීකරණය
- යෝජිත සෞඛ්‍ය මධ්‍යස්ථානය සංවර්ධනය
- නගර මධ්‍ය සංවර්ධනය

5. ***ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :***

අභ්‍යන්තර කලාපවල ජනාවාස ප්‍රචලිත කිරීම යටතේ හල්කඳවිල නගරයට ප්‍රධාන ස්ථානයක් හිමිවේ. දැනටමත් සංවර්ධනය වූ සේවා මධ්‍යස්ථානයක් වීමත් දොඩන්ගොඩ ප්‍රදේශයට ඍජුව සම්බන්ධ වීම සඳහා වන ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීමට හඳුනාගෙන තිබීමත් නිසා හල්කඳවිල පළමු පෙළ අභ්‍යන්තරික නේවාසික මධ්‍යස්ථානයක් ලෙස ඉහත පහසුකම් වලින් යුතුව සංවර්ධනය කිරීමට අවශ්‍ය වේ.

දැනට ගං වතුර අවධානම පවතින ප්‍රදේශ වල එම අවධානම මග හැරීමට වැසි ජල බැසයාමේ කාණු පද්ධතියක්ද, මෙම සේවා මධ්‍යස්ථානය ආශ්‍රිත පොදු විනෝද කටයුතු ස්ථාන වැඩි කිරීමේ අරමුණින් උද්‍යාන පහසුකම් ද, සෞඛ්‍ය පහසුකම් ආදී පහසුකම් සංවර්ධනය කිරීම තුළින් හල්කඳවිල පළමු පෙළ අභ්‍යන්තරික සේවා මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ.

6. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය, බේරුවල ප්‍රාදේශීය සභාව, නාගරික සංවර්ධන අධිකාරිය.*

# 32.

1. ***ව්‍යාපෘතියේ නම :*** *මග්ගොන ක්‍රීඩාංගනය හා වැසි ජල කාණු පද්ධතිය සංවර්ධනය*
2. ***පිහිටීම :***




3. ***ව්‍යාපෘති අංශය :*** *සමාජීය සංවර්ධනය*
4. ***ව්‍යාපෘතිය :***

*4.1 ව්‍යාපෘති සීමාවන් :*

| **පළාත** | **දිස්ත්‍රික්කය** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** | **ග්‍රාම නිලධාරී වසම පිහිටීම** |
|---|---|---|---|
| බස්නාහිර | කළුතර | බේරුවල | අක්කරමලේ |

*4.2. ඉඩමේ ප්‍රමාණය : අක්කර 1.05*

*4.3. වර්තමාන තත්ත්වය / භාවිතය :*

ප්‍රදේශයේ ක්‍රියාකාරී පොදු ක්‍රීඩාංගනයක් ලෙසට පවතින මග්ගොන පොදු ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම සඳහා මේ වන විට ව්‍යාපෘති යෝජනා කර ඇත.

*4.4. යෝජිත / අපේක්ෂිත තත්ත්වය :*

මෙම ක්‍රීඩාංගනය පහත සඳහන් පහසුකම් වලින් යුතුව සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ.

- ක්‍රීඩාගාර පහසුකම් සංවර්ධනය
- ක්‍රීඩාංගනය සඳහා ප්‍රවේශ මාර්ග සංවර්ධනය
- වාහන නැවතුම් පහසුකම් සංවර්ධනය කිරීම.

5. ***ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :***

2030 වන විට මග්ගොන නගරය දෙවන පෙළ ප්‍රමුඛ නගරයක් ලෙස ඉහළ නැංවීමට යෝජිත අතර ඒ සඳහා සඳහා නවීන තාක්ෂණයට අනුව ඉදිකරන ලද ක්‍රීඩාංගනයක අවශ්‍යතාවය ඇත. ඒ අනුව මග්ගොන නගරයේ දැනට ඇති මෙම පොදු ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම තුළින් සමාජීය සංවර්ධනයක් අත්පත් කර ගැනීමට අපේක්ෂිතය. එය 2030 වනවිට අපේක්ෂිත සමස්ථ සංවර්ධන ක්‍රියාදාමයටද ඉවහල් වේ.

6. ***ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය :*** *බේරුවල ප්‍රාදේශීය සභාව*

## 33.

1. ***ව්‍යාපෘතියේ නම :*** *බේරුවල වෙළඳපොළ සංවර්ධනය කිරීම.*
2. ***පිහිටීම :***




3. ***ව්‍යාපෘති අංශය :*** *ආර්ථික සංවර්ධනය*
4. ***ව්‍යාපෘතිය :***

*4.1 ව්‍යාපෘති සීමාවන් :*

| ***පළාත*** | ***දිස්ත්‍රික්කය*** | ***ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*** | ***ග්‍රාම නිලධාරී කොට්ඨාසය*** | ***පිහිටීම*** |
|---|---|---|---|---|
